201 වන කාණ්ඩය - 3 වන කලාපය
தொகுதி 201 - இல. 3
**Volume 201 - No. 3**

2011 අගෝස්තු 11 වන බ්‍රහස්පතින්දා
2011 ஓகஸ்ட் 11, வியாழக்கிழமை
**Thursday, 11th August, 2011**



# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**ශෝක ප්‍රකාශය :**
ගරු ඊ.පී. පෝල් පෙරේරා මහතා
ගරු පී.ඕ. විමලනාග මහතා
ගරු අල්හාජ් එන්.එම් බුහාර්දීන් මහතා
ගරු සරත් චන්ද්‍ර රාජකරුණා මහතා

**ශ්‍රී ලංකා ව්‍යවහාරික සංඛ්‍යානවිද්‍යා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත:**
සලකා බලා සංශෝධිතාකාරයෙන් තුන්වන වර කියවා සම්මත කරන ලදී

**දෙහිවල, නැදිමාලේ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත:**
දෙවන වර කියවා "බී" ස්ථාවර කාරක සභාවට පවරන ලදී

**සමස්ත ලංකා භික්ෂු සහයෝගිතා සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත:**
දෙවන වර කියවා "බී" ස්ථාවර කාරක සභාවට පවරන ලදී

**දේශමාන්‍ය රවීන්ද්‍ර වනිගසේකර පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත:**
දෙවන වර කියවා "ඒ" ස්ථාවර කාරක සභාවට පවරන ලදී

**ශ්‍රී ලංකා ඖෂධ විද්‍යා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත:**
දෙවන වර කියවා "බී" ස්ථාවර කාරක සභාවට පවරන ලදී

**ජෝන් සෙනෙවිරත්න පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත:**
දෙවන වර කියවා "ඒ" ස්ථාවර කාරක සභාවට පවරන ලදී

**තිදොර - තියටර් ඉන්ස්ටිටියුට් ෆෝ ඩිසැබිලිටි ඔරියන්ටඩ් රිසර්ච් ඇන්ඩ් ඇඩ්වොකසි (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත:**
දෙවන වර කියවා "ඒ" ස්ථාවර කාරක සභාවට පවරන ලදී

**ශ්‍රී ධම්මාලංකාර සමාජ සේවා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත:**
දෙවන වර කියවා "ඒ" ස්ථාවර කාරක සභාවට පවරන ලදී

**කල් තැබීමේ යෝජනාව:**
අධ්‍යාපන පරිපාලන කටයුතු බිඳ වැටීම

---

# பிரதான உள்ளடக்கம்

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**அனுதாபத் தீர்மானம் :**
மாண்புமிகு ஈ. பீ. போல் பெரேரா
மாண்புமிகு பீ.ஓ. விமலநாக
மாண்புமிகு அல்ஹாஜ் என்.எம்.புஹார்டின்
மாண்புமிகு சரத் சந்திர ராஜகருணா

**இலங்கை பிரயோக புள்ளிவிபரவியல் நிறுவகம் (கூட்டிணைத்தல்) சட்டமூலம்:**
பரிசீலிக்கப்பட்டு, திருத்தப்பட்டவாறு மூன்றாம் முறை மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது

**தெஹிவளை நெதிமாலை பௌத்த கலாசார நிலையம் (கூட்டிணைத்தல்) (திருத்தச்) சட்டமூலம்:**
இரண்டாம்முறை மதிப்பிடப்பட்டு நிலைக்குழு 'பி' க்குச் சாட்டப்பட்டது

**ஐக்கிய இலங்கை பிக்குமார்களுக்கான அபிவிருத்தி அமைப்பு (கூட்டிணைத்தல்) சட்டமூலம்:**
இரண்டாம்முறை மதிப்பிடப்பட்டு நிலைக்குழு 'பி' க்குச் சாட்டப்பட்டது

**தேசமான்ய ரவீந்திர வணிகசேகர ஒழுங்கமைப்பு (கூட்டிணைத்தல்) சட்டமூலம்:**
இரண்டாம்முறை மதிப்பிடப்பட்டு நிலைக்குழு 'ஏ' க்குச் சாட்டப்பட்டது.

**இலங்கை ஔடதங்கள் சங்கம் (கூட்டிணைத்தல்) சட்டமூலம்:**
இரண்டாம்முறை மதிப்பிடப்பட்டு நிலைக்குழு 'பி' க்குச் சாட்டப்பட்டது

**ஜோன் செனவிரத்ன மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்:**
இரண்டாம்முறை மதிப்பிடப்பட்டு நிலைக்குழு 'ஏ' க்குச் சாட்டப்பட்டது.

**அங்கவீனர்களுக்கான ஆலோசனையும் உதவிகளையும் வழங்குவதற்கான திதொரா தியேட்டர் நிறுவகம் (கூட்டிணைத்தல்) சட்டமூலம்:**
இரண்டாம்முறை மதிப்பிடப்பட்டு நிலைக்குழு 'ஏ' க்குச் சாட்டப்பட்டது.

**ஸ்ரீ தம்மாலங்கார சமூக சேவைகள் மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்:**
இரண்டாம்முறை மதிப்பிடப்பட்டு நிலைக்குழு 'ஏ' க்குச் சாட்டப்பட்டது.

**ஒத்திவைப்புப் பிரேரணை:**
கல்வி நிருவாக நடவடிக்கைகளின் வீழ்ச்சி

# PRINCIPAL CONTENTS

ORAL ANSWERS TO QUESTIONS

VOTE OF CONDOLENCE:
Hon. E.P.Paul Perera
Hon.P.O.Wimalanaga
Hon. Alhaj N.M.Buhardeen
Hon. Sarath Chandra Rajakaruna

INSTITUTE OF APPLIED STATISTICS, SRI LANKA (INCORPORATION) BILL:
Considered, read the Third time and passed as amended

BUDDHIST CULTURAL CENTRE OF NEDIMALA, DEHIWALA (INCORPORATION) BILL:
Read the Second time and allocated to Standing Committee "B"

ALL ISLAND BHIKSHU BENEVOLENT DEVELOPMENT FOUNDATION (INCORPORATION) BILL:
Read the Second time and allocated to Standing Committee "B"

DESHAMANYA RAVINDRA WANIGASEKARA FOUNDATION (INCORPORATION) BILL:
Read the Second time and allocated to Standing Committee "A"

PHARMACEUTICAL SOCIETY OF SRI LANKA (INCORPORATION) BILL:
Read the Second time and allocated to Standing Committee "B"

JOHN SENEVIRATNE FOUNDATION (INCORPORATION) BILL:
Read the Second time and allocated to Standing Committee "A"

THIDORA-THEATRE INSTITUTE FOR DISABILITY ORIENTED RESEARCH AND ADVOCACY (INCORPORATION) BILL:
Read the Second time and allocated to Standing Committee "A"

SRI DHAMMALANKARA SOCIAL SERVICES FOUNDATION (INCORPORATION) BILL:
Read the Second time and allocated to Standing Committee "A"

ADJOURNMENT MOTION:
Disruption in Education Administration Activities

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

*2011 අගෝස්තු 11 වන බ්‍රහස්පතින්දා*
*2011 ஓகஸ்ட் 11, வியாழக்கிழமை*
*Thursday, 11th August, 2011*

***අ. භා. 1.00ට පාර්ලිමේන්තුව රැස්විය. කථානායකතුමා [ගරු චමල් රාජපක්ෂ මහතා] මූලාසනාරූඪ විය.***
*பாராளுமன்றம் பி. ப. 1.00 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சமல் ராஜபக்ஷ] தலைமை வகித்தார்கள்.*
*The Parliament met at 1.00 p.m.,* MR. SPEAKER [THE HON. CHAMAL RAJAPAKSA] *in the Chair.*

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்.
## PAPERS PRESENTED

2009 වර්ෂය සඳහා ජාතික ආරක්ෂක අරමුදල පිළිබඳ විගණකාධිපතිගේ වාර්තාව.- [අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

2010 වර්ෂය සඳහා පාර්ලිමේන්තුවේ සභානායක කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව. -[වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍ය ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகால மைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)
ගරු කථානායකතුමනි, යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2008 සහ 2009 වර්ෂ සඳහා ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ වාර්ෂික වාර්තා ඉදිරිපත් කරමි.

මෙම වාර්තා යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, සමුපකාර හා අභ්‍යන්තර වෙළෙඳ අමාත්‍යතුමා වෙනුවෙන් මම 2008 වර්ෂය සඳහා වී අලෙවි මණ්ඩලයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව සමුපකාර හා අභ්‍යන්තර වෙළෙඳ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු (ආචාර්ය) මර්වින් සිල්වා මහතා (මහජන සම්බන්ධතා හා මහජන කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) மேர்வின் சில்வா - மக்கள் தொடர்பு, மக்கள் அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Dr.) Mervyn Silva - Minister of Public Relations and Public Affairs)
අති ගෞරවණීය කථානායකතුමනි, මා පළමුවෙන්ම ඔබතුමාට සුබ පතනවා.

ගරු කථානායකතුමනි, මම මාතලේ, නාලන්ද, මීගොල්ල, අංක 33 දරන ස්ථානයේ පදිංචි ගැරව්දෙනියේගෙදර ගාමිණී මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### පාසල් සිසුන්ට ආහාර සැපයීමේ වැඩසටහන: විස්තර
### பாடசாலை மாணவர்களுக்கு உணவு வழங்கும் நிகழ்ச்சித்திட்டம்: விபரம்
### PROVISION OF MEALS TO SCHOOL CHILDREN: DETAILS

0860/'10

1. **ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (5) :

(අ) (i) පාසල් සිසුන්ට ආහාර සැපයීමේ වැඩසටහනක් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක වන්නේද;

[ගරු අජිත් කුමාර මහතා]

(ii) එම වැඩසටහන ක්‍රියාත්මක වන පාසල් සංඛ්‍යාව හා ඒවායේ නම්, දිස්ත්‍රික්ක සහ අධ්‍යාපන කලාප මට්ටමෙන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඒ සඳහා අරමුදල් ලබා දෙන දේශීය හෝ විදේශීය ආයතන කවරේද;

(iv) මෙම වැඩසටහන අනුව එක් සිසුවෙකුට දිනකට වෙන් කරනු ලබන මුදල හා ලබා දෙන ආහාර වේල කවරේද;

(v) මෙම වැඩසටහන පාසල් මට්ටමින් ක්‍රියාත්මක වන ආකාරය කෙසේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත වැඩසටහන යටතේ පාසල් සඳහා ආහාර සපයන අධ්‍යාපන කලාප ගණනාවකම ආහාර සැපයුම්කරුවන්ට නියමිත පරිදි මුදල් ගෙවා නොමැති බවත්;

(ii) ආහාර සැපයුම්කරුවන්ට මුදල් ගෙවීම ප්‍රමාද කිරීමෙන් ඔවුන්ට අසාධාරණයක් සිදුව ඇති බවත් හා එමගින් පාසල් සිසුන්ට ආහාර ලබා දීමේ වැඩසටහනට බාධා වන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) ඉහත ආහාර සැපයුම්කරුවන්ට අවසාන වරට මුදල් ගෙවා ඇති මාසය කවරේද;

(ii) මේ වන විට ඔවුන්ට ගෙවා ඇති හිඟ මුදල ඒ ඒ දිස්ත්‍රික්ක හා අධ්‍යාපන කලාප මට්ටමින් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கல்வி அமைச்சரினால், பாடசாலை மாணவர்களுக்கு உணவு வழங்கும் நிகழ்ச்சித்திட்டமொன்று நடைமுறைப்படுத்தப்படுத்தப்படுகின்றதா என்தையும்;

(ii) குறித்த நிகழ்ச்சித்திட்டம் நடைமுறையிலுள்ள பாடசாலைகளின் எண்ணிக்கை மற்றும் அவற்றின் பெயர்கள் மாவட்ட மற்றும் கல்வி வலய ரீதியாக வெவ்வேறாக யாவை என்பதையும்;

(iii) இதன்பொருட்டு நிதி வழங்கும் உள்நாட்டு அல்லது வெளிநாட்டு நிறுவனங்கள் யாவையென்பதையும்;

(iv) இந்நிகழ்ச்சித்திட்டத்தின் பிரகாரம் நாளொன்றுக்கு ஒரு மாணவனுக்கு ஒதுக்கப்படும் பணத்தொகை மற்றும் வழங்கும் உணவு யாது என்பதையும்;

(v) இந்த நிகழ்ச்சித் திட்டம் பாடசாலை மட்டத்தில் எவ்வாறு நடைமுறைப் படுத்தப்படுகிறது என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி நிகழ்ச்சித் திட்டதின் கீழ், பாடசாலைகளுக்கு உணவு வழங்குகின்ற அநேகமான கல்வி வலயங்களில் உணவு வழங்குநர்களுக்கு உரிய முறையில் பணம் செலுத்தப்படவில்லை என்பதையும்;

(ii) உணவு வழங்குநர்களுக்கு பணம் செலுத்துவது தாமதமாயுள்ளதால் இவர்களுக்கு அநீதி நேர்த்துள்ளதென்பதையும், இதனால் பாடசாலை மாணவர்களுக்கு உணவு வழங்கும் நிகழ்ச்சித்திட்டத்திற்கு தடை ஏற்படுவதென்பதையும்

அவர் ஏற்றுக்கொள்வாரா?

(இ) (i) மேற்படி உணவு வழங்குநர்களுக்கு இறுதியாக பணம் செலுத்தியுள்ள மாதம் யாதென்பதையும்;

(ii) தற்போது இவர்களுக்கு செலுத்தப்பட்டுள்ள நிலுவைத் தொகை அந்தந்த மாவட்டங்கள் மற்றும் கல்வி வலய ரீதியாக எவ்வளவென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he inform this House-

(i) whether a programme to provide meals to school children is implemented by the Ministry of Education;

(ii) separately, of the number of schools in which this programme is implemented and their names at the District and Education Zone level;

(iii) of the names of the local or foreign organizations that provide funds for this programme;

(iv) of the amount of money allocated for each student per day and the type of the meal provided under this programme; and

(v) of the manner in which the programme is implemented at school level?

(b) Will he admit that-

(i) the payments due to the suppliers of the meals have not been made properly in many Education zones in which meals are provided under the aforesaid programme; and

(ii) an injustice has been caused to the suppliers of meals due to the non-payment of the monies that are due to them and as a result, the programme for providing meals to school children has been hampered?

(c) Will he state-

(i) The month for which these suppliers of meals have been paid last; and

(ii) separately, the amount of money that has been paid to them as arrears by now, at District and Education zone level?

(c) If not, why?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා (අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**

[மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா - கல்வி பிரதி அமைச்சர்)

(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa - Deputy Minister of Education)

ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ඔව්.

(ii) ඇමුණුම 1හි දක්වා ඇත.

(iii) රජයේ අරමුදල් හා ලෝක ආහාර වැඩසටහනේ අධාර.

(iv) දිනකට එක් සිසුවෙකුට වෙන් කරනු ලබන මුදල රු. 20කි. ආහාර වට්ටෝරු ඇමුණුම 2හි දක්වා ඇත.

(v) ආහාර ලබා දීමේ වගකීම පාසල් සංවර්ධන සමිතිය හා සෞඛ්‍ය ප්‍රවර්ධන කමිටුවට පැවරේ. මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ හා කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශය මත ආහාර ලබා දීම සඳහා දෙමාපියන් හා සමෘද්ධිලාභීන් තෝරා ගනු ලබන අතර වරින්වර ආහාර සැපයීම පිළිබඳ සෞඛ්‍ය වාර්තා ලබා ගැනේ.

ආහාර ලබා දීම උදේ වරුව තුළ සිදු වන අතර ආහාරපාන දීමට පෙර ගුරුවරුන් විසින් එහි ගුණාත්මක බව පරීක්ෂා කෙරේ.

වර්ෂය මුලදී පාසල් සඳහා අත්තිකාරම් මුදල් ලබා දෙන අතර මාසිකව මුදල් පියවීම සිදු කෙරේ. සිසුන්ගේ පෝෂණ මට්ටම දෛනික පැමිණීම හා ක්‍රියාශීලී සහභාගීත්වය පිළිබඳව නියාමනය වේ.

(ආ) (i) කලාප කිහිපයක අවසන් මාසයේ මුදල් ගෙවීම සම්බන්ධයෙන් හිඟයක් පවතී. එහෙත් එම මුදල් 2011 වර්ෂයේදී ගෙවීම් සිදු කිරීමට කටයුතු කෙරේ. ඇමුණුම 3 බලන්න.

(ii) සෑම විටම නියමිත වේලාවට මුදල් ගෙවීමට උත්සාහ කරන අතර එම නිසා වැඩසටහනට බාධා නොවන ආකාරයෙන් පවත්වා ගෙන යාමට මෙතෙක් හැකියාව ලැබී තිබේ. එයට හේතුව වර්ෂය මුලදී සෑම පාසලකටම රු. 20,000ක අත්තිකාරමක් ලබා දෙන බැවින් පසු ගිය මාසයේ මුදල් ලැබෙන තුරු එම මුදල් භාවිතයට ගැනේ.

(ඇ) (i) 2010 දෙසැම්බර් මස.

(ii) නැඟෙනහිර පළාතට රුපියල් මිලියන 10ක් හිඟ මුදල් ගෙවීම වෙනුවෙන් මේ වන විටත් යවා ඇත. ඉතිරි මුදල් නොපමාව යැවීමට කටයුතු කෙරේ. හිඟ මුදල් පිළිබඳ ඇමුණුම 3හි දක්වා ඇත.

(ඈ) අදාළ නොවේ.

***සභාමේසය මත තබන ලද ඇමුණුම්:**

*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்புக்கள் :*

*Annexs tabled:*

*ඇමුණුම*

***2010 වර්ෂයේ තොරතුරු***

| පළාත | දිස්ත්‍රික්කය | අධ්‍යාපන කලාපය | පාසල් සංඛ්‍යාව | ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|---|---|
| බස්නාහිර | කොළඹ | කොළඹ | 41 | 7046 |
| | | හෝමාගම | 72 | 12226 |
| | | පිළියන්දල | 56 | 8241 |
| | | ශ්‍රීජයවර්ධනපුර | 46 | 8797 |
| | ගම්පහ | ගම්පහ | 84 | 12120 |
| | | මිනුවන්ගොඩ | 117 | 14834 |
| | | කැලණිය | 50 | 9468 |
| | | මීගමුව | 54 | 8478 |
| | කළුතර | කළුතර | 92 | 12976 |
| | | මතුගම | 102 | 10269 |
| | | හොරණ | 90 | 10419 |
| | එකතුව | | 804 | 114874 |
| දකුණ | ගාල්ල | ගාල්ල | 70 | 6204 |
| | | උඩුගම | 58 | 6811 |
| | | අම්බලන්ගොඩ | 51 | 4856 |
| | | ඇල්පිටිය | 80 | 7079 |
| | මාතර | මාතර | 73 | 6938 |
| | | මොරවක | 70 | 11737 |
| | | මුලටියන | 84 | 11012 |
| | | අකුරැස්ස | 65 | 9255 |
| | හම්බන්තොට | වලස්මුල්ල | 81 | 13850 |
| | | තංගල්ල | 91 | 15593 |
| | | හම්බන්තොට | 114 | 25556 |
| | එකතුව | | 837 | 118891 |
| මධ්‍යම | මාතලේ | නාඋල | 41 | 3269 |
| | | මාතලේ | 93 | 9645 |
| | | විල්ගමුව | 45 | 3569 |
| | | ගලේවෙල | 75 | 6947 |
| | මහනුවර | දෙනුවර | 59 | 5776 |
| | | වත්තේගම | 47 | 4802 |
| | | තෙල්දෙණිය | 100 | 7616 |
| | | ගම්පොළ | 112 | 10728 |
| | | කටුගස්තොට | 71 | 4829 |
| | | මහනුවර | 62 | 5436 |
| | කොත්මලේ | කොත්මලේ | 54 | 5271 |
| | | නුවරඑළිය | 85 | 8611 |
| | | හැටන් | 110 | 12194 |
| | | වලපනේ | 61 | 5042 |
| | | හඟුරන්කෙත | 63 | 9152 |
| | එකතුව | | 1078 | 102887 |
| වයඹ | කුරුණෑගල | කුරුණෑගල | 72 | 4192 |
| | | කුලියාපිටිය | 119 | 10645 |
| | | නිකවැරටිය | 129 | 10104 |
| | | මහව | 154 | 14692 |
| | | ගිරිඋල්ල | 102 | 8653 |
| | | ඉබ්බාගමුව | 125 | 9000 |
| | පුත්තලම | පුත්තලම | 107 | 32047 |
| | | හලාවත | 89 | 10644 |
| | එකතුව | | 897 | 100017 |
| සබරගමුව | රත්නපුර | රත්නපුර | 132 | 12739 |
| | | බලංගොඩ | 100 | 9172 |
| | | නිවිතිගල | 138 | 11919 |
| | | ඇඹිලිපිටිය | 86 | 8454 |
| | කෑගල්ල | කෑගල්ල | 124 | 8819 |
| | | මාවනැල්ල | 104 | 11990 |
| | | දෙහිඹවිට | 179 | 12773 |
| | එකතුව | | 863 | 75866 |
| ඌව | බදුල්ල | බදුල්ල | 153 | 15461 |
| | | බණ්ඩාරවෙල | 120 | 11043 |
| | | මහියංගනය | 73 | 11248 |
| | | වැලිමඩ | 73 | 7063 |
| | | පස්සර | 84 | 8581 |
| | මොනරාගල | වැල්ලවාය | 86 | 17319 |
| | | බිබිල | 75 | 10554 |
| | | මොනරාගල | 99 | 14721 |
| | | එකතුව | 763 | 95990 |
| උතුරුමැද | පොලොන්නරුව | පොලොන්නරුව | 47 | 10728 |
| | | දිඹුලාගල | 94 | 11998 |
| | | හිඟුරක්ගොඩ | 92 | 18724 |
| | අනුරාධපුර | අනුරාධපුර | 101 | 10830 |
| | | කැබිතිගොල්ලෑව | 119 | 17162 |
| | | ගලෙන්බිඳුනුවැව | 86 | 11873 |
| | | කැකිරාව | 93 | 7127 |
| | | තඹුත්තේගම | 61 | 9302 |
| | එකතුව | | 693 | 97744 |
| උතුර | යාපනය | යාපනය | 100 | 32395 |
| | | වලිකාමම් | 140 | 30094 |
| | | දූපත් | 53 | 8222 |
| | | තෙන්මාරච්චි | 56 | 10078 |
| | | වඩමාරච්චි | 67 | 14595 |
| | මුලතිව් | තුනුක්කායි | 42 | 4714 |
| | | මුලතිව් | 04 | 2618 |
| | මන්නාරම | මන්නාරම | 69 | 10972 |
| | | මඩු | 20 | 3426 |
| | වවුනියා | වවුනියා දකුණ | 74 | 15864 |
| | | වවුනියා උතුර | 54 | 6216 |
| | එකතුව | | 651 | 143518 |

[ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා]

| | | | | |
|---|---|---|---|---|
| නැගෙනහිර | මඩකලපුව | පදිරිප්පු | 81 | 12928 |
| | | මඩකලපුව | 90 | 17755 |
| | | මඩකලපුව මධ්‍යම | 59 | 13615 |
| | | කල්කුඩා | 78 | 21512 |
| | අම්පාර | අම්පාර | 91 | 13066 |
| | | කල්මුනේ | 54 | 13328 |
| | | සමන්තුරේ | 68 | 12286 |
| | | මහඔය | 34 | 5064 |
| | | දෙහිඅත්තකණ්ඩිය | 46 | 5488 |
| | | අක්කරෙයිපත්තු | 59 | 15013 |
| | ත්‍රිකුණාමලය | කන්තලේ | 36 | 6807 |
| | | ත්‍රිකුණාමලය | 83 | 18542 |
| | | මූතූර් | 75 | 15466 |
| | | තිරුක්කොවිල් | 37 | 8531 |
| | | කින්නියා | 55 | 16011 |
| | එකතුව | | 949 | 195329 |

ඇමුණුම 2

පාසල් සිසුන් සඳහා ආහාර වැඩසටහන -2011 - ආහාර වට්ටෝරු

| | පළමුවන සතිය/තුන්වන සතිය | ප්‍රාථමික | ද්විතික |
|---|---|---|---|
| 1 වන දිනය | මුං ඇට /කඩල/ කව්පි (තෙම්පරාදුකර) පොල් සමඟ<br>කඩල/ග්‍රෑම්<br>පොල් ග්‍රෑම්<br>තෙල් ග්‍රෑම්<br>ප්‍රදේශයෙන් සොයාගත් දේශීය පළතුරක් | ග්‍රෑම්75(කෝප්ප1/2)<br>ග්‍රෑම්15(මේස හැඳි2)<br>ග්‍රෑම්03(තේ හැඳි1/2) | කෝප්ප 1<br>මේස හැඳි 3<br>මේස හැඳි 1 |
| 2 වන දිනය | එළවළු බත් (කැරට්.බෝංචි.ලීක්ස්) බිත්තර කිරි හොදි සමඟ<br>හාල් (සම්බා)ග්‍රෑම්<br>එළවළු ග්‍රෑම්<br>බිත්තර<br>(කැරට් බෝංචි ග්‍රෑම් ලීක්ස් )<br>ප්‍රදේශයෙන් සොයා ගත් දේශීය පළතුරක් | ග්‍රෑම්75(කෝප්ප1)<br>ග්‍රෑම්10(මේස හැඳි2)<br>1/2 | කෝප්ප 1<br>මේස හැඳි 4<br>1/2 |
| 3 වන දිනය | බත් කරවල / හාල්මැස්සන් තෙම්පරාදුව සමඟ කොළ මැල්ලුම. කිරි හොදි<br>හාල් (කැකුළු<br>කරවල/ කුඩා හාල් මැස්සන්<br>ලොකු හාල්මැස්සන්<br>කතුරුමුරුංගා/මුකුණුවැන්න/ගොටුකොළ<br>පොල් (කිරි හොදි සඳහා )<br>ප්‍රදේශයෙන් සොයාගත් දේශීය පළතුරක් | ග්‍රෑම්75(කෝප්ප11/4)<br>ග්‍රෑම්10(මේස හැඳි1)<br>ග්‍රෑම්06(මේස හැඳි 2)<br>ග්‍රෑම්20(මේස හැඳි2)<br>ග්‍රෑම්25(මේස හැඳි 2) | කෝප්ප 2 1/2<br>මේස හැඳි 2<br>මේස හැඳි 2<br>මේස හැඳි 4<br>මේස හැඳි 4 |
| 4 වන දිනය | බත් .බිත්තර කිරි හොදි සහ සලාද<br>හාල් (කැකුළු)<br>බිත්තර<br>සලාද<br>(කැරට් .බීට් .පිපිඤ්ඤා)<br>ප්‍රදේශයෙන් සොයාගත් දේශීය පළතුරක් | ග්‍රෑම්75(කෝප්ප1)<br>1/2<br>ග්‍රෑම්30(මේස හැඳි2) | කෝප්ප 4<br>1/2<br>මේස හැඳි 4 |
| 5 වන දිනය | එළවළු මිශ්‍ර රොටි ළූණු සම්බෝල සමඟ<br>කුරක්කන් පිටි ග්‍රෑම් 20 .පාන්පිටි ග්‍රෑම් 10<br>එළවළු ග්‍රෑම් 20<br>තෙල් ග්‍රෑම් 03<br>ප්‍රදේශයෙන් සොයා ගත් දේශීය පළතුරක් | ග්‍රෑම්20( මේස හැඳි2)<br>ග්‍රෑම්3(තේ හැඳි1/2) | මේස හැඳි 4<br>තේ හැඳි 1 |

| දෙවන සතිය/ හතරවන සතිය | | | |
|---|---|---|---|
| 1 වන දිනය | කහ බත් අල බැදුම. පරිප්පු සමඟ<br>සම්බා බත්<br>පරිප්පු<br>අල ප්‍රදේශයෙන් සොයා ගත් දේශීය පළතුරක් | ග්‍රෑම්75(කෝප්ප11/4)<br>ග්‍රෑම්20(මේස හැඳි2)<br>ග්‍රෑම්20(මේස හැඳි 1) | කෝප්ප 21/2<br>මේස හැඳි 3<br>මේස හැඳි 2 |
| 2 වන දිනය | බත්. පරිප්පු. එළවළු සලාදයක්<br>හාල් (කැකුළු)<br>පරිප්පු<br>එළවළු<br>(කැරට් .බීට් පිපිඤ්ඤ)<br>ප්‍රදේශයෙන් සොයා ගත් දේශීය පළතුරක් | ග්‍රෑම්75(කෝප්ප11/4)<br>ග්‍රෑම්20(මේස හැඳි2)<br>ග්‍රෑම්30(මේස හැඳි 1) | කෝප්ප 2<br>මේස හැඳි 3<br>මේස හැඳි 5 |
| 3 වන දිනය | නූඩ්ල්ස් (එළවළු මිශ්‍ර) බිත්තර කිරි හොදි සමඟ<br>හාල් පිටි නූඩ්ල්ස්<br>එළවළු<br>(කැරට් බෝංචි ලීක්ස්)<br>කරවල හෝ මාළු<br>ප්‍රදේශයෙන් සොයා ගත් දේශීය පළතුරක් | ග්‍රෑම්50(කෝප්ප1)<br>ග්‍රෑම්30(මේස හැඳි3)<br>කරවල කෑලි 2/මාළු කෑලි 1 | කෝප්ප 2<br>මේස හැඳි 5<br>කරවල කෑලි 3/ මාළු කෑලි 2 |
| 4 වන දිනය | තැම්බූ බතල/මයියොක්කා/කිරිඅල<br>පොල්<br>තෙල් දැමූ කරවල<br>හෝ<br>කිරිබත්/මුංඇට කිරිබත් සමඟ උම්බලකඩ සහිත ලූණු මිරිස්<br>කිරිබත් සඳහා<br>හාල්<br>පොල්<br>මුංඇට කිරිබත් සඳහා<br>මුංඇට<br>හාල්<br>පොල්<br>ප්‍රදේශයෙන් සොයාගත් දේශීය පළතුරක් | කෝප්ප 1<br>ග්‍රෑම් 10(මේස හැඳි2)<br>ග්‍රෑම්30( මේස හැඳි2)<br>ග්‍රෑම්75(කෝප්ප11/4)<br>ග්‍රෑම් 50(මේස හැඳි5)<br>ග්‍රෑම්25(කෝප්ප1/2)<br>ග්‍රෑම්50(කෝප්ප1)<br>ග්‍රෑම්50(මේස හැඳි5) | කෝප්ප 2<br>මේස හැඳි 4<br>මේස හැඳි 4<br>කෝප්ප 21/2<br>ග්‍රෑම් 75(මේස හැඳි7)<br>කෝප්ප1/2<br>කෝප්ප2<br>ග්‍රෑම්75(මේස හැඳි71/2) |
| 5 වන දිනය | හාල් පිටි ඉඳි ආප්ප.ලූණු සම්බෝල බිත්තර කිරි හොදි සමඟ හෝ<br>බත් සෝයා ව්‍යංජනය<br>පලා මැල්ලුම. කැරට්.සලාද සමඟ<br>හාල් (රතු කැකුළු) ග්‍රෑම් 75<br>සෝයා ග්‍රෑම් 10<br>පලා වර්ගයකින් ග්‍රෑම් 10<br>කැරට් ග්‍රෑම් 10<br>පොල් ග්‍රෑම් 25<br>ප්‍රදේශයෙන් සොයා ගත් දේශීය පළතුරක් | ග්‍රෑම්75(කෝප්ප11/4)<br>ග්‍රෑම් 10(මේස හැඳි1)<br>ග්‍රෑම්20(මේස හැඳි1)<br>ග්‍රෑම්10( මේස හැඳි1)<br>ග්‍රෑම්5 (මේස හැඳි2) | කෝප්ප 21/2<br>මේස හැඳි2<br>මේස හැඳි2<br>මේස හැඳි2<br>මේස හැඳි4 |

ආදේශ ආහාර වේල්-

1. උළුඳු මුං තෝසේ හෝ ඉටිලි පරිප්පු හා එළවළු මිශ්‍ර සම්බාරු සමඟ
2. බත්- හත්මාලුව සමඟ
3. උඳු/ තලප- මාළු හෝ කරවල ව්‍යංජන සමඟ
4. උපුමා- පරිප්පු හෝ සෝයා ව්‍යංජනය හෝ හතු ව්‍යංජනය සමඟ

ඇමුණුම 3

| පළාත | කලාපය | ගෙවීම් සිදු කිරීමට ඇති මාසය | හිඟ මුදල/මිලියන |
|---|---|---|---|
| මධ්‍යම | හැටන් | නොවැම්බර් | 5.8 |
| බස්නාහිර | කොළඹ | නොවැම්බර් | 6.4 |
| | ගම්පහ | නොවැම්බර් | 0.25 |
| | හෝමාගම | ඔක්තෝබර්/නොවැම්බර් | 7.5 |
| දකුණ | හම්බන්තොට | ඔක්තෝබර්/නොවැම්බර් | 12 |
| | තංගල්ල | ඔක්තෝබර්/නොවැම්බර් | 8.2 |
| | වලස්මුල්ල | නොවැම්බර් | 5.3 |
| | මොරවක | ඔක්තෝබර්/නොවැම්බර් | 7.5 |
| නැගෙනහිර | ත්‍රිකුණාමලය | නොවැම්බර් | 3 |
| | කන්තලේ | නොවැම්බර් | 1.4 |
| | මඩකලපුව | නොවැම්බර් | 4.0 |
| | මඩකලපුව-මධ්‍යම | නොවැම්බර් | 5.5 |
| | කල්කුඩා | නොවැම්බර් | 2.4 |
| | පද්රිප්පු | නොවැම්බර් | 1.0 |
| | කල්මුණේ | නොවැම්බර් | 2.4 |
| | සමන්තුරේ | නොවැම්බර් | 4.0 |
| | අක්කරෙයිපත්තු | නොවැම්බර් | 2.3 |
| | තිරුක්කෝවිල් | නොවැම්බර් | 0.6 |
| | අම්පාර | නොවැම්බර් | 5.0 |
| | දෙහිඅත්තකණ්ඩිය | නොවැම්බර් | 2.4 |
| | මහඔය | නොවැම්බර් | 0.6 |
| එකතුව | | | 77.55 |

2010 දෙසැම්බර්මාසය වන විට වියදම් විස්තර පහත දැක්වේ.

පාසල් සිසුන්ට දිවා ආහාර ලබාදීම වැඩසටහනේ සාරාංශ වාර්තාව-2010

| පළාත | පාසල් ගණන | ශිෂ්‍ය සංඛ්‍යාව | වියදම | හිඟ මුදල් ප්‍රමාණය |
|---|---|---|---|---|
| දකුණ | 837 | 118891 | 385,979,951.45 | 23 |
| බස්නාහිර | 804 | 114874 | 379,940,308..32 | 14.15 |
| ඌව | 763 | 95990 | 311,747,962.79 | |
| මධ්‍යම | 1078 | 102887 | 336,364,978.74 | 5.8 |
| සබරගමුව | 863 | 75866 | 245,480,387.25 | |
| උතුරුමැද | 693 | 97744 | 249,252,384.54 | |
| වයඹ | 897 | 100017 | 327,545,514.26 | |
| උතුර | 721 | 150718 | 49,504,373.59 | |
| නැගෙනහිර | 949 | 195329 | 265,672,055.78 | 34.6 |
| එකතුව | 7605 | 1052316 | 2,551,487,916.72 | 77.55 |

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, (ඇ)(i) හි සඳහන් "ඉහත ආහාර සැපයුම්කරුවන්ට අවසාන වරට මුදල් ගෙවා ඇති මාසය කවරේද?" යන්නට පිළිතුර කුමක්ද?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

පොඩ්ඩක් ඉන්න. (ඇ) (i) 2010 දෙසැම්බර් මාසය.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

ඒ වාගේම (ඇ) (ii) ට ලබා දුන් පිළිතුරේ ඇමුණුම අනුව ගෙවන්න තිබෙන සම්පූර්ණ හිඟ මුදල කියන්න පුළුවන්ද? ඒ සම්පූර්ණ ලේඛනය නොවෙයි ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඇමුණුමේ තිබෙන එකතුව විතරක් කියන්න.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
[மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா]
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

ඔබතුමා ඉල්ලන්නේ කොයි කලාපයේද?

**ගරු අජිත් කුමාර මහතා**
[மாண்புமிகு அஜித் குமார]
(The Hon. Ajith Kumara)

සමස්ත රටේම.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
[மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா]
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

රුපියල් මිලියන 77.55යි.

**ගරු අජිත් කුමාර මහතා**
[மாண்புமிகு அஜித் குமார]
(The Hon. Ajith Kumara)

බොහොම ස්තුතියි. ගරු කථානායකතුමනි, මට අතුරු ප්‍රශ්න කිහිපයක් ගරු ඇමතිතුමාගෙන් අසන්නට තිබෙනවා. පළමුවැනි අතුරු ප්‍රශ්නය හැටියට මං අහන්න කැමැතියි, මේ සඳහා අය වැයෙන් මුදල් වෙන් කර තිබෙනවාද, එහෙම මුදල් වෙන් කර තිබේ නම් රුපියල් මිලියන 77.55ක් වාගේ මුදලක් ගිය අවුරුද්දේ දෙසැම්බර් මාසයේ ඉඳලා මේ වන තෙක් ගෙවන්න බැරි වෙලා තිබෙන්නේ අමාත්‍යාංශයේ හෝ පරිපාලනමය වශයෙන් තිබෙන දුර්වලතාවක් නිසාද කියා. එමෙන්ම අඩු ආදායම්ලාභී අය - සමෘද්ධිලාභීන්- මේ ව්‍යාපෘතිය කරන නිසා ඔවුන්ට සිදු වන අසාධාරණය වෙනුවෙන් ගන්නා ක්‍රියාමාර්ගය මොකක්ද කියලාත් මා දැන ගන්න කැමැතියි.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
[மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா]
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

ගරු කථානායකතුමනි, අපි මේ මුදල් යවමින් පවතින්නේ භාණ්ඩාගාරයෙන් ලැබෙන ආකාරයටයි. ඒ අනුව අපි ඒ ඒ පළාත් සභාවලට මුදල් යවනවා. සමහර විට ඒ මුදල් යැවීමේ දී යම් යම් ප්‍රමාදයන් සිදු වෙලා ඇති. ගරු මන්ත්‍රීතුමනි, මට ඒ සම්බන්ධයෙන් සොයා බලන්න පුළුවන්.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

බොහොම ස්තුතියි. ගරු කථානායකතුමනි, 2010 ඉඳලා තවම මුදල් හිඟයක් තිබෙනවා.

මගේ දෙවන අතුරු ප්‍රශ්නය මේකයි. මහින්ද චින්තනය යටතේ ගැබිණි මවුවරුන්ට පෝෂණ මල්ලකුත්, වසර පහ දක්වා දරුවන්ට කිරි මිලදී ගැනීම සඳහා මසකට රුපියල් 200කුත්, දිවා ආහාරය සඳහා සිසුන්ට බත් වේලකුත් දෙන්න යෝජනා කළා. ඒ වාගේම

[ගරු අජිත් කුමාර මහතා]

අවුරුදු 3ට අඩු දරුවන්ට රුපියල් 1,500ක අතිරේක සහනාධාරයකුත් දෙන්න මේ රජය යෝජනා කළා. අනිකුත් යෝජනා කෙසේ වුවත් දරුවන්ගේ දිවා ආහාරයට බත් වේලක් හෝ ආහාර වේලක් දෙනවාය කියන එක මහින්ද චින්තනයේ තිබුණු පොරොන්දුවක්. මා ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි, අඩුම තරමේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන්නේ තෝරා ගත් පාසල්වලට පමණක් නේද, සමස්ත ශිෂ්‍යයන්ට මෙය ක්‍රියාත්මක වන්නේ නැහැ නේද කියලා. ඒ පොරොන්දුව ඉෂ්ට වෙලා නැහැ නේද?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
[மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
නැහැ. ඉෂ්ට වෙලා තිබෙනවා, ගරු කථානායකතුමනි. මහින්ද චින්තනයෙන් ඉදිරිපත් කරන ලද පොරොන්දු රජය ඉටු කරලා තිබෙනවා. අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන්ගේ මන්ද පෝෂණ තත්ත්වයන් අනුව සහ දරුවන්ගේ සෞඛ්‍ය සායනවලදී ලැබෙන වාර්තා අනුව අදාළ පාසල්වලට දිවා ආහාර වේල සපයනවා, ගරු කථානායකතුමනි.

**ගරු අජිත් කුමාර මහතා**
[மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
ළමයි ගෙදරින් කාලා එන්නේ, ගරු කථානායකතුමනි.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
[மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
සමහර ළමයි ගෙදරිනුත් කාලා එනවා. ඕනෑ නම් මෙහෙනුත් කෑම දෙන්න පුළුවන්.

**ගරු අජිත් කුමාර මහතා**
[மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
මොනරාගල දිස්ත්‍රික්කයේ පාසල් කීයකට දිවා ආහාර දෙනවාද?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
[மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ඒකට ඔබතුමා වෙනම ප්‍රශ්නයක් අහන්න. එතකොට මා උත්තරය දෙන්නම්.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
මගේ තුන්වන අතුරු ප්‍රශ්නය මේකයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේ පිළිබඳව 2010 ඔක්තෝබර් මස 05වන දින පාර්ලිමේන්තුවේ කල් තැබීමේ අවස්ථාවේදී යෝජනාවක් මා විසින් ඉදිරිපත් කරනු ලැබුවා. ගරු ඇමතිතුමා ඒ පිළිබඳව උත්තර දුන්නා. එහිදීත් මා මතු කළා, සියලු ළමයින්ට ආහාර වේලක් දෙනවාය කියා පොරොන්දු වුණු රජය එයිනුත් තෝරා ගත් කොටසක් සඳහා ඔබතුමාගේ ඇමුණුමේ සඳහන් කර තිබෙන පරිදි එක් සිසුවකුට දෙන ආහාර වේලට රජය ගෙවන්නේ රුපියල් 20යි කියලා. නමුත් ගරු කථානායකතුමනි, මීට කලින් අධ්‍යාපන ඇමතිතුමා සභාගත කළ ඇමුණුමේ තිබෙනවා, පළමුවන සතියට මුං ඇට/කඩල/කවුපි පොල් සමඟ කඩල ග්‍රෑම් 75ක් සහ පලතුරක් දෙනවා කියලා. ඊට පස්සේ දෙවන දිනයේ එළවලු බත් (කැරට්, බෝංචි, ලීක්ස් සහිතව) දෙනවා. ගරු කථානායකතුමනි, මේ පිළිබඳව විස්තර කරන්න වෙලාව මදියි. මෙය විශාල ආහාර වේලක්. නමුත් මේ විශාල ආහාර වේලට වෙන් කරන්නේ රුපියල් 20ක මුදලක්. ඒ ආහාර වේල මේ මුදලෙන් දෙන්න පුළුවන්ද? ඒ නිසා බොරුවක් නේද වෙන්නේ? ඔබතුමන්ලා ඒ මුදල වැඩි කරන්න කටයුතු කරනවාද?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
[மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු කථානායකතුමනි, අර කථාවක් තිබෙනවා "හිත ඇත්නම් පත කුඩාද" කියලා.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
කොහොමද රුපියල් 20න් දෙන්නේ?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
[மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
මේක දෙමවුපියන් සහ සමෘද්ධි සහනාධාරලාභීන් එකතු වෙලා තමන්ගේ ගමේ පාසලේ, තමන්ගේ දරුවන්ට යම් කිසි ආහාර වේලක් ලබා දීමට පෙරහුරුවක් ඇති කිරීම සඳහා සහ දරුවන්ගේ පෝෂණ මට්ටම ඉහළ දැමීම සඳහා රජය විසින් දෙන්නා වූ දිරි දීමනාවක්.තමුන්නාන්සේලා කල්පනා කරනවා නම් අංගසම්පූර්ණ, මහ විශාල ආහාර වේලක් දරුවෙක් ගන්නවා කියලා-

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
නැහැ. මම නොවෙයි කියන්නේ. [බාධා කිරීමක්]

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
[மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගෙදර පුංචි ඇයෝ නැද්ද? ගෙදර පුංචි ඇයෝ කන්නේ බොහොම ටිකයි. දෙන්න පුළුවන් ඒ ආහාර වේල.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
බොහොම ස්තුතියි.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු කථානායකතුමනි, මේ වැඩ පිළිවෙළ සාර්ථකයි.

## උතුරු-නැඟෙනහිර සංවර්ධන කටයුතු: යන්ත්‍රෝපකරණ
## வடக்கு, கிழக்கு அபிவிருத்திப் பணிகள்: இயந்திர உபகரணங்கள்
## DEVELOPMENT ACTIVITIES IN NORTH AND EAST: MACHINERY

0962/'10

3. **ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) යුද්ධයෙන් පසු උතුරු නැඟෙනහිර සංවර්ධන කටයුතු සඳහා යන්ත්‍රෝපකරණ ලබා දුන් රටවල් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම එක් එක් රට ලබා දුන් යන්ත්‍රෝපකරණවල නම් සහ ඒවායේ වටිනාකම එම රටවල් අනුව, වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම එක් එක් යන්ත්‍රය ලබා දී ඇත්තේ ප්‍රදානයක් ලෙසද, ආධාරයක් ලෙසද; නැතහොත් මිල දී ගැනීමක් ලෙසද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත යන්ත්‍රෝපකරණ ලබා දී ඇති ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ කවරේද;

(ii) එම එක් එක් බල ප්‍රදේශය සඳහා ලබා දී ඇති යන්ත්‍රෝපකරණ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) யுத்தத்துக்குப் பின்னர் வடக்கு, கிழக்கு அபிவிருத்திப் பணிகளுக்காக இயந்திர உபகரணங்களை வழங்கிய நாடுகள் யாவையென்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) மேற்படி ஒவ்வொரு நாடும் வழங்கிய இயந்திர உபகரணங்களின் பெயர்களும் அவற்றின் பெறுமதி யும் அந்தந்த நாடுகளுக்கமைய வெவ்வேறாக யாவையென்பதையும்;

(ii) மேற்படி ஒவ்வொரு இயந்திரமும் கிடைக்கப் பெற்றுள்ளது அன்பளிப்பாகவா, உதவியாகவா அல்லது கொள்வனவாகவா என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) (i) மேற்படி இயந்திர உபரகணங்கள் விநியோகிக்கப் பட்டுள்ள பிரதேச செயலாளர் ஆளுகைப் பிரதேசங்கள் யாவையென்பதையும்;

(ii) மேற்படி ஒவ்வொரு ஆளுகைப் பிரதேசத்துக்கும் விநியோகிக்கப்பட்டுள்ள இயந்திர உபகரணங்கள் யாவையென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Economic Development:

(a) Will he state the names of the countries that provided machinery for the development activities in the North and the East in the aftermath of the war?

(b) Will he state-

(i) separately, the types of machinery provided by each country and the monetary value of each piece of machinery ; and

(ii) whether each of those pieces of machinery has been provided in the form of a donation, aid or a purchase?

(c) Will he state-

(i) the names of the Divisional Secretaries' Divisions that have been provided with the aforesaid machinery ; and

(ii) the types of machinery that have been provided for each division?

(d) If not, why?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)

(The Hon. Lakshman Yapa Abeywardena - Deputy Minister of Economic Development)

ගරු කථානායකතුමනි, ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

ගරු කථානායකතුමනි, මම මුලින්ම මේ කාරණය කියන්න කැමැතියි. ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයේ සඳහන් වෙන්නේ උතුරු නැඟෙනහිර පළාත කියලා. උතුරු නැඟෙනහිර ලෙස පළාතක් නැහැ. උතුරු-නැඟෙනහිර කියන්නේ පළාත් දෙකක්. ඒ නිසා මම එය උතුරු පළාත සහ නැඟෙනහිර පළාත ලෙස නිවැරදි කරනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**

(மாண்புமிகு தயாசிறி ஜயசேகர)

(The Hon. Dayasiri Jayasekara)

වෙන් කරලා නේ තිබෙන්නේ. නේද?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**

(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)

(The Hon. Lakshman Yapa Abeywardena)

(අ) චීනය, ඉන්දියාව, ඕස්ට්‍රේලියාව, එක්සත් ජාතීන්ගේ සරණාගතයින් සඳහා වන මහ කොමසාරිස් කාර්යාලය

(ආ) (i) හා (ii)

| රට | යන්ත්‍ර වර්ගය | ප්‍රමාණය | වටිනාකම | ප්‍රදානයක්ද ආධාරයක් යන වග |
|---|---|---|---|---|
| චීනය | මෝටර් ග්‍රේඩර් (Motor Grader) | 07 | රුපියල් මිලියන 68.5 | ප්‍රදානයකි. |
| | වයිබ්‍රේටර් රෝලර් (Vibrator Roller) | 02 | රුපියල් මිලියන 12.5 | ප්‍රදානයකි. |
| | ක්‍රෑලර් බුල්ඩෝසර් (Crawler) | 10 | රුපියල් මිලියන 152.7 | ප්‍රදානයකි. |
| | වීල් ලෝඩර් (Wheel Loader) | 05 | රුපියල් මිලියන 21.8 | ප්‍රදානයකි. |
| | බැකෝ ලෝඩර් (Backhoe Loader) | 10 | රුපියල් මිලියන 56.1 | ප්‍රදානයකි. |
| ඉන්දියාව | ට්‍රැක්ටර් (Tractor) | 500 | රුපියල් මිලියන 431.4 | ප්‍රදානයකි. |
| | ටිලර්ස් (Tillers) | 500 | රුපියල් මිලියන 23.7 | ප්‍රදානයකි. |
| | රෝටවේටර්ස් (Rotavators) | 500 | රුපියල් මිලියන 99.5 | ප්‍රදානයකි. |
| | කේජ් විල්ස් (Cage Wheels) | 1000 | රුපියල් මිලියන 14.0 | ප්‍රදානයකි. |

[ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා]

| රට | යන්ත්‍ර වර්ගය | ප්‍රමාණය | වටිනාකම | ප්‍රදානයක්ද ආධාරයක් යන වග |
|---|---|---|---|---|
| | ඩිස්ක් ප්ලග් (Disk Plough) | 500 | රුපියල් මිලියන 31.3 | ප්‍රදානයකි. |
| එක්සත් ජාතීන්ගේ සරණාගතයින් සඳහා වන මහ කොමසාරිස් කාර්යාලය | MV 4 Flails | 05 | රුපියල් මිලියන 215 | ප්‍රදානයකි. |

(ඈ) (i) හා (ii)

සංවර්ධන අවශ්‍යතා හඳුනා ගෙන ඉහත සඳහන් යන්ත්‍රෝපකරණ අදාළ අංශ වෙත ලබා දීමට උතුරු හා නැඟෙනහිර පළාත්වල ආණ්ඩුකාරවරුන් වෙත ලබා දී ඇත.

(ඇ) පැන නොනඟී.

මේ අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල වශයෙන් වෙන් කිරීමේ අවශ්‍යතාවක් නැහැ. කෘෂිකර්මයට අවශ්‍ය ට්‍රැක්ටර් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිර්දේශයක් ලබා ගෙන, ට්‍රැක්ටර් අවශ්‍ය ස්ථාන මොනවාද කියලා හඳුනා ගෙන තමයි අපි ලබා දීලා තිබෙන්නේ. අනික් ඒවා ආණ්ඩුකාරවරයා තීන්දු කරන ආකාරයට ඒ ඒ ප්‍රදේශවලට ලබා දීලා තිබෙනවා. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් වව්නියාවට ට්‍රැක්ටර් 35ක්, යාපනයට ට්‍රැක්ටර් 100ක් හා කිලිනොච්චියට ට්‍රැක්ටර් 50ක් වශයෙන් 500ක් ලබා දීලා තිබෙනවා. ඒ විධියට තමයි ඒවා බෙදලා තිබෙන්නේ. අනිකුත් උපකරණ ආණ්ඩුකාරවරයා අපට නිර්දේශ කළ ආකාරයට බෙදා දීලා තිබෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ට්‍රැක්ටර් 500න් ඔබතුමා දීලා තිබෙන්නේ-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒක අතුරු ප්‍රශ්නයක්ද?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අතුරු ප්‍රශ්න තමයි, ගරු කථානායකතුමනි. පිළිතුරට අනුව ට්‍රැක්ටර් 185ක් තමයි බෙදා දීලා තිබෙන්නේ. ඉතිරි ට්‍රැක්ටර් 300ට මොකක්ද වුණේ කියලා අපි අහනවා.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
නැහැ, වව්නියාවට ට්‍රැක්ටර් 35ක් නොවෙයි 350ක් දීලා තිබෙනවා. යාපනයට ට්‍රැක්ටර් 100ක් හා කිලිනොච්චියට 50ක් දීලා තිබෙනවා. එතකොට 500හරි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මට වුවමනා වෙලා තිබුණේ මේ වෙන් කරපු ඒවා කවුරු අතේද, කොයි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේද තිබෙන්නේ කියන එක සොයා ගන්නයි. ඒවා උතුරේ ආණ්ඩුකාරවරයා සතුව තිබිලා වැඩක් නැහැ නේ. ඒවා දැන් වෙන වෙන තැන්වල තිබෙනවා. ඒකයි මම මේ කියන්නේ. ඒ ගැන දැනුවත් වෙලායි මම මේ කියන්නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔබතුමා ප්‍රශ්නය අහන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
උතුරු නැගෙනහිර ප්‍රදේශයට බෙදුවා කිව්වත්, ඒ තැන කොහේද කියලා හරියට කිව්වා නම් හොඳයි, මෙන්න මේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට කියලා. මෙන්න මේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට-

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ගරු කථානායකතුමනි, මම ඉතාම පැහැදිලිව කිව්වා. මෙතුමා ප්‍රශ්නය අහලා තිබෙන්නේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට දීපු ඒවා සම්බන්ධව. අපි දුන්නේ එහෙම නොවෙයි ගරු කථානායකතුමනි. කෘෂිකර්මය සඳහා අවශ්‍ය ඒවා කෘෂිකර්ම අධ්‍යක්ෂගේ නිර්දේශය ඇතිව,ආණ්ඩුකාරවරයා මඟින්, වව්නියාව ප්‍රදේශයේ කෘෂිකාර්මික කටයුතු සඳහා ඒ ඒ මධ්‍යස්ථානවලටත්, යාපනයේ ඒ ඒ මධ්‍යස්ථානවලටත්, කිලිනොච්චියේ ඒ ඒ මධ්‍යස්ථානවලටත් දැනට ලබා දීලා තිබෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
කෘෂිකර්මයට දීපු ඒවා නොවෙයි මම කිව්වේ. ට්‍රැක්ටර් පැත්තකින් තියමු. අනික් බැකෝ ලෝඩර්ස්, වයිබ්‍රේටර්ස්, අරවා මේවා කොහේද තිබෙන්නේ?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ඒවා පිළිබඳව තමුන්නාන්සේ මගෙන් වෙන වෙනම අහනවා නම් පිළිතුරු ලබා දෙන්නම්. ඔබතුමා අහලා තිබෙන්නේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට දුන්නාද, නැද්ද කියලා. අපි ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට දීලා නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මේ ආපු යන්ත්‍රෝපකරණ අපි දැක්කා ගාලු මුවදොර පෙළ ගහලා -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒවා වැඩක් නැහැ. තමුන්නාන්සේගේ ප්‍රශ්නය අහන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නැහැ ඉතින් පිළිවෙළට එන්න එපා යැ ප්‍රශ්නයක් අහන්න.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒවා අවශ්‍ය නැහැ. ඒවා උපදේශක කාරක සභාවට ගිහිල්ලා අහන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ආණ්ඩුවත් නිකම් සැරසිලි නේ කරන්නේ. ඒක හන්දා මම පොඩ්ඩක් එහෙම අහන්නම්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එහෙම බැහැ. එහෙනම් මම ඊළඟ ප්‍රශ්නයට යනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අනේ එපා. මේ දෙවැනි අතුරු ප්‍රශ්නය. ඒවා ලස්සනට පෙළ ගහලා තිබුණා පාර දිගේ. ඊට පස්සේ එදා පුවත් පත්වල පළ වෙලා තිබුණු විස්තරේ තිබුණේ මේවා බැසිල් රාජපක්ෂ-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අතුරු ප්‍රශ්න තුන ඉවරයි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අනේ පොඩ්ඩක් ඉන්න ගරු කථානායකතුමනි. මේ අහන්න හදන්නේ. [බාධා කිරීමක්] ඒකයි මම ඇහුවේ. පොඩ්ඩක් ඉන්නකෝ.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ගරු කථානායකතුමනි, මෙතුමා අහයි එල්ටීටීඊ එක ගෙනිච්ච ඒවාත් කොහේද තිබෙන්නේ කියලා. ඉතින් අපට උත්තර දෙන්න-

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, ප්‍රශ්නය අහන්න කලින් හරියට ලස්සනට හදා ගන්න එපා යැ. ඒ පත්තරේ දමලා තිබුණේ බැසිල් රාජපක්ෂ මැතිතුමා එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලටත්, ප්‍රාදේශීය සභාවලටත් මේවා භාර දුන්නා කියන එකයි. මම ඒකයි ඇහුවේ. මේ ප්‍රශ්නය බොහොම පැහැදිලියි. මට කියන්න මේ බැකෝ ලෝඩර්ස්, වයිබ්‍රේටර්ස් දුන්නේ මොන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයටද, නැත්නම් මොන ප්‍රාදේශීය සභාවටද කියලා. එච්චරයි.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ගරු කථානායකතුමනි, මම ඉතාම පැහැදිලිව කිව්වා ආණ්ඩුකාරවරයාගේ නිර්දේශය මත ඒ ඒ ආයතනවලට මේවා දුන්නා කියලා. මෙතුමා කියන විධියට මෙන්න මේ ග්‍රේඩර් එක ගියේ කොයිබටද, මේ ලෝඩර් එක ගියේ කොයිබටද කියලා වෙනම ඇහුවා නම් අපට උත්තරයක් දෙන්න පුළුවන්. නමුත් මෙතුමාගේ ප්‍රශ්නයේ අහලා තිබෙන්නේ ඒවා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට දුන්නාද, නැද්ද කියලායි. එතැනට ඒවා දුන්නේ නැහැ, දුන්නු තැන් මම කිව්වා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
එහෙනම් ගරු කථානායකතුමනි, අවසාන වශයෙන් මම මේ ඉල්ලීම කරනවා. මේ සභාවේ තවත් ප්‍රශ්නයක් අහන්න ඕනෑ නැහැ. මටවත් බලා ගන්න මොන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට, මොනවාද දුන්නේ කියන ඒ විස්තර ටික කරුණාකරලා මේ ගරු සභාවට සභාගත කරන්න. එතකොට අපට බලාගන්න පුළුවන් නේ.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
මම ඔබතුමාට එවන්නම් ඒ විස්තරය.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නැත්නම් මේ උත්තරයට හොඳ නැති වෙනවා නේද ගරු කථානායකතුමනි?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔව්, ඔව්. කරුණාකරලා උපදේශක කාරක සභාවට ආරාධනා කරන්න එන්න කියලා.

ප්‍රශ්න අංක 5-1026/'10-(3), ගරු සජිත් ප්‍රේමදාස මහතා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன )
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි,-

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු ඇමතිතුමනි, මම කැමැතියි විෂය භාර ඇමතිතුමා හරි, නියෝජ්‍ය ඇමතිතුමා හරි උත්තර දෙනවා නම්.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
විෂය භාර ඇමතිතුමා අතිගරු ජනාධිපතිතුමා. ඔබතුමාට ඕනෑ නම් එතුමා එන දවස වනතුරු ඉන්න පුළුවන්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නියෝජ්‍ය ඇමතිතුමා?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, මගේ කිසි විරුද්ධත්වයක් නැහැ. නමුත් විපක්ෂය චෝදනා කරනවා ප්‍රශ්නවලට උත්තර දෙන්නේ නැහැ කියලා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නැහැ. මම චෝදනාවක් කළේ නැහැ. මම කිව්වේ විෂයභාර-

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
කථානායකතුමනි, ඔබතුමා කැමති නම් කල් දාන්න. මගේ එකඟතාවයත් තිබෙනවා කල් දාන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු ඇමතිතුමනි,-

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
I agree. There is no issue. On your request, let the Hon. Speaker get it re-listed.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
No, no, I never complained. I am merely requesting -

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
You are part of the UNP. You all have been accusing the Government that we are not answering the Questions. Just a few minutes ago the Hon. Dayasiri Jayasekara said, "උත්තර දෙන්නේ නැහැ" කියලා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නියෝජ්‍ය ඇමතිතුමාට උත්තර දෙන්න කියන්න කෝ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔබතුමාට කැමති කාලයක් ගන්න. [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. ගරු මන්ත්‍රීතුමාට ඕනෑ, ගරු ඇමතිතුමාගෙන් උත්තරය ලබා ගන්නද?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මම සාධාරණ ඉල්ලීමක් කරන්නේ. මොකද, මම අතුරු ප්‍රශ්න අහනකොට ඒ විෂය පිළිබඳ පූර්ණ දැනුමක් තිබෙන නියෝජ්‍ය අමාත්‍යවරයා හෝ මේකට උත්තර දෙන්නට ඕනෑය කියන එකයි මා කියන්නේ. මේක සාධාරණ ඉල්ලීමක්. [බාධා කිරීම්] එහෙම නම් ඔබතුමා උත්තර දෙන්න.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. පිළිතුර සභාගත කරන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, සභාගත කරන්නට එපා. [බාධා කිරීම්] ඒක හරි අසාධාරණයක් නේ. මේක හරි විහිළුවක් නේ. මම මේ සාධාරණ ඉල්ලීමක්නේ කරන්නේ. [බාධා කිරීමක්] ගරු කථානායකතුමනි, සම්ප්‍රදායයක් හැටියට-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු අමාත්‍යතුමා එනකන් හිටියොත් මාස තුනකට සැරයක් වෙයි. [බාධා කිරීමක්]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
වචන පටලවන්නට එපා. ගරු කථානායකතුමනි, මේ සභා ගර්භයේ ප්‍රශ්න මම හැම වේලාවේම අදාළ විෂය භාර ඇමතිවරයා හෝ නියෝජ්‍ය ඇමතිවරයාගෙන් තමයි අසා තිබෙන්නේ, ප්‍රතිපත්තියක් හැටියට. ඉතින් මම ඉල්ලීමක් කරනවා-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එහෙමනම් ඒක එතුමා ආව දවසකට අහන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
සතියක් කල් ඉල්ලනවා ද ? මොකක්ද? [බාධා කිරීම්] ගරු ඇමතිතුමනි, පොඩ්ඩක් කියන්න. You have to be reasonable. – [*Interruption.*] No. You can take one week's time and then reply.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
I do not want to take any week's time.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Okay then, you –

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
If you want the Deputy Minister to reply, you can get it listed for a week or two or three.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
සතියක් ඇතුළත උත්තර දෙන්න ආපසු මේ සභාවට.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. අපි ඒක එහෙමනම් සති දෙකකින් නියෝජ්‍ය ඇමතිතුමාට උත්තර දෙන්න තියමු.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 6 -1073/'11- (1), ගරු බුද්ධික පතිරණ මහතා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා. [බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා, අපටත් කථා කරන්න පුළුවන්. ඒ නිසා පරිස්සමෙන් කථා කරන්න.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 7 -1235/'11- (1), ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## රජයේ පාසල්: දිවා ආහාර වේල
## அரசாங்கப் பாடசாலைகள்: மதிய உணவு
## GOVERNMENT SCHOOLS: MID-DAY MEAL

1027/'10

8. **ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ශ්‍රී ලංකාවේ රජයේ පාසල්වලින් අධ්‍යාපනය ලබන සිසුන් සංඛ්‍යාව කොපමණද;

(ii) මෙම සිසු පරපුරට පාසල් පවත්වන සෑම දිනකම දිවා ආහාර වේලක් ලබා දීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්,ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் அரசாங்கப் பாடசாலைகளில் கல்வி பயிலும் மாணவர்களின் எண்ணிக்கை யாதென் பதையும்,

(ii) இம்மாணவர் சந்ததிக்கு பாடசாலை நடைபெறும் அனைத்து நாட்களிலும் மதிய உணவு வழங்கு வதற்கு நடவடிக்கை எடுப்பாரா என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he inform this House-

(i) of the total number of students who study at the Government Schools in Sri Lanka; and

(ii) whether steps will be taken to provide a mid-day meal to this student population on all the days on which schools are conducted ?

(b) If not, why ?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) 3,929,234.

(ii) ආහාර ලබා දෙන පාසල් සංඛ්‍යාව - 7,779

එම පාසල්වල ආහාර ලබා ගන්නා මුළු සිසුන් සංඛ්‍යාව - 1,088,890 පාසල් තෝරා ගැනීමේ නිර්ණායක

* දුෂ්කර ප්‍රදේශවල පිහිටි පාසල්.
* ආර්ථික අපහසුතාවලින් පෙළෙන පවුල්වල දරුවන්.
* සිසුන්ගෙන් සියයට 30කට වඩා මන්ද පෝෂණයෙන් පෙළෙන පවුල්වල දරුවන් ඇති පාසල්.
* දරිද්‍රතාවයෙන් පෙළෙන ගම්මානවල පාසල්.

[ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා]

සිසුන් තෝරා ගැනීමේ නිර්ණායක

* මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 100ට අඩු පාසල්වල සියලුම සිසුන් පසුගිය වර්ෂවල අනුමත කළ පාසලක් නම් මේ වර්ෂයේදී පාසලේ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 100ට වැඩි වුවද සියලුම සිසුන් සඳහා ආහාර ලබා දිය යුතුය.
* තෝරා ගත් පාසල්වල 1-5 ශ්‍රේණිවල සිසුන්.
* පාසල් තුළ උදේ වරුවේ පන්ති පැවැත්වෙන සාක්ෂරතා පන්තිවල සිසුන්.
* ක්‍රීඩා පාසල්හි ක්‍රීඩා ශිෂ්‍යත්වධාරින්.

(ආ) අදාළ නොවේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මට අතුරු ප්‍රශ්න තුනක් අහන්න තිබෙනවා. අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් නිසි පිළිතුරු මම බලාපොරොත්තු වනවා.

මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. 2005 ජනාධිපතිවරණයේදී "මහින්ද චින්තන-දිනවමු ශ්‍රී ලංකා" ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 18 වන පිටුවේ අනු අංක 5හි සඳහන් වෙලා තිබෙන්නේ මෙන්න මෙහෙමයි:

"දරුවන්ගේ දිවා ආහාරය සඳහා බත් වේලක් නොමිලේ ලබා දෙන්නෙමි"

එහි ලක්ෂ 39ක් වූ දරු පරපුරෙන් ලක්ෂ 10කට පමණක් ලබා දෙනවායි කියලා කිසිම සඳහනක් නැහැ. මම අහන්න කැමැතියි, ශ්‍රී ලංකාව පුරාවටම තිබෙන සියලුම පාසල්වල සියලුම දූ දරුවන්ට, භේදයකින් තොරව, ඒ පොරොන්දු වුණු දිවා ආහාර වේල වූ බත් වේල ලබා දෙන්නට කටයුතු කරන්නේ කවදාද කියලා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු කථානායකතුමනි, මහින්ද චින්තනය අනුව පොරොන්දු වූ විධියට මන්ද පෝෂණය සහිත සහ දුෂ්කර ප්‍රදේශවල පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ආහාර වේල ලබා දෙනවා. නමුත් සජිත් මන්ත්‍රීතුමා, ඔබතුමා අපි වාගේ අධි පෝෂණය තිබෙන අයට ඒ ආහාර වේල ලබා දෙන්නේ නැහැ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට ඇහුණේ නැහැ. මොකක්ද?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ඔබතුමන්ලා අපි වාගේ අධි පෝෂණ තත්ත්වයක් තිබෙන අයට ඒ ආහාර වේල දෙන්නේ නැහැ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඔබතුමා සඳහන් කරන්නේ තිස්නව ලක්ෂයක් වූ අපේ රටේ දරු පරපුරෙන් ලක්ෂ දහයක් හැරුණු කොට විසිනව ලක්ෂයක් අධි පෝෂණයෙන් ඉන්නවා කියලාද? ඒකද ඔබතුමා කියන්නේ?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ඔබතුමා ගැන කිව්වේ, අධි පෝෂණය කියලා. ශිෂ්‍යයන් ගැන නොවෙයි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය. දැන් අපේ රටේ ආශ්චර්යවත් සුවිශාල සංවර්ධනයක් ක්‍රියාත්මක වනවායි කියන එක ලොවටම ප්‍රකාශ කර තිබෙනවා. ගුවන් පාලමක් හදන කොට වර්ග අඩියකට වැය කරන මුදල පිළිබඳව ලෝක වාර්තාවකුත් හදලා තිබෙනවා.

මම අහන්න කැමැතියි, ඒ තරම් මුදල් කන්දරාවක් සංවර්ධනය වෙනුවෙන් වෙන් කරන කොට අපේ රටේ පාසල් යන සමස්ත දූ දරුවන්ට, සමස්ත දරු පරපුරට ඒ දිවා ආහාර වේල ලබා දෙන්නට මැළි වන්නේ ඇයි කියලා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ඔබතුමාගේ අප්පච්චිත් "ජනසවිය" ලබා දුන්නා නේ. "ජනසවිය" දුන්නේ කොහොමද? "ජනසවිය" දීපු විධිය බලන්න කෝ. ගරු කථානායකතුමනි, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 28කටයි ජනසවිය දුන්නේ. ඔන්න පෝෂ්‍යදායී ආහාර වේල දීපු හැටි! රජයට පුළුවන් ආකාරයට තමයි ඒ කටයුත්ත කරන්නේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒ කියන්නේ අප්පච්චිගේ ක්‍රමයටද "මහින්ද චින්තනය" ලිව්වේ? [බාධා කිරීමක්]

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
රජය කැමැතියි මේ සියලු දෙනාට දෙන්න. රජයට මුදල් තිබෙන ආකාරයට පියවරෙන් පියවර, පියවරෙන් පියවර මේක ඉදිරියට ගෙන යනවා ගරු කථානායකතුමනි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඊ ළඟ අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය. මම ඔබතුමාගෙන් පුන පුනාම අහන්න කැමැතියි, 2005ත්, 2011ත් යන කාල වකවානුව තුළ ප්‍රදර්ශනය වුණු කඩවුණු පොරොන්දු ජවනිකාවට විරාමයක් තබලා අඩුම තරමින් එළඹෙන අය වැයේදිවත් සමස්ත දරු පරපුරට දිවා ආහාර වේල ලබා දීම සඳහා ප්‍රතිපාදන වෙන් කරන්නට ඔබතුමන්ලාට හැකියාවක්, කැක්කුමක් තිබෙනවාද කියලා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු කථානායකතුමනි, නිර්ණායකයන් අනුව අදාළ ආකාරයට ඒ අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කරලා සිසු පරපුරට ආහාර වේල ලබා දෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
"මහින්ද චින්තන" ප්‍රතිපත්ති ප්‍රකාශනයේ නිර්ණායකයක් නැහැ.

## පාසල් දරුවන්ගේ දිවා ආහාරය: වැය කරන මුදල
## பாடசாலைப் பிள்ளைகளுக்கு மதிய உணவு: செலவு
## MID-DAY MEAL TO SCHOOL CHILDREN : EXPENDITURE

1052/’10

9. **ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) රජයේ පාසල් සඳහා දිවා ආහාරය ලබා දීමට මාසිකව රජය වැය කරන මුදල කොපමණද;

(ii) පාසල් සඳහා දිවා ආහාරය ලබා දීම අත් හිටුවීමට ක්‍රියාකර තිබේද;

(iii) එසේ නම්, එයට හේතු වූ කරුණු කවරේද;

(iv) දිවා ආහාර ලබා දීම අත් හිටුවීමෙන් අසරණ වන පාසල් දරුවන් වෙනුවෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அரசாங்க பாடசாலைகளுக்கு மதிய உணவு வழங்குவதற்காக மாதாந்தம் அரசாங்கம் செலவிடும் தொகை யாதென்பதையும்;

(ii) பாடசாலைகளுக்கு மதிய உணவு வழங்கப்படுவதை இடைநிறுத்த நடவடிக்கை எடுக்கப்பட்டுள்ளதா என்பதையும்;

(iii) அவ்வாறாயின், அதற்கான காரணங்கள் யாவை என்பதையும்;

(iv) மதிய உணவு வழங்கல் இடைநிறுத்தப்படுவதால் நிர்க்கதியாகும் பாடசாலை மாணவர்கள் சார்பாக எடுக்கப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Education :

(a) Will he state -

(i) the amount of money spent by the Government monthly to provide the mid-day meal at Government schools;

(ii) whether action has been taken to suspend the provision of mid-day meal at schools ;

(iii) if so, the reasons for it ; and

(iv) the measures that will be taken on behalf of the school children who become destitute as a result of suspending the provision of mid-day meal?

(b) If not, why ?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) මාසික වියදම රුපියල් මිලියන 250කි. එහෙත් එය පාසල් දින ගණන අනුව වෙනස් වේ.

(ii) නැත.

(iii) ආහාර ලබා දීම අත්හිටුවා නොමැති බැවින් අදාළ නොවේ.

(iv) එසේ අසරණවීමක් සිදු වී නැත.

(ආ) එවැනි තත්ත්වයක් නොමැති බැවින් අදාළ නොවේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, (iii) සහ (iv) වැනි අතුරු ප්‍රශ්නයට දුන්නු පිළිතුරත් එක්කයි මම අහන්නේ. අද රටේ ජීවත් වන සියයට 50ක් දරිද්‍රතා මට්ටමින් පහළ ඉන්නේ. මේ දරුවන් අසරණ වෙලා නැහැ කියලා කවුරු හරි කියනවා නම් ඒක වැරදියි. ඒ දරුවන් අසරණ වෙලා ඉන්නේ. ඒ නිසා මම අහන්න කැමැතියි, මේ රුපියල් මිලියන 250 පාවිච්චි කරලා ඔබතුමන්ලා මාසයක් ඇතුළත දරුවෝ කොච්චර සංඛ්‍යාවකට මේ දිවා ආහාරය ලබා දෙනවාද කියලා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු මන්ත්‍රීතුමා වෙනම ප්‍රශ්නයක් අහන්න. මම එහෙම උත්තර දෙන්න කැමැතියි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය අධ්‍යාපන ඇමතිතුමා විධියට ඒක දැන ගන්න එපායැ.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
සංඛ්‍යාත්මකව ගණන් බලලා. මම කලින් ප්‍රශ්නයටත් සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කළා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒකට එතුමා පහුවෙලා උත්තර හදාගෙන ඒවි.

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය වශයෙන් මම අහන්න කැමැතියි, දැන් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා කිව්වා එතුමාගේ දිස්ත්‍රික්කයේ දරුවෝ සියයට වඩා වැඩි ප්‍රමාණයක් ඉන්න පාසල්වලට දිවා ආහාරය දෙනවාය කියලා. දුප්පත්ම දිස්ත්‍රික්කයක් බවට පත් වෙලා තිබෙන එතුමාගේ දිස්ත්‍රික්කයේ පාසල් කීයකට, දරුවන් කීයකට මේක දෙනවාද කියලා ගරු නියෝජ්‍ය අධ්‍යාපන ඇමතිතුමා හැටියට පොඩ්ඩක් අපට කියන්න බැරිද?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු මන්ත්‍රීතුමා වෙනම ප්‍රශ්නයක් ඇහුවොත් කියන්න පුළුවන්. පාසල් අටසිය ගණනක් තිබෙනවා. ඔබතුමා ගහෙන් ගෙඩි එන්නා වාගේ ප්‍රශ්න අහන කොට පිළිතුරු දෙන්න බැහැ. ගරු කථානායකතුමනි, අහලා තියෙන ප්‍රශ්නයට තමයි උත්තර දෙන්න පුළුවන්. අනික මොනරාගල දිස්ත්‍රික්කය එතුමා කියන තරම් දුප්පත් නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්නයට අදාළව අහන්න. එතකොට විස්තර දෙයි.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු මන්ත්‍රීතුමන්ලාගේ කාලයේ මොනරාගල දිස්ත්‍රික්කය දුප්පත්. දැන් එහෙම දුප්පත් නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
දැන් දියුණුයි, එහෙමද?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ඔව්, දැන් දියුණුයි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
එහෙම නම් ඔක්කෝටම දිවා ආහාරය දෙනවාද?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
අවශ්‍ය අයට දෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒ තරම් දියුණු නම් ඔක්කෝටම දෙන්නේ නැතුව ඉන්න එපා යැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් තුන්වන අතුරු ප්‍රශ්නය.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මුල් අතුරු ප්‍රශ්න දෙකටම උත්තර නැහැ. මගේ තුන්වන අතුරු ප්‍රශ්නය හැටියට මම අහන්න කැමැතියි, මෙන්න මෙය. අපේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේ දිවා ආහාර වේල සෑම දරුවෙකුටම ලබා දුන්නා. ඒකට ක්‍රමවේදයකුත් හදලා තිබුණා. ඔබතුමන්ලා දැන් ඒක අහෝසි කරනවාද, නැත්නම් කරුණාකරලා,-

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු කථානායකතුමනි, මේකට දෙන්න තිබෙන උත්තරය තමයි "කන් ඇත්තෝ අසත්වා, ඇස් ඇත්තෝ බලත්වා" කියන එක.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
පොඩ්ඩක් ඉන්න. ප්‍රශ්නය අහන්න දෙන්නේ නැහැ නේ. පනින්න එපා. අහන කල් ඉන්න.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
පනින්නේ නැහැ. ඔබතුමා පනින්න කෝ. ඉණිමඟ තියන්න කෝ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
කෑම කියපු ගමන් පනින්න හදනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, පාසල් දරුවන්ගේ දිවා ආහාරය සම්බන්ධයෙන් බලන විට ආඩම්බරකාර තාත්තා විධියට ජනාධිපතිතුමාගේ ආණ්ඩුව දිවා ආහාරය දෙන්න ලැහැස්ති වෙනවාද, එහෙම නැත්නම් ඒකටත් game එක දෙන්නද හදන්නේ කියායි මම අහන්නේ.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
මෙතැන තාත්තා අම්මා මතක් කරන්න අවශ්‍ය නැහැ. ගරු කථානායකතුමනි, මෙතැනදී අම්මා තාත්තා මතක් කරන්න අවශ්‍ය නැහැ. ගරු කථානායකතුමනි, මෙතුමන්ලාගේ ආණ්ඩු කාලයේ සෑම පාසල් දරුවකුටම කෑම වේලක් දුන්නාලු. මට මේකට දෙන්න තිබෙන උත්තරය තමයි, "ඇස් ඇත්තෝ බලත්වා, කන් ඇත්තෝ අසත්වා" කියන එකයි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, බීරන්ට කොච්චර කිව්වත් ඇහෙන්නේ නැහැ. මේක "බිහිරි අලින්ට වීනා වාදනය කරනවා වාගේ" යි. ආඩම්බරකාර තාත්තා දැන් දිවා ආහාරයටත් කෙළලා තිබෙන්නේ. දිවා ආහාරයත් ඉවරයි.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
කරුණාකරලා පක්ෂය හදා ගන්න. දැන් පක්ෂයේ නායකයා තෝරා ගන්න.

## ලංකා ගමනාගමන මණ්ඩලය: නව බස් රථ
## இலங்கை போக்குவரத்துச் சபை: புதிய பஸ் வண்டிகள்
## SRI LANKA TRANSPORT BOARD: NEW BUSES

1074/'11

10. ගරු බුද්ධික පතිරණ මහතා
( மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් මුළු ඩිපෝ සංඛ්‍යාව කොපමණද;

(ii) එම ඩිපෝවලට අයත් මුළු බස් රථ සංඛ්‍යාව කොපමණද;

(iii) කාර්යක්ෂම මගී ප්‍රවාහන සේවාවක් පවත්වාගෙන යෑම සඳහා එම බස් රථ සංඛ්‍යාව ප්‍රමාණවත්ද;

(iv) නව බස් රථ මිලදීගෙන මගී ප්‍රවාහනයට එකතු කිරීමේ සැලසුමක් තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ලංකා ගමනාගමන මණ්ඩලය සඳහා නව බස් රථ මිලදී ගැනීමේ තීරණයකට එළැඹී තිබේ නම්, ඒ අනුව මිලදී ගැනීමට අපේක්ෂිත බස් රථ සංඛ්‍යාව කොපමණද;

(ii) එම බස් රථ අත්පිට මුදලට ලබා ගන්නේද;

(iii) නොඑසේ නම්, ණය ක්‍රමයක් යටතේ මිලදී ගන්නේද;

(iv) බස් රථ ණයට මිලදීගනු ලබන්නේ නම්, ණය සපයන ආයතනය කවරේද;

(v) එම ණය මුදල ගෙවා අවසන් කිරීමට නියමිත දිනය කවරේද;

(vi) ඒ සඳහා අයකරන පොලී ප්‍රතිශතය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து அமைச்சரைக்கேட்பதற்கு,- (1)

(அ) (i) இலங்கை போக்குவரத்து சபைக்குரிய மொத்த டிப்போக்களின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்;

(ii) அந்த டிப்போக்களுக்குரிய மொத்த பஸ் வண்டிகளின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்;

(iii) வினைத்திறன்மிக்க பயணிகள் போக்குவரத்துச் சேவையொன்றை நடத்துவதற்கு அந்த பஸ் வண்டிகளின் எண்ணிக்கை போதுமானதா என்பதையும்;

(iv) புதிய பஸ் வண்டிகளை கொள்வனவு செய்து அவற்றை பயணிகள் போக்குவரத்துக்கு சேர்ப்பதற்கான திட்டம் இருக்கின்றதா என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) இலங்கை போக்குவரத்துச் சபைக்கு புதிய பஸ் வண்டிகளை கொள்வனவு செய்வதற்கான தீர்மானம் எடுக்கப்பட்டிருப்பின் அதன்படி கொள்வனவு செய்ய உத்தேசித்துள்ள பஸ் வண்டிகளின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்;

(ii) அந்த பஸ்வண்டிகள் உடன் காசு செலுத்தப்பட்டு கொள்வனவு செய்யப்படுமா என்பதையும்;

(iii) இன்றேல் கடன் அடிப்படையில் கொள்வனவு செய்யப்படுமா என்பதையும்;

(iv) பஸ் வண்டிகள் கடன் அடிப்படையில் கொள்வனவு செய்யப்படுவதாக இருந்தால், கடன் வழங்கும் நிறுவனம் யாது என்பதையும்;

(v) அந்த கடன் தொகைகளை செலுத்தி முடிக்கவுள்ள திகதி எது என்பதையும்;

(vi) அதற்காக அறவிடப்படும் வட்டி வீதம் எவ்வளவு என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Transport:

(a) Will he state-

(i) the total number of depots that belong to the Sri Lanka Transport Board;

(ii) the total number of buses that belong to those depots;

(iii) whether that number of buses are sufficient to maintain an efficient passenger transport service; and

(iv) whether there is a plan to purchase new buses and deploy them for passenger transport ?

(b) Will he state-

(i) the number of buses expected to be purchased, if a decision has been taken to purchase new buses for the Sri Lanka Transport Board;

(ii) whether those buses are purchased for cash;

(iii) if not, whether they are purchased under a loan scheme;

(iv) the name of the credit agency, if the buses are purchased on credit;

(v) the stipulated date for the completion of the payment of that loan; and

(vi) the rate of interest charged on it ?

(c) If not, why ?

ගරු කුමාර වෙල්ගම මහතා (ප්‍රවාහන අමාත්‍යතුමා)
(மாண்புமிகு குமார வெல்கம - போக்குவரத்து அமைச்சர்)
(The Hon. Kumara Welgama - Minister of Transport)

(අ) (i)

| | |
|---|---|
| ඩිපෝ සංඛ්‍යාව | 103 |
| උප ඩිපෝ සංඛ්‍යාව | 17 |
| මුළු ඩිපෝ සංඛ්‍යාව | 120 |

(ii) 8,063යි

(iii) ප්‍රමාණවත් නැත.

(iv) ඔව්.

(ආ) (i) 500යි

(ii) නැත.

(iii) ගෙවීමේ පදනම මත ලබා ගැනීමට නියමිතයි.

[ගරු කුමාර වෙල්ගම මහතා]

(iv) ලංකා අශෝක් ලේලන්ඩ් සමාගම.

(v) බස් රථය මිලදී ගත් දින සිට මාසික වාරික 40කින්.

(vi) සියයට 15.5යි.

(ඇ) අදාළ නොවේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු ඇමතිතුමා, (අ) (ii) හි පිළිතුර මට නැවත කියන්න.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
8,063යි. ඒ කියන්නේ දුවන්න බැරි ඒවත් එක්ක. [බාධා කිරීම්] ඇත්ත කියන්න ඕනෑ නේ. බොරු කියන්න බැහැ නේ. දුවන්න බැරි ඒවාත් එක්ක තමයි 8,063.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, 8,063ක් බස් තිබෙනවාලු දුවන්න බැරි ඒවාත් එක්ක. ඒ කියන්නේ කොට උඩ තිබෙන බසුත් එක්ක.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඇත්ත කියපු එක ගැන සතුටු වන්නට ඕනෑ. අතුරු ප්‍රශ්න අහන්න දෙයක් නැති වනවා එතකොට.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
දැන් ගරු මන්ත්‍රීතුමාට අහන්නට ඕනෑ මොකක්ද?

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මාගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. සාමාන්‍යයෙන් දෛනිකව ධාවනය කළ හැකි මට්ටමේ බස් රථ සංඛ්‍යාව කියන්නට පුළුවන්ද?

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
4,800යි 5,000යි අතර. [බාධා කිරීම්] පොඩ්ඩක් ඉන්න කෝ කෑ ගහන්නේ නැතිව.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. දළ වශයෙන් බස් 3,000ක් විතර දුවන්න බැරි තත්ත්වයක තිබෙනවා. ගරු ඇමතිතුමාගේ පිළිතුර අනුව ඒක හරි පැහැදිලියි.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
මම ඒ කාරණාව ගැනත් කියන්නම්. දැන් මේ බස් 3,000න් බස් 1,000ක් තිබෙනවා හදන්න -

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
පැහැදිලි නැහැ ගරු ඇමතිතුමා.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ඔය තිබෙන බස් 8,063න් බස් 5,000ක් දුවන කොට තව බස් 1,000ක් හදන මට්ටමේ තිබෙනවා. හදන්න පුළුවන් මට්ටමේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ඒ කියන්නේ දළ වශයෙන් සියයට 60ක් විතර තමයි දුවන මට්ටමේ තිබෙන්නේ?

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
බස් රථ 5,000යි. පරණ බස් රථ 1,000ක් විතර තිබෙනවා repair කරලා ධාවනය කරන්න පුළුවන් මට්ටමේ ඒවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මා දැන ගන්න කැමැතියි ඒ බස් රථ 1,000 කොච්චර කාලයකින්ද සේවය සඳහා යෙදවීමේ හැකියාව ලැබෙන්නේ කියලා. [බාධා කිරීම්]

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
මට ඇහෙන්නේ නැහැ, කෑ ගහන නිසා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
නිශ්ශබ්ද වන්න.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු ඇමතිතුමනි, ඒ බස් රථ 1,000 ගොඩ ගන්න කොච්චර කල් යනවාද?

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
සාමාන්‍යයෙන් අවුරුද්දක් ඇතුළත වාගේ ඒ බස් රථ 1,000 ගොඩ ගන්නවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
අවුරුද්දක් ඇතුළත?

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ඔව්.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
එතකොට ගරු කථානායකතුමනි, ඒ බස් රථ 1,000 ගොඩ ගන්න කොට තව බස් රථ 1,000ක් කොට උඩනේ?

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ඔබතුමා මට කියන්න. මට ඇහෙන්නේ නැහැ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, ඒ කාලය සාධාරණ නැහැ.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
මට ඇහෙන්න කියන්නකෝ. ඇහෙන්නේ නැහැ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මේ microphones වැඩ කරනවා නම්, ඇහෙන්නේ නැහැ කියන එක- [බාධා කිරීම්] ගරු මුතුහෙට්ටිගම මන්ත්‍රීතුමා එක වතාවක් ගිහිල්ලා මොළය පරීක්ෂා කළා වාගේ ඇමතිතුමාට ගිහිල්ලා කන් පරීක්ෂා කර ගන්න වෙනවා.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ඔතැන කථා කරන ඒවා මෙතැනට එන කොට හරියට එන්නේ නැහැ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මම අහන්නේ මේකයි. මේ බස් රථ 1,000 හදන්න අවුරුද්දක් ගන්නවා නම් ඒ අවුරුද්ද ඇතුළත තව ඒ වාගේම බස් ප්‍රමාණයක් අබලි තත්ත්වයට පත් වෙනවා. එතකොට මේකට විසඳුමක් නැහැ.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
නැහැ. ඒවා repair කර කර ගෙන යන්න පුළුවන්.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
එතකොට හැමදාම තිබෙන්නේ බස් රථ 5,000යි දුවන්න.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ගරු මන්ත්‍රීතුමනි, ඒවාට තමයි අමතර කොටස් තිබෙන්නේ. බස් එකක් repair එකට ආපුවාම ඒ අමතර කොටස් යොදවනවා. ලෙඩ වුණාම කොහොමද? දැන් ඔබතුමාට හෙම්බිරිස්සාව හැදුණාම-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එක පිළිතුරක් දුන්නාම ඇති.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ගරු කථානායකතුමනි, ඉඳලා හිටලා නේ කථා කරන්නේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දෙවන අතුරු ප්‍රශ්නය ඇහුවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
නැහැ, දෙවැනි අතුරු ප්‍රශ්නය. තුන්වැනි අතුරු ප්‍රශ්නය ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා අහනවා.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
දැන් ඔබතුමා අහන්නේ තුන්වන අතුරු ප්‍රශ්නය.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
නැහැ, දෙවන අතුරු ප්‍රශ්නය.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තුන්වන අතුරු ප්‍රශ්නය. ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාට ඉඩ දෙනවාද?

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය ඇහුවේ නැහැ. වෙන දේකටයි කථා කළේ. මේ අහන්නේ දෙවන අතුරු ප්‍රශ්නය. ගරු කථානායකතුමනි, බොහෝ ඩිපෝවල බස් රථ බොහොමයක සේවාවන් -service - නිසි පරිදි සිද්ධ වෙන්නේ නැහැ.

ඉතින් ඒ නිසා කරුණාකරලා මේ බස්වල service එක, නැත්නම් සේවාවන් සිදු කරන්න ඒ නිලධාරින්ට කොච්චර කිව්වත් ඒක සිදු වන්නේ නැති හේතුවක් තමයි, මේ පිළිබඳව අමාත්‍යාංශ මට්ටමෙන් සොයා නොබැලීම.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒ හේතු කියන්න, වෙනත් තැනකදී. දැන් ප්‍රශ්නය අහන්න.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ඒ සඳහා සොයා බැලීමේ ක්‍රමවේදයක් ඇති කරන්න අමාත්‍යාංශ මට්ටමෙන් වැඩි උනන්දුවක් දැක්වුවොත්, මෙපමණ බස් ඉවත් කරන්නට සිදු වන්නේ නැහැ යි කියලා ඩිපෝවල බොහෝ දෙනෙක් කියනවා. ඒකට ඇමතිතුමා එකඟ වනවාද, නැත්නම් ඒ සම්බන්ධයෙන් ගන්නා ක්‍රියා මාර්ගය කුමක්ද?

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ගරු මන්ත්‍රීතුමා, ඒවා සොයා බලන්න තමයි ප්‍රවාහන ඇමතිවරයෙක් පත් කරලා තිබෙන්නේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ඒක තමයි. ඒක වෙන්නේ නැහැ යි කියලා නේ මේ කියන්නේ.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ඉතින් ඔබතුමා නේ ඒ කියන්නේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
මම නොවෙයි.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
රටේ මහ ජනතාව කියනවා ප්‍රවාහන ඇමතිතුමා හොඳයි කියලා. ඔබතුමා තමයි නැහැයි කියන්නේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ශාඛා සමිතිවල අය වෙන්න ඇති එහෙම කියන්නේ. මම දන්නේ නැහැ. කළුතර දිස්ත්‍රික්කයේ මතුගම අය නම් කියන්නේ නැහැ.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
යන්න කෝ, ඕනෑ තැනකින් ගිහිල්ලා අහන්න කෝ. අපේ ගරු කථානායකතුමාගෙන් අහන්න කෝ. කාන්තාවන්ගෙන් අහන්න කෝ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි, හොඳයි. ඇමතිතුමා හොඳයි. ප්‍රශ්නවලට උත්තර දෙන්නවත් ඇවිල්ලා ඉන්නවා නේ. [බාධා කිරීම්]

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, වග කීමක් ඇතිව උත්තර දෙන්න කියන්න කෝ විහිළු කථා කියන්නේ නැතිව.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
විහිළු කථා නොවෙයි, ඔබතුමා අහන ඒවාට තමයි උත්තර දෙන්නේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මගේ තුන්වන අතුරු ප්‍රශ්නය -

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
දැන් අතුරු ප්‍රශ්න ඉවරයි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, දැන් බැලුවාම ලංකාවේ බස් රථවලින් සියයට 50ක් තිබෙන්නේ කොට උඩ. ඉතින් කොට උඩ තිබෙන බස් -

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
සියයට 50ක් නැහැ නේ. අසත්‍ය නේ කියන්නේ. සියයට 50ක් නැහැ. [බාධා කිරීම්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
හරි. තරහා ගන්න එපා.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ඒවාත් පැටලිලා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නැහැ, නැහැ, ඉස්සෙල්ලා engine එක අරගෙන ඇවිල්ලා set කරලා ඉන්න. ප්‍රශ්නය අහගන්න.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්නය අහන්න. ප්‍රශ්නය මොකක්ද?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, එතුමා කියන විධියට සියයට 40යි කියමු කෝ. එච්චර බස් සංඛ්‍යාවක් පිරිමින්ට එළවන්නට බැරිව ඉන්න කොට තමයි මෙතුමා ගැහැණුන් ලවා දැන් බස් එළවන්නට හදන්නේ. මම අහන්නේ -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. අතුරු ප්‍රශ්න ඉවරයි. මට පෙනෙන්නේ, තමුන්නාන්සේට වෙනම පන්තියක් පවත් වන්නට ඕනෑ වෙයි,

ප්‍රශ්න අහන හැටිත්, අතුරු ප්‍රශ්න අහන හැටිත් කියලා දෙන්න. [බාධා කිරීම්] එහෙම බැහැ නේ. [බාධා කිරීම්] හරි, දෙන්නාම එක වාගෙයි මට පෙනෙන්නේ.

මීළඟට ප්‍රශ්න අංක 11-1236/'11- (1), ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක් කල් ඉල්ලනවා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු කථානායකතුමනි, දැන් මේ දැයට කිරුළ ප්‍රදර්ශනය කරලා ඉවරයි. දැන් අවුරුද්දක් විතර ගත වෙලා. දැන් ඊළඟ දැයට කිරුළ ප්‍රදර්ශනයත් පවත් වන්න ළඟයි. දැන් මේ සඳහා අමුතුවෙන් ගණන් හදන්න ඕනෑ නැහැ. ෆයිල් එක පෙරළුවා නම් උත්තරය තිබෙනවා. ඉතින් ඒක එවා ගන්න බැරි ඇයි කියන එකයි ප්‍රශ්නය.

පිළිතුරු දෙන්න මාසයක් කල් ඉල්ලනවා. ඇත්තටම දැන් දැයට කිරුළ ප්‍රදර්ශනය කරලා ඉවරයි නේ. ඒකේ වියදම් ෆයිල් එක පෙරළුවා නම් උත්තරය තියෙනවා. සරල වැඩක්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි ඒ ගැන සොයලා බලන්න ඕනෑ.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## පාසල් දරුවන්ගේ මන්දපෝෂණ තත්ත්වය : ක්‍රියාමාර්ග
## பாடசாலை மாணவர்களின் போஷாக்கின்மை: நடவடிக்கை
## MALNUTRITION IN SCHOOL CHILDREN: ACTION TAKEN

1028/'10

12. **ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) (i) ශ්‍රී ලංකාවේ රජයේ පාසල්වලින් අධ්‍යාපනය ලබන සිසු පරපුරේ පෝෂණ තත්ත්වය කවරේද;

(ii) එම පාසල් දරුවන් අතරින් මන්දපෝෂණයෙන් පෙළෙන දරුවන්ගේ ප්‍රතිශතය කවරේද;

(iii) පාසල් දරුවන්ගේ මන්දපෝෂණ තත්ත්වය නැති කිරීමට රජය ගන්නා වූ ක්‍රියාමාර්ග කවරේද;

(iv) එම ක්‍රියාමාර්ග පාසල් දරුවන්ගේ මන්දපෝෂණය නැති කිරීමට ප්‍රමාණවත්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්,ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் அரசாங்கப் பாடசாலைகளில் கல்விபயிலும் சந்ததியினரின் போஷாக்கு நிலைமை யாதென்பதையும்,

(ii) மேற்படி பாடசாலை மாணவர்கள் மத்தியில் போஷாக்கின்மை காரணமாக பாதிக்கப்பட்டுள்ள மாணவர்களின் சதவீதம் யாதென்பதையும்,

(iii) பாடசாலை மாணவர்களின் போஷாக்கின்மை நிலைமையை இல்லாதொழிப் பதற்கு அரசாங்கம் மேற்கொள்ளும் நடவடிக்கைகள் யாவையென்ப தையும்,

(iv) மேற்படி நடவடிக்கைகள் பாடசாலை மாணவர் களின் போஷாக்கின்மை நிலைமையை இல்லா தொழிப்பதற்கு போதுமானதா என்பதையும்

அவர் இச்சபைக்கு குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he state-

(i) the nutrition level of the students studying in government schools in Sri Lanka;

(ii) the percentage of the students who are suffering from malnutrition out of the aforesaid number of school children;

(iii) the courses of action taken by the government to eradicate malnutrition in school children; and

(iv) whether those courses of action are adequate to eradicate malnutrition in school children ?

(b) If not, why?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු කථානායකතුමනි, ගරු අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා මෙම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) රජයේ පසල්වල ළමුන් අතර මිටි බව, කෘෂ බව අයඩින් ඌනතාවය, විටමින් A ඌණතාවය සහ යකඩ ඌණතාවය ඇතැම් ප්‍රදේශවල ඇති බව හඳුනා ගෙන ඇත.

(ii) පාසල් දරුවන්ගේ මන්දපෝෂණ තත්ත්වය පාසල් වෛද්‍ය පරීක්ෂණ මගින් පහත සඳහන් පරිදි බව හෙළි වී ඇත.

| වර්ෂය | මන්දපෝෂණ ප්‍රතිශතය |
|---|---|
| 2005 | 12% |
| 2010 | 17% |

(iii) • මන්දපෝෂණයෙන් පෙළෙන ළමුන් සිටින ප්‍රාථමික පාසල්වල සිසුන් කෙරෙහි අවධානය යොමු කරමින් පාසල් 7,779ක සිසුන් 1,088,890ක් සඳහා පාසල් දිවා ආහාර වැඩසටහන ක්‍රියාත්මක වේ. මේ සඳහා 2011 වර්ෂය වෙනුවෙන් රුපියල් මිලියන 2,800ක් වැය කෙරේ. පෝෂණ ගැටලු අවම කිරීම සඳහා ආහාර ලබාදීම පමණක් ප්‍රමාණවත් නොවන බැවින් එම දරුවන් සඳහා යකඩ පෙති ෆෝලික් ඇසිඩ් හා පණු පෙති ලබා දීමට 2011 වර්ෂයේ සිට ක්‍රියා කෙරේ.

[ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා]

- පාසල් දරුවන්ගේ මන්දපෝෂණය තත්ත්වය සඳහා ඔවුන්ගේ දෙමාපිය නොදැනුවත්කම බලපාන බැවින් පෝෂණ අධ්‍යාපන වැඩසටහන් අධ්‍යාපන සහ සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් කර ගෙන යනු ලැබේ. පාසල් වේලාව තුළදී සෞඛ්‍යවත් ආහාර පරිභෝජනය ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය උපදෙස් හා මග පෙන්වීම සිදු කර ඇත. (චක්‍රලේඛ අංක 2011/03)
- දිළිඳු පවුල්වල ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීම සඳහා වැඩ පිළිවෙළක් සමෘද්ධි වැඩසටහන මඟින් ක්‍රියාත්මක කර ගෙන යනු ලැබේ.
- රජය මඟින් ආරම්භ කර ඇති ගෙවතු වගා කිරීමේ වැඩසටහන යටතේ පෝෂ්‍යදායී ආහාර වගා කිරීමේ කටයුතු ආරම්භ කර ඇත.

(iv) පහත සඳහන් ක්‍රියා මාර්ගයන් සාර්ථක ව ක්‍රියාත්මක කිරීමෙන් මන්ද පෝෂණය අවම කිරීමට හැකිවේ. දුප්පත්කම සහමුලින්ම තුරන් කිරීම සඳහා රජයේ ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන හෙයින් මෙම ගැටලු විසඳීමට එය ඉවහල් වේ.

(ආ) අදාළ නොවේ.




මූලාශ්‍රය - පාසල් වෛද්‍ය පරීක්ෂණය 2010

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, මට අතුරු ප්‍රශ්න තුනක් අහන්න තිබෙනවා. මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා ලබා දුන් පිළිතුර අනුව, 2005-2010 අතර පාසල් දරුවන්ගේ මන්දපෝෂණ මට්ටමේ ඉහළ යෑමක් තිබෙනවා, සියයට 12 සිට සියයට 17 දක්වා.

ඒ නිසාම මම අහන්න කැමැතියි, අපේ රටේ සෑම පාසලකම දරුවන්ගේ පෝෂණ මට්ටම සුරක්ෂා කිරීම සඳහා හැම පාසලකටම ආවේනික විශේෂිත සෞඛ්‍ය වෛද්‍ය ඒකකයක් පිහිටුවන්නට ඔබතුමන්ලා කටයුතු කරනවාද කියලා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

ගරු කථානායකතුමනි, සංඛ්‍යාලේඛනවල වැඩි වීමක් පෙන්වන්නේ උතුරු නැඟෙනහිර පළාත් සම්බන්ධ වීමෙන් පසුව සමස්ත ශිෂ්‍ය සංඛ්‍යාවේ වර්ධනය අනුවයි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

හරි, ඉතින් උතුරු නැඟෙනහිරත් අපේ රටේ නේ.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

කලින් රටේ නොවෙයි නේ. කලින් වැටේ. ගරු කථානායකතුමනි-

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

උතුරු නැඟෙනහිර කියලා වෙන් කරන්න එපා. මම ඇහුවේ රට ගැනයි.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

නැහැ, ඒ කාලයේ තමයි වෙන් කළේ. දැන් නැහැ. දැන් එක්සත් ශ්‍රී ලංකාව.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

එක්සත් නොවෙයි, ඒකීය ශ්‍රී ලංකාව. හරියට කියන්න. [බාධා කිරීමක්] ඒකීය ශ්‍රී ලංකාව.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

පිළිගන්න එක සතුටට කාරණාවක්. ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා ඒක පිළිගන්න එක සතුටට කාරණාවක්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

එක්සත් නොවෙයි, ඒකීය ශ්‍රී ලංකාවක්. ඒක ඉගෙන ගන්න.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

මොකක්ද, ඔබතුමා ඇහුවේ? [බාධා කිරීම්] පොඞ්ඩක් කෑගහන්නේ නැතිව ඉන්න. වැදගත් ප්‍රශ්නයක් අහන්නේ. වැදගත් විධියට කථා කරන්න. නිකම් බොරුවට නළුවෝ වාගේ දඟලන්නේ නැතිව. ඔබතුමා අහපු ප්‍රශ්නය නැවත කියන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මගේ ප්‍රශ්නයට උත්තර දෙන්න.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
අහපු ප්‍රශ්නය මොකක්ද? ප්‍රශ්නය කියන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මගේ පළමුවන අතුරු ප්‍රශ්නය වුණේ හැම පාසලකම විශේෂිත වූ සෞඛ්‍ය වෛද්‍ය ඒකකයක් ස්ථාපනය කරන්න ඔබතුමන්ලා කටයුතු කරනවාද කියන එකයි.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු කථානායකතුමනි, පාසලක් පාසා සෞඛ්‍ය වෛද්‍ය ඒකක පිහිටුවීමෙන් මේ ප්‍රශ්නයට උත්තරයක් ලැබෙන්නේ නැහැ. මහින්ද චින්තනය යටතේ සෞඛ්‍ය අමාත්‍යාංශය හා අධ්‍යාපන අමාත්‍යාංශය ඒකාබද්ධව ඇති කර තිබෙන සෞඛ්‍ය අධ්‍යාපන වැඩ පිළිවෙළවල් මඟින්, ප්‍රාදේශීය සෞඛ්‍ය කාර්යාල මඟින් සෑම ගමකම, සෑම නිවසකටම සෞඛ්‍ය චින්තනු මාතාව ගමන් කරමින් මව්වරුන්ගේ සහ දරුවන්ගේ පෝෂණ තත්ත්වයන් වර්ධනය කිරීමට අවශ්‍ය වැඩ සටහන් සකස් කරලා ක්‍රියාත්මක වෙමින් පවතිනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙසේයි. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගේ පිළිතුර ප්‍රකාරව අද උද්ගත වී තිබෙන පාසල් දරුවන්ගේ උග්‍ර මන්දපෝෂණ තත්ත්වය මත දැනට සෞඛ්‍ය දෙපාර්තමේන්තුවත් අධ්‍යාපන අමාත්‍යාංශයත් ඒකාබද්ධව 1, 4, සහ 7 ශ්‍රේණිවල දරු දැරියන්ගේ පමණක් පෝෂණ මට්ටම් පරීක්ෂා කිරීමේ වැඩ සටහනක් ක්‍රියාත්මක කරනවා. මම අහන්න කැමැතියි, මේ වැඩි වී තිබෙන මන්දපෝෂණ තත්ත්වය මත ඒක 1, 4 සහ 7 ශ්‍රේණිවල දූදරුවන්ට පමණක් සීමා කරන්නේ නැතිව සමස්ත සිසු පරපුරට ව්‍යාප්ත කරන්නට කටයුතු කරන්නට ඔබතුමන්ලා පිළියම් යොදනවාද? කියලා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ඒක කිරීමේ කිසිම බාධාවක් නැහැ ගරු කථානායකතුමනි. සාමාන්‍යයෙන් මන්දපෝෂණ තත්ත්වයන් දෘෂ්‍යමාන වන්නේ බාල අවධියේදීයි.

ඒ බාල අවධියේ තමයි එයට ප්‍රතිකර්ම යොදන්න පුළුවන්කම තිබෙන්නේ. මේරූ පසුව ඒ ප්‍රතිකර්මවලින් ප්‍රයෝජනයක් වන්නේ නැහැ. එම නිසා දැනට කෙරෙන වැඩ පිළිවෙළ ප්‍රමාණවත් වනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මගේ තුන්වන අතුරු ප්‍රශ්නය මේකයි, ගරු කථානායකතුමනි. අද පාසල් යන දූ දරුවන්ගේ නීරක්ති ප්‍රතිශතය සියයට 20යි. නීරක්තිය බිහි වන්නේ යකඩ ඌනතාව නිසායි. මේ නිසාම විශේෂයෙන්ම ඥාන වර්ධනයට, බුද්ධි වර්ධනයට, අධ්‍යාපන කුසලතා වර්ධනයට සෘජු බලපෑමක් ඇති වනවා. එම නිසාම අද වන විට 7 - 10 ශ්‍රේණිවල දූ දරුවන්ට යකඩ පෙති ලබා දීම ක්‍රියාත්මක වනවා. එය කරන්නේත් රජයේ සල්ලිවලින් නොවෙයි, යුනිසෙෆ් ආයතනයේ සල්ලිවලින්.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
විදේශ ආධාර ලැබෙන්නේ රජයට.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට ප්‍රශ්නය අහන්න ඉඩ දෙන්න. අපේ රටේ පාසල් යන දරු පරපුරෙන් සියයට 20ක් නීරක්තියෙන් පෙළෙන කොට, යුනිසෙෆ් ආයතන මතම රැඳී සිටින්නේ නැතුව, ඒ මතම කටයුතු කරන්නේ නැතුව, ආණ්ඩුවේ -රජයේ-, අමාත්‍යාංශයේ ප්‍රතිපාදන හරහා නීරක්තියෙන් පෙළෙන සිසු පරපුරට ඒ යකඩ පෙති ලබා දෙන්න කටයුතු කරන්නේ නැත්තේ ඇයි?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු කථානායකතුමනි, මට හිතා ගන්න අමාරුයි. යුනිසෙෆ් ආයතනය ක්‍රියාත්මක වන්නේ, සියලු මෙහෙයුම් කරන්නේ අධ්‍යාපන දෙපාර්තමේන්තුව, අධ්‍යාපන අමාත්‍යාංශය හරහායි. මේවා රජයට ලැබෙන ආධාර. මල්ලෙන් හෝ පෙට්ටියෙන් හෝ ලැබෙනවා. ඒවා වැඩි කරන්න අවශ්‍ය නම් ඔබතුමාගේ ඉල්ලීම ගැන සලකා බලා වැඩි කරන්න පුළුවන්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ලැබෙන්නේ 7 - 10 ශ්‍රේණිවලට විතරයි.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ඔව්. වැඩි කරන්න අවශ්‍ය නම් අපි වැඩි කරන්නම්.

## උතුරු නැඟෙනහිර මිය ගිය සිවිල් පුරවැසියන්: පරීක්ෂණ
## வடக்கு, கிழக்கில் கொல்லப்பட்ட சிவில் பிரஜைகள்: விசாரணை
## CIVILIAN KILLINGS IN NORTH AND EAST : INVESTIGATIONS

1053/'10

13. **ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) යුද්ධය අවසන්වූ දින සිට 2010 වර්ෂය අවසානය දක්වා උතුරු නැඟෙනහිර පළාත්වල නාඳුනන ප්‍රහාරයන්ගෙන් මිය ගිය සිවිල් පුරවැසියන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ඝාතනයන් සඳහා හේතු වූ කරුණු සොයා ගෙන තිබේද;

(iii) එසේ නම්, ඒ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත ඝාතනවලින් කොපමණ සංඛ්‍යාවක් පිළිබඳව මේ වන විට පරීක්ෂණ පවත්වා විසඳුම් ලබා දී තිබේද;

[ගරු දයාසිරි ජයසේකර මහතා]

(ii) විසඳුම් ලබා දී නොමැති ඝාතන සංඛ්‍යාව කොපමණද;

(iii) එම ඝාතන විසඳා ගැනීමට නොහැකි වූ හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) யுத்தம் முடிவடைந்த நாளிலிருந்து 2010 ஆம் ஆண்டு இறுதி வரை வடக்கு, கிழக்கு மாகாணங்களில் இனந்தெரியாதவர்களால் கொல்லப்பட்ட சிவில் பிரஜைகளின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்;

(ii) இப்படுகொலைகளுக்கு காரணமாயிருந்த விட யங்கள் கண்டறியப்பட்டுள்ளனவா என்ப தையும்;

(iii) ஆமெனில், அவை யாவையென்பதையும்

அவர் இச்சபைக்கு குறிப்பிடுவாரா?

(ஆ) (i) மேற்படி படுகொலைச் சம்பவங்களில் இதுவரை விசாரணை நடத்தி தீர்க்கப்பட்டுள்ளவைகளின் எண்ணிக்கை யாவையென்பதையும்;

(ii) தீர்க்கப்படாத படுகொலைச் சம்பவங்கள் எத்தனை யென்பதையும்;

(iii) மேற்படி படுகொலைச் சம்பவங்கள் தீர்க்கப்படா மைக்கான காரணங்கள் யாவை என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs:

(a) Will he state -

(i) the number of civilians who died due to unidentified attacks in the Northern and the Eastern Provinces from the day that the war ended up to the end of the year 2010;

(ii) whether the reasons for those killings have been disclosed; and

(iii) if so, what they are ?

(b) Will he inform this House-

(i) of the number out of the aforesaid killings with respect to which after investigations were held;

(ii) of the number of killings that have not been dealt with in that manner ; and

(iii) the reasons for the failure to disclose full details of those killings ?

(c) If not, why ?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) නාඳුනන ප්‍රහාරවලින් මිය ගිය අයවළුන් වාර්තා වී නොමැති අතර උතුරු පළාතේ හය (06) දෙනකු හා නැගෙනහිර පළාතේ තිදෙනකු (03) වශයෙන් අදාළ කාල සීමාව තුළ මිනී මැරුම් 09ක් වාර්තා වී ඇත.

(ii) උතුරු පළාතේ යාපනය දිස්ත්‍රික්කයේ එක් ඝාතනයක් සඳහා හේතු වූ කරුණු සොයා ගෙන ඇති අතර අනෙක් ඒවා සම්බන්ධයෙන් කරුණු පරීක්ෂා කෙරෙමින් පවතී.

(iii) ඝාතනයට ලක් වූ පුද්ගලයාගේ ජංගම දුරකථනයට අමතා කැඳවා ගෙන ගොස් ඔහුව නිදහස් කිරීමට රුපියල් ලක්ෂ 08ක මුදලක් ඉල්ලා එම මුදල නොලැබීම හේතුවෙන් ගෙල කපා ඝාතනය කොට ඇත.

(ආ) (i) ඝාතන සියල්ලටම පරීක්ෂණ පවත්වා ඇත.

(ii) සියලුම ඝාතන සඳහා විසඳුම් ලැබී නොමැති අතර පරීක්ෂණ දිගටම සිදු කෙරේ.

(iii) ඝාතන ඔප්පු කිරීමට ප්‍රමාණවත් සාක්ෂි අනාවරණය නොවීම ප්‍රධාන හේතුව ලෙස දැක්විය හැකිය.

(ඇ) අදාළ නොවේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු කථානායකතුමනි, මෙතුමා දැන් කියන්නේ මිනී මැරුම් ගැන නේ. මිනී මැරුම් පැත්තක තියලා මම ඒ ප්‍රශ්නයට අදාළව එක උදාහරණයක් විතරයි ගන්නේ. ගරු ඇමතිතුමනි, දැන් ඝාතනය වූ සිවිල් පුරවැසියන් කියලා ගත්තාම ඇත්ත වශයෙන්ම මට පැහැදිලිව දෙන්න පුළුවන් එක උදාහරණයක් තිබෙනවා. පට්ටනි රාසික් කියන ස්වේච්ඡා සංවිධානයක වැඩ කරපු කෙනෙක් අතුරුදන් වුණා. ඔහු ඝාතනයට ලක් වෙලා. දැන් ඔහුගේ මිනිය සොයා ගෙන අවශ්‍ය කරන කටයුතු ටික කෙරී ගෙන යනවා. ආණ්ඩු පක්ෂයේ ගරු සංවිධායකතුමනි, මම අහන්නේ එදිනෙදා සිදු වුණු මිනී මැරුම් ගැන තොරතුරු ලැබෙනවාට වැඩිය මේ වාගේ ස්වේච්ඡා සංවිධානවල ඉඳලා මිය ගිය අය සම්බන්ධව ඔබතුමාට යම් දත්ත, තොරතුරු ඇවිල්ලා නැද්ද කියලායි. මේ මම දැනුවත්ව එක කාරණයක්. තව කාරණා ගණනාවක් තිබෙනවා. නමුත් මම ඔබතුමාගෙන් අහන්නේ මේ සම්බන්ධව තොරතුරු කිසිවක් ලැබිලා නැද්ද? කියලායි. මේක සාමාන්‍ය මිනී මැරුමක් නොවෙයි. පැහැර ගෙන ගොස් ඔහුව මරා දමා තිබෙනවාය කියලා තමයි මිනිය ගොඩ ගන්න අවශ්‍ය කරන කටයුතු ටික ලෑස්ති කරලා තිබුණේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමාගේ අතිරේක ප්‍රශ්නයෙන් ස්ථිර පුද්ගලයෙක් ගැන විමසන්නේ. එතුමා ඒ පිළිබඳ විස්තර අපිට ලබා දෙන්නේ නම් අපි ඒ ගැන සොයා බලලා වහාම වාර්තා කරන්නම්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු කථානායකතුමනි, මම ඒ කාරණය ඇහුවේ වෙන මොකක්වත් නිසා නොවෙයි. මොකද, සිවිල් පුරවැසියන් ඝාතනය වෙලා තිබෙනවාය කියන එක ඔප්පු කරන්න පුළුවන් එක කාරණයක් විතරයි මම කිව්වේ. තව කාරණා ගණනාවක් තිබෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එතුමා විස්තර ඉල්ලා සිටිනවා. ඔබතුමා ඒවා දෙන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, තවත් ඒ වාගේ කාරණා ගණනාවක් තිබෙනවා. මේ සංවිධාන විවිධ මට්ටමින් නම් කරන විට ඒක ආණ්ඩුවට හොඳ නැති නිසා මම මේ එක කාරණයක් විතරක් කථා කළේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඊ ළඟ අතුරු ප්‍රශ්නය අහනවාද?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒ නිසා මම ඇමතිතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලනවා ඒ සම්බන්ධයෙන්-

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
දැනට වාර්තා වී තිබෙන්නේ පොලීසියට පැමිණිලි කිරීමෙන් හෝ ඒ ඝාතනය සිදු වූ තැනින් -ප්‍රදේශයෙන්- වාර්තාව ලැබීමෙන් ආදී වශයෙන්. හැබැයි ගරු මන්ත්‍රීතුමාට ඊට වඩා විස්තර තිබෙනවා නම් ඒවා ඉදිරිපත් කළොත් අපි වහාම පිළිතුරු දෙන්න සූදානම්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 14 -1076/'11 -(1), ගරු බුද්ධික පතිරණ මහතා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් වැය කළ මුදල: පුද්ගලික ප්‍රවාහන සේවා අමාත්‍යාංශය
## 2011 `தேசத்துக்கு மகுடம்' கண்காட்சிச் செலவினம்: தனியார் போக்குவரத்துச் சேவைகள் அமைச்சு
## MONEY SPENT ON DEYATA KIRULA EXHIBITION 2011 : MINISTRY OF PRIVATE TRANSPORT SERVICES

1237/'11

15. **ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
පුද්ගලික ප්‍රවාහන සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් පුද්ගලික ප්‍රවාහන සේවා අමාත්‍යාංශය වැය කළ මුළු මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයේ එක් එක් ආයතනය හා දෙපාර්තමේන්තුව මඟින් එම ප්‍රදර්ශනය සඳහා කළ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම දෙපාර්තමේන්තු හා ආයතන විසින් ඉටු කරන ලද කර්තව්‍යයන් කවරේද;

(iii) එම එක් එක් කාර්යය වෙනුවෙන් වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පසු ගිය අය වැයෙන් ඉහත වියදම් සඳහා මුදල් වෙන් කරන ලද අමාත්‍යාංශ වැය ශීර්ෂය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නො එසේ නම් ඒ මන්ද?

தனியார் போக்குவரத்துச் சேவைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) 2011 `தேசத்துக்கு மகுடம்' கண்காட்சிக்காக தனியார் போக்குவரத்துச் சேவைகள் அமைச்சு செலவிட்டுள்ள மொத்தப் பணத் தொகை எவ்வளவு என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) அமைச்சின் ஒவ்வொரு நிறுவனம் மற்றும் திணைக்களத்தினால் மேற்படி கண்காட்சிக்காக மேற்கொள்ளப்பட்ட செலவு தனித் தனியே எவ்வளவு என்பதையும்;

(ii) மேற்படி திணைக்களங்கள் மற்றும் நிறுவனங்களினால் ஆற்றப்பட்ட பணிகள் யாவை என்பதையும்;

(iii) மேற்படி ஒவ்வொரு பணிக்காகவும் செலவிடப்பட்ட பணத் தொகை எவ்வளவு என்பதையும்

அவர் தனித்தனியாக குறிப்பிடுவாரா?

(இ) கடந்த வரவு செலவுத் திட்டத்தில் மேற்படி செலவினத்துக்காக அமைச்சின் எந்த செலவுத் தலைப்பின் கீழ் நிதி ஒதுக்கப்பட்டிருந்தது என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

asked the Minister of Private Transport Services:

(a) Will he state the total amount of money spent by the Ministry of Private Transport Services on the "Deyata Kirula" Exhibition in 2011?

(b) Will he state-

(i) separately, the expenditure borne by each institution and department of the Ministry on that exhibition;

(ii) the functions carried out by those institutions and departments; and

(iii) separately, the amount of money spent on each of those functions?

(iv) Will he state the Head of Expenditure of the Ministry out of which funds were allocated from the last Budget for the above mentioned expenses?

(c) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, පුද්ගලික ප්‍රවාහන සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

ano - 01

(අ) අදාළ නොවේ. (2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් පුද්ගලික ප්‍රවාහන සේවා අමාත්‍යාංශය මුදල් වැය කර නැත.)

(ආ) (i) අමාත්‍යාංශය යටතේ පවතින ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් රු. 2,610,521.46 (විසිහයලක්ෂ දසදහස් පන්සිය විසිඑකයි ශත හතළිස් හයක්) වියදම් කර ඇත.

(ii)
- ප්‍රදර්ශන කුටිය සෑදීම හා ප්‍රදර්ශනයට සුදුසු පරිදි සකස් කිරීම, ප්‍රදර්ශන පුවරු සකස් කිරීම හා සියලු කටයුතු
- ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ කාර්යය හා කර්තව්‍යයන් මහ ජනතාවට පැහැදිලි කිරීම හා පාසල් සිසුන් ඇතුළු ජනතාවට අධ්‍යාපන කටයුතු සඳහා ප්‍රයෝජනවත් පරිදි අවශ්‍යවන අත් පත්‍රිකා හා පොත් පත් ලබා දීම (සිංහල හා දෙමළ)
- වාහනය තිබෙන ස්ථානය හඳුනා ගැනීමේ පද්ධතිය පිළිබඳ (GPS & Vehicle Tracking System) ආකෘතිය සෑදීම. (ක්‍රියාත්මක වන ආකාරය ප්‍රායෝගිකව ප්‍රදර්ශනය වන අයුරින්)
- පොදු ප්‍රවාහනය සංවර්ධන කිරීම පිළිබඳව ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ තෑගි ලබා දීම. (විවෘත තරගයකි)
- ප්‍රදර්ශන භාණ්ඩ, නිලධාරීන් හා උපකරණ, පත්‍රිකා ආදිය ප්‍රවාහනය සඳහා කුලියට ගත් වාහන පිරිවැය.
- නිලධාරීන්ගේ යැපීම් දීමනා ආහාරපාන හා නවාතැන් පහසුකම් සඳහා පිරිවැය.

(iii) ඔව්.

| | කරන ලද කාර්යය | වැය කරන ලද මුදල රු. |
|---|---|---|
| 01 | ප්‍රදර්ශන කුටිය සෑදීම හා ප්‍රදර්ශනයට සුදුසු පරිදි සකස් කිරීම, ප්‍රදර්ශන පුවරු සකස් කිරීම හා සියලු කටයුතු | 670,000.00 |
| 02 | ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ කාර්යයන් හා කර්තව්‍යයන් මහ ජනතාවට පැහැදිලි කිරීම හා පාසල් සිසුන් ඇතුළු ජනතාවට අධ්‍යාපන කටයුතු සඳහා ප්‍රයෝජනවත් පරිදි අවශ්‍ය වන අත් පත්‍රිකා හා පොත් පත් ලබා දීම (සිංහල හා දෙමළ) | 855,000.00 |
| 03 | වාහනය තිබෙන ස්ථානය හඳුනා ගැනීමේ පද්ධතිය පිළිබඳ ((GPS & Vehicle Tracking System) ආකෘතිය සෑදීම. (ක්‍රියාත්මක වන ආකාරය ප්‍රායෝගිකව ප්‍රදර්ශනය වන අයුරින්) | 345,216.00 |
| 04. | පොදු ප්‍රවාහනය සංවර්ධන කිරීම පිළිබඳ ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ තෑගි ලබා දීම (විවෘත තරගයකි) | 275,000.00 |
| 05 | ප්‍රදර්ශන භාණ්ඩ, නිලධාරීන් හා උපකරණ, පත්‍රිකා ආදිය ප්‍රවාහනය සඳහා කුලියට ගත් වාහන පිරිවැය | 400,305.46 |
| 06 | නිලධාරීන්ගේ යැපීම් දීමනා ආහාරපාන හා නවාතැන් පහසුකම් සඳහා පිරිවැය | 65,000.00 |
| | මුළු වියදම් | 2,610,521.46 |

(ඇ) අදාළ නොවේ. (වෙන් කර නැත.)

(ඈ) අමාත්‍යාංශය 2010.11.22 දින ආරම්භ කරන ලද අතර ඒ වන විට 2010 අය වැය සම්පාදනය කර අවසන්ව තිබුණු බැවිනි.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙකයි. දැයට කිරුළ ප්‍රදර්ශනය පැවැත්වුයේ ජනාධිපතිතුමාගේ පදවි ප්‍රාප්තිය සමරන්නයි. එතකොට ඇත්තටම එක් එක් අමාත්‍යාංශවලට වෙන් වෙච්ච මුදල්වලින් යම් ප්‍රමාණයක් වියදම් කරලා ප්‍රදර්ශන කුටි පවත්වා තිබෙන බව මේ පිළිතුරෙන් අනාවරණ වෙනවා. ගරු කථානායකතුමනි, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගේ මේසය උඩත් මේ ලේඛන ඇතැයි කියා මම හිතනවා. ඒ ලේඛනවල 2011 අවුරුද්දට වෙන් කරපු පරිපූරක ඇස්තමේන්තු තිබෙනවා. ඒ අනුව, පුද්ගලික ප්‍රවාහන සේවා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ කුලියටයි, ගෘහ භාණ්ඩ හා කාර්යාලයීය උපකරණ මිල දී ගන්නයි රුපියල් ලක්ෂ 90ක මුදලක් වෙන් කර තිබෙනවා. එහෙම කරන්නේ, අය වැයෙන් ඒ අමාත්‍යාංශයට වෙන් කරපු මුදල මදි නිසායි. ඒ අමාත්‍යාංශයට

තමන්ගේ කාර්යාල කුලිය ගෙවා ගන්න විධියක් නැතිව තිබෙද්දී, ජනාධිපතිතුමාගේ පදවි ප්‍රාප්තිය සමරන උත්සවයට රුපියල් විසිහය ලක්ෂයක් වෙන් කරන්න සිදු වෙලා තිබෙනවා. ඇත්තටම ඒකෙන් ඒ ඇමතිතුමාට ලොකු අසාධාරණයක් නේ වෙන්නේ.

2011 අවුරුද්දේ අය වැයෙන් ප්‍රමාණාත්මක ලෙස ඒ අමාත්‍යාංශයට මුදල් වෙන් කරලා නැතිව තිබියදී, වෙනත් කටයුත්තක් සඳහා -ජනාධිපතිතුමාගේ පදවි ප්‍රාප්තිය සඳහා- ඒ අමාත්‍යාංශය විසි හය ලක්ෂයක් වියදම් කිරීම යුක්ති සහගතද කියලා මම ඔබතුමාගෙන් අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, දැයට කිරුළ ප්‍රදර්ශනය වාර්ෂිකව පැවැත්වෙන, අපේ ජාතික නිදහස් දිනය සම්බන්ධ කර ගත් ප්‍රධානතම උළෙලක්. මා කලින් උත්තර දුන්නා මේ අමාත්‍යාංශය ආරම්භ කර තිබෙන්නේ 2010.11. 22වැනිදා කියලා. පරිපූරකයක් ඉල්ලන්නේ අමාත්‍යාංශය ඇති කිරීමෙන් පසුව අමාත්‍යාංශ කාර්යාලවලට අවශ්‍ය පහසුකම් ඇති කරන්නයි. අමාත්‍යාංශයකට ඒ පහසුකම් නැති වුණාම අපේ මන්ත්‍රීතුමන්ලා අහනවා, කොහේද මේ අමාත්‍යාංශය තිබෙන්නේ කියලා. ඒ නිසා අමාත්‍යාංශයකට හිමි ප්‍රතිපාදන සඳහායි ඒ වැය ශීර්ෂයෙන් මුදල් ඉල්ලා තිබෙන්නේ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු කථානායකතුමනි, අය වැය ඉදිරිපත් කළාට පසුව හදාපු අලුත් අමාත්‍යාංශවලට ඒ අය වැයේ වෙනත් වැය ශීර්ෂවලින් මුදල් වෙන් කළා. අලුත් අමාත්‍යාංශ වෙනුවෙන් වෙනම වැය ශීර්ෂ හැදුවා. දැන් මේ පරිපූරකය නම් කරලා තිබෙන දිනය තමයි 2011.05.05. එතකොට 2011 අවුරුද්ද සඳහා තමයි පුද්ගලික ප්‍රවාහන සේවා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ කුලිය ගෙවන්න ලක්ෂ 90ක් වෙන් කර තිබෙන්නේ.

2011 අවුරුද්දට අදාළවම තමයි දැයට කිරුළට මුදල් වෙන් කරලා තිබෙන්නේත්. මම අහන ප්‍රශ්නය මෙකයි. අඩු තරමින් අමාත්‍යාංශයේ කුලිය ගෙවන්නවත් ඒ අමාත්‍යාංශයේ ප්‍රතිපාදන ප්‍රමාණවත් නැති නිසා නේ අද දවසේ අපේ මේසය උඩ මේ පරිපූරක ඇස්තමේන්තු තිබෙන්නේ. එහෙම තිබියදී, දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් ජනාධිපති ලේකම් කාර්යාලයේ ප්‍රතිපාදනයකින් හරි වෙනත් අමාත්‍යාංශයකින් හරි මුදල් වෙන් කරනවාට වඩා, මේ ඉතාම කුඩා අමාත්‍යාංශවලින් -අඩු තරමින් ඒ අමාත්‍යාංශයේ ගෘහ භාණ්ඩ ටිකවත් ගන්න ප්‍රමාණවත් මුදලක් අය වැයෙන් වෙන් වෙලා නැති අමාත්‍යාංශවලින්- මුදල් ලබා ගැනීම සාධාරණද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා මගේ පිළිතුරට සවන් දීලා නැහැ. මේ සම්පූර්ණ වියදම දරලා තිබෙන්නේ ජාතික ප්‍රවාහන කොමිෂන් සභාවෙන්.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
කොමිසමත් මේ අමාත්‍යාංශය යටතේ නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
නැහැ. අමාත්‍යාංශය එකක්. කොමිෂන් සභාව පමණයි අමාත්‍යාංශය යටතේ තිබෙන විශේෂ ආයතනය. ඒක නිසා මන්ත්‍රීතුමා කරුණු පටලවා ගෙන මේ කථා කරන්නේ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
එහෙම නම් ඒකට අමාත්‍යාංශය නොකියා "කොමිෂන් සභාව" කිව්වා නම් හොඳයි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අමාත්‍යාංශයක් පවතිනවා. කොමිෂන් සභාව තිබෙන්නේ අන්තර් පළාත් ගමන් මාර්ග සහ විශේෂ ප්‍රවාහන ගමන් මාර්ග සඳහා අවසර පත් නිකුත් කිරීම හා පාලනය කිරීම සඳහා. ඉතින් ඔබතුමා ඒ දෙක පටලවා ගන්න එපා. අමාත්‍යාංශයේ කාර්යභාරය ඊටත් වැඩියි. 17,000ක් පමණ පෞද්ගලික බස් රථ තිබෙනවා රටේ. ඒ නිසායි අමාත්‍යාංශයක් ඒ වෙනුවෙන් ඇති කරලා තිබෙන්නේ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු කථානායකතුමනි, මගේ තුන් වැනි අතුරු ප්‍රශ්නය මෙකයි. 2012 අවුරුද්දේත් "දැයට කිරුළ" ප්‍රදර්ශනය පවත්වද්දී මේ ආකාරයටම සියලුම අමාත්‍යාංශවලට ප්‍රදර්ශන කුටි වෙන් කර දීමක් කරනවා නම්, ඒ අමාත්‍යාංශවලට ඒ සඳහා වන ප්‍රමාණාත්මක මුදල් වෙන් කර දීමකුත් කරනවාද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඒ ප්‍රශ්නය අය වැය ලේඛනය සාකච්ඡා කරන කාලයේදී අහන්න පුළුවන්. සියලු අමාත්‍යාංශ ගැන අහන ප්‍රශ්නය ඒ වෙලාවේ අපට සාකච්ඡා කරන්න පුළුවන්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දෙවන වටය.

ප්‍රශ්න අංක 2 - 0880/'10 - (5), ගරු අජිත් පී. පෙරේරා මහතා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු කථානායකතුමනි, ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු රවුෆ් හකීම් මහතා (අධිකරණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு றவூப் ஹகீம் - நீதி அமைச்சர்)
(The Hon. Rauff Hakeem - Minister of Justice)
Mr. Speaker, I want one month's time to answer that Question.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 4 - 0977/'10 - (5), ගරු එම්.ටී. හසන් අලි මහතා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
கௌரவ எம்.ரீ. ஹஸன் அலி அவர்களின் அந்தக் கேள்வியை நான் கேட்கின்றேன்.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## ශෝක ප්‍රකාශය: ගරු ඊ.පී. පෝල් පෙරේරා මහතා
## அனுதாபத் தீர்மானம்: மாண்புமிகு ஈ. பீ. போல் பெரேரா
## VOTE OF CONDOLENCE : HON. E.P. PAUL PERERA

[අ. භා. 2.00]

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා )**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Irrigation and Water Resources Management and Leader of the House of Parliament)
ගරු කථානායකතුමනි, කඩුවෙල මැතිවරණ කොට්ඨාසයේ හා ගම්පහ දිස්ත්‍රික්කයේ ජනතාව නියෝජනය කරමින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හා අමාත්‍යවරයකු වශයෙන් වසර ගණනාවක් තිස්සේ මෙම උත්තරීතර සභාව හෙබ වූ ප්‍රවීණ දේශපාලනඥයකු වූ ජනාධිපති නීතිඥ ඊ.ඒ. පෝල් පෙරේරා මැතිතුමාගේ අභාවය පිළිබඳව ශෝකය පළ කිරීමේ යෝජනාව මම මේ අවස්ථාවේදී ගරු සභාවට ඉදිරිපත් කරන්නෙමි.

1929 ජුනි මස 29 වැනි දින මීගමුවේදී ඉලුප්පිටිය මුදියන්සේලාගේ රූපට් පෙරේරා මහතාගේත්, අරදාසිවත්ත බස්නායකගේ දෝන මේරි ඇන්ජලින් පෙරේරා මහත්මියගේත් වැඩිමහල් පුතණුවන් ලෙස ඉලුප්පිටිය මුදියන්සේලාගේ පීටර් පෝල් පෙරේරා මහතා ජන්ම ලාභය ලැබුවේය. මීගමුව මාරිස්ටෙලා විද්‍යාලයෙන් අධ්‍යාපනය ලද එතුමා එහිදී විෂය දැනුමට අමතරව පාපන්දු, ක්‍රිකට්, ජවන හා පිටිය ක්‍රීඩා සඳහා විශේෂ දස්කම් පෑවේය. ඉන් අනතුරුව කොළඹ විශ්වවිද්‍යාලයට ඇතුළත්ව ඉතිහාසය විෂයය හදාරා ගෞරව උපාධියක්ද හිමි කර ගත් අතර, විශ්වවිද්‍යාලයීය පාපන්දු කණ්ඩායමේ සාමාජිකයකු වශයෙන්ද දස්කම් දැක්වූවේය.

රාජ්‍ය ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ සහකාර ලේඛනාරක්ෂකයකු ලෙස රාජ්‍ය සේවය ඇරඹූ පෝල් පෙරේරා මහතා රජයේ ශිෂ්‍යත්වයක් මත නීති විද්‍යාලයට පිවිස, නීතිය හදාරා 1960 දී නීතිඥයකු ලෙස දිවුරුම් දුන්නේ ය. අනතුරුව වරාය සංයුක්ත මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා සහ නීති නිලධාරියා වශයෙන්ද කටයුතු කළ එතුමා, 1967 දී නීති වෘත්තියට පිවිස, රාජනීතිඥ එච්.ඩබ්ලිව්. ජයවර්ධන සහ එම්. තිරුචෙල්වම් මහත්වරුන් යටතේ කටයුතු කරමින් සාර්ථක නීතිවේදියකු වශයෙන් ප්‍රසිද්ධියට පත් වූ අතර, 1989 වර්ෂයේදී ජනාධිපති නීතිඥයකු වශයෙන්ද දිවුරුම් දුන්නේ ය.

එතුමා කුලසීලී පෙරේරා මහත්මිය සමඟින් විවාහ ජීවිතය ගත කළ අතර, පෙරේරා මහත්මිය පසු කලක බස්නාහිර පළාත් සභාවේ මන්ත්‍රීවරියක ලෙස තේරී පත්ව එහි ගරු සභාපතිනිය ලෙසද කටයුතු කළාය. රොනල්ඩ්, ආර්නල්ඩ්, හැරල්ඩ්, පුෂ්පමාලා සහ රොඩ්නි නැමැති දයාබර දූ පුතුන් පස් දෙනෙකු එම දෙපොළ මෙලොවට දායාද කළහ.

දේශපාලනමය වශයෙන් එක්සත් ජාතික පක්ෂය හා සම්බන්ධව සිටි එතුමා 1973 දී පක්ෂයේ කෘත්‍යාධිකාරි මණ්ඩලයට පත් විය. එතුමා තුළ පැවති තියුණු ඥානය හා ප්‍රබල සංවිධාන ශක්තිය එක්සත් ජාතික පක්ෂයටත්, ජාතික සේවක සංගමයටත් විශාල ශක්තියක් වූ අතර, 1977 එක්සත් ජාතික පක්ෂය ලැබූ සුවිශේෂී ජයග්‍රහණයටද එම දක්ෂතාවන් බෙහෙවින්ම ඉවහල් විය. තවද පක්ෂයටත්, ජේ.ආර්.ජයවර්ධන මහතාටත් විවිධ අභියෝගයන්ට මුහුණ දීමට සිදු වූ සෑම අවසථාවකදීම ඒවාට මුහුණ දෙමින් එතුමා දැක් වූ දැඩි කැපවීම ප්‍රශංසනීයය.

1977 ජයග්‍රහණයෙන් පසු "ටයිම්ස්" පුවත්පත් ආයතනයේ බලධාරියා ලෙසත්, ලංකා බැංකුවේ අධ්‍යක්ෂවරයකු ලෙසත්, ඉන් අනතුරුව මහ කොළඹ ආර්ථික කොමිෂමේ නියෝජ්‍ය අධ්‍යක්ෂක ජනරාල් ලෙසත් පත් වූ එතුමා එහිදී වෙළෙඳ කලාප ඉදි කිරීම සහ ඒවායේ යටිතල පහසුකම් සංවිධාන කිරීම භාරව ක්‍රියා කළේය. එම කටයුතු අරඹා වසරක් ගතවීමටත් පෙර කටුනායක කර්මාන්ත පුරවරයක් බිහි වූයේ පෙරේරා මහතා තුළ පැවැති සංවිධාන ශක්තිය නිසාමය. උපාලි විජයවර්ධන මහතාගෙන් පසුව මහ කොළඹ ආර්ථික කොමිෂමේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් පත් වූ එතුමා කඩුවෙල නව පාලම ඉදි කිරීම, බියගම ආයෝජන කලාපය පිහිටුවීම වැනි කාර්යයන්හිදී ද සුවිශේෂී දායකත්වයක් දැක්වූයේය. ඇම්.ඩී.එච්.ජයවර්ධන මැතිතුමාගේ අසනීප තත්ත්වය හේතුවෙන් 1983 වසරේ පැවැති කඩුවෙල අතුරු මැතිවරණයට තරග කොට ජයග්‍රහණය ලද පෝල් පෙරේරා මහතා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් ප්‍රථම වරට මෙම සභාවේ අසුන් ගත්තේ ය. එම වසරේදීම පොළොන්නරුව දිසා ඇමතිවරයා වශයෙන් පත් වූ එතුමා 1988 දී අධිකරණ නියෝජ්‍ය ඇමතිවරයා වශයෙන් ද, යළි එම වසරේදීම අධිකරණ ඇමතිවරයා වශයෙන් ද මහජන සේවාවේ නියැළිණි.1989 වසරේදී අත්තනගල්ල සංවිධායකවරයා වශයෙන් කටයුතු කළ එතුමා එම වසරේ පැවැති පාර්ලිමේන්තු මැතිවරණයේදී ගම්පහ දිස්ත්‍රික් මන්ත්‍රීවරයකු වශයෙන් තේරී පත් ව දෙවැනි වරටත් මෙහි අසුන් ගෙන විද්‍යා හා තාක්ෂණ රාජ්‍ය අමාත්‍යවරයා වශයෙන් ද, 1990 දී විද්‍යා හා තාක්ෂණ ව්‍යාපෘති අමාත්‍යවරයා වශයෙන් ද කටයුතු කළේය.

1993 වසරේදී ඉඩම් අමාත්‍යවරයා වශයෙන් ද කටයුතු කළ එතුමා අත්තනගල්ල උසාවිය පිහිටුවීමට හා ගම්පහ දිස්ත්‍රික්කයට එතෙක් අඩුවක්ව පැවැති කාර්මික විද්‍යාලයක් පිහිටුවීමට පියවර ගත්තේය. රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාවේත්, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේත් සභාපතිවරයා ලෙස විශාල කාර්ය භාරයක් ඉටු කළ පෙරේරා මහතා එම කාල වකවානුව තුළ ශ්‍රී ලංකාව නියෝජනය කරමින් මැලේසියාව, සිංගප්පූරුව, හොංකොං, එක්සත් රාජධානිය, ඇමෙරිකාව හා ජපානය වැනි රටවල සංචාරය කරමින් එයින් ලබා ගත් දැනුම තම රටේ සංවර්ධනය සඳහා යොදා ගැනීමට ද පියවර ගත්තේය.

උපතින් රෝමානු කතෝලිකයකු වුවත් එතුමා බෞද්ධයන් හා සංඝයා වහන්සේලා ඉතා කිට්ටුවෙන් ඇසුරු කළේය. ආගම්

භේදයකින් තොරව සැම කෙනෙකු සමඟම සහයෝගයෙන් කටයුතු කරමින් ප්‍රදේශයේ වෙහෙර විහාරස්ථාන සංවර්ධනයටත් දේවස්ථාන නඟා සිටුවීමටත් ක්‍රියා කළේය. තම නීතිඥ දැනුමත්, දේශපාලන දැනුමත් තුළින් විවිධ කාර්යයන්හි නියැළෙමින් ජනතා සේවාවක නිරතව සිටි පෝල් පෙරේරා මැතිතුමා කලක් අසනීප තත්ත්වයෙන් පසු වී වසර 78ක් ආයු වළඳා 2007 අගෝස්තු මස 11 වැනි දින කඩුවෙල ජනතාවට පමණක් නොව ගම්පහ දිස්ත්‍රික් ජනතාවටද වේදනාවක් ගෙන දෙමින් මෙලොවින් සදහටම සමු ගත්තේය.

ගරු කථානායකතුමනි, රාජ්‍ය සේවකයකු වශයෙන් ජීවිත ගමන ආරම්භ කර නීතිඥයකු වශයෙන්ද දේශපාලනඥයකු වශයෙන්ද කටයුතු කර අවසානයේ කඩුවෙල සහ ගම්පහ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙසත්, අධිකරණ, ඉඩම්, විද්‍යා හා තාක්ෂණ ආදී අමාත්‍ය තනතුරු ගණනාවක් දරමින් සුවිශේෂී මෙහෙවරක් රටටත් ජනතාවටත් ඉටු කළ ජනාධිපති නීතිඥ ඉලුප්පිටිය මුදියන්සේලාගේ පීටර් පෝල් පෙරේරා මැතිතුමාට සග මොක් සුව ප්‍රාර්ථනා කරන අතර, මෙම පාර්ලිමේන්තුවේ ශෝකය එතුමාගේ දයාබර භාර්යාව වන බස්නාහිර පළාත් සභාවේ හිටපු සභාපතිනි කුලසීලි පෙරේරා මැතිනියටත්, දූ දරුවන්ටත් පවුලේ ඥාතීන්ටත් දන්වා යවන ලෙසට යෝජනා කර සිටිමි.

[අ. භා. 2.07 ]

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**

(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - எதிர்க்கட்சி முதல்வர்)

(The Hon. Ranil Wickremasinghe - Leader of the Opposition)

ගරු කථානායකතුමනි, පෝල් පෙරේරා මැතිතුමාගේ ජීවිත කථාව අපේ සභානායකතුමා සඳහන් කළ නිසා ඒ කරුණු ගැන මා යළිත් කථා කරන්නේ නැහැ. පොල් පෙරේරා මැතිතුමා එදා ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාට පක්ෂය ජයග්‍රහණය කරා ගෙන යන්න දුන්න උදව්ව නිසාත්, මහ කොළඹ ආර්ථික කොමිසම ආරම්භ කරන්න ගත් ක්‍රියා මාර්ගය නිසාත් ලංකාවේ ඉතිහාසය වෙනස් කරන්න පුළුවන් වුණා. මමත් පෝල් පෙරේරා මැතිතුමාත් දේශපාලනයට ආවේ එකම කාලයේයි. 1972 ආධුනික අධිනීතිඥයෙක් හැටියට එච්.ඩබ්ලිව්. ජයවර්ධන මැතිතුමාත් සමඟ වැඩ කටයුතු කරන අවස්ථාවේ තමයි මට පෝල් පෙරේරා මැතිතුමා පළමුවෙන්ම මුණ ගැසුණේ. ඒ, 1972 අප්‍රේල් මාසයේයි; ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා වෙනුවෙන් දැම්ම නඩුව සඳහායි. එදා නඩු කියන්න කියා මොළය පාවිච්චි කළේ පෝල් පෙරේරා මැතිතුමා බව මා කියන්න කැමැතියි. ඊට පසු බොහෝ අවස්ථාවල ඒ නඩුව සඳහා තිරුචෙල්වම් මැතිතුමා ඉදිරිපත් වෙද්දී පෝල් පෙරේරා මැතිතුමාත් ඉදිරිපත් වුණා. එතැනදී අපි දෙන්නාටම එදා ද්‍රවිඩ දේශපාලනය පිළිබඳවත්, වඩ්ඩුකොඩ්ඩෙයි යෝජනාව පිළිබඳවත්, ඒ එක්කම ඒ කාලය තුළදී කොහොමද දෙමළ දේශපාලනය පරිවර්තනය වුණේ කියන එක පිළිබඳවත් හොඳ වැටහීමකුත් ලැබුණා.

1972 දී කැස්බෑව අතුරු මැතිවරණය සංවිධානය කිරීමේදී අපි දෙන්නා පළමු වතාවට එකතු වුණා. ඒ වාගේම ජාතික සේවක සංගමයටත් එකතු වෙලා, 1973 දී ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා අපි දෙන්නාවම කෘත්‍යාධිකාරී මණ්ඩලයට පත් කළා. එදා සිට එක්සත් ජාතික පක්ෂයේ -එදා කාලයේ- සංවිධාන කටයුතු කරන්න, විශේෂයෙන්ම නීතිමය ප්‍රශ්නවලට මුහුණ දෙන්න එතුමා පියවර කීපයක් අරගත්තා. ඒවා මම මෙතැන කියන්න වුවමනා නැහැ. සත්‍යග්‍රහ ව්‍යාපාර නවත්වන්න ගිය වෙලාවේදී උසාවියට ගිය එක, ඒ වාගේම අත්තනගල්ල මැතිවරණ ව්‍යාපාරයේදී අපි ඊට ඉස්සෙල්ලා රාත්‍රියේ ගිහින් අත්තනගල්ලේ නිවසක පදිංචි වුණු අන්දම, ඒ හැම එකකදීම වාගේ මට මතකයි, පෝල් පෙරේරා මැතිතුමාගේ ඥානය නිසා, එතුමාගේ උපක්‍රමශීලීභාවය නිසා හුඟාක් දුරට ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාට ඒ වෙලාවේ සාර්ථකව වැඩ කටයුතු කර ගන්නට පුළුවන් වුණු බව.

නීතිඥයකු හැටියට කියනවා නම්, ඒ වෙලාවේම හිතන්න පුළුවන් වුණු කෙනෙක් - he was a lawyer who was quick on his feet - නිසා තමයි ඒ කාරණාවලින් අපට වාසි ලැබුණේ.

එතුමා හුඟක් දුරට සංවිධාන ශක්තිය යෙදෙව්වා. ඒකෙන් තමයි අද පාර්ලිමේන්තුවේ සිටින මමත්, මගේ වම් පැත්තේ සිටින විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමාත්, මගේ දකුණු පැත්තේ ඉන්න හිටපු කථානායකතුමාත් අපි ඔක්කොම එකට එදා ඒ දේශපාලනය කළේ. එහෙම කරලා අන්තිමට එතුමා මැතිවරණ කාලයේදී නීතිඥ සංවිධානය මෙහෙයවන්නත් කරපු සේවය මම මතක් කරන්නම්. 1977 ජයග්‍රහණයට එතුමාගෙන් විශාල වැඩ කොටසක් සිදු වුණා කියන එක මම මෙතැන සඳහන් කරන්න කැමැතියි.

මම පාර්ලිමේන්තුවට ආවාට පස්සේ පෝල් පෙරේරා මැතිතුමා කළ පළමු වැඩ කටයුත්ත අප මතක තියා ගන්න ඕනෑ. එතුමා "ටයිම්ස්" ආයතනය භාර ගත්තා. එදා "ටයිම්ස්" ආයතනය -ලංකාදීප ආයතනය- කොළඹ මහ නගර සභාවට වරිපනම් ගෙවන්නත් බැරිව වහන්න ගිය කාලයක්. එතැනදී එතුමා ඒක භාර ගෙන කෙසේ හෝ එහි මුදල් තත්ත්වය දියුණු කළා. ඒත් වැඩි කල් යන්නට ඉස්සර ඒක භාර දීලා උපාලි විජයවර්ධන මැතිතුමා එක්ක මහ කොළඹ ආර්ථික කොමිසම ආරම්භ කරන්නට කටයුතු කළා. මම හිතන්නේ අපි උපාලි විජයවර්ධන මැතිතුමාව මතක් කරන්නට ඕනෑ. එතුමාගේ ඒ ව්‍යාපාර ඥානය නිසා තමයි එදා ඒ යෝජනාව ඉදිරිපත් කරන්න පුළුවන් වුණේ. පෝල් පෙරේරා මැතිතුමා තමයි මහ කොළඹ ආර්ථික කොමිසම සංකල්පය ක්‍රියාවට නඟන්න කියලා කටුනායක ගුවන් තොටු පොළ ඉස්සරහ තිබුණ පොල් වත්ත භාර ගත්තේ. ඒ කාලයේදී මට කියනවා, "මම මීගමුවෙන් ආවේ, මේක හොඳයි, මම දන්නවා, මේක විගහට කරන්න පුළුවන්." කියලා.

ඇත්ත වශයෙන්ම මාස කීපයකින් ඒ කලාපය ඇති කළා. ඒවාට බොහොම ලැදිව කටයුතු කළා. මට මතකයි, මේ වැඩ කටයුතු බලන්න චීනයෙන් එදා නියෝජිතයන් එව්වා. ඒ උපාලි විජේවර්ධන මුණ ගැහිලා මේ වැඩ කටයුතු බලන්න. ඒ එවූ ප්‍රධානියා ඩෙන්ෂෙයාවිපින්ගෙන් පස්සේ චීනයේ ජනාධිපති වුණේ වෙන්ෂූයි. එදා මෙරටට ඇවිල්ලා මේ කටයුතු ඉගෙන ගෙන තමයි ඒ ගොල්ලන්ගේ ඔය අනෙක් විශාල වෙළඳ කලාප ආරම්භ කරන්න ගියේ. වෙන්ෂූයිගෙන් පටන් ගෙන විශාල වෙළඳ කලාප ආරම්භ කළේ ඒකෙන් පස්සේ. ඉතින් අපේ විවෘත ආර්ථිකයේ පදනමක් වුණේ මේ වෙළඳ කලාපයි. විවෘත ආර්ථිකය පෙන්නුවේ වෙළඳ කලාපයෙන්. අපට විදුලි බලය ලබා දුන්නේ මහවැලියෙන්. වෙළඳ කලාප ඉදිරියට ගෙනිච්චේ එතුමා නිසා. බියගම වෙළඳ කලාපය හදන්න බැහැ කියලා කියන අවස්ථාවලදීත්, මේ කටයුත්ත කරන්න බැහැ කියලා UNIDO ආයතනයෙන් කියපු අවස්ථාවේදී මම එතුමාට කථා කරලා එතුමාත්, ටියුඩර් ගුණසේකර මැතිතුමාත් එකතු වෙලා අපි තමයි එදා බියගම වෙළඳ කලාපය ආරම්භ කළේ. බියගම සංවර්ධනය කරන්න එතුමාගෙන් විශාල උපකාරයක් ලැබුණා. ඒ වාගේම මුදල් ලබා දීලා එදා නොදියුණුම ප්‍රදේශය වුණු බියගම දියුණුම ප්‍රදේශය බවට පත් කරන්න මුල් වුණේ පෝල් පෙරේරා මැතිතුමා කියලා මම විශේෂයෙන් මෙතැන සඳහන් කරන්න ඕනෑ. ඒ සහයෝගය නොලැබුණා නම් අද අපට එහෙම දියුණුවක් ඒ ප්‍රදේශයේ දකින්න ලැබෙන්නේ නැහැ.

එතුමා ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා එක්ක ඉතා ලැදිව වැඩ කටයුතු කළා. මම දවසක්දා ඇහුවා, “පෝල් කොහොමද එතුමා දැන ගත්තේ?” කියලා. “මම එතුමාව දැන ගත්තේ මෙහෙමයි. 1970 පරාජයෙන් පස්සේ එතුමා අල්ලපු ගෙදර හිටියා. මම

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

ගිහිල්ලා කථා කළා'' කියා කිව්වා. මම දවසක්දා හොඳ කථාවක් කිව්වා. මම කිව්වා, "ඔබතුමා හැම එකටම එතුමා එක්ක ඉන්නේ ඒක තමයි" කියලා. "මම මීගමුවෙන් එන කතෝලිකයෙක්, මට ඉන්නේ එක දෙවියයි, එක පක්ෂයයි, එක නායකයයි, ඒ තුනම මම හොඳට ආරක්ෂා කරනවා" කියලා එදා එතුමා කිව්වා.

පෝල් පෙරේරා මැතිතුමා ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා ඉදිරියට ඇවිල්ලා ඒ කරපු කැපවීම මම විශේෂයෙන් මෙතැන සඳහන් කරනවා. මම දන්නවා, අපි ගිහිල්ලා එතුමා හම්බ වෙන කොට, කථා කරන කොට පෝල් පෙරේරා මැතිතුමාගේ කාලයෙන් බොහෝ කාලයක් යෙදවුයේ කොහොමද කියලා එතුමා ඉදිරියට ගෙනියන්න. ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා පෝල් පෙරේරා මැතිතුමාව කඩුවෙල ආසනයට පත් කළා. කඩුවෙලට පත් කරලා කඩුවෙලට ආවාම එතුමාට උදව් කරන්න මට අවස්ථාව ලැබුණා. එම්.ඩී.එච්. ජයවර්ධන මැතිතුමා අන්තිම කාලයේ අසනීප වුණ නිසා කඩුවෙල ආසනයේ නැවැත්වූ වැඩ කටයුතු පෝල් පෙරේරා මැතිතුමා යළිත් ආරම්භ කළා. ඒ ප්‍රදේශයට විදුලි බලය ලබා දීම වැනි වැඩ කටයුතු ගණනාවක් එතුමා සිද්ධ කළා.

අධ්‍යාපන අමාත්‍යාංශය මම පැලවත්තට ගෙනිච්ච නිසා හැම වෙලේම එහාට ඇවිල්ලා තමයි එතුමා යන්නේ. ඒ ප්‍රදේශයේ පාසල්වලට වුවමනා ආධාර උපකාර ලබා ගන්න, ගුරුවරු ලබා ගන්න ඒ වැඩ කටයුතු කරන්න එතුමා පැලවත්තට ආවා. ඒ හැම එකකටම එතුමා මුහුණ දුන්නා. කිසි එකකට එතුමා භය වුණේ නැහැ. කිසි එකකින් එතුමා වෙනස් වුණේ නැහැ. එතුමා සැලුණේ නැහැ. 1988 ජනාධිපතිවරණයේදී එතුමා භය නැතිව ඉදිරිපත් වෙලා ක්‍රියා කළා. එතුමා ඒ කාලයේ කරපු තවත් කර්තව්‍යයක් මම කියන්න ඕනෑ. අද ඇඟලුම් කර්මාන්තය ඇති වන්න එක හේතුවක් තමයි, එතුමා එදා ලලිත් ඇතුලත්මුදලි ඇමතිතුමා සමඟ ගිය අවස්ථාවේදී අපට quota ලබා ගන්න ගත්ත පියවර. වෙළෙඳ අමාත්‍යවරු හැම එක් කෙනාම එය අත හැරපු අවස්ථාවේදී එතුමා ඒක භාර අරගෙන කොළඹ උපාලි විජේවර්ධන මැතිතුමාට කථා කරලා, එතුමා දන්න අයටත් කථා කරලා, ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාට කථා කරලා එතැනින් තමයි අන්තිමට අපට පළමුවැනි quota එක ලැබුණේ. ඒකෙන් තමයි මේ ඇඟලුම් කර්මාන්තය දියුණු වුණේ. මේ ඇඟලුම් කර්මාන්ත වෙළෙඳ කලාපයේ ඇති කරන්න එතුමා ආධාර දුන්නු නිසා තමයි අද මේ කර්මාන්තය සාර්ථක වෙලා තිබෙන්නේ.

උපාලි විජේවර්ධන මැතිතුමා ප්‍රතිපත්තිමය වශයෙන් උදවු කරන ගමන් කණ්ඩායම් බඳවා ගැනීමේ වැඩ කටයුතු කරන්න මෙතුමා සමඟ එකතු වෙලා ක්‍රියා කළා. නැත්නම් මේ කටයුත්ත සාර්ථක වන්නේ නැහැ. දෙවැනි පියවර එතුමා බියගමින් පටන් ගත්තා. 1989 තමයි එතුමාට විශාල ප්‍රශ්නයකට මුහුණ දෙන්න සිදු වුණේ. එතුමා කොළඹ දිස්ත්‍රික්කයෙන් ඉදිරිපත් වෙන්න බලාපොරොත්තු වුණා. කෙසේ හෝ එතුමා එන එකට විරුද්ධව කොළඹ දිස්ත්‍රික්කයේ විශාල බලවේගයක් තිබුණා. මට මතකයි ප්‍රේමදාස ජනාධිපතිතුමා මගෙන් ඇහුවා, "පෝල් දාමුද ගම්පහට?" කියලා.

පෝල් පෙරේරා මැතිතුමා 1977 කාලයේදී අපේ සම්බන්ධීකරණ නිලධාරියා හැටියට ක්‍රියා කළා. පෝල් පෙරේරා මැතිතුමා එතැනට දැම්මා. එතුමාත් අත්තනගල්ලේ දේශපාලනය කොහොම හරි වෙනස් කළා. ඊට පස්සේ ඒ විධියට ඒක ආවේ නැහැ. එක විවෘත වුණා. විවෘත වුණේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට වෙන්න පුළුවන්, අපට වෙන්න පුළුවන්. ප්‍රශ්න ඇති වුණා. ඒවාට මුහුණ දුන්නා. අපි ඔක්කොම මහ මැතිවරණයට තරග කරන අවස්ථාවේදී මම ඒ ප්‍රදේශය වටේ යන ගමන් මිනිස්සුන්ගෙන් ඇහුවාම, "ඔබතුමාට ඡන්දය දෙනවා, මනාපයක් දෙනවා, ඔබතුමාට දෙනවා" කියලා ඒ අය මට කිව්වා. එතකොට මම ඇහුවා, "වෙන කාටද දෙන්නේ?" කියලා. එතකොට මෙතුමාගේ නම කිව්වා. රාජකරුණාගේ නම කිව්වා. බොහෝ දෙනෙක් මට කිව්වේ, "අපි පෝල් පෙරේරා මැතිතුමාටත් ඡන්දය දෙනවා" කියලායි. මම ඇහුවා, "එතුමාට ඡන්දය දෙන්නේ බියගම දියුණු කරපු නිසාද?" කියලා. "නැහැ, නැහැ, සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය පරද්දන්න" කියලා කිව්වා. පෝල් පෙරේරා මැතිතුමා එක පණිවුඩයකින් පස් වැනියා වුණා. ඒ පණිවුඩය විතරයි දුන්නේ. මම බියගම වටේ යන කොට මිනිස්සුන්ගෙන් මේ ප්‍රශ්න ඇහුවා. "පෝල් පෙරේරා මැතිතුමාට ඡන්දය දෙන්නේ කෙළෙහි ගුණ සලකන්න. හොඳයි, හොඳයි, එතුමා නැත්නම් බියගම දියුණු වන්නේ නැහැ" කියලා මම කිව්වාම, "නැහැ, බණ්ඩාරනායක මැතිනිය පරද්දන්න" කියලා ඒ අය කිව්වා.

මනාප ක්‍රමය තුළින් ඡන්ද කොහොමද ගන්නේ කියලා ඉස්සෙල්ලාම අපට පෙන්නලා දුන්නේ පෝල් පෙරේරා මැතිතුමායි. ඊට පස්සේ හැම එක් කෙනාම එක එක විධියට ඒ වැඩ කටයුත්ත කර ගෙන ගියා. අත්තනගල්ලේත් එතුමා විශාල සේවයක් කළා. මා එක්කත් එතුමා රාජ්‍ය ඇමති හැටියට වැඩ කටයුතු කළා. කැබිනට් ඇමතිකමින් රාජ්‍ය ඇමතිකමට වැටුණා කියලා එතුමා තුළ කිසි ප්‍රශ්නයක් තිබුණේ නැහැ.

මට මතකයි, එතුමායි අපේ සභානායකතුමායි එක්ක මට උරුගුවේ යන්න සිදු වුණා. ඒ කථා මෙතැන කියන්න බැහැ. එකක් විතරයි කියන්න පුළුවන්. ඉන්දියාවේ තමිල්නාඩුවෙන් ආපු මන්ත්‍රීතුමා මොකක්ද ප්‍රශ්නයක් ගැන දෙමළෙන් කථා කරද්දී පෝල් පෙරේරා මැතිතුමා එතුමාට දෙමළෙන් පිළිතුරු දීලා දෙමළ සාහිත්‍ය කවි ටිකක් කියන්න පටන් ගත්තා. ඒ පුද්ගලයා තමයි කුමාරමංගලම් මැතිතුමා. පසුව එතුමා BJP ආණ්ඩුවේ ඇමතිවරයෙක් බවට පත් වුණා. මම ඉන්දියාවට යන හැම වෙලේම එතුමා මගෙන් අහනවා "කොහොමද අර අපේ යහළුවා. දෙමළ කවි කියන පෙරේරා මහත්මයා ඉන්නවාද?" කියලා.

එදා ප්‍රේමදාස ජනාධිපතිතුමාට දෝශාභියෝගය ආව වෙලාවේදී පෝල් පෙරේරා මැතිතුමා මාත් එක්ක හුඟක් වැඩ කටයුතු කළා. මමයි, විජේතුංග ජනාධිපතිතුමයි එක්ක වැඩ කටයුතු කළා. ඇත්ත වශයෙන්ම මගේ අමාත්‍යාංශයේ හුඟක් එදිනෙදා වැඩ කටයුතු මම එතුමාට භාර දීලා ආර්ථික සංවර්ධන අංශය තමයි මම ඉදිරියට ගෙනිච්චේ, වැඩ කටයුතු කළේ. ඒ, ආණ්ඩුවේත්, කැබිනට් මණ්ඩලයේත්, ආර්ථික කටයුතු කොමිටියේත් සාමාජිකයෙක් හැටියට.

එතුමා ආපසු ඉඩම් ඇමති හැටියට පත් වුණා. එතුමා ඉඩම් registration ක්‍රමය, කාර්යාලය සම්පූර්ණයෙන් නවීකරණය කරන්නයි හිටියේ. ඡන්දය නිසා එතුමාට ඒ අවස්ථාව ලැබුණේ නැහැ. ඒ ඡන්දයෙන් එතුමා තරග කර පාර්ලිමේන්තු දේශපාලනයෙන් පිට වුණා. එදා අත්තනගල්ල තිබුණේ සටහන් බිමක් හැටියට. මට මතකයි එතුමාගේ පුත්‍ර රත්නයත් අත් අඩංගුවට ගත්තා. පසුව නඩු කියලා ඔහුව බේරා ගන්න අපිට පුළුවන් වුණා. එතුමා එතැන ඉඳන් හැම වෙලේම අපට අදහස් දුන්නා.

අන්තිමට ටෝකියෝ නුවර ඉඳන් එන කොට එතුමා අසනීප වුණා. අපි ජයලත් ජයවර්ධන මන්ත්‍රීතුමාට ස්තුති කරන්නට ඕනෑ. ඒ අවස්ථාවේදී එතුමා ලබා දුන් වෛද්‍ය උපදේශ නිසා පෝල් පෙරේරා මැතිතුමා ජීවතුන් අතර හිටියා. මෙහාට ඇවිල්ලා කාලයක් වැඩ කටයුතු කරලා ඉන් පසුව කෘත්‍යාධිකාරී මණ්ඩලයෙන් ඉවත් වුණා. ඒත් හැම කාරණයක් ගැනම එතුමා දුරකථනය අරගෙන කථා කරනවා, උපදෙස් දෙනවා, "මෙහෙම කරන්න. තදින් ඉන්න, මේවාට වැඩ කටයුතු කරන්න" කියලා. අන්න ඒ වාගේ උනන්දුවක් එතුමාට තමන්ගේ පක්ෂය ගැන සහ පක්ෂයේ නායකයෝ ගැන තිබුණා. එහෙම පුද්ගලයෙක් සොයා ගන්න එක ලෙහෙසි පහසු නැහැ. මම දන්නා විධියට

දේශපාලනයේදී එහෙම පුද්ගලයන් අපට ලේසියෙන් ලැබෙන්නේ නැහැ.

මේ අවස්ථාවේදී පෝල් පෙරේරා මැතිතුමා මේ රටට කළ සේවයත් මතක තබා ගන්න ඕනෑ. ඒ වාගේම එතුමා අපේ පක්ෂයේ නායකවරුන්ට කළ සේවය මතක තබා ගන්න ඕනෑ. ඒ වාගේම එතුමා පුද්ගලයෙක් හැටියට, මිතුරෙක් හැටියට මට ඉදිරි ගමන යන්න දුන්න උපදෙස්, අවවාද මම මතක තබා ගන්නවා. මම වැඩියෙන් කථා කරන්නට යන්නේ නැහැ. මට මේ අවස්ථාවේදී එතුමාගේ අවසානය ගැන කියන්න ෂේක්ස්පියර්ගේ කවියක් මතක් වුණා. ඒකෙන් මම මගේ කථාව අවසන් කරනවා. එතුමා කොයි ලෝකයේ සිටියත් මම එතුමාට සුභ ප්‍රාර්ථනා කරන ගමන් අනෙක් අයගේ ලෝකය ගැන මට හිතන්න ඕනෑ. ඒ අය හැම එක්කෙනාම ටිකක් පරිස්සමින් ඉන්න ඕනෑ. පෝල් පෙරේරා මැතිතුමා ගැන කතා කරන කොට අන්තිමට මෙම වචන ටික කියනවා.

I want to say a few words about him in English. He had one of the keenest and sharpest minds that I have seen in politics; whether in this world or in the next world, we do not know where, but that mind is still working. All I want to say now is that he was a friend who helped me in politics, and from whom I learnt many things as to how to face adversity more than any other issue. I want to quote just a few lines from a poem by William Shakespeare.
It states, I quote:

> "Fear no more the heat o' the sun;
> Nor the furious winter's rages,
> Thou thy worldly task hast done,
> Home art gone, and ta'en thy wages;"

[අ. භා. 2.21]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**

(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகால மைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)

(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු හැටියට, අමාත්‍යවරයෙක් හැටියට කටයුතු කළ ගරු ඊ.පී. පෝල් පෙරේරා මැතිතුමාගේ වියෝ වීම පිළිබඳ ශෝක යෝජනාවට අපද එක් වන්නේ එතුමාගේ ගුණ සමුදාය සිහිපත් කරමිනුයි. ගරු ඊ.පී. පෝල් පෙරේරා මැතිතුමා පළමුවරට පාර්ලිමේන්තුවට පැමිණියේ 1983 ගරු එම්.ඩී.එච්. ජයවර්ධන මැතිතුමා රෝගාතුර වීම නිසා ඉල්ලා අස්වීම ලබා දුන්නාට පස්සේයි. එතුමා පාර්ලිමේන්තුවේ පත් කරන ලද මන්ත්‍රීවරයකු හැටියට කඩුවෙල මැතිවරණ කොට්ඨාසය නියෝජනය කළා. මා ඒ අවස්ථාවේදී මහරගම මැතිවරණ කොට්ඨාසය නියෝජනය කළා. ඒ කොට්ඨාස දෙකම මායිම් වුණු නිසා නිතර දෙවේලේ කොට්ඨාසවල කටයුතුවලදී අප හමු වෙලා සාකච්ඡා කළා. මහ ජනතාවගේ ප්‍රශ්න විසඳීම සඳහා ගරු ඊ.පී. පෝල් පෙරේරා මැතිතුමාගේ තිබුණු දැඩි ඕනෑකම මේ අවස්ථාවේදී මා සිහිපත් කරනවා. එතුමා තමන්ගේ ඡන්ද දායකයන් හමු වීම කිසි විටෙක ප්‍රතික්ෂේප කළේ නැහැ. එක්සත් ජාතික පක්ෂයේ පාක්ෂිකයන් පමණක් නොව, ප්‍රතිවිරුද්ධ දේශපාලන මතධාරීන් සමඟද සාකච්ඡා කිරීමේ හැකියාවක් එතුමාට තිබුණු බව මා මේ අවස්ථාවේදී සඳහන් කරන්නේ ඉමහත් ගෞරවයෙන් යුතුවයි.

ගරු කථානායකතුමනි, ඊ.පී. පෝල් පෙරේරා මැතිතුමා රජයේ නිලධාරියෙක් හැටියට ජනසතු කරන ලද වරායේ සේවය කළ කාලයේ එහි සේවකයන් හා වෘත්තීය සමිති සමඟ කටයුතු කළ ආකාරය පිළිබඳවත්, ඒ වාගේම මගේ ආදරණීය පියා හමු වුණු අවස්ථා රාශියක් පිළිබඳවත්, ජනසතු වරායේ දියුණුව පිළිබඳවත් නිතර දෙවේලේ මා සමඟ කථා කළ බව මා මේ අවස්ථාවේදී සිහිපත් කරනවා.

එතුමා සෑම ක්ෂේත්‍රයක් සමඟම කටයුතු කර මහා අත් දැකීම් සම්භාරයක් එකතු කර ගත්, ඒ වාගේම නොයෙක් හැකියාවන් තිබුණු කෙනෙක්. යම් දෙයක් තමන්ට ප්‍රයෝජනයක් ගත හැකි දෙයක් බවට පරිවර්තනය කර ගැනීමේ බුද්ධිමය දැනුම එතුමා තුළ තිබුණා. එය එතුමා තුළ තිබුණු සුවිශේෂ ගති ගුණයක්. ඒ වාගේම ඉතාමත් දක්ෂ, තියුණු බුද්ධියකින් එතුමාට කටයුතු කරන්නට පුළුවන් වුණු බවත්, නීතිමය ක්ෂේත්‍රයේ එය විදහා පෑ අවස්ථා රාශියක් තිබෙන බවත් අපි මේ අවස්ථාවේ දී ගෞරවයෙන් සඳහන් කරන්නට ඕනෑ.

එපමණක් නොවෙයි. පෝල් පෙරේරා මැතිතුමා අමාත්‍යවරයකු හැටියට කටයුතු කරමින් නිදහස් වෙළෙඳ කලාපය සංවර්ධනය කිරීමට මහත් කාර්ය භාරයක් ඉටු කළා. ඒ වාගේම එතුමා නීතිඥවරුන්ගේ සංවිධාන ඇති කරන්නටත්, නීති ක්ෂේත්‍රයේ කටයුතු සක්‍රිය කරවා ගැනීම සඳහා දේශපාලන ක්ෂේත්‍රයේ උදවු ලබා දෙන්නටත් එක්සත් ජාතික පක්ෂයේ සිටිමින් විශාල වැඩ කොටසක් ඉටු කළා. හිටපු ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ ඉතා කිට්ටු මිත්‍රයෙක් හැටියට ඒ යුගයේ එතුමා විසින් ඉටු කළ යුතු කාර්ය භාරය ජනාධිපතිතුමාට හා එම පක්ෂයට ඉටු කළාය කියන ටික ප්‍රතිවිරුද්ධ මත දැරුවත් මා සඳහන් කරන්නට ඕනෑ.

ජෝන් අමරතුංග මැතිතුමාත්, මමත්, පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සාමාජිකයන් වියයට 1980 දශකයේ සිටි කාලයේ අපේ හිත මිත්‍ර පෝල් පෙරේරා මැතිතුමාත් එම කමිටුවේ සාමාජිකයකු හැටියට සිටියා. එතුමා රාජ්‍ය ව්‍යවසායන් ගැන ඉතාම පැහැදිලි ස්ථාවරයන්වල සිටිමින් අප සමඟ ඒ කටයුතුවලට සහභාගි වෙමින් දායාද කරපු දැනුම අපේ රාජ්‍ය සංස්ථාවලටත්, ඒ වාගේම එම ආයතන ආරක්ෂා කර ගන්නටත් උදවු වුණු බව මේ අවස්ථාවේ දී සඳහන් කිරීම මගේ යුතුකමක්.

ගරු විපක්ෂ නායකතුමා විසින් සඳහන් කරපු ආකාරයටම එතුමාගේ දක්ෂතාවන් සහ විවිධත්වයන් දියුණු කර ගැනීම සඳහා කුලසීලී පෙරේරා මැතිනිය උදවු වුණා. ඒ වාගේම ඒ පුතුන්, දියණිය ඒ ආකාරයෙන්ම තම පියාට ආඩම්බරයක් වන හැටියට කටයුතු කළ හැකි ක්ෂේත්‍රවලට සම්බන්ධ වෙමින් අද සමාජයේ වගකීම භාර ගෙන තිබෙනවා.

මගේ කථාව අවසන් කිරීමට මත්තෙන් මේ ගැනත් මා සඳහන් කරන්නට කැමැතියි. පෝල් පෙරේරා මැතිතුමා දේශපාලන කරළියේ හුඟාක් ප්‍රසිද්ධ පුද්ගලයෙක්. අපේ රටේ කනගාටුදායකම සිදු වීම ලෙස සලකන ජනමත විචාරණයක් පවත්වා මේ රටේ පාර්ලිමේන්තු මැතිවරණය කල් දැමීමෙන් මේ රටේ සර්වජන ඡන්ද ක්‍රමයට හා පාර්ලිමේන්තු මැතිවරණ ක්‍රමයට සිදු වෙච්ච ඒ ඛේදවාචකයට පෝල් පෙරේරා මැතිතුමාට ද මුහුණ දෙන්නට සිදු වුණාය කියන ටික සඳහන් කරන්නට ඕනෑ.

ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික අයිතිවාසිකම් වන පාර්ලිමේන්තු මැතිවරණය ආරක්ෂා කර ගැනීම සඳහා එදා අපි විරුද්ධ පක්ෂය හැටියට ඉදිරිපත් වන කොට, එතුමාගේ පක්ෂය නිසා එතුමාට එයට එරෙහි මතයක -විපක්ෂයේ මතයට එරෙහි මතයක- සිට කටයුතු කරන්නට සිදු වුණා. ඒ නිසා අත්තනගල්ල මැතිවරණය ප්‍රසිද්ධියට පත් වුණා. පෝල් පෙරේරා මැතිතුමා කවදාවත් සටනකින් පැනලා යන කෙනෙක් නොවෙයි. මම එකඟ වනවා,

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ එම ප්‍රකාශය සමඟ. ඒ තරම් එඩිතරකමක්, හැකියාවක්, දක්ෂකමක් එතුමාට තිබුණා. අපිත් සාමාන්‍යයෙන් සටනකින් පැනලා යන්නේ නැහැ. කවදාවත් ඉදිරියට අඩිය තැබුවා නම් ආපසු පැනලා යන්නේ නැහැ. ඒ නිසා අනිවාර්යයෙන් ඒ කාලයේ දේශපාලනය උණුසුම් වීමට, ඒ උණුසුම රට පුරා ප්‍රසිද්ධියට පත් වීමට එතුමා හේතු සාධක වුණු බවට විපක්ෂ නායකතුමා කියපු කථාව මා යළිත් සිහිපත් කරනවා. පෝල් පෙරේරා මැතිතුමාට අපේ සදා ගෞරවය මේ අවස්ථාවේ පුද කරනවා.

[අ. භා. 2.29]

**ගරු කරු ජයසූරිය මහතා**
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)

ගරු කථානායකතුමනි, මීට වසර හතරකට පෙර, 2007 අගෝස්තු 07 වැනි දින අප අතරින් වෙන් වුණු හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු පෝල් පෙරේරා මැතිතුමාගේ අභාවය පිළිබඳ ශෝක ප්‍රකාශ යෝජනාව සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කරන්නේ බලවත් ශෝකයෙන් යුතුවයි.

විශිෂ්ට දේශපාලනඥයකු වූ පෝල් පෙරේරා මැතිතුමාගේ කීර්තිමත් චරිතාපදානය සම්බන්ධයෙන් ආණ්ඩු පක්ෂය වෙනුවෙන් ගරු සභානායකතුමාත්, ඒ වාගේම විපක්ෂනායකතුමාත්, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාත් දීර්ඝ විවරණයක් කළ නිසා මා ඒ කරුණු ගැන පුන පුනා කියන්න බලාපොරොත්තු වන්නේ නැහැ.

විශේෂයෙන්ම මේ රටේ සිටි දේශපාලනඥයන් අතුරෙන් ජනතාව තුළ හෘදයංගම මතකයක් සනිටුහන් කළ දේශපාලනඥයකු වශයෙන් මා පෝල් පෙරේරා මැතිතුමාව හඳුන්වා දෙන්නට කැමැතියි. එතුමා තුළ වූ ප්‍රතිපත්ති ගරුකභාවය හා සියලු දේ කෙරෙහි පුළුල් ලෙස බැලීමට තිබූ හැකියාව මා මේ අවස්ථාවේදී විශේෂයෙන් සඳහන් කරනවා. එතුමාගේ ජීවිතය දෙස ආපසු හැරී බලද්දී, රූපට් පෙරේරා මහතාත්, දෝන මේරි බස්නායක මැතිනියත් මවු පිය දෙපළ කර ගනිමින් 1929 ජූනි මස 29 වෙනි දින උපත ලැබූ පෝල් පෙරේරා මැතිතුමා මූලික අධ්‍යාපනය ලැබූ අවධියේ සිටම දීප්තිමත් අනාගතයකට හිමිකම් කියන බව පෙන්නුම් කළ බව කියන්නට ඕනෑ. එතුමා පේරාදෙණිය විශ්වවිද්‍යාලයට ඇතුළත් වී ඉතිහාසය පිළිබඳව ගෞරව උපාධියක්ද හිමි කර ගත්තා. එතුමාගේ දක්ෂතා අධ්‍යාපන කටයුතුවලට පමණක් සීමා වුණේ නැහැ. විද්‍යාලය නියෝජනය කරමින් ඉන්දියාවේ පාපන්දු තරගවලට පවා සහභාගි වීමට එතුමාට හැකි වුණා.

ගරු කථානායකතුමනි, එතුමාගේ ජීවිත දර්ශනය තුළ වූ තවත් වැදගත් ලක්ෂණයක් ගැන අදහස් දක්වන්නට අප කැමැතියි. එතුමා උපතින් රෝමානු කතෝලිකයකු වුවා. තම බිරිඳ වූ දෝන කුලසීලි විජේරත්න මැතිනිය එතුමාට හමු වන්නේ එතුමා උපාධි අපේක්ෂකයකුව සිටියදීයි. දෝන කුලසීලි විජේරත්න මැතිනිය බොහොම වැදගත් බෞද්ධ පවුලකින් පැවත එන තැනැත්තියක්. එවකට කතෝලික බෞද්ධ ආගම් අතර විවාහයන් බහුලව සිදු වූයේ නැහැ. එවන් අවධියක කොටහේනේ ශාන්ත ලුසියා ආසන දෙව් මැඳුරේදී කුලසීලි විජේරත්න මැතිනිය සමඟ විවාහ වූ පෝල් පෙරේරා මැතිතුමා ඉන්පසුව බෞද්ධ සිරිත් විරිත් අනුවද විවාහ මංගල්‍යයේ කටයුතු සිදු කළා.

එතුමා කීර්තිමත් දරු පවුලක් බිහි කළා. එතුමාගේ බිරිඳ මෙන්ම විශේෂයෙන්ම එතුමාගේ පුතුන් හතර දෙනාත් දියණියත් සමාජයට විශාල සේවාවක් කරමින් සමාජයේ ගෞරවය ලබමින් සිටිනවා. ජ්‍යෙෂ්ඨ නීතිඥයකු වන රොනල්ඩ්, ඒ වාගේම ආර්නල්ඩ්, හැරල්ඩ්, රොඩ්නි යන පුතුන් සහ පුෂ්පා යන දියණියත් අප මේ අවස්ථාවේදී සිහිපත් කරනවා.

එතුමා තුළ කිතුණු දහම වාගේම බෞද්ධ දර්ශනය ගැනත් පුළුල් දැනීමක් තිබුණා. ඇතැම් විට උපතින්ම බෞද්ධයකු වූ අයකු තුළ තිබෙන දැනුමටත් වඩා වැඩි දැනුමක් එතුමාට තිබුණා.

ලංකා සිවිල් සේවයට ඇතුළත් වූ පෝල් පෙරේරා මැතිතුමා ප්‍රථමයෙන්ම රජයේ සේවයේ සහකාර ලේඛනාරක්ෂක තනතුරට පත් වුණා. නීති උපාධිය ලබා 1960 දී අධිනීතිඥයකු වශයෙන් දිවුරුම් දුන්නා. වරාය නීතිගත සංස්ථාවේ නීති නිලධාරි තනතුරට පත් වුණු එතුමා 1966 දී පෞද්ගලික අංශයේ සේවයට එක් වී කටයුතු කළා. සිංහල, ඉංග්‍රීසි මෙන්ම දෙමළ භාෂා ප්‍රවීණත්වය ලබා සිටි එතුමා උතුරු නැඟෙනහිර පවා නීති ක්ෂේත්‍රයේ කටයුතුවල නිරත වී සිටියා. 1988 දී ජනාධිපති නීතිඥයකු වශයෙන් දිවුරුම් දීමට කලින් රාජ නීතිඥ එච්.ඩබ්ලිව්. ජයවර්ධන, නෙවිල් සමරකෝන් හා එම්. තිරුචෙල්වම් යන ප්‍රවීණ නීතිඥවරුන් යටතේ සේවය කර මනා දක්ෂතාවක් ලබා ගත්තා.

එතුමා හිටපු එක්සත් ජාතික පක්ෂ නායක ජේ.ආර්. ජයවර්ධන මහතාගේ අසල්වැසියෙක් වශයෙන් සිටි නමුත් දේශපාලන කටයුතුවලට සම්බන්ධ වූයේ 1970 දීයි. 1970 දී ජාතික නීතිඥ සංගමය පිහිටුවා එක්සත් ජාතික පක්ෂ නීතිඥයන් යටතේ පක්ෂය යළි සංවිධානය කරද්දී එහි ලේකම් වශයෙන් එතුමා කටයුතු කළා. ජාතික නීතිඥ සංගමය එක්සත් ජාතික පක්ෂයට විශාල ශක්තියක් වුණා.

1971 වසරේදී ජේ.ආර්. ජයවර්ධන මහතාට එරෙහිව පක්ෂය විසින් නෛතික ක්‍රියා මාර්ගයක් ගන්නා අවස්ථාවේදී ජේ.ආර්. ජයවර්ධන මහතා වෙනුවෙන් කරුණු ඉදිරිපත් කළේත් පෝල් පෙරේරා මැතිතුමායි.

ඒ වාගේම 1972 දී එවකට පැවැති සමඟි පෙරමුණු රජයට එක් වීමට ජේ.ආර්. ජයවර්ධන මහතාට ආරාධනය කරනු ලැබූ අවස්ථාවේදී එම තනතුර භාර නොගන්නා ලෙසට කරුණු ඉදිරිපත් කළ අය අතර ප්‍රමුඛයා වූයේ පෝල් පෙරේරා මැතිතුමායි. 1977 එක්සත් ජාතික පක්ෂයේ ජයග්‍රහණයෙන් පසු එතුමා රජයේ ජ්‍යෙෂ්ඨ තනතුරු ගණනාවක් දැරුවා. මහ කොළඹ ආර්ථික කොමිසමේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් එතුමා විශාල කාර්ය භාරයක් ඉටු කළා. එතුමා 1982 දී මහ කොළඹ ආර්ථික කොමිසමේ දෙවැනි අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් පත් වුණා.

මට මෙතැනදී මතක් වෙනවා, එදා එතුමා යටතේ තිබුණු මහ කොළඹ ආර්ථික කොමිසම ආදර්ශවත් ස්ථානයක් වුණාය කියන එක. විපක්ෂ නායකතුමාගේ කථාවේදී කිව්වා වාගේ එදා චීන නායකයින් අපේ ආර්ථික කොමිසම දිහා බැලූ හැටි, එයින් පාඩම් ඉගෙන ගත් හැටි අපට මතකයි. අද චීනයේ ඇති වන දැවැන්ත ආර්ථික විප්ලවයේ මූලාරම්භය අපේ මහ කොළඹ ආර්ථික කොමිසමේ ක්‍රමවේදය තුළින් ලබා ගත්තාය කියා අපි විශ්වාස කරනවා. ඒ වාගේම මා තවත් කාරණයක් සඳහන් කළ යුතුයි. ඒ අවස්ථාවේ මමත් පෞද්ගලික අංශයට සම්බන්ධ වී සිටි නිසා මට මතකයි, එක් අවස්ථාවක මැලේසියාවේ අගමැති මහතීර් මොහොමඩ් මැතිතුමාත්, එම මැතිනියත් කොළඹ ආර්ථික කොමිසමට පැමිණ, පැය 4ක් පමණ එම කර්මාන්තශාලා පරීක්ෂා කරලා ඒ වැඩ කටයුතු සම්බන්ධයෙන් විශාල අධ්‍යයනයක් ලබා ගත්ත ආකාරය. ඒ නිසා චීනයට වාගේම මැලේසියාවටත් අපේ ආර්ථික කොමිසමේ ක්‍රමවේදය ආදර්ශයක් වුණා.

එතුමාගේ දේශපාලන කටයුතු සම්බන්ධයෙන් කථා කරනවා නම් එතුමා 1983 දී කඩුවෙල ආසනය නියෝජනය කරමින් පාර්ලිමේන්තුවට පත් වුණා. ඒ වාගේම 1983 වසරේදීම

පොළොන්නරුව දිසා ඇමති වශයෙන්, 1988 දී නියෝජ්‍ය අධිකරණ ඇමති වශයෙන් සහ 1989 දී ගම්පහ දිස්ත්‍රික් මන්ත්‍රීවරයකු වශයෙන් එතුමා පත් වුණා. ඒ වාගේම විද්‍යා හා තාක්ෂණ රාජ්‍ය ඇමති වශයෙන්ද එතුමා ක්‍රියා කළා.

එමෙන්ම ජනාධිපති ප්‍රේමදාස මැතිතුමාට විරුද්ධව දෝෂාභියෝග යෝජනාව ගෙන ආපු අවස්ථාවේදී එතුමාට පක්ෂව විශාල කාර්ය භාරයක් පෝල් පෙරේරා මැතිතුමා විසින් ඉටු කළා. ඒ වාගේම එතුමා 1993 දී ගරු ඩී.බී. විජේතුංග ජනාධිපතිතුමා යටතේ ඉඩම් ඇමති තනතුරට පත් වුණා. පෝල් පෙරේරා මැතිතුමා අභීත දේශපාලනඥයෙක්. ඒ වාගේම නිර්භීත දේශපාලනඥයෙක්. සත්‍ය වෙනුවෙන් පෙනී සිටි, පරිණත, ඒ වාගේම උපක්‍රමශීලී දේශපාලනඥයෙක්. ඒ වාගේම එතුමා විසින් එක්සත් ජාතික පක්ෂයට කළා වූ අපරිමිත සේවය, ඒ වාගේම සමහර අවස්ථාවල තිරය පිටුපස හිඳ ගෙන එක්සත් ජාතික පක්ෂයට එතුමා කළ සේවය අපි මේ අවස්ථාවේදී බොහොම ගෞරවයෙන් සිහිපත් කරනවා.

පෝල් පෙරේරා මැතිතුමා වැනි පරිණත දේශපාලනඥයකුගේ අවශ්‍යතාව, පුළුල් දැනුමක්, දැක්මක් ඇති ජනතා නියෝජිතයන්ගේ අවශ්‍යතාව එදාටත් වඩා අද මේ රටට දැනෙමින් තිබෙන බව සඳහන් කරමින්, එතුමාගේ වියෝව සම්බන්ධයෙන් අපගේ ශෝකය කුලසීලි පෙරේරා මැතිනියට, රොනල්ඩ්, ආර්නල්ඩ්, හැරල්ඩ්, රොඩ්නි, පුෂ්පමාලා යන දූ පුතුන් ඇතුළු පවුලේ සියලු දෙනාටම පළ කරමින් එතුමාට මොක් සුව ප්‍රාර්ථනා කරනවා.

[අ. භා. 2.38]

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා)**

(மாண்புமிகு வைத்திய கலாநிதி ராஜித சேனாரத்ன - கடற்றொழில், நீரக வளமூலங்கள் அபிவிருத்தி அமைச்சர்)

(The Hon. (Dr.) Rajitha Senaratne - Minister of Fisheries and Aquatic Resources Development)

ගරු කථානායකතුමනි, අපේ මිත්‍ර පෝල් පෙරේරා ඇමැතිතුමාගේ අභාවය ගැනයි අද අපි ශෝකය ප්‍රකාශ කරන්නේ. අපි දන්නවා පෝල් පෙරේරා මැතිතුමා කියන්නේ මීගමුවේ පුංචි රෝමයේ හොඳ කතෝලික පවුලක ඉපදුණ භක්තිමත් කතෝලිකයෙක් බව. නමුත් එතුමා විවාහ වුණේ ඉතාමත්ම හොඳ බෞද්ධ පවුලක ඉපදුණ කුලසීලි විජේරත්න මෙනෙවිය සමඟයි. එතැන් සිට එතුමාගේ ගෙදර මේ ආගම් දෙකම අදහන්නට ඉඩකඩ සැලසුණා. අදත් එතුමා වෙනුවෙන් කතෝලික පල්ලියේ පූජාව පවත්වන අතර, බෞද්ධ ස්වාමීන් වහන්සේලාට ගෙදර දානය පිළිගන්වනවා.

එතුමා බොහොම නිදහස් සිතුවිලි ඇතිව සිටි කෙනෙක්. එතුමා මේ රටේ හැම අංශයකින්ම කීර්තිමත් තත්ත්වයකට පත් වුණු කෙනෙක්. එතුමා පාසල් වියේදී ක්‍රිකට්, පාපන්දු, දුර දිවීම වැනි සියලුම ක්‍රීඩාවලට දක්ෂ, හොඳ ක්‍රීඩකයෙක්. ඒ විතරක් නොවෙයි, එදා තිබුණු අන්තර් පාඨශාලා තරගාවලියේ දී එතුමා ලංකාවේ හොඳම උස පනින්නා බවට පත් වුණා. ඒ වාගේ ඉතා හොඳ ක්‍රීඩකයෙක්. ඒ වාගේම එතුමා විශ්වවිද්‍යාලයට ගිහිල්ලාත් පාපන්දු කණ්ඩායමේ ක්‍රීඩා කළා. එතුමා ඒ විධියට ක්‍රීඩාවේ නියැළුණා.

එතුමා අධ්‍යාපනයේ කෙළ පැමිණියා. ඉතිහාසය පිළිබඳ ගෞරව උපාධියක් එතුමා ලැබුවා. විශ්වවිද්‍යාලයේදී 2වෙනි පන්තියේ ගෞරව සාමාර්ථයක් එතුමා ලැබුවා. ඒ විධියට ඇවිල්ලා එතුමා එදා තිබුණ රජයේ සිවිල් පරිපාලන -Civil Service - විභාගයට පෙනී ඉඳලා ඒක සමත් වෙලා Civil Service එකට බැඳිලා කටයුතු කළා. එතුමා නොයෙකුත් තනතුරුවල හිටියා. නමුත් 1960 අවුරුද්ද වන විට එතුමාගේ දෙමවුපියන්, නැන්දණිය, මාමණ්ඩිය ඔක්කොම විරුද්ධ වෙද්දී, එතුමා දරපු උසස් තනතුරු පැත්තකට දමලා නීතිඥ වෘත්තියට බැඳුණා. එතුමා හොඳ සිවිල් පරිපාලකයෙක් වශයෙන් ක්‍රියා කළා. එතුමා හොඳ උගතෙක් වුණා. ඊට පසුව එතුමා මේ රටේ හොඳ නීතිඥයෙක් වුණා. එතුමාට නීතිය පිළිබඳ ඉතාමත්ම තීක්ෂණ බුද්ධියක් තිබුණා. බොහෝ අයට නීතිය පිළිබඳ බුද්ධිය තිබෙනවා. නමුත් තීක්ෂණ බුද්ධිය කියන එක තිබෙන්නේ කිහිප දෙනකුට පමණයි. බොහෝ නඩුවලදී ඒ බුද්ධිමත් නීතිඥවරයාට නොපෙණුන තැන් එතුමා පෙන්වා දුන්නා. මගේ නඩුවලදී සහ අනෙකුත් අයගේ නඩුවලදීත් එවැනි අවස්ථා කිහිපයක්ම එතුමාගෙන් මම දැක්කා. බොහෝ රාජ නීතිඥවරුන් නොදැකපු දේවල් එතුමා ඒ අයට පෙන්වා දුන්නා.

පසු කාලීනව එතුමා දේශපාලනයට සම්බන්ධ වුණා. එතුමා දේශපාලනයට සම්බන්ධ වුණේ එක්සත් ජාතික පක්ෂ රජයක් බිහි වෙලා තිබුණු කාලයක නොවෙයි. එතුමාගේ දේශපාලන ගමන රෝස මල් යහනාවකින් ආපු දේශපාලන ගමනක් නොවෙයි. 1970 පරාජයෙන් පස්සේ තමයි එතුමා එක්සත් ජාතික පක්ෂයට බැඳුණේ. එසේ බැඳිලා ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාත් එක්ක ඒ පක්ෂයේ ජයග්‍රහණය සඳහා කැප වුණා. ඒ කැපවීමේදී ජේ.ආර්. ජයවර්ධන මහත්මයා පළමු වරට එක්සත් ජාතික පක්ෂයේ ජාතික නීතිඥ පෙරමුණ හදපු වෙලාවේ සිරිකොතේ දී එහි පළමුවැනි ලේකම් ධුරයට එතුමා පත් වුණා. එසේ පත් වෙලා බොහෝ දේශපාලන පළි ගැනීම්වලට ලක් වී සිටි එක්සත් ජාතික පාක්ෂිකයන් වෙනුවෙන් ඉදිරිපත් වෙලා එතුමාගේ නීතිඥ ඥානය උඩ සිය ගණනකට සහන සලසලා, නීති ආධාර පවා ලබා දීලා නැවත රැකියා ලබා දුන්නා. එතුමා ආරම්භයේ සිටම එක්සත් ජාතික පක්ෂයට එවැනි කීර්තිමත් සේවයක් ලබා දුන්නා. ඒ වාගේම එතුමා පසු කලෙක එක්සත් ජාතික පක්ෂය ජයග්‍රහණය කරන කොට ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිවරයාගේ ඉතාමත්ම කිට්ටුම මිත්‍රයකු බවට පත් වෙලා සිටියා.

මොකද, 1964 සිට ජයවර්ධන හිටපු ජනාධිපතිතුමාගේ නිවස ඉදිරිපිට තමයි එතුමා පදිංචි වෙලා සිටියේ. ඒ වෙලාවේ එතුමා ඒ පක්ෂයේ ප්‍රබලයකු විධියට ක්‍රියා කළා. 1973 වන විට "ඩඩ්ලි-ජේආර් අර්බුදය" නමින් විශාල අර්බුදයක් පක්ෂයේ ඇති වුණා. ඒ වෙලාවේ ජේ.ආර්. ජයවර්ධන මහත්මයා ශ්‍රී ලංකා නිදහස් පක්ෂ රජයට බැඳෙන්න යන විට ඒකට එරෙහිව, එතුමාගේ බොහොම කිට්ටුවන්තයකු විධියට "යන්න එපා" කියලා උපදෙස් දුන්නේ පෝල් පෙරේරා මැතිතුමායි.

ඒ විතරක් නොවෙයි. ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා පක්ෂයෙන් නෙරපා හරින්නට යෝජනාවක් ගෙනෙන්න ගියා. ඒ අවස්ථාවේදී ජේ.ආර්. ජයවර්ධන මහත්මයා දිවයිනෙන් බැහැරව යන්නයි සිටියේ. ඒ වෙලාවේ පෝල් පෙරේරා මැතිතුමා කිව්වා, "දිවයිනෙන් බැහැරව යන වෙලාවේ තමන් වෙනුවෙන් power of attorney එක කාට හෝ දීලා යන්න. මොකද ඔබතුමාව අස් කිරීමට යම් ක්‍රියාමාර්ගයක් ගන්න පුළුවන්" කියලා. නමුත් ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා කිව්වා, "නැහැ. ඩඩ්ලි මගේ මිත්‍රයා නිසා කවදාවත් එහෙම තත්ත්වයක් පක්ෂයේ ඇති වන්නේ නැහැ" කියලා. නමුත් පෝල් පෙරේරා මැතිතුමා කිව්වා, "කෝකටත් හොඳයි, ඔබතුමා තමන්ගේ power of attorney එක කාට හෝ දීලා යන්න. එහෙම වුණොත් ඔබතුමා නැති වෙලාවේදී ඔබතුමා වෙනුවෙන් නීතිමය කටයුතු කරන්න අපට පුළුවන්" කියලා. ඒ අවස්ථාවේදී ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා බොහොම අකැමැත්තෙන් power of attorney එක එතුමාගේ සහෝදරයාට දීලා ගියා. කියපු විධියටම එක්සත් ජාතික පක්ෂයේ කෘත්‍යාධිකාරි මණ්ඩලය ජේ.ආර්. ජයවර්ධන මහත්මයාව නෙරපා හැරීමේ යෝජනාව ගෙන එන්න ලෑස්ති වුණා. කෘත්‍යාධිකාරි මණ්ඩලය රැස්වීමට පෙර පෝල් පෙරේරා මැතිතුමා QC ත්‍යාගලිංගම් එක්ක සාකච්ඡා කරලා, ත්‍යාගලිංගම් මහත්මයාත් එක්ක උසාවියට ගිහින්, ජේආර්ව නෙරපීමට එරෙහිව තහනම් නියෝගයක් ගත්තා.

[ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා]

තහනම් නියෝගයක් ගත්තා විතරක් නොවෙයි, කෘත්‍යාධිකාරි මණ්ඩලයේ රැස්වීම පැවැත්වීමට මොහොතකට පෙර පෝල් පෙරේරා මැතිතුමා ගිහිල්ලා ඩඩ්ලි සේනානායක මහත්මයාට ඒ තහනම් නියෝගය දුන්නා. එදා ජේ.ආර්. ජයවර්ධන මහත්මයාට පක්ෂයේ සාමාජිකත්වය ඉතුරු වුණේ පෝල් පෙරේරා මහත්මයාගේ උපදෙස් හා එතුමා ත්‍යාගලිංගම් මහත්මයාත් එක්ක කරපු ඒ ක්‍රියාව නිසායි. ඒ වාගේ ඉතාම ශ්‍රේෂ්ඨ කාර්යභාරයක් එදා එතුමා ඒ පක්ෂය වෙනුවෙන් ඉටු කළා. ඒ විතරක් නොවෙයි. එදා "ටයිම්ස්" පුවත් පත රජයට අරගෙනයි තිබුණේ. ජේ.ආර්. ජයවර්ධන මහත්මයා බලයට පත් වුණාට පස්සේ එතුමා ඒ පුවත් පතේ ප්‍රධාන බලධාරියා බවට පත් වුණා.

මේ රටේ විවෘත ආර්ථිකය බිහි වුණාට පස්සේ මේ රටේ පළමුවන නිදහස් වෙළෙඳ කලාපය හැදුවා. ඒ නිදහස් වෙළෙඳ කලාපයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් උපාලි විජේවර්ධන මහත්මයා පත් කළ වෙලාවේ ජේ.ආර්. ජයවර්ධන මහත්මයා විසින් එහි නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් පත් කළේ පෝල් පෙරේරා මැතිතුමායි. මේ දෙදෙනා විශාල කාර්යභාරයක් කළා. අද BOI කියන ආයතනය එදා හැඳින්වූයේ මහ කොළඹ ආර්ථික කොමිසම කියලායි. ඒ යටතේ මේ රටේ පළමුවන නිදහස් වෙළෙඳ කලාපය කටුනායකත්, දෙවන නිදහස් වෙළෙඳ කලාපය බියගමත් බිහි වුණේ උපාලි සහ පෝල් යන මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙන්. උපාලි විජේවර්ධන මහත්මයා ඉවත් වුණාට පස්සේ පෝල් පෙරේරා මැතිතුමා එහි අධ්‍යක්ෂ ජනරාල්වරයා බවට පත් වුණා. එතුමාගේ කාර්යභාරය නිසා තමයි ඇමෙරිකානු කෝටාව ලංකාවට වැඩි කර ගන්න පුළුවන්කම ලැබුණේ.

පෝල් පෙරේරා මැතිතුමා 1983 දී පැවැති අතුරු මැතිවරණයෙන් ජයග්‍රහණය කරලා පාර්ලිමේන්තුවට පිවිසුණා. එම අවුරුද්දේම පොලොන්නරුව දිසා ඇමතිවරයා බවට පත් වූ එතුමා 1988 දී නියෝජ්‍ය අධිකරණ ඇමතිවරයා වශයෙන්ද, ඊට පසුව අධිකරණ ඇමතිවරයා වශයෙන්ද පත් වුණා. එතුමා අධිකරණ ඇමති ධුරය භාර ගත්තාට පසු, 1988 මැතිවරණයට පෙර, කෘත්‍යාධිකාරි මණ්ඩලයට යෝජනාවක් ගෙනාවා, ජේ.ආර්. ජයවර්ධන මහත්මයාට තුන්වන වරටත් ජනාධිපති ධුරය සඳහා තරග කිරීමට ව්‍යවස්ථා සංශෝධනයක් ගෙනෙන්නය කියලා. ඒ කාර්යය සඳහා තුන් දෙනෙක් ක්‍රියා කළා. එක් කෙනෙක් තමයි දිවංගත ලයනල් ජයතිලක මහත්මයා. අනික් දෙදෙනා තමයි දිවංගත මෙරිල් කාරියවසම් මැතිතුමා සහ දිවංගත පෝල් පෙරේරා මැතිතුමා. මෙතැන විශේෂම දේ තමයි, ඒ යෝජනාව ගෙනාපු තුන් දෙනාගෙන් පෝල් පෙරේරා මැතිතුමා විතරක් ඉතුරු වුණු එක. මෙරිල් කාරියවසම් හා ලයනල් ජයතිලක යන දෙදෙනාම ජේවීපී එකෙන් ඝාතනය කළා. ඉතුරු වුණේ පෝල් පෙරේරා මැතිතුමා විතරයි. ඒකට ප්‍රධානම හේතුව පෝල් පෙරේරා මහත්මයා ජේ.ආර්. ජයවර්ධන මහත්මයාගේ ගෙය ඉදිරිපිට ජීවත් වීමයි. ඒ කාලයේ මාර්ග බාධක දමලා ඒ මාර්ගය තහනම් කරලා තිබුණා, කාටවත් එන්න බැරි විධියට.

ඊට පස්සේ 1989 දී ගම්පහ දිස්ත්‍රික්කයෙන් තරග කරලා ජයග්‍රහණය කළ එතුමා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් තේරී පත් වුණත්, ඊට කලින් කැබිනට් ඇමතිවරයකු වශයෙන් සිටි එතුමාට ප්‍රේමදාස ආණ්ඩුවෙන් රාජ්‍ය ඇමති ධුරයක් ලබා දීලා පහළට දැමුවා. නමුත් එතුමා ඒකෙන් කලබලයට පත් වුණේ නැහැ.

මම පෝල් පෙරේරා මැතිතුමාගේ දැක්ක හොඳම, විශිෂ්ටම ගුණය මේකයි. එතුමා උස පැනීමේ දක්ෂයකු වුණත්, දේශපාලනයේදී උස පනින්න ගියේ නැහැ; දුර පනින්න ගියේ නැහැ. එන තත්ත්වයන්ට අවශ්‍ය විධියට මුහුණ දෙමින් එතුමා කටයුතු කළා. එතුමා සැලුනේ නැහැ. එතුමා බොහොම විනෝදයෙන් ඒ හැම දෙයක් දිහාම බලා ගෙන හිටියා. බොහොම සුන්දර විධියට ඒ සියල්ල දිහා බලා ගෙන සිටීමේ ශක්තියක් එතුමාට තිබුණා.

එදා රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ අභාවයෙන් පස්සේ ඩී.බී. විජේතුංග ජනාධිපතිතුමා බලයට පැමිණියා. ඊට පසුව පෝල් පෙරේරා මැතිතුමා නැවත කැබිනට් ඇමති ධුරයකින් පිදුම් ලැබුවා. මමත් දරපු ඉඩම් අමාත්‍ය ධුරයට එදා පෝල් පෙරේරා මැතිතුමා පත් වුණා. ඉඩම් විෂය පිළිබඳ විශාල ඥානයක් තිබුණ එතුමා ඉඩම් ඇමතිවරයා විධියට බොහෝ අණ පනත් ගෙන ඒමට ක්‍රියා කළා.

මෙම පාර්ලිමේන්තුවේ COPE සහ PAC යන ඒ කමිටු දෙකේම සභාපති ධුරය දරමින් රජය තුළ, ඒ ආයතන තුළ තිබුණු දූෂණවලට එරෙහිව එතුමා ක්‍රියා කළා. එතුමා මොන පක්ෂයේ හිටියත්, තමන් හිටිය පක්ෂයේ වුණත් දූෂණයට විරුද්ධව දැඩි ප්‍රතිපත්තියක හිටියා. මට මතකයි එදා මම එක්සත් ජාතික පක්ෂයේ -විපක්ෂයේ- ඉන්න කොට දිනපතා හවස හය වෙනකොට මම පෝල් පෙරේරා මැතිතුමාගේ ගෙදරට ගියා. එතුමා හවස හයට විතර කැරකෙන පුටුවේ වාඩි වෙලා මම ගෙදරට එන තුරු බලා ගෙන හිටියා.

ඒ කාලයේ තිබුණු හිල්ටන් හෝටලයේ ගනුදෙනුව පිළිබඳ ප්‍රශ්නය මට මතකයි. ඒ ගනුදෙනුව එක්සත් ජාතික පක්ෂ රජයෙන්ම, ඒ ඇමති මණ්ඩලයෙන්ම සිදු වූ දූෂිත ගනුදෙනුවක් කියලා එතුමා නොබියව ප්‍රකාශ කරමින් ඒ සඳහා පත් කරපු කොමිසම ශක්තිමත් කරන්නට -චන්ද්‍රිකා කුමාරතුංග ආණ්ඩුවෙන් ගෙනාපු කොමිසම ශක්තිමත් කරන්නට- වැඩ කොටසක් කළා. ඒ හිල්ටන් ගනුදෙනුව ගැන පාර්ලිමේන්තුවේ කථා කරන්නට, ඒ දූෂණවලට විරුද්ධව කථා කරන්නට, රජයේ තිබුණු අනෙකුත් දූෂණ පිළිබඳව කථා කරන්නට එතුමා මට හුඟක් උදව් කළා. මගේ කථා හදලා දෙන්න, ඒවාට අවශ්‍ය කරුණු ලබා දෙන්න එතුමා කටයුතු කළා. එතුමා හැම පැත්තක් පිළිබඳවම ඉතා හොඳ බුද්ධියක් -තීක්ෂණ බුද්ධියක්- තිබුණු පුද්ගලයකු බව මම දැක්කා.

එදා පැවැති රජයේ හිටපු ජනාධිපතිතුමිය මට විරුද්ධව දිගින් දිගටම නඩු පවරමින් ඉන්න කොට ඒ හැම නඩුවකටම එතුමා මට උදව් කළා. ගරු රනිල් වික්‍රමසිංහ මහත්මයා මගේ ඒ නඩු ටික බලා ගන්න කියලා භාර දුන්නේ පෝල් පෙරේරා මැතිතුමාටයි. එතුමාගේ ගෙදර තමයි ඒ නඩු පිළිබඳව සාකච්ඡා වුණේ. එදා බෙන් එලියතම්බි, චොක්සි මහත්මයා වාගේ අය එක්ක එකතු වෙලා ඒ නඩු ඔක්කෝමටම ඉදිරිපත් වෙලා මට ජයග්‍රහණය ලබා දුන්නා. මගේ ඒ ජයග්‍රහණ පිටු පසින් ඉඳ ගෙන ක්‍රියා කරපු පුද්ගලයෙක් තමයි දිවංගත පෝල් පෙරේරා මැතිතුමා.

එයාර් ලංකා ගනුදෙනුව ගැන මගේ මුළු කථාවම හැදුවේ පොල් පෙරේරා මැතිතුමාගේ ගෙදර ඉඳ ගෙනයි. ඒකට අවශ්‍ය ජාත්‍යන්තර දත්ත ඇතුළු සියලු කරුණු මට එකතු කරලා දුන්නේ පෝල් පෙරේරා මැතිතුමා. දේශපාලනයේදී වාගේම නීතිඥ වෘත්තියේදී බුද්ධිමය කරුණු ඉදිරිපත් කිරීම සඳහා විශාල හැකියාවක් එතුමාට තිබුණා. මට ඒක කිසි දවසක අමතක වෙන්නේ නැහැ.

එතුමා ජපානයේදී අසනීප වුණා. අසනීප වෙලා ලංකාවට රැගෙන එන අවස්ථාවේදී එතුමාගේ තත්ත්වය ඉතාම නරක් වුණා. ඒ වෙලාවේ වහාම ඒ ගුවන් යානය බැංකොක් ගුවන් තොටුපොළට ගොඩ බාන්න සිදු වුණා. ඒ අනුව එතුමාව බැංකොක් නුවර පෞද්ගලික ආරෝග්‍ය ශාලාවකට ගෙන ගියා. ඒ වෙලාවේදී මමත්, ජයලත් ජයවර්ධන මැතිතුමාත්, අපේ පවුල්වල සාමාජිකයෝත් තායිලන්තයට ගිහිල්ලා එතුමාව බැලුවා. එතුමා බොහොම අසාධ්‍ය තත්ත්වකයි හිටියේ. ඊට පස්සේ ජයලත් ජයවර්ධන මැතිතුමා එතුමාගේ සම්බන්ධතා පාවිච්චි කරලා තායිලන්ත රජයත් එක්ක කථා කරලා, විශාල වියදමක් දරපු

පෞද්ගලික රෝහලේ සිට රජයේ රෝහලකට එතුමාව අරගෙන ගියා. ඇත්තටම එතුමාට ජීවිතය ලබා දෙන්නට ජයලත් ජයවර්ධන මැතිතුමා බොහොම මහන්සි ගත්තා. අපි කවුරුවත් හිතුවේ නැහැ එතුමා සුවපත් වෙයි කියලා. වෛද්‍යවරු කිව්වේ, "එතුමා ගොඩ ගන්න බැහැ, එතුමා සුවපත් වුණත් vegetable එකක් වාගේ ඉදියි කිසි වැඩක් වෙන්නේ නැහැ" කියලා. එතුමාව ලංකාවට ගෙන ඒමේදී VIP එක බුක් කරලා, මමත් ජයලත් ජයවර්ධන මැතිතුමාත් ගිහිල්ලා එතුමාව ඇඳේ තියා ගෙනම මහ රෝහලට ගෙනැල්ලා එතුමාට සාත්තු කළා. එතුමා සුවපත් වුණා. මම හිතන හැටියට ඊට පසුව තවත් අවුරුදු 15ක් විතර එතුමා ජීවත් වුණා.

එදා 1994 දී එක්සත් ජාතික පක්ෂයේ පරාජයත් එක්ක එතුමා විශාල පීඩනයකට පත් වුණා. එතුමාගේ පුතාවත් හිර භාරයට ගත්තා. එතැනදී එතුමා මට කරපු උපකාරවලට ප්‍රතිඋපකාර කිරීම සඳහා මටත් අවස්ථාවක් ලැබුණා එතුමාගේ පුතාට එරෙහිව හිර ගෙදරත් දැඩි බන්ධන තිබෙද්දී මම වෛද්‍යවරුන් එක්ක එකතු වෙලා එතුමාගේ පුතා රෝහලට අරගෙන ගිහිල්ලා සාත්තු සප්පායම් කරන්නත්, ඒ කටයුතු සංවිධානය කරන්නත් කටයුතු කළා.

පුතාගේ නඩුවලදී වුණත් එතුමා තමයි පසු පස හිටපු නියම නීතිඥවරයා. අද එතුමාගේ පුතකු වන රොනල්ඩ් ඒ වාගේම හොඳ දක්ෂ නීතිඥවරයකු වශයෙන් පියාගේ ගමන යනවා. ඒ වාගේමයි අනෙක් පුතා රොඩ්නි. ඔහු රෝමයේ තානාපතිවරයා වශයෙන් කටයුතු කරනවා. කොයි රජයක් ආවත් ඒ රජයෙන් පැසසුමට ලක් වන ඉතාම හොඳ තානාපතිවරයකු වශයෙන් කටයුතු කරනවා. ඔහු යන ගමන පිටුපස තිබෙන්නේත් තාත්තාගේ බුද්ධිය. මා ඒක පැහැදිලිවම කියන්නට ඕනෑ. මොකද, අප ගරු පෝල් පෙරේරා මැතිතුමා එක්ක ටික කාලයක් හිටියාම එතුමාගේ බුද්ධියෙන් බෙහෙවින් පෝෂණය වුණා නම් ඒ දරුවන් පියාගේ බුද්ධියෙන් කොච්චර පෝෂණය වන්නට ඇත්දැයි හිතෙනවා.

ගරු කථානායකතුමනි, මා ගරු පෝල් පෙරේරා මැතිතුමා දකින්නේ මේ රටේ හිටපු, එක්සත් ජාතික පක්ෂයට හිටපු දැවන්ත යෝධයකු හැටියටයි. ඒ විතරක් නොවෙයි එතුමා ඇත් රජෙක්. නිකම්ම ඇත් රජකු නොවෙයි. පනාමුරේ ඇත් රාජයා වාගේ රජෙක්. කිසි දවසක තමන්ගේ ගෝල බාලයන් පාවා නුදුන්, අත් නොහැරපු, අවසානය දක්වා තමන්ගේ පාක්ෂිකයා වෙනුවෙන් සටන් වැදුණු, අනෙක් අය යන්න බැහැ කියපු ඕනෑම තැනකට ගිය පනාමුරේ ඇත් රාජයා වාගේ ඇත් රාජයකු වශයෙන් තමයි කවදා හරි එක්සත් ජාතික පක්ෂ ඉතිහාසයේ එතුමා හැඳින්වෙන්නේ. ඒ වාගේම එතුමා හොඳ කීර්තිමත් දේශපාලනඥයෙක්. හොඳ බුද්ධිමතෙක්. මේ රටේ හිටපු හැම අංශයකින්ම ඉහළ තත්ත්වයකට පත් වෙච්ච බුද්ධිමත් දේශපාලනඥයෙක්. එතුමාගේ ආගම අනුව එතුමාට මොක් සැප ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මම නිශ්ශබ්ද වෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනය ගන්නවා ඇති.

***අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු චන්දිම වීරක්කොඩි මහතා] මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சந்திம வீரக்கொடி] தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. SPEAKER *left the Chair, and* MR. DEPUTY SPEAKER [THE HON. CHANDIMA WEERAKKODY] *took the Chair.*

[2.55 p.m.]

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

Mr. Deputy Speaker, in 2007, when the news reached us that the Hon. E.P. Paul Perera had passed away, the country recorded that it had lost a very capable and efficient citizen of Sri Lanka, more particularly for the United National Party. Much about him was mentioned by the Ministers, the Leader of the Opposition and many Members of the Opposition and I do not wish to repeat them again.

However, we have to appreciate that the Hon. Paul Perera was a brilliant man. He was a strategist, a tactician, an efficient administrator and a shrewd politician. During his career he was able to enter the Civil Service and functioned in a very high capacity in some of the institutions such as the Port Cargo Corporation and he was the Competent Authority of the Times of Ceylon newspapers at that time. Thereafter, he entered the legal profession. Even though he had passed out as a lawyer and was a President's Counsel, he took up the practice a couple of years later and he associated himself during his tenure as a lawyer with President J.R. Jayewardene. He gave the late President all the points, which he had to touch on, in order to gain victory at the 1977 Election and finally to be the President of Sri Lanka. It was mentioned earlier that he was one of those people who prevented President J.R. Jayewardene being sacked from the United National Party. When he was away at an international conference, the Hon. Dudley Senanayake sought to throw him out of the UNP and if that happened, maybe we would not have been here today in Parliament. The Jayewardene regime owes a great debt to the Hon. Paul Perera who went in the nick of time to courts and obtained an injunction preventing Dudley Senanayake from bringing a motion to expel President J.R. Jayewardene.

Thereafter, came the Elections and the Hon. Paul Perera played a vital role to bring the United National Party to the winning post in 1977. Having done that, he took up a couple of posts. Of that, the most important post that he took up was to be the Deputy Director-General of the Greater Colombo Economic Commission. That was the turning point of the Sri Lankan economy. During the Bandaranaike regime, the country was starved of employment and foreign investment; the economy was stagnated and the people were struggling; there was no foreign exchange as people could not go abroad and people had no food to eat. It was a very difficult time at which the President J.R. Jayewardene took over and he had to find ways and means of meeting the unemployment situation that existed in the country. One of the key proposals that he wanted to implement was the building up of free trade zones in this country. Much was studied from Singapore. The Hon. Paul Perera did go to Singapore and study the nuts and bolts of what a zone

[ගරු ජෝන් අමරතුංග මහතා]

means. Even though Mr. Upali Wijewardene was the Chairman of the Greater Colombo Economic Commission, the Hon. Paul Perera was the live wire, he was the man behind the scene; he was the man who went to different parts of the world, to the Western countries, and induced investors to come to Sri Lanka and set up factories in the zones, particularly in the Katunayake Free Trade Zone, the first free trade zone in Sri Lanka.

Thereafter, over a hundred thousand young people, men and women, in Sri Lanka were employed. The unemployment stagnation was cleared and many of the people even from the far away villages came to Katunayake seeking employment. This, I think was the turning point - as mentioned by the Leader of the Opposition - of the economy of Sri Lanka. Having established the Katunayake Free Trade Zone, he took up the task of establishing the Biyagama Free Trade Zone. Biyagama was a difficult area. I was told that during that time there was no infrastructure at all in the Biyagama area and it was full of robbers, and various kinds of criminals dominated that area. However, with the establishment of the Biyagama Free Trade Zone, it became a highly developed area with new roads, frontages, and so on.

So, Sir, these are some landmarks in Sri Lankan history and in our economy. He introduced the concept of setting up free trade zones and inviting foreign investors to Sri Lanka. I remember very distinctly he often travelled to the Western world, to countries like Japan, the USA and Canada trying to attract foreign investment in order to create more industries and trading institutions in Sri Lanka, and that was a success. Even today, there are over 200,000 young boys and girls employed there, and the architect behind the creating of these zones was no other than the late Hon. Paul Perera.

As a lawyer he was very successful. I am aware of the number of cases that he was able to gain victory in whichever court he appeared. Even as a politician, he made a great contribution to the Attanagalla Electorate as was mentioned by the Leader of the House. Though the Attanagalla Electorate was represented by the Prime Minister, the basic infrastructure development was really created by no other than the Hon. Paul Perera. The court house was a blessing to the people of that area and the technical school that was established are some of the landmarks even today that we find. In that way, he, not only as an administrator but also as a politician, as a people's representative did his part and his duty. One of his ambitions was to make Sri Lanka an industrial country and develop the Sri Lankan economy.

Besides that, he made a tremendous contribution to the United National Party. One of those, I still remember as a lawyer myself, was the creation of the National Lawyers' Association. During President J.R.Jayewardene's regime and that of President R. Premadasa, the National Lawyers' Association played a very important part in party politics, which I think was an asset to our political leaders. The Hon. Paul Perera was the live wire of the National Lawyers' Association.

As one of the organizers of the Gampaha District, he was able to keep the District Group together. There were no divisions or dissensions and a proper leadership was given by the Hon. Paul Perera. There is no doubt that as the Minister of Justice with his legal background, he made a tremendous contribution towards the reforms in the judicial and the legal spheres of Sri Lanka. Many of the amendments and the Bills that are coming out today was the thinking of the Hon. E. P. Paul Perera and which he originated in the Ministry of Justice at that time.

Sir, he was a loving husband, he looked after his wife and children and so much so, that during his period as a politician, Mrs. Kulaseeli Perera was the Chairman and the Organizer of the Gampaha District and did a yeoman service to the district. I am sure she is here in the Gallery listening to the achievements of her husband and their political life would have been really exciting.

They had five children. One is Ronald Perera who is now closely following the footsteps of his father. He is one of the finest lawyers we find today practising in the Supreme Court. He is rendering a great service to the United National Party in defending the Party in all matters, when necessary, and when called upon to do so. We are very proud that the Hon. E.P. Paul Perera has produced a son, who is able to equally perform as his father did when he was a lawyer and I am sure very soon Ronald Perera will also follow his father's footsteps to enter politics.

Then, we have Rodney, one of our senior Ambassadors. He is a career diplomat who has always performed very well as mentioned by some of the Ministers and he will go further, he will climb further in the diplomatic circle. Then, his son Arnold and his daughter are also present here.

Sir, much can be said about him. I do not want to repeat all what was said by the Hon. Leader of the House and by the other Ministers. But, I have to mention that the Hon. E.P. Paul Perera was one of the finest strategists that the United National Party had in facing all problems which we had during the last 30 to 40 years. So, as I said, his demise is really a loss to the country and more particularly to the United National Party.

May his soul rest in peace!

Thank you.

[3.07 p.m.]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

*Bismillahir Rahmanir Raheem.*

Hon. Deputy Speaker, Benjamin Franklin once said, "God works wonders now and then; Behold! a lawyer, an honest man".

Today, Sir, we rise in this Parliament with a heavy heart to express our grief on the passing away of some great men, who have enriched the political life of this country. A great lawyer and an honest man, as Benjamin Franklin said, was the late Hon. E.P. Paul Perera. Today, we are also delivering our condolences on the demise of the late Hon. N.M. Buhardeen, the late Hon. Sarath Chandra Rajakaruna and also the late Hon. P.O. Wimalanaga.

We knew the Hon. E.P. Paul Perera quite well. We were intimate friends. When we used to visit Braemar at Ward Place, Colombo, the ancestral home of late President J.R. Jayewardene, the first person we met was the Hon. E.P. Paul Perera. I carry nostalgic memories of meeting him several times in the lawn of that ancestral home with late President J.R. Jayewardene and also with our good friend, Senator S.Z.M. Mashoor Moulana.

The Hon. E.P. Paul Perera could always smile, crack a joke and was very friendly.

He had a very incisive legal mind, deeply involved with legal matters. A clever lawyer himself, he used to speak to me and Mr. Mashoor Moulana in pure Tamil language. That was the finest aspect of the late Hon. Paul Perera, I should say, because he always made us feel that we were one of him and he was one of us. At every election he used to walk with Mr. J.R. Jayewardene from Ward Place to Alexandra College to cast the vote and the Hon. Paul Perera was always on his right. He, in fact I should say, emphatically guided, Mr. J.R. Jayewardene and gave him all the advice needed in law, in politics, in social activities, and in many other fields. He never faulted, he kept his steps right, walked straight as bulging as he was. He was also very straight and upright, a great man indeed!

Sir, I should record our gratitude in this House for one important thing that he did during his lifetime. When he was the Head of the Greater Colombo Economic Commission, there was a plan to put up a Haj Memorial Building closer to the Katunayake Airport in remembrance of the Hajis - the shuhadas of Indonesia - who were killed in a disastrous plane crash at Kimbulapitiya, Katunayake. Immediately after that, the Indonesian Ambassador met the then Speaker, Deshamanya Alhaj M.A. Bakeer Markar. It was such a tragic incident that we had never experienced in our lifetime in this country. There were charred bodies of 300 odd Hajis. They were like burnt logs, and we carried them under the direction of the Hon. Bakeer Markar and all the other volunteers to the vehicles to be airlifted to Kalimantan in Indonesia, where we later visited and prayed for their souls with the then Speaker. The Indonesian Ambassador approached us, they wanted a piece of land. The Minister for Religious Affairs of Indonesia came here and the Hon. Paul Perera, very generously - although he had a lot of problems - and with the persuasion of the late Upali Wijewardene, allocated a piece of land for putting up the Haj Memorial Building which you can see now just before you turn to the airport. It was a massive project initiated at that time with a prayer hall, a library for all the people and resting rooms for the Hajis who were coming from all parts of the country. Whoever who stayed there and took flights for the Haj Pilgrimage would remember forever the great act of charity done by the Hon. Paul Perera by giving that land.

Sir, I also remember visiting with him, many electorates and other areas addressing meetings. His beloved wife, Mrs. Kulaseeli Perera, the then Chairman of the Western Provincial Council also accompanied him.

He had an art of its own when dealing with people. He was like the man who came to the bridge - cannons in front, cannons behind, cannons on right and cannons on left. But, the Hon. Paul Perera, undaunted, unperturbed, arrived at the bridge and crossed the bridge. That was not only the story of his successful life but also the story of the United National Party as well. It is sometimes, unfair, Sir, to speak about him only to the work he did for the United National Party. No, he was a man more than that. He gave his advice to other deserving quarters as well. He was very patriotic. He liked this country.

He was a good Roman Catholic, and, Sir, as a result he helped to build a united nation. He did not want divisions in this country. He had many battles with others on that subject. When I mention him as a very good Catholic, Sir, I also wanted to refer today that sometimes people who do not know the vision and mission of the Hon. Paul Perera, make statements condemning even His Lordship Cardinal Malcolm Ranjith, the Archbishop of Colombo. There were statements made in the media, Sir, criticizing him, which cannot be done. I think the Hon. John Amaratunga would agree with me on that. That will be an insult to that religion, Catholicism. Sir, I knew Archbishop Cardinal Malcolm Ranjith when he was in the Maggona Seminary. He was a person of learning, who had full of mercy in him and that is why he rose to this high position. At this moment when we are remembering the Hon. Paul Perera, I should look at such a statement by our Opposition MP with revulsion. I lodge my protest against saying that he has been linked with one of our Members, the Hon. Duminda Silva, in the matter of cleaning up Colombo. The Archbishop always would want to help the people by building them houses but

[ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා]

would never want to destabilise people. He would certainly look to the needs of those people first. Now, in order to make remarks, such as, he was using trickery, is very unfair by any person to have made such blasphemous statements about the Archbishop of Colombo.

The Hon. Paul Perera succeeded Mr. M.D.H. Jayawardena in 1983 and as was said, he won the Kaduwela Electorate and also the Gampaha District. He was first the District Minister for Ponannaruwa, then the Justice Minister, the Organizer for the Attanagalla Electorate, the Minister for Science and Technology and in 1993, he became the Minister of Lands.

He was helpful in establishing the court in Attanagalla. When we confronted him in certain land matters as far as the Muslims are concerned, he was very helpful to us. Sir, when we go to him, one unique feature in him was he studied the case very well. He did not see to which community that person belonged, but always readied himself up in order to solve the problem and these cases of lands were settled amicably by him.

He spoke Tamil. He used to always call us "என்னடாப்பா! சாப்பிட்டியா? "ஐயா!" "அண்ணன் என்ன செய்கின்றாய்?" "உன்னுடைய சுகம் எப்படி!". Sir, we need that type of people in this country today - trilingualists - in order to build a harmonious and united Sri Lanka with understanding with all communities that live in this land.

Sir, once again, while concluding I would pay our respect to the Hon. Paul Perera and also convey our condolences to Madam Kulaseeli Perera, children Rodney, Ronald, Arnold, Harold and Pushpamala. I would end, Sir, by quoting an epigram by William Erskine.

It states, I quote:

"This house, where once a lawyer dwelt,
Is now a smith's. Alas!
How rapidly the iron age
Succeeds the age of brass!"

Thank you, Sir.

[අ. භා. 3.20 ]

**ගරු ලසන්ත අලගියවන්න මහතා (ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லசந்த அலகியவன்ன - நிர்மாண, பொறியியல் சேவைகள், வீடமைப்பு, பொதுவசதிகள் பிரதி அமைச்சர்)
(The Hon. Lasantha Alagiyawanna - Deputy Minister of Construction, Engineering Services, Housing and Common Amenities)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෘතහස්ත දේශපාලනඥයෙක් වශයෙන් කටයුතු කළ දිවංගත පෝල් පෙරේරා මැතිතුමාගේ අභාවය පිළිබඳව ශෝකය ප්‍රකාශ කරන මේ අවස්ථාවේදී එතුමාගේ දේශපාලන ජීවිතය තුළ අවසන් වතාවට වගකීම් දරපු මැතිවරණ බල ප්‍රදේශයේ උපන් කෙනෙක් විධියට එතුමා ගැන මමත් කෙටියෙන් හෝ වචන කිහිපයක් සඳහන් කළ යුතුව තිබෙනවා. ආණ්ඩු පක්ෂයෙනුත්, විපක්ෂයෙනුත් ඇමතිවරුන්, මන්ත්‍රීවරුන් එතුමාගේ දේශපාලන ජීවිතය පිළිබඳව, වෘත්තිමය ජීවිතය පිළිබඳව කරුණු විශාල ප්‍රමාණයක් ඉදිරිපත් කළා.

සෑම රජයකම කාල සීමාවන් තුළදී එක් එක් රජයයන් විසින් ක්‍රියාත්මක කළ ජාතික ප්‍රතිපත්ති, ප්‍රාදේශීය වශයෙන් ක්‍රියාත්මක කිරීමයි ප්‍රාදේශීය දේශපාලනඥයන් වෙත පැවරෙන කාර්යභාරය වන්නේ. ඒ අනුව අසූව දශකයේදී විශේෂයෙන්ම නිවාස වැඩ පිළිවෙළ යටතේ නිවාස යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමේදී අත්තනගල්ල මැතිවරණ බල ප්‍රදේශයේ රන්පොකුණගම නිවාස යෝජනා ක්‍රමය වැනි දැවැන්ත සංවර්ධන ව්‍යාපෘති ගණනාවක කටයුතු ඉටු කිරීමේ නායකත්වය එවකට එතුමා විසින් දැරුවා. එම නිසා විශේෂයෙන්ම එතුමා දරන ලද සියලුම අමාත්‍ය තනතුරු තුළින් අත්තනගල්ල ප්‍රමුඛ ඒ ප්‍රදේශවලට කරන ලද සේවාවන් අපි මේ අවස්ථාවේදී කෘතවේදීව සිහිපත් කරන අතර පෝල් පෙරේරා මැතිතුමාගේ අභාවය පිළිබඳව අත්තනගල්ල පුමුඛ ගම්පහ දිස්ත්‍රික්කයේ ජනතාවගේ ශෝකය එතුමාගේ ආදරණීය බිරිඳ ඇතුළු එම දරුවන් වෙත මේ අවස්ථාවේදී පළ කරමින් පෝල් පෙරේරා මැතිතුමාට මොක් සුව අත් වේවා!යි ප්‍රාර්ථනා කරනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඊළඟට ගරු ජෝශප් මයිකල් පෙරේරා මහතා.

Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා (රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன - பொது நிருவாக, உள்நாட்டலுவல்கள் அமைச்சர்)
(The Hon. W.D.J. Senewiratne - Minister of Public Administration and Home Affairs)
"ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* MR. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. ALHAJ A.H.M AZWER *took the Chair.*

[අ. භා. 3.23]

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පෝල් පෙරේරා මැතිතුමාගේ අභාවය පිළිබඳ ශෝක යෝජනාව ගැන කථා කරද්දී එතුමා පිළිබඳව මේ සභාවේ කියපු දේවල් නැවත නැවතත් කිව යුතුය

කියා මා කල්පනා කරන්නේ නැහැ. ගරු සභානායකතුමාත්, විරුද්ධ පාර්ශ්වයේ නායකතුමාත්, අනිකුත් මන්ත්‍රීවරුනුත් දිවංගත පෝල් පෙරේරා මැතිතුමා පිළිබඳව දක්වපු අදහස් ඒ ආකාරයෙන්ම අනුමත කරන්නට මටත් හැකියාව තිබෙනවා.

මා පෝල් පෙරේරා මැතිතුමාව දකින්නේ වෙනත් අංශයකිනුයි. එතුමා මීගමු පුත්‍රයෙක් හැටියට එතුමාගේ ජීවිත කාලය තුළ මීගමුවේ නම ඉතිහාස පොතේ ලියවෙන ආකාරයට කටයුතු කළා. එතුමා හොඳ රාජ්‍ය පාලකයෙක් වුණා; හොඳ නීතිවේදියෙක් වුණා; හොඳ මන්ත්‍රීවරයෙක් වුණා; හොඳ ඇමතිවරයෙක් වුණා. ඒ වාගේම හොඳ හදවතක් ඇති මනුෂ්‍යයෙක් බවට පත් වුණා.

එතුමා පවුල් සංස්ථාවක ඉතාම වාසනාවන්ත පියකු බවට පත් වුණා. මේ කාරණා සියල්ලම එකම පුද්ගලයකුට ලබා ගන්න බොහොම අමාරුයි. නමුත් එතුමාණන් ඒ සැම දෙයකින්ම ඉතා උසස්. ඒ වාගේම එතුමා දෙවියන් වහන්සේ භාර දුන් කටයුත්ත හරියාකාරව අවංකව ඉෂ්ට කරපු කෙනෙක්. අපට මතකයි එතුමා ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ කාලයේ ඉඳලා ඒ දේශපාලන ඉතිහාසය තුළ තමන්ගේ පක්ෂය, තමන්ගේ නායකයන් රැක ගෙන ඉදිරියට ගිය කෙනකු වූ බව. එවැනි දේශපාලනඥයන් අදත් ආදර්ශයට ගන්නවා නම් මේ පාර්ලිමේන්තුවටත්, මේ රටටත් ඉතාම වැදගත් කියන එකයි මගේ කල්පනාව.

මිතුරකු හැටියට, පියකු හැටියට එතුමා ගැන සඳහන් කරන කොට මා කියන්න ඕනෑ, එතුමා ආදර හදවතක් තිබුණු කෙනකු බව. අප නොදන්නා මොනවා හරි දෙයක් -කොයි අංශයෙන් හරි- ඇහුවාම ඒක බොහොම කාරුණිකව පැහැදිලි කර දෙන්නට පුළුවන් නිහතමානිකමක් අපි එතුමා තුළ දැක්කා. ඒ වාගේම අපි දන්නවා, ගරු ප්‍රේමදාස හිටපු ජනාධිපතිතුමාගේ නිවාස වැඩ පිළිවෙළේදීත් මීගමුව ජනතාවගේ ඉඩම් ප්‍රශ්නයේදීත් ගරු පෝල් පෙරේරා මැතිතුමා කොයි තරම් දුරට එඩිතරව, ක්‍රියාශීලිව කටයුතු කළාද කියලා. තමා තුළ තිබුණු ශ්‍රේෂ්ඨ අදහසක් අනුව, නිදහස් වෙළඳ කලාපය ළඟ තිබෙන ගුවන් තොටුපොළ සංවර්ධනය කිරීමේ, නිදහස් වෙළඳ කලාපය වැඩි දියුණු කිරීමේ, ඒ වාගේම එයින් ප්‍රයෝජන ලබන ප්‍රධාන නගරය හැටියට මීගමුව නගරය සංවර්ධනය කිරීමේ අඩිතාලම එතුමා දැම්මා. එක කාලයක එතුමා නිදහස් වෙළඳ කලාප තුළ -මහ කොළඹ ආර්ථික කොමිසමේ- වැඩ කරන කොට එතුමා දැක්කා කවදා හරි මීගමුව ජනතාවට බලපාන ප්‍රශ්න දෙකක්. එකක්, ගම්පහ දිස්ත්‍රික්කය තුළ "මීගමුව" ප්‍රධාන නගරයක් හැටියට ආදර්ශවත් නගරයක් හැටියට දියුණු නගරයක් හැටියට පත් කරන එක. ඒ සඳහා එතුමා අඩිතාලම දැම්මා. ඒ සංවර්ධන යෝජනා ක්‍රම එතුමා ක්‍රියාත්මක කළා. මීගමුවේ දහස් ගණනක ජනතාවට ඉඩමක අයිතිය ලබා දෙන්නට කටයුතු කරලා ඒ සියලු දෙනා සඳහාම හොඳ ජීවන තත්ත්වයක් -උසස් ජීවන තත්ත්වයක්- ගෙන දෙන්නට එතුමා කටයුතු කළා. මෙතුමා වැඩිය සද්දයක්, බද්දයක් නැතුව බොහොම නිහතමානීව තමුන් නියෝජනය කරපු අත්තනගල්ල ආසනයේත්, ගම්පහ දිස්ත්‍රික්කයේත් කොයි ආකාරයෙන්වත් නොදෙවැනි මහා විශාල වෙනසක් -සමාජයීය වෙනසක්, දේශපාලන වෙනසක්- ඇති කරපු නායකයෙක්. එතුමා බොහොම උපක්‍රමශීලිව තමුන්ගේ දේශපාලන මෙහෙවර ඉටු කළා; දේශපාලන සටන් බිමේ හැසිරුණා.

මා ඉතාම සන්තෝෂයෙන් මතක් කරනවා, ගරු විපක්ෂනායකතුමා කියපු කථාව. අපි මනාප ක්‍රමය යටතේ මැතිවරණයකට මුහුණ දුන්නා. ඒ වෙලාවේ මම ඡන්දයට ඉදිරිපත් වෙලා ජාඇල මැතිවරණ කොට්ඨාසයේ වැලිගම්පිටිය ගමට ගියා. මම එහෙම ගියාම සාමාන්‍යයෙන් ජනතාවගෙන් අහනවා කොහොමද මනාප පාවිච්චි කරන්නේ කියලා. එහෙම අහන කොට එතැන හිටි ජනතාව කිව්වේ, පළමුවැනි මනාපය පෝල් පෙරේරාට දෙනවාය කියලායි. එතකොට මමයි ජාඇල සංවිධායක. මම ඇහුවා ඒ ඇයි කියලා. එදා ජනතාවගේ සිත් තුළ මේ දේශපාලන අදහස කොයිතරම් දුරට තිබුණාද කියලා කියනවා නම් පෝල් පෙරේරාට ඡන්දය දෙන්නේ අත්තනගල්ලෙන් එන නිසා, සිරිමාවෝ බණ්ඩාරනායක පරාද කරන්න කියලා ඔවුන් කිව්වා. මේක තමයි ජනතාවගේ මතය; ජනතාවට දාපු මතය. හුහක් කෑගහලා, රණ්ඩු කරලා, පෙළපාලි ගිහිල්ලා දේශපාලනය කරනවාට වඩා ජනතාව තුළට මේ අදහස ගෙනිච්චාම එයින් ලොකු වාසියක් තිබෙනවා. මම හිතන්නේ මෙහෙම දේශපාලන දර්ශනයන්, දේශපාලන උපක්‍රමයන් එතුමාගෙන් අපි ඉගෙන ගත්ත නිසා තමයි අදත් මේ පාර්ලිමේන්තුවේ මේ ආකාරයට වැඩ කටයුතු කරන්න අපට පුළුවන් වෙලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා කොයිම දවසකවත් මේ පාර්ලිමේන්තුව තුළ කිසි කෙනෙකුගේ හිත රිදෙන්න කථා කළේ නැහැ. බැන්නත් ආපහු හිනා වෙලා ඒ අයව ජයග්‍රහණය කරන්න පුළුවන් ආකාරයට කටයුතු කළ ඉතිහාසයේ ආදර්ශවත් නායකයෙකු වුණා. එතුමා ඒ තිබ්බ සටහන අදත්, මතු පරපුරටත් මේ පාර්ලිමේන්තුව තුළින් නැවත, නැවතත් සිහිපත් කරන්නට පුළුවන් ඉතා අගනීය දේශපාලන දර්ශනයක්. මම හිතන්නේ, ඒ දේශපාලන ඉගැන්වීම, ඒ දේශපාලන හුරුව එතුමා ලබා ගත්තේ එතුමා ආශ්‍රය කරපු නායකයන්ගෙන්ය කියායි. මම මීට වඩා කථා කරන්නේ නැහැ. කතෝලිකයකු හැටියටත්, මේ සමාජයේ හිටපු ශ්‍රේෂ්ඨ පුද්ගලයකු හැටියටත් එතුමා ලස්සන පවුලක් අපට උරුම කරලා දුන්නා. එතුමාගේ දේශපාලන ජීවිතය තුළම එතුමාගේ ආදරණීය බිරිඳ පළාත් සභාවේ ඒ වාගේම අත්තනගල්ල ආසනයේ, ගම්පහ දිස්ත්‍රික්කයේ එතුමාගේ කාර්යභාරය භාර අර ගෙන නිහතමානීව කටයුතු කළ බව අපි දන්නවා. මේක මම ඉතාම ගෞරවයෙන් කියන්නට ඕනෑ. අපි දැක තිබෙන පුරුෂයාගේ බලය අතට ගත්තු සමහර දේශපාලන භාර්යාවන් ක්‍රියා කරපු ආකාරයට නොවෙයි කුලසීලි මැතිනිය ඒ වැඩ කටයුතු කළේ; ඉතාම නිහතමානීවයි. එතුමියත් අපි මේ අවස්ථාවේදී සිහිපත් කරනවා. ඒ වාගේම තම පියාගේ අඩිපාරේ යමින්, තම පියාගේ ගෞරවය අරක්ෂා කරමින් ඉතා ශ්‍රේෂ්ඨ නීතිඥයකු හැටියට කටයුතු කරන, ඒ වාගේම එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් ඕනෑම අවස්ථාවකදී ඉදිරිපත් වන, පක්ෂයේ ජයග්‍රහණය තහවුරු කරන්නට ඉදිරිපත් වෙලා වැඩ කරන රොනල්ඩ් පෙරේරා නීතිඥ මහත්මයා වැනි ශ්‍රේෂ්ඨ උසස් නිලධාරින් අපේ සමාජයට උරුම කර දී ගිය පෝල් පෙරේරා මැතිතුමා ගැනයි අපි මේ කථා කළේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, භක්තිමත් කතෝලිකයකු හැටියට, ආදර්ශවත් ස්වාමිපුරුෂයකු හැටියට, ආදරණීය පියාණන් කෙනකු හැටියට, ආදර්ශවත් දේශපාලනඥයකු හැටියට, ඉතාම ශ්‍රේෂ්ඨ නීතිඥයකු හැටියට, හිත හොඳ මනුෂ්‍යයකු හැටියට පෝල් පෙරේරා මැතිතුමන් මේ සමාජයට කළ ඒ උත්තරීතර සේවයට අපගේ කෘතඥතාවය පුද කරන අතර, ඒ ආදරණීය මැතිනියට, ඒ දරුවන්ට, ඒ වාගේම එතුමා වෙනුවෙන් ශෝක වන සියලු දෙනාටම පෞද්ගලිකව මගේත්, මගේ පවුලේත්, ගම්පහ දිස්ත්‍රික්කයේ ජනතාවගේත්, ජා-ඇල ජනතාවගේත් ශෝකය මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාටත් මා ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

[3.34 p.m.]

**ගරු රවුෆ් හකීම් මහතා (අධිකරණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு றவுப் ஹகீம் - நீதி அமைச்சர்)
(The Hon. Rauff Hakeem - Minister of Justice)

*Bismillahir Rahmanir Raheem.*

Mr. Presiding Member, I too wish to associate myself on behalf of the Sri Lanka Muslim Congress to pay tribute to one of the illustrious Members who entered politics during the J.R. Jayewardene era in this country.

[ගරු රවුෆ් හකීම් මහතා]

The late Hon. E.P. Paul Perera was a multifaceted personality who adorned very important positions. At the very outset he entered the Ceylon Civil Service, as it was then, a much coveted position in the Public Service of this country. But, his eminent qualities did not allow him to continue in the Public Service for a long time. While having been a serving member of the Public Service, he distinguished himself by passing the Attorney's final examination with first-class honours. All of us who are lawyers in this House know that anyone who is able to pass the Attorney's final examination with first-class honours is certainly a worthy material to enter the profession. He indeed displayed the qualities of a very sharp and incisive legal mind, which he brought to the practising period of him in the Bar in this country.

Having served the Bar with distinction, he entered politics during the most troublesome period for one of the principal political parties of this country. Sir, 1970s was a very challenging period for that party having lost the General Elections and given a two-thirds majority to the then governing SLFP-led coalition. His entry to UNP politics was as a Secretary of the UNP Lawyers' Association. His dedication was such that he was successful in securing a five-sixths majority for the United National Party having served as one of the three-member organizing committee for the General Elections of 1977. That unique feat enabled him to be appointed to the Greater Colombo Economic Commission initially as the Director-General (Administration) and thereafter to follow the coveted position of the Director-General after the illustrious Upali Wijewardena. Many Members before me have spoken about interesting episodes and anecdotes from his illustrious career. I do not want to repeat all those features of his political career, but certainly in his Parliamentary career, he held many portfolios.

He was a predecessor to the portfolio I am holding, the Ministry of Justice and was also the Minister in charge of Science and Technology, and the Minister of Lands subsequently. And, most importantly, this House being the primary watchdog over public finance, he was one of the worthy chairmen of the Public Accounts Committee. I, during my tenure of Chairmanship in the Public Accounts Committee, benefited much by going through the Reports that he presented as the Chairman of the Public Accounts Committee in this House.

The Hon. Paul Perera, having been dwelled in the Chambers of eminent counsels such as Mr. H.W. Jayawardene QC and Mr. M.Thiruchelvam QC, was subsequently granted silk and was appointed a President's Counsel in 1988. His incisive legal mind had helped the United National Party immensely and it is no surprise that one of his offsprings, Ronald, is presently serving the United National Party as a hard-working member for the UNP Lawyers' Association. Similarly, Rodney, another son of his, is serving in the Foreign Service as one of the senior Diplomats that we are all proud of. It is my wish that his children would follow the footsteps of his father and serve this country in the manner he served and I would like to convey, on behalf of the Sri Lanka Muslim Congress, our condolences to the family of the Hon. Paul Perera, to his wife Mrs. Kulaseeli Perera who was a former Chairperson of the Western Provincial Council, his children Ronald, Arnold, Harold, Rodney and daughter Pushpamala.

Thank you.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
( தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Thank you, Hon. Minister. May I inform the Hon. Members to be brief as possible in their speeches since we have three more Votes of Condolence to be taken up. We must be fair by the members of the families of the respective Members who passed away who are present in the gallery on invitation by the House.

The next speaker is the Hon. (Dr.) Jayalath Jayawardana.

[අ. භා. 3 .42 ]

**ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ஜயலத் ஜயவர்தன)
(The Hon. (Dr.) Jayalath Jayawardana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පෝල් පෙරේරා මැතිතුමාගේ අභාවය වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කරන මේ මොහොතේ ගම්පහ දිස්ත්‍රික්කය නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙසත්, පෝල් පෙරේරා මැතිතුමාගේ පවුලේ හිතවතෙකු ලෙසත් එතුමා පිළිබඳව වචන ස්වල්පයක් කථා කිරීම මගේ වග කීමක් සහ යුතුකමක් හැටියට මා දකිනවා.

එක්සත් ජාතික පක්ෂයේ පතාක යෝධයෙක් ලෙස, එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් හැම දාම ක්‍රියා කළ මහජන නියෝජිතයෙක්, මන්ත්‍රීවරයෙක්, ඇමතිවරයෙක්, ජනාධිපති නීතිඥවරයෙක් ලෙස පෝල් පෙරේරා මැතිතුමා අපේ එක්සත් ජාතික පක්ෂයට කරන ලද විශාල සේවය මම මේ අවස්ථාවේදී කෘතවේදීව සිහිපත් කරන්න කැමැතියි. එදා පෝල් පෙරේරා මැතිතුමා ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාගේ දර්ශනය අනුව යමින් කටුනායක නිදහස් වෙළෙඳ කලාපය, බියගම නිදහස් වෙළෙඳ කලාපය නිර්මාණය කරමින් ලක්ෂ සංඛ්‍යාත තරුණ තරුණියන්ට රැකියා ලබා දීමේ විශාල වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කළා. එක්සත් ජාතික පක්ෂ රජය තුළින් විවෘත වෙළෙඳ ආර්ථිකය වඩාත් ඵලදායී ලෙස ගමට ගෙන යමින් ගමේ තරුණ තරුණියන්ට රැකියා ලබා දෙමින් එය විපුල සේවයක් බවට පත් කරන්න පෝල් පෙරේරා මැතිතුමා ක්‍රියා කරපු ආකාරය මම මේ අවස්ථාවේදී මතක් කරන්නේ එතුමාට ගරු කිරීමක්, කළ ගුණ සැලකීමක් හැටියටයි.

පෝල් පෙරේරා මැතිතුමා එක්සත් ජාතික පක්ෂයට සැලකුවේ තමන්ගේ මවට, තමන්ගේ ආගමට, තමන්ගේ ජාතියට සලකන ආකාරයටමයි. මොන ප්‍රශ්නය මතු වුණත් එතුමා කැබිනට් ඇමතිවරයෙක් හැටියට කටයුතු කළා. පසු කලෙක එතුමා රාජ්‍ය ඇමතිවරයෙක් හැටියටත් කැබිනට් නොවන ඇමතිවරයෙක්

හැටියටත් පත් වුණා. ඒ මොන තත්ත්වයේ සැලකිල්ලක් එතුමා ලැබුවත් එතුමා එක්සත් ජාතික පක්ෂය දමා ගියේ නැහැ. එක්සත් ජාතික පක්ෂය හැල්ලුවට ලක් කළේ නැහැ. එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් එතුමා පෙනී හිටියා. එතුමා ඒ සියලුම කෙනහිලිකම් දැක්කේ, ඒවාට එතුමා මුහුණ දුන්නේ බොහොම සුන්දර විධියට කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ.

එක්සත් ජාතික පක්ෂයත් පෝල් පෙරේරා මැතිතුමාත් එක් පුද්ගලයෙක් මිසක් පුද්ගලයෝ දෙදෙනෙක් බවට පත් වුණේ නැහැ. ඒ ආභාෂය නිසාම වෙන්න ඇති, එතුමාගේ දයාබර පුත්‍ර රත්නයක් වන රොනල්ඩ් පෙරේරා ජ්‍යෙෂ්ඨ නීතිඥතුමා එක්සත් ජාතික පක්ෂයත් සමඟ ගැටෙමින්, එක්සත් ජාතික පක්ෂයේ වර්තමාන කෘත්‍යාධිකාරී මණ්ඩල සාමාජිකයෙක් ලෙස ක්‍රියා කරමින්, තමාගේ දයාබර පියාණන් ඒ පක්ෂයට ලබා දුන් දායකත්වය එතුමාත් ලබා දෙන්නට කටයුතු කරන්නේ. රොනල්ඩ් පෙරේරා මැතිතුමාත් ජනාධිපති නීතිඥයෙක් බවට පත් වන්න සියලු සුදුසුකම් තිබෙන ජ්‍යෙෂ්ඨ නීතිඥයෙක් කියන එක ගරු රවුෆ් හකීම් අධිකරණ ඇමතිතුමනි, ඔබතුමා හොඳින් දන්නවා. එතුමා ජනාධිපති නීතිඥ තනතුර ලබා ගන්නට එතුමාගේ දේශපාලන දර්ශනය වෙනස් කරන්න, ඒ දේශපාලන දර්ශනය පාවා දෙන්න එක්සත් ජාතික පක්ෂයේ දර්ශනය පාවා දෙන්න කටයුතු නොකරන තාත්තාගේ අඩි පාරේ යන පුතෙක් කියන එක මා මතක් කරන්න ඕනෑ.

එතුමාගේ ඊළඟ පුතා වන රොඩ්නි මැතිතුමා ගැනත් අපට ආඩම්බර වන්න පුළුවන්. එතුමා ශ්‍රී ලාංකීය ජනතාවට ආඩම්බර වන්න පුළුවන් රාජ්‍ය තාන්ත්‍රිකයෙක් බවට පත් වෙලා ඉන්නවා. එතුමා රෝමයේ කරපු සේවය මම දැක්කා. එතුමා නෝර්වේ රාජ්‍යයේ කරන සේවය අද අපි දකිනවා. මේ සියල්ලටම පෝල් පෙරේරා මැතිනිය -කුලසීලි පෙරේරා මැතිනිය- ඉතාමත්ම නිහතමානී කුල කාන්තාවක් ලෙස මුහුණ දුන්නා. තමාගේ දයාබර ස්වාමි පුරුෂයා ප්‍රතාපවත් ඇමතිවරයෙක් වුණත්, විධායක ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාගේ ඉතාමත්ම විශ්වසනීය මිතුරෙක් වුණත්, එතුමා වෝඩ් පෙදෙසේ පාරෙන් එහා පැත්තේ ජීවත් වුණත් කුලසීලි මැතිනිය මොන තරම් නිහතමානීව කුලවත් කාන්තාවක් හැටියට කටයුතු කළාද කියා අප දන්නවා. එදා එලීනා ජයවර්ධන මැතිනිය ක්‍රියා කළ ආකාරයට කුලසීලි මැතිනියත් ක්‍රියා කළ බව අප ඉතා හොඳින් දන්නවා.

එම නිසා තමයි අද ආණ්ඩු පක්ෂයේත් විපක්ෂයේත් සියලු දෙනාම පෝල් පෙරේරා මැතිතුමා පිළිබඳව මේ ආකාරයට ගුණ වර්ණනා කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා -ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මැතිතුමා - මුස්ලිම් ජාතිකයකු හැටියට පෝල් පෙරේරා මැතිතුමා ගැන කළ ගුණ වර්ණනාව අප දකින්නේ ඇත්තවශයෙන්ම හෘදය සාක්ෂියට එකඟව කළ ගුණ වර්ණනාවක් හැටියටයි. එතුමාගේ ඒ ගුණ සමූහය නිසා යි, අප සියලු දෙනාම පෝල් පෙරේරා මැතිතුමා ගැනත්, ඒ පවුලේ සියලු දෙනා ගැනත් මේ ආකාරයට කථා කරන්නේ. පෝල් පෙරේරා මැතිතුමාගේ දයාබර දියණිය -පුෂ්පා- ඒ වාගේම පුතුන් මේ සියලු දෙනාම අද පෝල් පෙරේරා මැතිතුමාගේ ගුණ සුවඳ දන්නා හඳුනන අයයි. එම නිසා අද ඒ පවුල, ඒ අනුව ගමන් කරන පවුලක් බවට පත් වී තිබෙනවා. ඒ මැතිනිය, දරුවෝ -ඒ පුතුන් තිදෙනා- විශේෂයෙන්ම රොනල්ඩ් මැතිතුමා අද ඒ ආකාරයට කටයුතු කරන්නේ එම නිසා යි කියන එක අප කියන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පෝල් පෙරේරා මැතිතුමා මේ රටට දුන් ආදර්ශය ඉතාම වටිනවා. එතුමා පටු දේශපාලන තනතුරු පසුපස ගියේ නැහැ. මැති ඇමතිකම් ගැන නොවෙයි සිතුවේ. එතුමා විශ්වාස කරන ආගම ගැන, එතුමාගේ කතෝලිකකම ගැන හැම දාම දැඩි විශ්වාසයෙන් හිටියා. ඒ වාගේම එතුමා විශ්වාස කරන දේශපාලන මතය අනුව මිය යන තුරුම එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් විශාල සේවයක් කළා.

මා නියෝජනය කරන දිස්ත්‍රික්කයේ -ගම්පහ දිස්ත්‍රික්කයේ- මීගමුව මැතිවරණ කොට්ඨාසයේ මීගමුවේ -එතුමා උරුම කර ගත් පුංචි රෝමයේ- නියම කතෝලිකයකු හැටියට එතුමා කළ සේවය තව චිරාත් කාලයක් මේ රටේ ජනතාව අතර පවතින බව මා විශ්වාස කරනවා.

මා අදහන ආගම අනුව, පෝල් පෙරේරා මැතිතුමා ඇදහුව ආගම අනුව එතුමාට සදාකාලික; නිත්‍ය සන්තර්පණය ප්‍රාර්ථනා කරන අතර, පෝල් පෙරේරා මැතිතුමාගේ අභාවය පිළිබඳව අපේ මේ අදහස් එතුමාගේ පවුලේ සියලු දෙනාටම විශේෂයෙන් කුලසීලි මැතිනියට, රොනල්ඩ් මැතිතුමා ප්‍රධාන ඒ පවුලේ සියලු දෙනාටම ප්‍රකාශ කරනවා. පෝල් පෙරේරා මැතිතුමාගේ සේවය නැවත වරක් අපේ රටට ලබා ගන්න එතුමාගෙන් පසුව ඒ වගකීම් භාර ගන්න රොනල්ඩ් පෙරේරා මැතිතුමා, රොඩ්නි පෙරේරා මැතිතුමා ඇතුළු ඒ දරුකැලෙන් අවස්ථාවක් ලැබේවායි ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ. භා. 3.49]

**ගරු තිලංග සුමතිපාල මහතා**
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පෝල් පෙරේරා මැතිතුමාගේ අභාවය පිළිබඳව ශෝකය පළ කරන මෙම අවස්ථාවේ විශේෂයෙන්ම එම පවුලේ දයාබර පුත්‍රවරුන් සමඟ සහ එම පවුලේ සියලු දෙනා සමඟ ඇසුරු කළ හිතවතකු හැටියට එතුමා වෙනුවෙන් යමක් එකතු කිරීම මගේ යුතුකමක් කොට මා සලකනවා.

එතුමාත් සමඟ මට සම්බන්ධ වන්නට අවස්ථාව ලැබුණේ දෙදාහේ වසර කිට්ටුවයි. ඒ නීතිමය වශයෙන් අපට උපදෙස් ලබා ගන්නට ලැබුණු අවස්ථාවකදීයි. එතුමාගේ පුත්‍ර රත්නය, රොනල්ඩ් පෙරේරා අපේ හිතවත් සහෝදරයා හමු වුණු අවස්ථාව මට මතකයි. මා ටෙලිකොම් ආයතනයේ සභාපති හැටියට සිටි කාලයේ, එම ආයතනය, ජපානයේ NTT ආයතනයට අයිති වෙලා තිබුණු වෙලාවේ අපට නීත්‍යානුකූල රැකවරණයක් තිබුණේ නැහැ. ඒ වෙලාවේ අපට උපදේශකයකු හැටියට රොනල්ඩ් පෙරේරා මැතිතුමා කිව්වේ, එතුමාගේ පියා මුණ ගැසුණා නම් අපට හොඳ අදහසක් ලබා ගන්නට පුළුවන් ය කියායි. එතුමා දුන් උපදෙස් නිසා, ඒ අවස්ථාවේ ජපානයේ පරිපාලනය යටතේ තිබුණු ටෙලිකොම් ආයතනය අපට නිදහස් කර ගන්නට ලැබුණාය කියන එක මේ ගරු සභාවට මා පැහැදිලිව කියන්නට කැමතියි. ඒ වාගේම එතුමා දීපු ඒ උපදෙස් නිසා ඕස්ට්‍රේලියානු ආයතනයක් වූ ටෙල්ස්ට්‍රා ආයතනයට අයිතිය තිබුණු මොබිටෙල් ආයතනයේත් අයිතිය සියයට සියයක්ම පවරා ගැනීමේ හැකියාව අපට ලැබුණා.

එතුමාගේ දයාබර බිරිඳ -කුලසීලී මහත්මිය- බස්නාහිර පළාත් සභාවේ සභාපතිනිය හැටියට වැඩ කරපු මහත්මියක්. ඒ පවුලේ දේශපාලන කර්තව්‍යය නියෝජනය කරපු රොනල්ඩ් මහත්මා එක්සත් ජාතික පක්ෂයේ විධායක සභාවේ සිටිනවා. මේ රොනල්ඩ්, ආර්නල්ඩ්, හැරල්ඩ්, රොඩ්නි සහ දියණිය පුෂ්පමාලා යන අයගේ දයාබර පියාණන් වූ ගරු ඊ.පී. පෝල් පෙරේරා මැතිතුමා අප මෙම අවස්ථාවේ සිහිපත් කරන්නේ කරුණු කීපයක් නිසායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ උත්තරීතර සභාවේ ගරු පෝල් පෙරේරා මැතිතුමා ගැන විශාල වශයෙන් සාකච්ඡා

[ගරු තිලංග සුමතිපාල මහතා]

වුණා. අපට මතක හුව බැලුවොත් පෙනෙනවා, එතුමා ක්‍රීඩකයෙක් හැටියට එදා යුගයේ ජවන හා පිටියේ උස පැනීම් ආදී ක්‍රීඩාවලට සම්බන්ධ වෙමින් අන්තර් පාසල් තරග නියෝජනය කළාය කියලා. ඒ වාගේම එතුමා GCEC එකේ- Greater Colombo Economic Commission - නියෝජ්‍ය ධුරයේ ඉඳලා 1982 දී එහි Director-General පදවියට පත් වුණා. ඒ යුගයේ තමයි ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ විවෘත ආර්ථික ක්‍රමය ආරම්භ වුණේ. එහිදී වෙළෙඳ පොළ ආර්ථිකය සම්පූර්ණයෙන්ම නිදහස් වෙළෙඳ කලාපයක් බවට පරිවර්තනය කළ යුගය තමයි අභියෝගාත්මක යුගය. එතුමා ඒ නිසා ඒ පරිපාලන දැනුම, විශේෂයෙන්ම නීතිමය දැනුම පාවිච්චි කරමින් අපේ රටේ එදා යුගයේ ආර්ථික සංවර්ධනයට විශාල දායකත්වයක් දුන් කෙනෙක්.

කොළඹ නගරයේ ජීවත් වෙච්ච කෙනෙක් හැටියට මට අවස්ථාව ලැබුණා පියෙක් හැටියටත්, ජ්‍යෙෂ්ඨ උපදේශකයෙක් හැටියටත් එතුමා පෞද්ගලිකව මුණ ගැහිලා කතිකාවත් ඇති කර ගන්න. මා දැක්කේ අප පරම්පරාවට උපදේශකයකු හැටියට සිටි ඒ පෝල් පෙරේරා මැතිතුමායි. එතුමා ආදර්ශවත් දේශපාලනඥයෙක්; ඉතාම සොඳුරු, නිහතමානී පුද්ගලයෙක්. එතුමා උපාධිධාරියෙක් වශයෙන් විශ්වවිද්‍යාලයෙන් පිට වෙලා පරිපාලන ක්ෂේත්‍රයට සම්බන්ධ වුණා. ඒ ගමන් මගේ ඉදිරියට යද්දි දේශපාලන නායකයෙක් හැටියට, ජනතා නියෝජිතයෙක් හැටියට සාර්ථක වෙන්න එතුමාට පුළුවන් වුණා.

අද විශේෂයෙන්ම රාජ්‍ය පරිපාලන ක්ෂේත්‍රය ගත්තොත්, රාජ්‍ය පරිපාලනයේ එවැනි පුද්ගලයන් සොයා ගන්න අපහසු තත්ත්වයක් තිබෙනවා. රාජ්‍ය පරිපාලන නිලධාරින් ඉතාම අතළොස්සක් තමයි පෝල් පෙරේරා මැතිතුමාගේ යුගයේ හිටියේ. එතුමා රාජ්‍ය පරිපාලනයට සම්බන්ධව එම ක්ෂේත්‍රයේ සාර්ථකව වැඩ කළා කියලා අපට කියන්න පුළුවන්. එතුමා මේ රටේ පුරවැසියෙක් වශයෙන් ඉපදිලා මන්ත්‍රීවරයෙක් හැටියට, ක්‍රීඩකයෙක් හැටියට, විශේෂයෙන්ම හොඳ නීතිඥයෙක් හැටියට මේ රටට විශාල සේවාවක් කළා; අත්තනගල්ල ආසනය ප්‍රමුඛ ඒ පළාතේ සංවර්ධනයට උදවු කළා. ඒ පවුලේ හිතවතෙක් හැටියට මම බොහොම කැමැත්තෙන් මේ අවස්ථාවේ ඒ අයට අපගේ ශෝකය ප්‍රකාශ කරන අතර, එතුමාගේ ආගමේ හැටියට එතුමාට මොක් සුව අත් වේවායි කියා ප්‍රාර්ථනා කරනවා. අපේ ආගමේ හැටියට එතුමාට නිවන් සුව ලැබේවායි කියාත් ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා.

[3.55 p.m.]

**ගරු රෝසි සේනානායක මහත්මිය**
( மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)

Mr. Presiding Member, today, I rise to address this House on the Vote of Condolence on the death of the Hon. Paul Perera, President's Counsel and former Member of Parliament.

Born to illustrious Christian parents in Negombo, the Hon. Paul Perera excelled in sports at his alma mater, Maris Stella College, where among many other achievements, he won the best performance award for high jump and subsequently toured India as part of the football team. After completing his primary and secondary education there, he entered the University of Ceylon, Colombo, to read for his Bachelor of Arts Degree. He graduated with an Honours Degree in History that influenced his interest in History that he held throughout his life.

It was at the university itself that he met and married the love of his life, Kulaseeli Wijeratne, a conservative Buddhist by birth. It was evident even at that time his willingness to break through barriers such as religion.

After he joined the Ceylon Civil Service, he held several important positions and during this time he benefited from the Government Scholarship Programme to study at the Law College and as a result became an advocate in 1960 serving as Legal Officer of the Port Cargo Corporation, which later became the Sri Lanka Ports Authority. He went on to private practice thereafter and became a very successful lawyer and a President's Counsel.

The Hon. Paul Perera was a lifelong supporter of the United National Party. He began closely associating with the former President J.R. Jayewardene from 1970. He was instrumental in supporting Mr. Jayewardene in the re -organization of the United National Party.

Sir, Hon. Paul Perera organized the inaugural meeting the National Lawyers' Association - the forerunner to the UNP Lawyers' Association - in August 1970 at "Sirikotha". He then, served as its First Secretary, fighting for the rights of those affected by arbitrary dismissals, as in the case of over 350 Point Controllers appointed by the CTB who were unceremoniously terminated by the then SLFP Government. He successfully represented the sacked employees at the Labour Tribunal and they were reinstated.

There were important instances where he directly assisted Mr. Jayewardene and thereby changed the course of Sri Lanka's modern history. In 1971, Mr. Jayewardene proposed that the Opposition cooperate with the Government on pressing national issues - this did not go down well with others in the party. A disciplinary committee was appointed and the findings recommended that he should be punished. Prior to leaving to attend a Commonwealth Parliamentary Conference in London, the Hon. Paul Perera insisted that Mr. Jayewardene give a power of attorney to be used in case legal action was necessary to stave off his expulsion, and Mr. Jayewardene did so. In his absence, a resolution was moved to expel Mr. Jayewardene and a meeting was fixed to consider this resolution. Acting immediately, the Hon. Paul Perera, obtained an injunction restraining the UNP from expelling him just hours before the Working Committee Meeting was to commence.

His commitment to the UNP was total and he was actively involved with the very many Sathyagraha political campaigns and other political activities from 1970-1977. When eventually the party came to power in

1977, it was a momentous occasion for the Hon. Paul Perera as he loved his country and the party. He looked down upon those who crossed over to fulfil their personal agenda. He was personally approached and requested many a time to cross over, especially in 1994, but as a true party man, he steadfastly refused to betray his principles and the loyalty towards the UNP.

Sir, As District Organizer for the Gampaha District, he was instrumental in the UNP winning 11 seats in the District. The new Government appointed him as the Competent Authority of the Times of Ceylon Newspapers and as a Director of the Bank of Ceylon. He was also the Deputy Director-General (Administration) of the GCEC - later called the Board of Investment of Sri Lanka, for which he gave up his lucrative legal practice. It was during his time that Sri Lanka's first Free Trade Zone in Katunayake and subsequently in Biyagama were established heralding the vital garment manufacturing sector that we depend so much upon today. He also worked diligently to increase the US apparel quota which was a very important achievement that earned valuable foreign exchange for Sri Lanka.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Member, you have to be brief or you may even table the rest of your speech.

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
Mr. Presiding Member, just give me two more minutes.

In recognition of his achievement, he was appointed as the Director-General of the GCEC succeeding the legendary Upali Wijewardene in 1982.

In the sphere of politics, he entered Parliament in July 1983 representing the Kaduwela Electorate and was appointed as the District Minister of Polonnaruwa in October 1983, with the special responsibility of resolving issues arising from illegal settlements in the Maduru Oya area. He was subsequently appointed as the Deputy Minister of Justice in 1988 and thereafter served as the Minister of Justice.

Despite some differences in opinion, he resisted the attempts to impeach the then President Premadasa and supported him completely. This was a reflection of his policy not to allow personal matters mar his better judgment and policies and accordingly aided by his son Ronald who functioned as a junior counsel, he took an active part in the defence of the then President Premadasa in the election petition filed against him.

He was appointed as the Cabinet Minister of Lands in August 1993 after President D.B. Wijetunga took office. He also served as the Chairman of the Committee on Public Accounts and the Committee on Public Enterprises in Parliament where his independent and fearless qualities were well respected.

Sir, I also would like to emphasize on something that matters very much to my heart. I remember that I had done an interview on TV once and the very next day I met the Hon. Paul Perera at the footsteps to "Sirikotha" and these were the very words I remember him saying: "Rosy, you were marvellous yesterday in your interview and I agree with you wholeheartedly that we should not be sending mothers who have very young children overseas as migrant workers. I opposed this when this opening came during President J.R. Jayewardene's time". He was one of those people who wanted to stop women with young children going overseas and I admire him for that because he valued family life.

The late Hon. Paul Perera's life and the legacy can be encapsulated in his favourite saying from the Bible.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Member, you may table the rest of your speech because we have very limited time. There are three other Votes of Condolence to be taken up.

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
"St. Mark's Gospel 8:36 - What does it profit a man if he gains the whole world and loses his own soul?"

I offer my condolences to his family members who are present here today.

May his soul rest in peace!

Thank you.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
The next speaker is the Hon. Gamini Lokuge. You may have only about three minutes.

[අ. භා. 4.03 ]

**ගරු ගාමිණී ලොකුගේ මහතා (කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு காமினி லொக்குகே - தொழில், தொழில் உறவுகள் அமைச்சர்)
(The Hon. Gamini Lokuge - Minister of Labour and Labour Relations)
මන්ත්‍රීතුමනි, මේ රටේ හිටපු ඉතාම ප්‍රතාපවත් දේශපාලනඥයකු වන පෝල් පෙරේරා මැතිතුමාගේඅභාවය පිළිබඳව අද මේ සභාවේදී විරුද්ධ පාර්ශ්වයත් ආණ්ඩුවත් ශෝකය ප්‍රකාශ කරන මේ මොහොතේ මටත් යුතුකමක් තිබෙනවා එතුමා

[ගරු ගාමිණී ලොකුගේ මහතා]

ගැන කථා කරන්න. එතුමාත් මමත් ඉතාම දීර්ඝ කාලයක් බොහොම කිට්ටුවෙන් ආශ්‍රය කළා.

රෝසි සේනානායක මහත්මිය කථා කරන කොට මට මතක් වුණා, අද වාගේ කාලයක් එක්සත් ජාතික පක්ෂයට එදාත් තිබුණු බව. ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාව පක්ෂයෙන් නෙරපා හරින්නට කෘත්‍යාධිකාරි මණ්ඩලයට එදා බණ්ඩාරවෙලින් ආපු නියෝජිතයකු වූ ලියනගේ යෝජනාවක් ඉදිරිපත් කළා. ඒක බේරා ගන්න නඩුව දමන්න කෙනෙක් නැතුව සිටියා. මට අද වාගේ මතකයි, අභාවප්‍රාප්ත වුණු පී.ඩී. කලුන්නාතිලක මැතිතුමා තමයි ඒ නඩුවේ පැමිණිලිකාරයා වෙලා සිටියේ. පෝල් පෙරේරා මහත්මයා ප්‍රධාන කණ්ඩායමක් තමයි අධිකරණයට ගිහිල්ලා ඒකට තහනම් නියෝගයක් ගත්තේ. මම තමයි කලුන්නාතිලක මැතිතුමාත් එක්ක සිරිකොතට ගිහිල්ලා ඒක භාර දුන්නේ. ඒ වාගේ මේ පක්ෂය ආරක්ෂා කරන්න කටයුතු කරපු ප්‍රවීණ නායකයෙක් තමයි පෝල් පෙරේරා මහත්තයා.

හැත්තෑ ගණන්වල ඉඳලා එතුමා අභාවයට පත් වන කල්ම එතුමාත් එක්ක අපි ආශ්‍රය කළා. එතුමා දුර්ලභ ගණයේ නායකයෙක්. ඒ වාගේම මේ පක්ෂය හරි මහට ගෙන යන්න හැම දාම නිවැරදි මතය කථා කරපු නායකයෙක්. අද මේ පක්ෂයට වෙලා තිබෙන්නේ එහෙම නායකයෝ නැති වීමයි. ඒ වාගේම පුද්ගලයෙක් හැටියට එතුමා ඉතාම සුහදශීලීයි. එතුමා අධිනීතිඥවරයකු හැටියටත්, මන්ත්‍රීවරයකු හැටියටත්, ඇමතිවරයකු හැටියටත්, හිතවතකු හැටියටත් ඉතාම දුර්ලභ ගණයේ ගුණාංග රාශියක් තිබුණු අයෙක්. මම එතුමාව ඉතාම කිට්ටුවෙන් ආශ්‍රය කළා. යම් කිසි ප්‍රශ්නයක් පිළිබඳව උපදේශයක් ගන්න ගියොත් ඒක නිවැරදිව ලබා දුන්නා. යමක් සාර්ථකව කරන්න හරි උපදේශය දෙන නායකයකු හැටියටයි අපි එතුමාව සලකන්නේ. එතුමා හැම කෙනකුටම ආදරය කළා; හැම කෙනකුටම උදවු කළා; ප්‍රශ්නයකදී ඒ පිළිබඳව ක්‍රියා කළා.

එතුමාගේ තිබෙන වැදගත්කම තමයි ඉතාම වැදගත් පවුලක් හැටියට පවුල් ජීවිතය ගත කළ එක. එතුමාගේ භාර්යාව වන කුලසීලි පෙරේරා මැතිනිය අපි ඉතාම කිට්ටුවෙන් ඇසුරු කළා. එතුමිය ඉතාම හොඳ කුල කාන්තාවක්. රොඩ්නි සහ රොනල්ඩ් පුත්තුත් ඒ වාගේමයි. රොනල්ඩ් නීතිඥවරයකු හැටියට අපි කිට්ටුවෙන් ආශ්‍රය කළා. අදත් ආශ්‍රය කරනවා.

ඉතාම හොඳ ප්‍රබුද්ධ ගණයේ දේශපාලනඥයෙක්, මිත්‍රයෙක්, නීතිඥයෙක්, රාජ්‍ය සේවකයෙක් හැටියට කටයුතු කළ පෝල් පෙරේරා මැතිතුමාට මේ සභාවේදී අපගේ ගෞරවය පුද කරන්නත්, ස්තුතිය ප්‍රකාශ කරන්නත්, ඒත් එක්කම එතුමාගේ අභාවය වෙනුවෙන් අපගේ ශෝකය ප්‍රකාශ කරන්නත් අපට යුතුකමක් තිබෙනවා. එතුමාගේ අභාවය වෙනුවෙන් අපගේ ශෝකය කුලසීලි මැතිනිය ඇතුළු පවුලේ සියලු දෙනාටම පළ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ. භා. 4.06]

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M.Ranjith Madduma Bandara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ හිටපු ප්‍රවීණ, දක්ෂ දේශපාලනඥයකු හැටියටත්, ඒ වාගේම දක්ෂ නීතිඥවරයකු හැටියටත් මේ රටට විශාල සේවාවක් කරපු හිටපු අමාත්‍ය පෝල් පෙරේරා මැතිතුමා ගැන කථා කරන කොට අපි කියන්න ඕනෑ, එතුමා හැම ක්ෂේත්‍රයකම බොහොම දක්ෂතා පෙන්නූ කෙනකු බව. ඒ වාගේම මේ රට වෙනුවෙන් විශාල සේවාවක් කරපු මැතිතුමකු විධියටත් එතුමාව හඳුන්වා දෙන්න පුළුවන්. එතුමා පාසල් ජීවිතයේදී බොහොම දක්ෂ ක්‍රීඩකයෙක් වාගේම, ඉගෙනීමටත් දක්ෂයෙක් වුණා. සාමාන්‍යයෙන් සමස්ත ලංකා ක්‍රීඩා තරගාවලියකට සම්බන්ධ වන්න පුළුවන්කම ලැබෙන්නේත්, ඒ තරග දිනන්න පුළුවන්කම ලැබෙන්නේත් ශිෂ්‍යයන්ගෙන් බොහොම සීමිත ගණනකට පමණයි.

1977 දී ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව බලයට ගෙනෙන කොට ඒ සඳහා ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාට ශක්තියක් දුන්නු, එතුමා ළඟින්ම හිටපු පුද්ගලයකු විධියට පෝල් පෙරේරා මැතිතුමාව හඳුන්වන්න පුළුවන්. ඒ වාගේම මේ රටේ විවෘත වෙළෙඳ පොළ ආර්ථික ක්‍රමය ගෙනාපු වෙලාවේ, මේ රටේ ආර්ථිකය වෙනස් කරපු වෙලාවේ, එතුමා ආයෝජන මණ්ඩලයේ සභාපතිවරයා විධියට විශාල කාර්ය භාරයක් ඉෂ්ට කරලා තිබෙනවා.

1983 කඩුවෙල පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා විධියට දේශපාලනයට පිවිසි ගරු පෝල් පෙරේරා මැතිතුමාට ඊ ළඟට දුන් ලොකුම අභියෝගය තමයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ බලකොටුවක් වෙලා තිබුණු අත්තනගල්ල ආසනයේ සංවිධායක ධුරය. එතුමා ඒ අභියෝගය සැහැල්ලුවෙන් භාර ගත්තා වාගේම බොහොම දක්ෂ විධියට කටයුතු කර ගම්පහ දිස්ත්‍රික් මන්ත්‍රීවරයෙක් විධියට පාර්ලිමේන්තුවට ආවා. මේ රටේ අධිකරණ ඇමතිවරයා විධියටත්, මේ රටේ විද්‍යා හා තාක්ෂණ ඇමතිවරයා විධියටත් එතුමා විශාල සේවයක් කළා. ඒ වාගේම මා අහලා තිබෙනවා, මහවැලි ව්‍යාපාරය තුළ ජනපදිකයන් පදිංචි කිරීමේදී ඒකේ විශාලම කාර්ය භාරය කරලා තිබෙන්නේ එතුමාය කියලා. ඒ වාගේම එතුමා නීතිඥ වෘත්තියේ යන්න පුළුවන් ඉහළම තැනට ගියා. එතුමාගේ දක්ෂතාවන් අගය කරමින් එතුමා ජනාධිපති නීතිඥයෙක් විධියට නම් කෙරුණා. මම හිතන්නේ එතුමා මේ රටේ දේශපාලනඥයින් අතර සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා තුනම හසුරුවන්න පුළුවන් දක්ෂ පුද්ගලයෙක් වුණා.

1989 නවක මන්ත්‍රීවරු විධියට අපි මේ පාර්ලිමේන්තුවට ආපු වෙලාවේ එතුමා මේ පාර්ලිමේන්තුවේ ජ්‍යෙෂ්ඨ ඇමතිවරයෙක් වශයෙන් සිටියා. අපිත් එක්ක සුහදත්වයෙන්, මිත්‍රත්වයෙන් එතුමා අපට උපදෙස් දුන් ආකාරය මට මේ වෙලාවේ මතක් වෙනවා. එතුමා බොහොම සැහැල්ලුවෙන්, බොහොම විනෝදයෙන් ඒ කටයුතු කළා. පාර්ලිමේන්තු ලොබියේදි අපිත් එක්ක බොහොම මිත්‍රත්වයෙන් අපට උපදෙස් දුන් ඇමතිවරයෙක් විධියට එතුමාව හඳුන්වන්න පුළුවන්.

එතුමා විතරක් නොවෙයි, එතුමාගේ දයාබර බිරිඳ කුලසීලි පෙරේරා මැතිතුමිය 1981 දිස්ත්‍රික් සංවර්ධන සභා ක්‍රමය හඳුන්වා දෙද්දි ගම්පහ දිස්ත්‍රික් සංවර්ධන සභාවේ සභාපතිවරිය විධියට පත් වුණා. ඒ වාගේම පළාත් සභාවේ සභාපතිවරිය විධියටත් පත් වුණා. එහෙනම් මේ පවුලම මේ රට වෙනුවෙන්, එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් විශාල සේවයක් කරපු අය.

ගරු පෝල් පෙරේරා මැතිතුමා මේ රටටත්, ඉස්සෙල්ලා කථා කරපු අපේ ගරු මන්ත්‍රීවරු කිව්වා වාගේම එක්සත් ජාතික පක්ෂයේ පැවැත්මටත්, එක්සත් ජාතික පක්ෂයේ අනාගතයටත් විශාල වැඩ කොටසක් කරපු ඇමතිවරයෙක්. අද එතුමාගේ ගුණ සිහිපත් කරන වෙලාවේ මම මතක් කරන්න ඕනෑ, එතුමාගේ ජ්‍යෙෂ්ඨ පුත්‍ර රත්නය වන රොනල්ඩ් පෙරේරා මැතිතුමා අද මේ රටේ දක්ෂ නීතිඥයෙක් විධියට නීති ක්ෂේත්‍රයේ නියැළී ඉන්නා ගමන්ම එක්සත් ජාතික පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලයේ සභිකයෙක් විධියට අවුරුදු ගණනාවක් තිස්සේ කටයුතු කරන බව. ගරු පෝල් පෙරේරා මැතිතුමා වියෝ වීමෙන් එක්සත් ජාතික පක්ෂයට වූ එම පාඩුව පිරිමසමින් රොනල්ඩ් පෙරේරා මැතිතුමා

අද කටයුතු කරනවා. කුලසීලි පෙරේරා මැතිනියටත්, රොනල්ඩ් පෙරේරා මැතිතුමා ඇතුළු ඒ දූ දරුවන්ටත් අපේ ශෝකය ප්‍රකාශ කරමින් අපේ හිතවත් ගරු පෝල් පෙරේරා ඇමැතිතුමාට මා මොක් සුව ප්‍රාර්ථනා කරනවා.

[අ. භා. 4.12]

**ගරු සුජීව සේනසිංහ මහතා**
( மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොහොම ස්තුතියි. ගරු පෝල් පෙරේරා මැතිතුමා දේශපාලන ඉතිහාසයේ පතාක යෝධයෙක්, ඒ වාගේම දක්ෂ ජනාධිපති නීතිඥවරයෙක්, ඒ වාගේම එක්සත් ජාතික පක්ෂයට ආදරය කරපු පාක්ෂිකයෙක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද කථිකයන් බොහෝ දෙනෙක් ගරු පෝල් පෙරේරා මැතිතුමා සම්බන්ධයෙන් කථා කිරීමට ඉදිරිපත් වීම නිසා මගේ කථාව කෙටි කරන්නට මට සිදු වෙනවා. කෙසේ වෙතත් අද විශේෂ දවසක්.

අද දින එතුමාව සිහිපත් කරන්න මන්ත්‍රීවරුන් අතරින් අපට භාග්‍යය ලැබී තිබෙනවා. 2007 වසරේ අගෝස්තු 11වැනි දා අප අතරින් වෙන් වූ එතුමාව සිහිපත් කරන්න විශේෂ දවසක් වූ අද - අගෝස්තු 11වැනි දා- මේ අවස්ථාව අපට ලැබීම පෝල් පෙරේරා මැතිතුමාගේ පවුලේ සියලු දෙනාටම වාගේම මේ පාර්ලිමේන්තුවේ ඉන්න අප සියලු දෙනාටම විශේෂ අවස්ථාවක්.

පෝල් පෙරේරා මැතිතුමා දේශපාලනයට සම්බන්ධ වුණු ආකාරයත්, එතුමා නීති වෘත්තියට සම්බන්ධ වුණු ආකාරයත් ගැන මැති ඇමතිවරුන් කිහිප දෙනෙකුම අදහස් දැක්වූ නිසා ඒ සම්බන්ධයෙන් අමුතුවෙන් අදහස් දක්වන්න මා මේ අවස්ථාවේ බලාපොරොත්තු වන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කෙටි දේශපාලන ජීවිතයේදී මට භාග්‍යයක් අත් වුණා, පෝල් පෙරේරා මැතිතුමා හඳුනා ගැනීමට. මේ පාර්ලිමේන්තුවේ දී බොහෝ අවස්ථාවල ගුණ කථනයන් කළත්, ඒ පතාක දේශපාලන චරිත අපේ මේ කෙටි දේශපාලන ජීවිතයේදී හඳුනා ගන්න අපට හැකියාවක් ලැබෙන්නේ නැහැ. නමුත් පෝල් පෙරේරා මැතිතුමා හඳුනා ගැනීමේ භාග්‍යය මට හිමි වුණා. විශේෂයෙන්ම රොනල්ඩ් පෙරේරා මැතිතුමා, අශෝක සමරරත්න මැතිතුමා සහ උපුල් ජයසූරිය මැතිතුමා වැනි ජ්‍යෙෂ්ඨ නීතිඥවරු එක්සත් ජාතික පක්ෂය තුළ මට ආශ්‍රය කිරීමට භාග්‍යය ලැබීමත් සමඟම පෝල් පෙරේරා යන වර්ණවත් චරිතය හඳුනා ගැනීමේ භාග්‍යයත් මට ලැබුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමාගේ සහජ හැකියාව තුළින් -තමන්ගේ ශක්තියෙන්- එතුමා තම දේශපාලන ගමන ආරම්භ කළ ආකාරය පිළිබඳව ආපසු හැරී බලන කොට එක්සත් ජාතික පක්ෂයේ -අපේ පක්ෂයේ- අභිමානයට ඒ වාගේ පතාක යෝධයෙක් සිටීම සම්බන්ධයෙන් තරුණ දේශපාලනඥයන් වශයෙන් මේ අවස්ථාවේ අපට ඉමහත් ආඩම්බරයක් ඇති වෙනවා.

1970 දී එතුමා එක්සත් ජාතික පක්ෂයේ ජාතික නීතිඥ සංගමයේ පළමුවැනි ලේකම් තනතුර දරමින් එක්සත් ජාතික පක්ෂයට විශාල ශක්තියක් ලබා දුන්නා. එම නිසා ඉදිරි අනාගතයේදී එක්සත් ජාතික පක්ෂයේ ස්වර්ණමය යුගයක් බිහි කරන්නට අපට එවැනි චරිත හොඳ ආදර්ශයක් බවට පත් වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමාගේ ජීවිතය පටන් ගත් ආකාරය දෙස බැලුවොත්, පළමුවෙන්ම එතුමා රාජ්‍ය ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ සහකාර ලේඛනාරක්ෂක තනතුරක් ලබාගත් අතර, ඉන් පසු එතුමාගේ සහජ හැකියාවෙන් මේ රටේ ප්‍රධාන අමාත්‍යවරයෙක් බවට පත් වෙන්න එතුමාට පුළුවන් වුණා. කාගේවත් උදව් නොමැතිව ඒ තනතුරට පත් වෙන්නටත්, ඒ වාගේම දේශපාලන වශයෙන් මේ රටේ පතාක යෝධයෙක් බවට පත් වෙන්නටත් එතුමාට ශක්තිය ලැබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමාගේ භාර්යාව අපේ ශ්‍රී ලාංකික කාන්තාවන්ට මහත් ආදර්ශයක්. එතුමිය හඳුනා ගන්න මටත් භාග්‍යය ලැබුණා. විශේෂයෙන්ම එතුමියගේ නිහතමානී බව, ඒ වාගේම පෞරුෂත්වය, ඒ වාගේම තමාගේ ස්වාමියාට දැක් වූ ආදරය සහ තමාගේ පවුලට දැක් වූ ආදරය, ඒ වාගේම රටට දැක් වූ ආදරය අපි අද පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වශයෙන් අගය කරනවා. ඒ විතරක් නොවෙයි, එතුමා සහ එම භාර්යාව සම්බන්ධයෙන් විශාල අදහස් ප්‍රමාණයක් මේ පාර්ලිමේන්තු සභා ගැබ තුළ අද ඉදිරිපත් වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමාගේ හපන්කම්වලටත් සහ එතුමා ලැබූ තනතුරුවලට වැඩිය එතුමා වඩාත්ම සන්තෝෂ වුණේ එතුමාගේ දරුවන් පස් දෙනා සහ එතුමාගේ මුණුබුරන් සහ මිණිබිරියන් සිටින තත්ත්වයන් ගැනයි; මේ රටට ලෝකයට ලබා දීලා තිබෙන ඒ සම්පත් ගැනයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ සම්බන්ධයෙනුත් වචන කිහිපයක් ප්‍රකාශ කරන්න මට තව පොඩි කාලයක් දෙන්න.

නීතිඥවරයෙක් වශයෙන් ක්‍රියා කරන එතුමාගේ වැඩිමහල් පුත්‍රයා වන රොනල්ඩ් පෙරේරා මැතිතුමා අනිවාර්යයෙන්ම ජනාධිපති නීතිඥවරයකු වශයෙන් දිවුරුම් දෙන්න සුදුසුකම් තිබෙන දක්ෂ නීතිඥවරයෙක්. ඒ විතරක් නොවෙයි, පාර්ලිමේන්තු සභා ගැබේ අද අපිත් එක්ක ඉන්න පුළුවන් දේශපාලන පරිණතභාවයක් තිබෙන පුද්ගලයෙක් තමයි රොනල්ඩ් පෙරේරා මැතිතුමා. එතුමාගේ දියණිය වන සියාරා එංගලන්තයේ "වින්චෙස්ටර්" විශ්වවිද්‍යාලයේදී නීතිය සම්බන්ධයෙන් උපාධියක් ලබා ගෙන තිබෙනවා. එතුමාගේ දෙවෙනි පුතා ආර්නල්ඩ් පෙරේරා මැතිතුමා ගණකාධිකාරිවරයෙක් වශයෙන් අද සියරා ආයතනයේ අධ්‍යක්ෂ ධුරයේ කටයුතු කරනවා. ඒ වාගේම ආර්නල්ඩ් පෙරේරා මැතිතුමාගේ මුදාර පුතු ඉංජිනේරුවරයෙක් වශයෙන්ද, දසිත් පුතු ඇඩිලේඩ් විශ්වවිද්‍යාලයේ උපාධියක් ලබමින්ද සිටිනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ වාගේම පෝල් පෙරේරා මැතිතුමාගේ තුන්වෙනි පුත් හැරල්ඩ් පෙරේරා මැතිතුමා යුරෝපයේ විකාශනය කරන රූපවාහිනී සමාගමක කළමනාකරු වශයෙන් ඉහළ තනතුරක් දරන අතර, හැරල්ඩ් පෙරේරා මැතිතුමාගේ දියණිය කුෂ්මින් මොනෑෂ් විශ්වවිද්‍යාලයේ උපාධිය හදාරනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ වාගේම පෝල් පෙරේරා මැතිතුමාගේ හතරවෙනි දරුවා වූ -එකම දියණිය- පුෂ්පමාලා පෙරේරා මැතිනිය අද ව්‍යාපාර කළමනාකරණය සම්බන්ධයෙන් බ්‍රිස්බන් නගරයේ කුවීන්ස්ලන්ඩ් හෙල්ත් ආයතනයේ ඉහළ තනතුරක් දනර අතර, එතුමියගේ දියණිය චින්තිකා වෛද්‍ය වෘත්තිය හදාරනවා. ඒ වාගේම එතුමියගේ දෙවැනි දියණිය අශාන්ති කුවීන්ස්ලන්ඩ් විශ්වවිද්‍යාලයේ නීතිය හදාරනවා. ඒ වාගේම පෝල් පෙරේරා මැතිතුමාගේ බාල පුත් රොඩ්නි පෙරේරා මැතිතුමා අපි කවුරුත් දන්නා පරිදි නෝර්වේ රාජ්‍යයේ තානාපති වශයෙන් ක්‍රියා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහෙම නම් එතුමාගේ කාර්ය භාරය දේශපාලන වශයෙන් පමණක් සීමා වෙලා නැහැ; නීතිඥවරයෙක් වශයෙන් පමණක් සීමා වෙලා නැහැ. රටට, දැයට, ලෝකයට වැඩදායී දරුවන් පස් දෙනෙකු සහ මුණුපුරන් සහ මිණිපිරියන් මේ ලෝකයට දායාද කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම එතුමා විශේෂයෙන්ම එක්සත් ජාතික පක්ෂයට විශාල ආදරයක් දැක්වූවා. පක්ෂය පාවා නොදෙමින් ජීවිතයේ අවසානය දක්වා එතුමා පක්ෂයට ලබා දුන් ශක්තිය තුළින් තරුණ මන්ත්‍රීවරු වශයෙන් එක්සත් ජාතික පක්ෂයේ ස්වර්ණමය යුගයක් ඉදිරියේදී බිහි කරන්නට අපට වාසනාව ශක්තිය ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් එතුමාට මොක් සුවය පතමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ. භා. 4.20]

**ගරු දි.මු. ජයරත්න මහතා (අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා)**

(மாண்புமிகு டீ.எம்.ஜயரத்ன - பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சரும்)

(The Hon. D.M. Jayaratne - Prime Minister, Minister of Buddha Sasana and Religious Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ මන්ත්‍රීතුමන්ලා සහ ඇමතිතුමන්ලා ගරු පෝල් පෙරේරා මැතිතුමා සම්බන්ධයෙන් දීර්ඝ වශයෙන් කථා කළා. අපි බොහොම සන්තෝෂ වනවා වාගේම ස්තුතිවන්ත වනවා ඒ වාගේ ශ්‍රේෂ්ඨ පුද්ගලයකුට, දේශපාලකයෙකුට, රටට විශාල සේවයක් කළ කෙනෙකුට, අති දක්ෂ නීතිඥවරයෙකුට ඒ වාගේම එක්සත් ජාතික පක්ෂයට බොහොම හිතවත්ව, නායකත්වයට හිතවත්ව හිටපු ශ්‍රේෂ්ඨ පුද්ගලයකුට ගෞරවය දැක්වීම සඳහා කථා කිරීමට අවස්ථාව ලැබීම ගැන. පෝල් පෙරේරා මැතිතුමා නීතිඥවරයෙක් හැටියට ඉස්සෙල්ලාම වෘත්තිය ආරම්භ කළේ එස්.ඩබ්ලිව්. ජයවර්ධන නීතිඥතුමාත්, එම්. තිරුචෙල්වම් නීතිඥතුමාත් එක්කයි. එම නීතිඥවරුන් තමන්ගේ ගුරුන්නාන්සේලා හැටියට තබා ගෙන තමයි එතුමා නීතිඥයෙක් හැටියට වැඩ පටන් ගත්තේ. ඒ නීතිඥවරුන් දෙදෙනාත් ඒ කාලයේ ලංකාවේ හිටිය බොහොම ශ්‍රේෂ්ඨ, දක්ෂ නීතිඥවරුන් දෙදෙනෙක්. ඒ වාගේම තමන් ඉගෙන ගත්ත ගුරුවරුන්ගේ සමාන තත්ත්වයට එන්න පෝල් පෙරේරා මැතිතුමාට නීතිඥවරයෙක් හැටියට හැකි වුණා. ඉන් පසුව එතුමාගේ සේවාවන් කර ගෙන යන අතර විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබා ගෙන ඉතිහාසය විෂයය සම්බන්ධයෙන් විශේෂඥයෙක් හැටියට පත් වන්න එතුමාට වරම් ලැබුණා.

එතුමා 1973 අවුරුද්දේ තමයි එක්සත් ජාතික පක්ෂයට සම්බන්ධ වුණේ. එක්සත් ජාතික පක්ෂයට සම්බන්ධ වෙලා එක්සත් ජාතික පක්ෂයේ සේවාවන් කියාත්මක කරමින් ඉන්න අතර තමයි එතුමාට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් හැටියට එන්න පුළුවන් වුණේ. ඒ වාගේම වරාය සංයුක්ත මණ්ඩලය වාගේ නොයෙක් ආයතනවල විවිධ තනතුරුවල ක්‍රියා කරමින් සාමාන්‍යයෙන් මනුෂ්‍යයෙක් ක්‍රියා කරනවාට වඩා විවිධ අංශවලින් දියුණු වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න එතුමාට පුළුවන් වුණා. කථාවක් තිබෙනවා "ලොවින් එකෙක් එක දෙයකට වෙයි සමත" කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නමුත් පෝල් පෙරේරා මැතිතුමා නීතිඥවරයෙක් වශයෙන් පමණක් නොවෙයි, දේශපාලනඥයෙක් වශයෙන් පමණක් නොවෙයි, තවත් නොයෙක් ආකාරයෙන් පරිපාලන කටයුතුවලටත් සම්බන්ධව ක්‍රියා කළ විශේෂිත පුද්ගලයෙක් කියලා අපට ප්‍රකාශ කරන්න පුළුවන්. ඒ වාගේ ක්‍රියා කරලා එතුමා විශාල සේවාවක් ඉෂ්ට කළා.

මට මතකයි එතුමා ගම්පහ දිස්ත්‍රික්කයේ අත්තනගල්ල ආසන සංවිධායකවරයා වශයෙන් සිටි කාලය. අත්තනගල්ල ආසනය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආසනයක්; නිදහස ලැබූ දා ඉඳන් හැමදාම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආසනයක්. නමුත් එතුමා එක්සත් ජාතික පක්ෂයේ සංවිධායකවරයා හැටියට අත්තනගල්ලට පත් කළා. මම හිතන හැටියට ඒ විධියට එතුමා පත් කරන්න ඇත්තේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වාගේ ප්‍රබල ස්ථානයකට එක්සත් ජාතික පක්ෂයේ ප්‍රබලයෙක් පත් කළොත් ඒක අල්ලා ගන්න පුළුවන් කියන චේතනාවෙන් වෙන්න ඇති. ඒක සාමාන්‍යයෙන් දේශපාලන චින්තනයක්. ඒකේ වැරැද්දක් කියන්න බැහැ. නමුත් නොයෙක් අවස්ථාවල ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයෝ පවා අපට දැන්වූවා, "මෙන්න මේ වැඩේ අපට කර ගන්න පෝල් පෙරේරා මැතිතුමාට පොඩ්ඩක් කියන්න සර්" කියලා. කීප අවස්ථාවකදී මට එහෙම කියලා තියෙනවා. ඇත්තටම මම එතුමාට කිව්වා, මෙන්න මෙහෙම දෙයක් කියනවා කියලා. එතකොට එතුමා කිව්වා, "අයියෝ! ඒ ගොල්ලන්ට එන්න කියන්න කෝ. මට කිව්වා නම් හරි නේ. ඔබතුමාට කියන්න වුවමනාවක් නැහැ නේ. අපේ එහෙම වෙනසක් නැහැ නේ" කියලා. අන්න ඒ වාගේ තමයි එතුමා කටයුතු කළේ. දේශපාලන පක්ෂයක උග්‍ර පාක්ෂිකයෙක් කියලා දැන් මෙතැන ප්‍රකාශ කළාට, අනික් දේශපාලන පක්ෂවල සියලු දෙනාටත් ශ්‍රේෂ්ඨ මනුෂ්‍යත්වයකින් සලකන්න ඕනෑ කියන චින්තනයක්, කල්පනාවක් තිබුණු කෙනෙක් තමයි ගරු පෝල් පෙරේරා මැතිතුමා.

මට මතකයි සමහර වැදගත් අවස්ථාවලදී සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියත් කිව්වා, "ඔන්න ඔක පොඩ්ඩක් පෝල් පෙරේරාට කියන්න කෝ" කියලා. ඊට පස්සේ මම එතුමාට කියනවා, "මේ මැතිනියත් කියනවා ඔබතුමාට කියන්න" කියලා. එතකොට පෝල් පෙරේරා මැතිතුමා කියනවා, "මැතිනියට කියන්නේ, කරදර කරන්නේ මොකද, මට කථා කරන්න කියලා ඒ කට්ටියට කියන්න" කියනවා. එහෙමයි කියන්නේ. "ඒ ඔක්කොටම එන්න කියන්න, ඕනෑ එකක් මට කියන්න" කියනවා. ඇත්තටම එතුමා ළඟට ඒ අය යැව්වාම බොහොම ආදරයෙන්, සන්තෝෂයෙන් ඒ අයගේ වැඩ කරලා දුන්නා.

මේ කනගාටුදායක අවස්ථාවේ වුණත් එතුමාගේ සේවය සම්බන්ධයෙන් මම අද මේවා කියන්නේ බොහොම සතුටකින්. තමන්ගේ දේශපාලන පක්ෂය කෙසේ වෙතත් එතුමා මනුෂ්‍යත්වයෙන්, ශ්‍රේෂ්ඨත්වයෙන් ක්‍රියා කළා. දක්ෂ පුද්ගලයකු වශයෙන් ක්‍රියා කළා. එතුමා උපන් ප්‍රදේශය මීගමුව වුණාට ලංකාවේ හැම තැනටම විශාල සේවාවක් කළා. විශේෂයෙන් පොළොන්නරුව ප්‍රදේශයේත් විශාල සේවා රාශියක් ක්‍රියාත්මක කළා. ඒ විධියට දේශපාලන ක්ෂේත්‍රයේ නොයෙක් අංශවලින් එහෙම ක්‍රියා කරමින් තමන්ගේ දේශපාලන පක්ෂය ආරක්ෂා කිරීමටත් ක්‍රියා කරලා තිබෙනවා. විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා ඒ ගැන හොඳට දන්නවා ඇති. මෙතුමාගෙන් අපි ආදර්ශයක් ගන්න ඕනෑ.

අද වෙලා තිබෙන්නේ අලුත් අය පරණ අයගේ අදහස් නිකම් කසි කබල් විධියට අහකට දමන එක. එහෙම දමන්න හොඳ නැහැ. පරණ ඒවාගේ තිබෙනවා හොඳ හොඳ කෑලි. පරණ පුද්ගලයන්ගේ හොඳ දේවල් තියෙනවා ඉගෙන ගන්න. ඒවා ඉගෙන ගන්න ඕනෑ. ඒ අනුව ක්‍රියා කරන්නත් බලන්න ඕනෑ. තමන්ගේ දේශපාලන පක්ෂය, තමන්ගේ දර්ශනය, තමන්ගේ වැඩ පිළිවෙළ සාර්ථක අන්දමින් ක්‍රියාත්මක කිරීමට ඒවා උපයෝගී කර ගන්න ඕනෑ කියන එකත් අපි මේ වෙලාවේ කල්පනා කරන්න ඕනෑ. මම මේ කියන්නේ එක්සත් ජාතික පක්ෂයේ තමුන්නාන්සේලාට විතරක් නොවෙයි. සියලු දෙනාටම මම මේ කියන්නේ. අතීතයේ අපේ දේශපාලනඥයන් ඒ වාගේ ශ්‍රේෂ්ඨ විධියට ක්‍රියා කරලා තියෙනවා. ඒ පක්ෂ ආරක්ෂා කර ගත්තා. ඒ වාගේම ඒ නායකත්වය රැක ගත්තා. ඒ දර්ශන ක්‍රියාත්මක කළා. ජනප්‍රියත්වයට පත් වුණා. දේශපාලන ක්ෂේත්‍රයේ අපි මොන පක්ෂයේ වුණත්, මොන විධියකට ක්‍රියා කරන්න ගියත්, අපි මේ රටටයි වැඩ කරන්න යන්නේ. මේ රටේ ජනතාව වෙනුවෙනුයි අපි ක්‍රියා කරන්නේ. ඒ ශක්තීන් ආරක්ෂා කර ගනිමින් අතීතයේ හිටපු ඒ ශ්‍රේෂ්ඨ දේශපාලනඥයන්ගේ දර්ශන අපේ හිතට අරගෙන ඒවා ක්‍රියාත්මක කරන්න උත්සාහ කරන්න ඕනෑ. එතකොට තමන්ට පෞද්ගලික වශයෙන් කවදාවත් නරකක් වෙන්නේත් නැහැ; පක්ෂයක් වශයෙන් නරකක් වෙන්නේත් නැහැ; පක්ෂයක දර්ශනයක් හරියට ක්‍රියාත්මක කිරීමට අමාරුවක් වෙන්නේත් නැහැ. අපි මෙන්න මේ අපේ අතීත සිද්ධීන් උපයෝගී කර ගන්න ඕනෑ කියලා මම විශේෂයෙන් මතක් කරන්න කැමැතියි.

මේ අවස්ථාවේ මම දීර්ඝ වශයෙන් කථා කරන්න යන්නේ නැහැ. එතුමා සම්බන්ධයෙන් හුඟක් දෙනෙක් බොහොම දීර්ඝ වශයෙන් කථා කළා. අපි එතුමාගේ සේවාව ඉතා ශ්‍රේෂ්ඨ විධියට අනුස්මරණය කරනවා. එතුමාගේ ප්‍රියාදර භාර්යාව වන කුලසීලි මැතිනිය බස්නාහිර පළාත් සභාවේ සභාපතිනිය හැටියට ක්‍රියා කළා. එතුමා තමන්ගේ සේවාව එහෙම කරන ගමන් තමන්ගේ

ප්‍රියාදර භාර්යාවත් දේශපාලන ක්ෂේත්‍රයට එවලා විශේෂ ස්ථානයක තබමින් තමන්ගේ පක්ෂය වෙනුවෙන්, තමන්ගේ දර්ශනය වෙනුවෙන් ක්‍රියා කළා. දරුවන්ටත් ඒ වාගේ විශේෂ ස්ථානයක් ලබා දුන්නා. දරුවන්ටත් සමාජයට සේවය කරන්න, තමන් අනුස්මරණය කරන්න පුළුවන් වන විධියට එතුමා ක්‍රියා කළා. මනුෂ්‍යයෙක් තමන් ගෞරවයෙන් ජීවත් වෙන්න උත්සාහ කරනවා වාගේම තමන්ගේ හිතවතුන්, ඥාතීන් සහ අනික් අයත් ඒ තත්ත්වයෙන් තබා ගන්න උත්සාහ කරනවා. ඊට පස්සේ කල්පනා කරනවා, මගේ ජීවිතයෙන් පස්සේ මේ වැඩ පිළිවෙළ අනුස්මරණය කරමින් ක්‍රියාත්මක කරන්න පුළුවන් පරපුරක් මට බිහි කරන්න පුළුවන්ද කියලා. ඒ චේතනාවෙන් ක්‍රියා කිරීම දක්ෂ, බුද්ධිමත් පුද්ගලයන් අනුගමනය කරන ක්‍රියාමාර්ගයක්.

ඒ ක්‍රියා මාර්ගය ගරු පෝල් පෙරේරා මැතිතුමා තමන්ගේ ජීවිතයෙන් ඉෂ්ට කරලා තිබෙනවාය කියන එක ඒ පවුලේ සියලු දෙනාගේම ජීවන තත්ත්වය ගැන බැලුවාම, එතුමා මේ රටට කර තිබෙන සේවය ගැන කල්පනා කර බැලුවාම පැහැදිලිව පෙනෙනවා. ඒ නිසා මේවා ආදර්ශයට අරගෙන අපිත් ක්‍රියා කරන්න බලමුය කියන එක ප්‍රකාශ කරමින්, එතුමාගේ භාර්යාව ප්‍රමුඛ සියලුම දරුවන්ටත්, ඥාතීන් සහ හිතවතුන් සියලුම දෙනාටමත් අපේ බලවත් කනගාටුව ප්‍රකාශ කර යවන ලෙස යෝජනා කරමින් මගේ කථාව අවසන් කරනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ස්තුතියි.

[අ. භා. 4.28 ]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දිවංගත ගරු පෝල් පෙරේරා මැතිතුමා වෙනුවෙන් ඉදිරිපත් කරන ශෝක යෝජනාවට සම්බන්ධ වෙලා එතුමාගේ දේශපාලන ජීවිතය තුළ එතුමාගේ බල ප්‍රදේශයටත්, ශ්‍රී ලංකාවටත් ඉෂ්ට සිද්ධ කරපු ඒ අතිවිශිෂ්ට වූ ජනතා සේවාව අගයන්නට මටත් අද අවස්ථාවක් එළැඹිලා තිබෙනවා. විශේෂයෙන්ම එක්සත් ජාතික පක්ෂයේ දේශපාලනඥයකු වූ ගරු පෝල් පෙරේරා මැතිතුමා මම දැකපු ඉතාම නිර්භීත, ගාම්භීර, තේජස් සහිත දේශපාලන චරිතයක්. දේශපාලනඥයකු සතුව තිබිය යුතු උතුම් ගුණාංග රැසක් එතුමා සතුව තිබුණා. අද වර්තමාන දේශපාලන ක්ෂේත්‍රය දිහා බැලුවාම චංචල සිතිවිලිවලින් තමන්ගේ දර්ශනය නිර්මාණය කර ගත් දේශපාලකයන් බොහොමයක් සිටිනවා.

ගරු පෝල් පෙරේරා මැතිතුමාගේ දේශපාලන චරිතය තුළින් අප සියලු දෙනාටම ඉගෙන ගන්න පුළුවන් හොඳ පාඩමක් තිබෙනවා. තමන් විශ්වාස කරන දර්ශනය, තමන් අනුගමනය කරන දේශපාලන ප්‍රතිපත්තිය අංශු මාත්‍රයකින්වත් පලුදු කරන්නේ නැතිව, මොනම අවස්ථාවකදීවත් තමන්ගේ හෘද සාක්ෂියට විරුද්ධව ගිහිල්ලා පෞද්ගලික වාසි තකා දේශපාලන තීන්දු තීරණ ගන්නේ නැතිව, ඕනෑම දේශපාලන නායකයකු ඉදිරිපිට තමන් විශ්වාස කරන මතය, දර්ශනය නිවැරදිව ඉදිරිපත් කරලා දේශපාලන ක්ෂේත්‍රයට ගාම්භීර, ශක්තිමත් ආලෝකයක් ලබා දුන්නු චරිතයක් හැටියට ගරු පෝල් පෙරේරා මැතිතුමා හඳුන්වන්නට පුළුවන්. මා මේ ප්‍රකාශ කළේ එදා කුඩා දරුවකු හැටියට පෞද්ගලිකව මා අත් දුටු දේයි. එම කාල වකවානු තුළදී අපි එතුමාව ආමන්ත්‍රණය කළේ "පෝල් අංකල්" කියලායි. පෝල් පෙරේරා මැතිතුමා අප හැම විටම දුටුවේ නිරන්තරයෙන්ම ක්‍රියාකාරීව, තමන්ට ලබා දුන්නු රාජකාරිය අකුරටම, තිතටම ක්‍රියාත්මක කරන සුපිරිසිදු දේශපාලනඥයකු හැටියටයි. අන්න ඒ නිසා ගරු පෝල් පෙරේරා චරිතය තුළින් අද වර්තමාන දේශපාලන ක්ෂේත්‍රයටම ඉතා යෝග්‍ය ගුණාංග රැසක් ලබා ගන්න පුළුවන් කියන එක මා විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සීමාසහිත කාල වේලාවක් තිබෙන නිසා මා තවදුරටත් කාලය ගන්න බලාපොරොත්තු වන්නේ නැහැ. විශේෂයෙන්ම ගරු පෝල් පෙරේරා මැතිතුමාගේ ඒ දේශපාලන ගමන මේ සභා ගර්භය තුළ සිටින දේශපාලනඥයන්ටත්, විවිධ තලවල සිටින දේශපාලනඥයන්ටත්, සමාජ සේවකයන්ටත් ආදර්ශවත් වනවා. අපි හැමෝම ප්‍රාර්ථනා කරන ශක්තිමත්, සෞභාග්‍යවත් ශ්‍රී ලංකාවක් ගොඩ නඟන්නට ඒ චරිතය තුළින් ගත හැකි ආදර්ශ බොහොමයක් තිබෙනවා. එතුමා කෙළින් කතා කරලා, කෙළින් වැඩ කරපු කෙනෙක්. යම් කිසි දෙයක් ප්‍රකාශ කළොත් කොට එය වචනයේ පරිසමාප්තාර්ථයෙන්ම අකුරටම, තිතටම ක්‍රියාත්මක කරන උතුම් ගුණාංගය සතුව තිබුණු ගරු පෝල් පෙරේරා මැතිතුමාගේ වියෝව පිළිබඳව අපේ කනගාටුව මේ අවස්ථාවේදී එතුමාගේ පවුලේ සියලුම දෙනාට පළ කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ. භා. 4.33]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා ඔබතුමාට ඉතාම ස්තුතිවන්ත වනවා, කාල වේලාව නොමැති වුණත් මට විනාඩි කිහිපයක් හෝ ලබා දීම පිළිබඳව. විශේෂයෙන්ම පෝල් පෙරේරා මැතිතුමා කියන්නේ අපේ පක්ෂයට ඉතාම දැවැන්ත සේවයක් කරපු කෙනෙක්. ඒ වාගේම විශේෂයෙන්ම එතුමාට තිබුණා අත් දැකීම් සම්භාරයක්. රාජ්‍ය සේවකයකු විධියට එතුමාගේ ආරම්භයත් එක්ක එතැනින් පසුව නීතිඥවරයකු විධියටත්, ඒ වාගේම අපේ රට දියුණු කරන්නට ජේ.ආර්.ජයවර්ධන මැතිතුමා ආරම්භ කරපු ඒ මහ කොළඹ ආර්ථික කොමිසමේ අධ්‍යක්ෂක ජනරාල්වරයා විධියටත් කටයුතු කර, එතැනින් පසුව දිසා අමාත්‍යවරයකු විධියටත්, අමාත්‍යවරයකු විධියටත් කටයුතු කරන්නට එතුමාට අවස්ථාව ලැබුණා. විශේෂයෙන් අපේ පක්ෂය වැටී තිබුණු අවස්ථාවල එතුමා මේ පක්ෂය ආරක්ෂා කරගන්නට කටයුතු කළා. අපේ පක්ෂයේ අර්බුද තිබෙන අවස්ථාවල එම අර්බුදවලට විසඳුම් සොයන නායකයකු විධියට එතුමා දැවැන්ත කාර්ය භාරයක් කර තිබෙනවා. එතුමාගේ අවසාන කාල වකවානුවේ තමයි එතුමා සමඟ කථා කරන්න, එතුමාව හඳුනා ගන්න මට අවස්ථාව ලැබුණේ. නමුත් ඒ කාල වකවානුවේත් එතුමාගේ තිබුණු එඩිතරකම පිළිබඳව මට මතකයි. අපේ ගරු අග්‍රාමාත්‍යතුමාත් කිව්වා වාගේ එතුමා භය නැතිව ඕනෑ කෙනෙකු සමඟ හැප්පුණු කෙනෙක්. අපි දන්නා කාල වාකවානුව තුළ පෝල් පෙරේරා මැතිතුමා කියලා කිව්වාම ටිකක් සැර පරුෂ, නැත්නම් බොහොම හැඩි දැඩි, යම් කිසි විධියක දැඩි තීන්දු තීරණවල සිටින කෙනෙක් විධියට තමයි අපි එතුමාව හඳුනා ගෙන තිබුණේ. නමුත් මා විශේෂයෙන්ම කියන්න කැමැතියි, එතුමා නායකයාත් එක්ක නිවැරදි තීන්දුවල හිටපු කෙනෙක් බව. නායකත්වයේ යම් යම් ප්‍රශ්න තිබුණා නම් ඒ ප්‍රශ්නවලදී එතුමා නායකත්වයත් සමඟ සිටියා වාගේම, ඒ නායකත්වයේ ගුණාංගවල තිබුණු අඩු පාඩු සම්බන්ධයෙන් බොහොම කෙළින් පැහැදිලි කර දෙන්න පුළුවන් දේශපාලන නායකයකු විධියට තමයි ක්‍රියා කළේ. ඒ නිසා නායකත්වය අන්ධානුකරණයෙන් ආරක්ෂා කරන නායකයකුට එහා ගිය, පක්ෂය වෙනුවෙන් පක්ෂය නිවැරදි තීන්දු ගන්නකොට ඒ සඳහා ක්‍රියා කරපු නායකයකු විධියට මා එතුමාව හඳුනනවා. ඒ සම්බන්ධයෙන් මා එතුමාව බොහොම ගෞරවයෙන් සිහිපත් කරනවා.

පස් දෙනෙකුගෙන් යුත් එතුමාගේ පවුලේ සියලු දෙනාම එතුමාගේ නම, එතුමාගේ ගෞරවය ආරක්ෂා කරමින් කටයුතු කරනවා. විශේෂයෙන් එතුමාගේ නීතිඥ වෘත්තිය ආරක්ෂා කරමින් නීතිඥයකු විධියට රොනල්ඩ් පෙරේරා මැතිතුමාත්, ඒ වාගේම

[ගරු දයාසිරි ජයසේකර මහතා]

එතුමාගේ තිබුණු ඒ රාජ්‍ය තාන්ත්‍රික භාවය ආරක්ෂා කරමින් රොඩ්නි පෙරේරා මැතිතුමාත් කටයුතු කරනවා. ඒ වාගේම ඒ පවුලේ අනෙක් අයත් පෝල් පෙරේරා මැතිතුමාගේ එම ගුණාංග ඉදිරියට අරගෙන යන්න පුළුවන් ඉතාම උගත්, බුද්ධිමත් සාමාජිකයන් බව ආඩම්බරයෙන් කියන්න පුළුවන් විධියට අද සමාජය තුළ ජීවත් වනවා. එතුමා ඒ ආරම්භ කරපු ගමන් මාර්ගය, එතුමා ප්‍රාර්ථනා කරපු දේවල් ඒ පවුලේ අනෙකුත් සියලු දෙනාම ඉදිරියට ගෙන යනවාය කියන එකත් අපි සන්තෝෂයෙන් මේ අවස්ථාවේ දී මතක් කරන්නට ඕනෑ. මා හිතන්නේ එතුමා කොහේ හෝ තැනක ඉඳගෙන ආදරයෙන් බලා ගෙන ඉන්නවා ඇති, තමන් ඇති දැඩි කරපු මේ පවුලේ අය සියලු දෙනාම ඉතාම දක්ෂ විධියට සේවය කරන ආකාරය දිහා. ඒ නිසා එතුමා මේ රටටත්, විශේෂයෙන්ම මේ පාර්ලිමේන්තුවටත්, එතුමාගේ දිස්ත්‍රික්කයේ එතුමාගේ ජනතාවටත් කරපු සේවය අපි කවදාවත් අමතක කරන්නේ නැති බවත් මතක් කරනවා. අප අදහන ආගම අනුව එතුමාට නිවන් සුව අත්වේවා යි කියා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Thank you. I wish to associate myself with the sentiments expressed by both sides of the House on the death of the Hon. E.P. Paul Perera, ex-Member of Parliament. I shall direct the Secretary-General of Parliament to make a Minute of the Proceedings of the Meeting today and send a copy thereof to the members of the bereaved family.

We will now take up the Vote of Condolence on the late Hon. P.O. Wimalanaga, former Member of Parliament.

## ශෝක ප්‍රකාශය: ගරු පී.ඕ. විමලනාග මහතා
## அனுதாபத் தீர்மானம்: மாண்புமிகு பீ.ஓ. விமலநாக
## VOTE OF CONDOLENCE: HON. P.O. WIMALANAGA

[අ. භා. 4.37 ]

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා (රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன - பொது நிருவாக, உள்நாட்டலுவல்கள் அமைச்சர்)
(The Hon. W.D.J. Senewiratne - Minister of Public Administration and Home Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා නියෝජනය කරන රත්නපුර දිස්ත්‍රික්කයේ කොලොන්න මැතිවරණ කොට්ඨාසයේ ජනතාව වසර ගණනාවක් තිස්සේ නියෝජනය කරමින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් මේ උත්තරීතර සභාව ශෝභාවත් කළ පී.ඕ. විමලනාග මැතිතුමාගේ අභාවය පිළිබඳ ශෝකය පළ කිරීමේ යෝජනාව මෙම අවස්ථාවේ දී ගරු සභාවට ඉදිරිපත් කරනවා.

ගාල්ලේ ගල්වඩුගොඩ විසූ පොල්වත්ත ගමගේ එඩ්වඩ් විමලනාග මහතාගේත් කංකානම්ගේ ලීලාවතී සමරවික්‍රම මහත්මියගේත් පුත්‍ර රත්නයක් ලෙස පොල්වත්ත ගමගේ ඔස්මන්ඩ් විමලනාග මහතා 1932 ජූනි මස 03 වන දින මෙලොව එළිය දුටුවේය. කෝට්ටේ ආනන්ද ශාස්ත්‍රාලයෙන් මූලික අධ්‍යාපනය ලැබූ එතුමා කොළඹ ආනන්ද විද්‍යාලයෙන් වැඩිදුර අධ්‍යාපනය ලබා ගත්තේය. අනතුරුව පේරාදෙණිය සරසවියට ඇතුළත්ව ශාස්ත්‍රවේදී උපාධිය ලබා ගත් අතර නීති විද්‍යාලයට පිවිස 1962 දී නීතිඥවරයකු ලෙස ඉන් පිට වූ විමලනාග මහතා 1985 දී ශ්‍රී ජයවර්ධනපුර සරසවියෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියද හිමි කර ගත්තේය.

හේමන්තා විජේසිංහ මෙනෙවිය සමඟ යුග දිවි ගමන ඇරඹූ එතුමා එම විවාහය තුළින් රුවනි හා දීප්ති නමින් ආදරණීය දියණියන් දෙදෙනෙකු මෙලොවට දායාද කළේය. තමන් අධ්‍යාපනය ලද කෝට්ටේ ආනන්ද ශාස්ත්‍රාලයෙන්ම සිය ජීවන වෘත්තිය ඇරඹූ විමලනාග මහතා එහි ඉතිහාස විෂයය භාර ගුරුවරයකු වශයෙන් කලක් සේවය කොට කොටහේන කුමාර විද්‍යාලය, කොළඹ ශාන්ත ජෝශප් විද්‍යාලය හා ශ්‍රී ලංකා විද්‍යාලය මඟින්ද සිය දැනුම අනාගත පරපුර වෙත බෙදා දුන්නේය. ඉන් අනතුරුව නීති වෘත්තියට අවතීර්ණව අධිනීතිඥවරයකු වශයෙන් සිය සේවාව මහජනතාව වෙත ලබා දුන්නේය.

තරුණ වියේදීම ලංකා සමසමාජ පක්ෂයට සම්බන්ධ වෙමින් දේශපාලන ක්ෂේත්‍රයට පිවිසුණු ඔස්මන්ඩ් විමලනාග මහතා 1970 දී පැවති පාර්ලිමේන්තු මහ මැතිවරණයේදී රත්නපුර දිස්ත්‍රික්කයේ කොලොන්න මැතිවරණ කොට්ඨාසය සඳහා අපේක්ෂකයකු වශයෙන් ඉදිරිපත් විණි. එහිදී එතෙක් එක්සත් ජාතික පක්ෂය සතුව පැවති එම ආසනය, හත් දහසකටත් වඩා වැඩි ඡන්ද ප්‍රමාණයක් ලබා ගනිමින් පහසුවෙන් ජයගෘහණය කොට මන්ත්‍රීවරයකු වශයෙන් තේරී පත්ව මෙම උත්තරීතර සභාවේ අසුන් ගැනීමේ භාග්‍යය හිමි කර ගත්තේය.

මන්ත්‍රීවරයකු වශයෙන් කටයුතු කළ කාල සීමාව තුළ දී කොලොන්න වැනි දුෂ්කර ප්‍රදේශයක සංවර්ධනය වෙනුවෙන් විශාල වශයෙන් කැපවූ එතුමා ඇඹිලිපිටිය උසාවිය හා කඩදාසි කම්හල ආරම්භ කිරීමට මූලික වූ අතර, ප්‍රදේශයේ අධ්‍යාපන හා සෞඛ්‍ය පහසුකම් නංවාලීම සඳහා ඉමහත් මෙහෙවරක් ඉටු කළේය. මහා මාර්ග ඉදි කරවමින් ඒවායේ ගමනාගමන පහසුකම් ඇති කිරීම වෙනුවෙන්ද අවධානය යොමු කළ විමලනාග මහතා විදුලිය, නිවාස වැනි අනෙකුත් සියලු අවශ්‍යතාවන් ඉටු කර දෙමින් කොලොන්න ප්‍රදේශවාසීන්ට සුවිශේෂී සේවාවන් රැසක් ද අත් පත් කර දුන්නේය.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් බ්‍රිතාන්‍යය, රුසියාව, සැම්බියාව ආදී විදේශීය රටවල් ගණනාවක චාරිකාවන්හි යෙදුණු එතුමා එමඟින් ලද දැනුම උපයෝගී කර ගනිමින් තම ප්‍රදේශයේ දියුණුව සලසාලීමටද පියවර ගත්තේය. ලංකා සමසමාජ පක්ෂයේ ක්‍රියාකාරී නායකයකු වූ විමලනාග මහතා එම පක්ෂයේ දේශපාලන මණ්ඩලයේ සභිකයෙක් වශයෙන්ද එහි මධ්‍යම කාරක සභිකයෙක් වශයෙන්ද කටයුතු කරමින් පක්ෂයේ උන්නතිය වෙනුවෙන් ද මහත් මෙහෙවරක යෙදුණි.

එක්සත් වෙළෙඳ සේවක මණ්ඩලයේ සභාපති ධුරය කලක් දැරූ මෙම මානව හිතවාදී දේශපාලනඥයා සිංහල ලේඛක සංවිධානයේ සංවිධාන කටයුතුවලද නියැලුණු අතර නරිබෑනා නාට්‍යයට සම්බන්ධවෙමින් කලා ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය සඳහාද තම දායකත්වය සැපයුවේය. ගවගැල් මිතුරෝ සංවිධානයේ සභාපති ධුරය පවා දරමින් තවත් සුවිශේෂී කාර්යයක නියැලුණු එතුමා විද්වත් සංගම් කිහිපයකම සාමාජිකයකු වෙමින් හා පේරාදෙණියේ ජයතිලක ශාලාවේත්, රාමනාදන් ශාලාවේත් ක්‍රියාකාරී සාමාජිකයකු වෙමින් ඒ මඟින්ද තමන්ගෙන් සමාජයට විය යුතු යුතුකම් රාශියක් ඉටු කර දුන්නේය.

වෙහෙර විහාර ඇසුරු කරමින් ආගමික සහජීවනය වෙනුවෙන්ද උදාර සේවාවක් ඉටු කළ විමලනාග මහතා හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී පූජ්‍ය ඕමල්පේ සෝභිත හිමිපාණන් වහන්සේ සමඟින් එක්ව දහම් පාසල් අධ්‍යාපනය ලබන දරු දැරියන් වෙත පොත්පත් බෙදා දීම වැනි සත් කාර්යයන්හිද නියැළිණි.

වසර හතරක පමණ කාලයක් සැම්බියා රජයේ නීති උපදේශකවරයකු වශයෙන් ද කටයුතු කළ මෙම උදාර මානව හිතවාදී දේශපාලනඥයා අවුරුදු 77ක් පමණ ආයු වළඳා 2009 මැයි මස 20 වැනි දින කොලොන්න ප්‍රදේශවාසී ජනතාවගේ ඇසට කඳුළක් එක් කරමින් හා පවුලේ ඥාතීන්ට වේදනාවක් ගෙන දෙමින් සදහටම දෙනෙත් පියා ගත්තේය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොලොන්න වැනි අති දුෂ්කර ප්‍රදේශයක පොදු මහජනතාවගේ හිත සුව පිණිස උදාර මෙහෙවරක් ඉටු කළ වාමාංශික දේශපාලන ව්‍යාපාරයේ පතාක යෝධයකු වූ කොලොන්න හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී පොල්වත්ත ගමගේ ඔස්මන්ඩ් විමලනාග නැමැති යුග පුරුෂයාට නිවන් සුව ප්‍රාර්ථනය කරන අතර, මෙම උත්තරීතර සභාවේ ශෝකය එතුමාණන්ගේ දයාබර බිරිඳ සහ දූවරු දෙදෙනා ඇතුළු පවුලේ ඥාතීන් වෙත දන්වා යවන ලෙස යෝජනා කර සිටිමි.

[අ. භා. 4.44]

**ගරු කරු ජයසූරිය මහතා**
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දිවංගත ගරු පී.ඕ. විමලනාග මන්ත්‍රීතුමාගේ විශිෂ්ට චරිතාපදානය සම්බන්ධයෙන් ගරු ජෝන් සෙනෙවිරත්න අමාත්‍යතුමා විසින් දීර්ඝ විවරණයක් කරනු ලැබූ නිසාත්, වේලාවේ සීමාවක් ඇති නිසාත් ඒ කරුණු ගැන නැවතත් කථා කරන්නට මා බලාපොරොත්තු වන්නේ නැහැ. නමුත් එතුමා ඉදිරිපත් කළ විමලනාග මැතිතුමාගේ චරිතයේ ගුණාංග අපිත් අනුමත කරනවා.

විමලනාග මැතිතුමා අවංක දේශපාලනඥයෙක්, හිතට එකඟව වැඩ කරපු දේශපාලනඥයෙක්, මහජනතාව වෙනුවෙන් කැප වුණු දේශපාලනඥයෙක් වශයෙන් හඳුන්වන්නට කැමැතියි. 1970-77 දක්වා කාලය තුළ පැවති සමගි පෙරමුණු රජයේ කොලොන්න ආසනයේ මන්ත්‍රීවරයකු ලෙස එතුමා කටයුතු කළා. ඒ වාගේම කොලොන්න වැනි දුෂ්කර ප්‍රදේශයක එතුමා විසින් කරපු ඒ සේවාව විශේෂයෙන්ම මේ අවස්ථාවේ මම ගෞරවයෙන් සිහිපත් කරනවා. සමසමාජ පක්ෂයේ මධ්‍යම කාරක සභිකයකු ලෙස කටයුතු කළ එතුමා මන්ත්‍රීවරයකු ලෙස සිය නිල කාලය තුළ දී ඇඹිලිපිටිය උසාවිය ආරම්භ කිරීම, ඇඹිලිපිටිය කඩදාසි කම්හල ආරම්භ කිරීම, කොලොන්න ප්‍රදේශයේ දුෂ්කර ප්‍රදේශවල මහාමාර්ග ඉදි කර බස් ධාවනය ඇරඹීම, පාසල් සංවර්ධනය, ආරෝග්‍යශාලා සංවර්ධනය, දුෂ්කර ගම්මානවලට විදුලි බලය සැපයීම ආදී විශාල සමාජ සේවා කටයුතු රාශියකටම බොහොම ඕනෑකමින්, කැප වීමෙන් කටයුතු කළා.

එතුමා ජනතාව සමඟම ජීවත් වුණු දේශපාලනඥයෙක්. කොළඹ ආනන්ද විද්‍යාලයෙන් සහ කෝට්ටේ ආනන්ද ශාස්ත්‍රාලයෙන් පාසල් අධ්‍යාපනය ලබා ගනිමින් විමලනාග මැතිතුමා, 1952 වසරේදී පේරාදෙණිය විශ්වවිද්‍යාලයට ඇතුළත්ව උසස් අධ්‍යාපනය ලබා 1957 දී නීති විද්‍යාලයට ඇතළත් වී නීති උපාධිය ලබා ගත්තා. පසුව අධි නීතිඥවරයකු ලෙස කටයුතු කරමින් සිටින අතරතුර විමලනාග මැතිතුමා සැම්බියා රජයේ නීති උපදේශකයකු ලෙස වසර හතරක් සේවය කරනු ලැබුවා. එතරම් දීර්ඝ සේවයක් කිරීමට අවස්ථාව ලැබුණේ එතුමාගේ තිබුණු හැකියාව නිසායි. ඒ වාගේම වාමාංශික ව්‍යාපාරය තුළ විශේෂයෙන්ම අද දුර්ලභ මහත්මා දේශපාලනයේ නියැළුණු විමලනාග මැතිතුමා 2009 මැයි මස 20 වැනි දින පරලෝ සැපත් වුවත් එතුමා විසින් කරපු ඒ සේවාව ඒ ප්‍රදේශයේ ජනතාව තවමත් බොහොම ආදරයෙන් මතක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේ දී එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් අපි එතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරන අතර, එතුමාගේ මැතිනිය දූ දරුවන් ඇතුළු පවුලේ සියලු දෙනාටම අපගේ ශෝකය පුද කරන්නට කැමැතියි.

[අ. භා. 4.48 ]

**ගරු දි.මු. ජයරත්න මහතා (අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு டீ.எம்.ஜயரத்ன - பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சரும்)
(The Hon. D.M. Jayaratne - Prime Minister, Minister of Buddha Sasana and Religious Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පී.ඕ. විමලනාග මැතිතුමා ශ්‍රී ලංකා සමසමාජ පක්ෂයේ සාමාජිකයකු හැටියට දීර්ඝ කාලයක් සේවය කරලා 1970 දී අපේ කාල සීමාවේදී අපිත් එක්ක පාර්ලිමේන්තුවට ඉදිරිපත් වුණා. එතුමා උගතෙක්; නීතිඥයෙක්; ඉතාම දක්ෂ කථිකයෙක්. එදා පාර්ලිමේන්තුවේ හැන්සාඩ් වාර්තා අරගෙන බැලුවොත් තමුන්නාන්සේලාට දැක ගන්න පුළුවන්, එතුමා රට වෙනුවෙන් කොපමණ ක්‍රමානුකූලව, කොපමණ ප්‍රයෝජනවත්ව තමන්ගේ වචන පාවිච්චි කරලා තිබෙනවාද කියලා. වෙන අය වාගේ එතුමා වචන දෙකක් පාවිච්චි කළේ නැහැ. ඕනෑ වෙලාවක, ඕනෑ කෙනකු එක්ක කෙළින්ම තමන්ගේ අදහස් ප්‍රකාශ කළා. තමන්ගේ පහසුවට, වාසියට අදහස් වෙනස් කර ගත්තේ නැහැ. ඒ වාගේම හැම වෙලාවේම පාර්ලිමේන්තුව තුළදී පමණක් නොවෙයි, අපේ group එකේදීත්, අනික් අවස්ථාවලදීත් බොහොම එඩිතරව ක්‍රියා කරපු, කථා කරපු දේශපාලනඥයෙක් තමයි පී.ඕ. විමලනාග මැතිතුමා.

ඒ විතරක් නොවෙයි. දේශපාලන පක්ෂ වශයෙන් වෙනත් වෙනත් පක්ෂ තිබුණත් හැම දාම අපි සියලු දෙනාම එකට එකතු වෙලා තමයි ක්‍රියා කළේ. කිසිම දවසක අපේ වෙනසක් ඇති වුණේ නැහැ. අපට පුළුවන් වුණා, හැම දාම එකතුව ක්‍රියා කරන්න. එකතුව කොපමණ ක්‍රියා කරන්න පුළුවන් වුණාද කිව්වොත් ඒ කාල සීමාව තුළදී අපේ එන්.එම්. පෙරේරා මැතිතුමාගේ -මුදල් අමාත්‍යතුමාගේ- අය වැය ලේඛනය පවා වෙනස් කරන්න අපට පුළුවන් වුණා. ඔන්න අපේ මන්ත්‍රීවරුන්ගේ එකතුවේ තත්ත්වය. එයට සාක්ෂිකරුවෙක් වන අපේ වාසුදේව නානායක්කාර මැතිතුමා මේ ළඟම ඉන්නවා. ඒ වාගේ අපි එකට එකතු වෙලායි සාකච්ඡා කළේ. රජය තීරණ ගන්නා අවස්ථාවලදී ඒ තීරණය කොපමණ දුරට හරිද, ඒවා වෙනස් කරන්න ඕනෑද කියලා අපි සාකච්ඡා කළා. සෑම පනත් කෙටුම්පතක් සම්බන්ධයෙන්ම අපි සාකච්ඡාවන් පැවැත්වූවා, ඒ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ගෙනෙන්න ඉස්සෙල්ලා. ඒවායේ තිබුණු අඩු පාඩුකම් සම්පූර්ණ කළා. සමහර ඒවාට සමහර මන්ත්‍රීවරු විරුද්ධ වුණා. ඒ වාගේ කටයුතුවලදී බොහොම එඩිතරවත්, හරියාකාරවත් තමන්ගේ අදහස් ප්‍රකාශ කරමින් ක්‍රියා කරපු දක්ෂ, විචක්ෂණ මන්ත්‍රීවරයෙක් තමයි පී.ඕ. විමලනාග මැතිතුමා.

මා ඉස්සෙල්ලා කිව්වා වාගේ විමලනාග මැතිතුමා තමන්ගේ පක්ෂය කෙරෙහි බොහොම ගෞරවයෙන්, බොහොම විශ්වාසවන්තව ක්‍රියා කළා. එතුමා පක්ෂය ආරක්ෂා කිරීමට කටයුතු කළා. අපි සියලු දෙනාම එකතුව සිටියත්, තමන්ගේ පක්ෂය ආරක්ෂා කරන්න ඕනෑය කියන හැඟීමකින් ඒ පක්ෂත් එක්ක කටයුතු කළා. අපි එන්.එම්. පෙරේරා මැතිතුමාගේ මුදල් පනතකට විරුද්ධ වෙන්න ගිය අවස්ථාවේදී එතුමා තනියම ගිහින්

[ගරු දි.මු. ජයරත්න මහතා]

ඒ පිළිබඳව සාකච්ඡා කළා. එහෙම සාකච්ඡා කරලා ඇවිත් අපට කිව්වා, "මා මෙහෙම සාකච්ඡා කළා. එන්.එම්. සහෝදරයා ඒකට කැමැතියි. ඒකේ වෙනසක් නැහැ"යි කියලා. නායකත්වය ආරක්ෂා කිරීමේ වැඩ පිළිවෙළවල්වලදීත්, පක්ෂය ආරක්ෂා කර ගැනීමේ වැඩ පිළිවෙළවල්වලදීත් එතුමා එහෙම ක්‍රියා කරලා තිබෙනවා. පාර්ලිමේන්තුව තුළදීත් ඒ විධියට ක්‍රියා කරලා තිබෙනවා.

අපේ ගරු ඇමතිතුමා ප්‍රකාශ කළා වාගේ තමන්ගේ ප්‍රදේශයේ දියුණුව සඳහා, සාමාන්‍ය ජනතාවගේ දියුණුව සඳහා එතුමා කටයුතු කළා. එතුමාගේ ඡන්ද කොට්ඨාසය ඒ කාල පරිච්ඡේදය තුළ රත්නපුරයේ තිබුණු නොදියුණුම ප්‍රදේශය කියා කියන්න පුළුවන්. එම ප්‍රදේශය දියුණු කිරීමට එතුමා විශාල වැඩ කොටසක් ක්‍රියාත්මක කළා. එතුමා පාර්ලිමේන්තුව තුළදීත් ඒ වාගේ ක්‍රියාත්මක වුණා; පක්ෂය තුළත් ඒ වාගේ ක්‍රියාත්මක වුණා; පාර්ලිමේන්තු කණ්ඩායම තුළත් ඒ වාගේ ක්‍රියාත්මක වුණා. එතුමා අන්න ඒ වාගේ ඉතා දක්ෂ අන්දමින් ක්‍රියා කරපු ශ්‍රේෂ්ඨ මන්ත්‍රීවරයෙක් හැටියට අපට ප්‍රකාශ කරන්න පුළුවන්. තමන් වෙනුවෙන් ඡන්දය පාවිච්චි කරලා, තමන්ට බලය ලබා දීලා, ඒ බලය තුළින් සේවාවක් ලබා ගන්න බලාපොරොත්තු වූ ජනතාවටත්, සමස්ත -ලංකා වාසි- ජනතාවටත්, තමන්ගේ පක්ෂය වන සමසමාජ පක්ෂයටත් පාර්ලිමේන්තුව තුළදීත්, ඉන් පිටතදීත් ගෞරව දක්වමින්, ඒ සඳහා කරන්න ඕනෑ සියලු සේවාවන් ඉතාමත් උත්කර්ෂවත් අන්දමින් කළ විමලනාග මැතිතුමා අද අපි ඉතාම ගෞරවයෙන් අනුස්මරණය කරනවා. එසේ අනුස්මරණය කරමින්, එතුමාගේ ඥාතීන්ටත්, පවුලේ අයටත්, හිත මිත්‍රාදීන්ටත් අපේ ශෝකය ප්‍රකාශ කරන ලෙස ඔබතුමාගෙන් ඉල්ලනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි, ගරු අග්‍රාමාත්‍යතුමාට.

ඊ ළඟට ගරු මහාචාර්ය තිස්ස විතාරණ අමාත්‍යතුමා.

[අ. භා. 4.52 ]

**ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා (විද්‍යාත්මක කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண - விஞ்ஞான அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Prof.) Tissa Vitarana - Minister of Scientific Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාගෙන් අවසරයි. අද මම මේ සභාවේ නැඟිට වචන ස්වල්පයක් කථා කරන්නේ ලංකා සමසමාජ පක්ෂයේ නායකයෙක් හැටියට දීර්ඝ කාලයක් ක්‍රියා කරපු මගේ මිත්‍ර පී.ඕ. විමලනාග මහතාගේ අභාවය වෙනුවෙන් එතුමාගේ බිරිඳටත්, ළමයින්ටත්, අනෙකුත් ඥාතීන්ටත් ලංකා සමසමාජ පක්ෂය වෙනුවෙන් අපේ බලවත් ශෝකය පළ කිරීමටයි.

විමලනාග සහෝදරයා අපේ පක්ෂයේ දේශපාලන දර්ශනය, ඒ සමාජවාදී දර්ශනය සම්පූර්ණයෙන්ම පිළි අරගෙන එතුමාගේ දේශපාලන ජීවිතය ඒ අනුව හැඩ ගස්වා ගත්තා. දුක් විඳින ජනතාව, පීඩිත ජනතාව වෙනුවෙන් එතුමාගේ මුළු ජීවිතයම කැප කළා. නීතිඥවරයෙක් හැටියට කටයුතු කරද්දී එතුමා දුප්පත් ජනතාවගේ නීති කටයුතුවලදී නොමිලේ පෙනී හිටි බව අපි දන්නවා. ඉතින් එවැනි පුද්ගලයෙක් ගැන මේ අවස්ථාවේදී වචන ස්වල්පයක් කථා කිරීමට පුළුවන් වීම මම භාග්‍යයක් හැටියට සලකනවා.

විමලනාග සහෝදරයා තම අධ්‍යාපනය කෝට්ටේ ආනන්ද ශාස්ත්‍රාලයෙනුත්, කොළඹ ආනන්ද විද්‍යාලයෙනුත් ලබා ගෙන පසුව ගුරුවරයෙක් හැටියට ආනන්ද ශාස්ත්‍රාලයේ කටයුතු කළා. එතුමාගෙන් ඉගෙන ගත්තු ශිෂ්‍යයන් අතරේ සිටි එක් අයෙකු තමයි වර්තමාන ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා. ගරු ජනාධිපතිතුමා මතක් කළා ගුරුවරයෙක් හැටියට විමලනාග මහතාගෙන් එතුමාට බැණුම් අහන්න වුණු බව. ඒ අනුව එතුමා අපේ රටේ වැදගත් අයට උගන්වපු ගුරුවරයෙක් කියලා අපි සිහිපත් කරන්න ඕනෑ.

විමලනාග සහෝදරයා විභාග සමත් වෙලා නීතිඥවරයෙක් හැටියට, අධිනීතිඥවරයෙක් හැටියට එතුමාගේ වෘත්තියේ උසස් තැනකට පත් වුණා. මුදල් හම්බ කිරීමේ අරමුණින් නොවෙයි ජනතාවට සේවයක් කිරීමේ අරමුණින් යුතුවයි එතුමා ඒ තත්ත්වයට පත් වුණේ. මම කිව්වාක් මෙන් එතුමා අපේ පක්ෂයේ වෘත්තිය සමිතිවල කටයුතු කරද්දීත්, එක්සත් වෙළෙඳ සේවක මණ්ඩලයේ සභාපති හැටියට කටයුතු කරද්දීත් කම්කරුවන් වෙනුවෙන් නොමිලේ පෙනී ඉඳලා පරදින්න යන නඩු පවා දිනා දෙන්නට දක්ෂ වුණා.

මම මෙතැනදී මේ කාරණය විශේෂයෙන් සඳහන් කරන්න කැමැතියි. එතුමා ලංකා සමසමාජ පක්ෂයෙන් කොලොන්නට තරග කරලා 1970 පැවැති මැතිවරණයේදී ජය ගත්තා. එපමණක් නොවෙයි, ඉතාමත්ම දුෂ්කර ප්‍රදේශයක් වූ කොලොන්නේ ජනතාවත් එක්ක කිට්ටු සම්බන්ධයක් ඇති කර ගනිමින්, ඒ ජනතාවගේ දුක තේරුම් ගනිමින්, ඒ ජනතාව වෙනුවෙන් ඇප කැප වෙලා එතුමා කරපු සේවය අපට කවදාකවත් අමතක වන්නේ නැහැ.

මට මතකයි අපේ සමසමාජ පක්ෂයේ කොල්වින් ආර්. ද සිල්වා සහෝදරයාගේ ප්‍රධානත්වයෙන් කෘෂිකර්ම කොමිටියක් තිබුණා. ඒ කොමිටියේ සාමාජිකයකු හැටියටත් විමලනාග සහෝදරයා කටයුතු කළා. එතුමා ඇඹිලිපිටියේ කොලොන්න ගොවි ජනතාවගේ අපහසුතාවන් ගැන වාර්තා කර ගෙන ඇවිල්ලා අපේ සාකච්ඡාවලදී ඒ අයගේ ප්‍රශ්න ඉතාම වැදගත් ලෙස මතු කරමින් ඒවා තේරුම් අර ගෙන දේශපාලන ක්‍රියාවල යෙදෙන්න අපට මඟ පෑදුවා. කම්කරු පන්තිය වෙනුවෙන් පමණක් නොවෙයි, ගොවි ජනතාව වෙනුවෙනුත් එතුමා විශිෂ්ට සේවාවක් ඉෂ්ට කළාය කියා අප මතක් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ පක්ෂය ජාති භේදය, ආගම් භේදය, කුල භේදය ප්‍රතික්ෂේප කරන පක්ෂයක්. අපේ අරමුණ එක ලාංකික ජනතාවක් හැටියට සියලු දෙනාම එක් වී ලාංකික සංස්කෘතියක්, ලාංකික අනන්‍යතාවක් ගොඩ නැඟීමයි. එතුමා තම මුළු ජීවිත කාලය තුළම එය පිළිපැද්දා. මා සතුටුයි කියන්න විමලනාග සහෝදරයා කොලොන්න කියන ඉතාම දුෂ්කර ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් කරපු සේවය ඉමහත් සේවයක් බව. යටිතල පහසුකම් දියුණු කිරීම පැත්තෙන් පමණක් නොවෙයි, එතුමා ඒ පළාතේ ජනතාවට අවශ්‍ය වන සේවාවන් ලබා දීමටත් වෙහෙසිලා ක්‍රියා කළා. ඒත් එක්කම එතුමාගේ මතයක් තිබුණා දුෂ්කර පළාත්වල කර්මාන්තකරණයකුත් ඇති කරන්න ඕනෑ කියලා. එය කිරීමට තමයි එතුමා කඩදාසි කම්හලක් ඇඹිලිපිටියේ ඇති කිරීමට මූලිකත්වය අර ගෙන කටයුතු කළේ. තමන්ගේ වෘත්තිය පදනම් කර ගෙන උසාවියකුත් ඇඹිලිපිටියට ලබා ගැනීමට එතුමා කටයුතු කළා. මේ ආකාරයට කොලොන්න කොට්ඨාසයට කරපු ඉමහත් සේවය කොලොන්නේ ජනතාව කවදාවත් අමතක කරන්නේ නැහැ කියායි මා හිතන්නේ. දැන් කොලොන්න ප්‍රාදේශීය සභාවට පත් වෙලා ඉන්න අපේ පක්ෂයේ සභාපති දයා පතිරණ සහෝදරයා විශේෂ සමුළුවක් පැවැත්වූවා පී.ඕ. විමලනාග සහෝදරයා සිහිපත් කරන්න. කොලොන්නේ විශාල ජන කොටසක් ඒකට සහභාගි වෙලා එතුමා සිහිපත් කළා. ඒ ගැන මම සන්තෝෂ වනවා. එතුමා කරපු සේවය ඒ ජනතාවට

ගිය අවුරුද්ද වන විටත් මතක තිබුණාය, දැනටත් මතක තිබෙනවාය කියා ඒකෙන් ඔප්පු වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා සමාජවාදී දර්ශනය තම ජීවිතය අවසන් වන තුරු පිළිපැද්දා. එතුමා අපේ පක්ෂයේ මධ්‍යම කාරක සභිකයකු පමණක් නොවෙයි, දේශපාලන මණ්ඩල සභිකයකු හැටියටත් අපේ පක්ෂයේ දේශපාලන කර්තව්‍ය, දේශපාලන ගමන ඉදිරියට ගෙන යෑමට ඇප කැප වෙලා මුළු ජීවිත කාලයම ගත කළාය කියා මතක් කරමින් එතුමාගේ වැදගත් සේවය මේ මොහොතේ සිහිපත් කරනවා. ඒත් එක්කම එතුමාගේ බිරිඳටත්, ඥාති පිරිසටත් සමසමාජ පක්ෂයේ බලවත් ශෝකය පළ කරමින් මම මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ. භා. 5.02]

**ගරු වාසුදේව නානායක්කාර මහතා (ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යතුමා)**

( மாண்புமிகு வாசுதேவ நாணாயக்கார - தேசிய மொழிகள், சமூக ஒருமைப்பாட்டு அமைச்சர்)

(The Hon. Vasudeva Nanayakkara - Minister of National Languages and Social Integration)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ශෝක යෝජනා ප්‍රකාශයෙන් අද අප සිහිපත් කරන්නේ මගේ සගයෙක්, මගේ කල්‍යාණ මිත්‍රයෙක්, මගේ දේශපාලන සහෝදරයෙක්, ඒ වාගේම මගේ ගමේ කෙනෙක්. විමලනාග සහෝදරයා ගැන බොහෝ දේ කිව යුතුව තිබෙනවා. ඔහු සතුව තිබුණු පළමුවැනිම ලක්ෂණය, ඔහු ගමෙන් ආපු ගැමි තරුණයකුගේ හැඩරුව ගතිගුණ සෑම කල්හිම පවත්වා ගෙන යෑමයි.

එතුමා ඉතාම ඉහළින් දේශීයත්වය අගය කළා; සියලුම ජනවර්ගයන්ගේ අනන්‍යතාවන්ට ගරු කළා. හැම ජන වර්ගයකගේම අයිතිය ආරක්ෂා කරන්න ඉදිරියට පැමිණියා. සමහර දුෂ්කර අවස්ථාවන්වලදී හානියට පත් වන ජනවර්ගයන් ආරක්ෂා කරන්න එතුමා අවදානම් සහිතව ක්‍රියා කළා. ඒ වාගේම එතුමා "සංස්කෘතිය" නමැති කීර්තිමත් සඟරාවට සිංහල සංස්කෘතිය ගැන ලිපි සැපයූ කෙනෙක්. ඒ වාගේම එතුමා නාට්‍ය කලාවට ඇලුම් කළ කෙනෙක්. එතුමා එවකට සිංහල නාට්‍ය කලාවේ සිටි ප්‍රවීනයන් ඇසුරු කළා පමණක් නොව, එම නාට්‍ය කලාව ප්‍රගුණ කිරීමට, වර්ධනය කිරීමට නොයෙක් විට එම නාට්‍යකරුවන් එතුමාගෙන් උපදේශනයන් පවා ලබා ගත් බව මා දන්නවා.

ගරු සරත් අමුණුගම ඇමතිතුමාට මේ ශෝක යෝජනා අවස්ථාවට එකතු වෙන්නට වුවමනාව තිබුණත් එතුමාට වෙනත් රැස්වීමකට යන්න සිදුවීම නිසා ඒ අවස්ථාව මග හැරී ගියා. එතුමා විශේෂයෙන් සඳහන් කරන්නට බලාපොරොත්තු වුණු දෙය තමයි සිංහල කලාවත් සමග අපේ දිවංගත විමලනාග සහෝදරයාගේ තිබුණු ඇසුර, සමීපතාවය. එයයි මා මෙතෙක් වේලා ඔබ ඉදිරියේ තැබුවේ.

ඊළඟට මා කියන්න ඕනෑ, එතුමා ඉතාමත් සෞම්‍ය ගුණයෙන් යුත් කෙනෙක් බව. ගතිගුණවලින් ඉතාම සෞම්‍යයි; කාරුණිකයි. ඒ වාගේම ඉතාමත්ම සෙනෙහෙවන්තයි; සානුකම්පිකයි. මේ ඔක්කොම ගතිගුණ එතුමා තුළ තිබුණා. ඒ අතින් එතුමා සිහිල් ජල දහරාවක් වාගෙයි. එමෙන්ම සමාජයේ පොදු වුවමනාවන්වලදී එතුමාගේ ගිනියම් වූ සටන්කාමීත්වයකුත් තිබුණා. එතුමා තුළ මේ දෙකම එකට තිබුණා. එතුමා තුළ දේශීයත්වය තිබුණා; සිංහල සාහිත්‍යයට ඇලුම්කමක් තිබුණා පමණක් නොව අන්‍ය ජනවර්ගයන්ගේ අයිතිය රකින්නට පවා ඉදිරිපත් වුණා. මෙන්න මේවායේ එක්තරා මිශ්‍රණයක් ඒ චරිතය තුළ ගැබ්ව තිබුණා. ඒ නිසා විමලනාග චරිතය ඉතාම සුවිශේෂයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු අගමැතිතුමා කිව්වා වාගේ 1970 දී අපි එකට මේ පාර්ලිමේන්තුවට පැමිණි අයයි. ඒ වාගේම අපි එකමුතු රංචුවක් හැදුවා. අපි එදාත් පෙරමුණක්, සන්ධානයක් වුණත් ඒ පක්ෂ, මායිම් හරහා අපි එකතු වෙලා හොඳ නරක බලා සභාවටත්, අපේ කණ්ඩායමටත් යම් යම් කරුණු ඉදිරිපත් කළා. නමුත් ඒ අවස්ථාවලදී අපේ පක්ෂයේ ආරක්ෂාවත්, අනන්‍යතාවත් අපි ආරක්ෂා කර දුන්නා. ඇත්තෙන්ම ඉතින් 1977 මැතිවරණයෙන් අපි ඔක්කොම වාගේ පැරදුණු වෙලාවේ විමලනාග සහෝදරයාත් පැරදුණා. ඒ පරාජයට ප්‍රධාන හේතුව වුණේ අපේ ඇති වුණු බෙදීමයි. ගරු අගමැතිතුමාට මතක ඇති, අපි එදා ඇඩූ කඳුළින් තමයි වෙන වෙනම තරග කළේ. ඒ, අපි පරදින නිසා නොවෙයි. මේ රටේ අනාගතයට සිදු වන අනර්ථය ගැන අපට ඒ වෙලාවේ පෙනුණු නිසායි.

විමලනාග සහෝදරයා තුළ කෘෂිකර්මාන්තය ගැන තිබුණු හසළ දැනුම කියා නිම කරන්න බැහැ. එතුමා කෘෂිකර්මය අධ්‍යයනය කළා; එතුමා කෘෂිකර්මයේ විවිධ පර්යේෂණාත්මක කටයුතුවලට සම්බන්ධ වුණා. ඇඹිලිපිටිය ප්‍රදේශයේ තිබුණු කොළොන්න ආසනය එතුමාගේ රසායනාගාරය හැටියට, නැත්නම් එතුමාගේ ක්ෂේත්‍රය හැටියට අරගෙන ගොවීන්ගෙන් යම් යම් කරුණු විමසමින් තැනින් තැන ගිය කෙනෙක්. ඒ සියලුම කරුණු එකතු කරගෙන ඇවිත් ඒවා යම් එකතුවක් හැටියට හදා ඒවායේ න්‍යායික හරය අපේ මධ්‍යම කාරක සභාවට, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. එතුමා පාර්ලිමේන්තුවේ කළ කතාවල දිගින් දිගටම තිබෙන්නේ ගොවි ජනතාවගේ දුගීභාවය, ගොවි ජනතාවගේ ප්‍රශ්න පිළිබඳ කරුණුයි. අතරමැදියන්ගේ සූරාකෑමට හසු වී සිටි ගොවීන් ගැන, ගොවිතැන්වලට වැය වන විවිධ වියදම් අතර ගිනි පොලියට මුදල් ගන්නට සිදු වී තිබීම ගැන එතුමා එදා ඉතාමත්ම දැඩිව මතක් කළා. මම ඒ ගැන දිගින් දිගටම කතා කරන්නට යන්නේ නැහැ. ඒ එක්කම මා කියන්න ඕනෑ, එතුමාගේ ජීවිතය අතිශයින්ම සරල බව. ඉතා චාම් ජීවිතයක්. අපට ඒ දවස්වල වාහන ලැබුණේ ආණ්ඩුවේ ගබඩාවෙනුයි. පාවිච්චි කරපු වාහන තමයි මන්ත්‍රීවරුන්ට දුන්නේ.

අපි ඒ වාහන ගත්තත්, අපේ විමලනාග සහෝදරයාට කොලොන්න වාගේ ඈත පළාතකට යන්නට ඉන්ධන වියදම් තිබුණේ නැහැ. අපට ලැබුණු ඉන්ධන දීමනාව ඒ සඳහා ප්‍රමාණවත් වුණේ නැහැ. ඒ නිසා අපේ විමලනාග සහෝදරයා ගියේ ලංගම බස් එකේ. එහෙම ගිහිල්ලා ඇඹිලිපිටියේ බැහැලා එතැනින් කොලොන්න දක්වාත්, අනික් තැන්වලටත් කාගේ හරි උදව්වෙන් වාහනයක් ඉල්ලා ගෙන තමයි එතුමා ගියේ. මේ කොළඹ එන එක දිග ගමනක් නිසා එතුමාට අතරමැද නවතින්න වුණේ රත්නපුරයේ. එතුමා නැවතුණේ රත්නපුරයේ පක්ෂ කාර්යාලයේ. පක්ෂ කාර්යාලය එතුමාගේ නිවහනකුත් වුණා. මේ විධියට එදා විමලනාග සහෝදරයා ඉටු කරපු ඒ සේවාව මට මේ වෙලාවේ මතක් වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා පිළිබඳව නොකියාම බැරි එක දෙයක් කියලා මගේ කථාව අවසන් කරනවා.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ එතුමා ශිෂ්‍යයෙක්ව සිටින කාලයේ එතුමා සම සමාජවාදී ඇසුරට එකතු වී සම සමාජ ක්‍රියාකාරිත්වය හා සම සමාජ න්‍යායික අදහස්වල ඉතාමත්ම ප්‍රවීණ පුද්ගලයෙක් වුණා. හෙට අපි සමරන 1953 අගෝස්තු හර්තාලය සිදු වුණේ එතුමා විශ්වවිද්‍යාලයේ ඉන්න කාලයේයි. එහිදී සටන්කාමී ක්‍රියාකරුවෙක් හැටියට විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් සමඟ එකතු වී එදා හර්තාලයට සහයෝගය දීමේ කටයුත්තට එතුමා එකතු වුණා. එහිදී එතුමා කඳුළු ගෑස්වලට මුහුණ දුන්නා; බැටන් පොලු පහරවල්වලට මුහුණ දුන්නා. එතුමා සමහර විට ඒ වෙලාවේ අත් අඩංගුවටත් ගත්තාය කියායි මගේ මතකය. මා හිතන්නේ මේවා තමයි එතුමා ගැන නොකියවුණු කරුණු. නොකියවුණු කරුණු අතර තවත් එක් දෙයක් තිබෙනවා. මේ මන්ත්‍රී ධුරයට එතුමා පත් වුණු හැටියේම කොලොන්නට විශාල ගං වතුරක් ආවා. එහිදී කඩා වැටුණු පස් කඳු අතර තිබුණු ඒ ඉතුරු වුණු ගෙවල්වල

[ගරු වාසුදේව නානායක්කාර මහතා]

එතුමා නැවතුණා. එතුමා කොළඹට ආවේ නැහැ. එතුමා ඒ පස් කඳුවලට යට වෙච්ච ජනයා, ගලා ගිය ජලයට යට වෙච්ච නිවාස ආදිය ගැන සොයා බලමින්, ඒවා පිළිබඳව ගණන් හදමින්, ඔවුන්ට ආධාර එකතු කර දෙන්නට අවශ්‍යතාවන් සොයා බලමින්, රජයට ඒ බැව් දැනුම් දෙමින් එහිම රැඳී සිටියා.

එතුමා කොළඹ ආවේ ආධාර එකතු කරගෙන යන්න පමණයි. එතුමා ඒ විපතට පත් වූ ජනයා අතර ජීවත් වෙමින් තමයි ආධාර බෙදීම ආදී කටයුතුවල යෙදුණේ. විමලනාග මැතිතුමා හැම අතින්ම ආදර්ශවත් චරිතයක්. ඉතාමත්ම අවංකව, ඍජුව කථා කරන චරිතයක්. ඉතා සෞම්‍ය ගුණයෙන් යුත්, ඒ වාගේම සටන්කාමීත්වයෙන් යුත් කෙනෙක්. එතුමාගේ මේ එකිනෙකට මිශ්‍ර වූ ගුණාංගයන් සියල්ලෙන්ම අපූරු චරිතයක් මැවුණු බව මා කිව යුතුයි. විමලනාග සහෝදරයා පිළිබඳ අප පළ කරන මේ අදහස්, අපගේ මේ ශෝකය, එතුමාට අප පළ කරන මේ ගෞරව ප්‍රණාමය අද මෙහි පැමිණ සිටින එතුමාගේ දයාබර බිරිඳ -හේමන්තා සහෝදරිය- හා ඒ පවුලේ දරුවන් ඇතුළු ඒ සියලු දෙනාටම දන්වා සිටින්නැයි කියා ඉල්ලා සිටිමින්, ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුණ වෙනුවෙන් මගේ වචන ස්වල්පය හමාර කරනවා.

[අ. භා. 5.12 ]

**ගරු වයි.ජී. පද්මසිරි මහතා**
( மாண்புமிகு வை.ஜீ. பத்மசிரி)
(The Hon. Y.G. Padmasiri)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ දිවංගත පී.ඕ. විමලනාග මැතිතුමා ගැන ඉතාම ගෞරවයෙන් වචන ස්වල්පයක් කථා කිරීමට මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව පළමු කොටම මා ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. සම සමාජවාදියෙක් හැටියට මේ ගරු සභාවට ඇවිල්ලා, සම සමාජවාදියෙක් හැටියටම මේ ගරු සභාවෙන් ආපහු ගිය, ඒ වාගේම තමන්ගේ ජීවිතයේ අවසානය දක්වාම එම ප්‍රතිපත්තිගරුකභාවය රැක ගෙන කටයුතු කළ ශ්‍රේෂ්ඨ පුරුෂයෙක් පිළිබඳව කරපු ගුණ කථනයන්වලටයි අප මෙතෙක් වේලා සවන් දුන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා ශිෂ්‍ය අවධියේම තමන්ගේ අවබෝධය තුළින්ම මේ දේශපාලන අදහස් හිතට කාවද්දා ගත්තා පමණක් නොවෙයි, ඒවා මේ රටේ ක්‍රියාත්මක කිරීමට නොයෙකුත් කැප කිරීම් කරමින් කටයුතු කරපු උදාර පුරුෂයෙක්. එතුමා නීති ක්ෂේත්‍රයට ඇතුළත් වුණා. ඒ වාගේම ගුරුවරයෙක් වශයෙන් කටයුතු කළා. එලෙසම එතුමා හොඳ දේශපාලන ගුරුවරයෙකුත් වුණා. 1967 වර්ෂයේ මා පාසල් ශිෂ්‍යයෙක් වශයෙන් සිටියදී එතුමාගේ දේශනයකට ඇහුම්කන් දෙන්න මට වාසනාව ලැබුණා. එදා ලංකා සම සමාජ පක්ෂය රුවන්වැල්ල, වරාවල කියන ප්‍රදේශයේ සංවිධානය කරපු ශාස්ත්‍රීය දේශපාලන කඳවුරකදී නැඟී එන තරුණ නායකයන් තුන් දෙනෙකුගේ දේශන තුනක් අහන්න මට අවස්ථාව ලැබුණා.

ඒ එක් කෙනෙක් තමයි මීට පෙර කථාව කළ වාසුදේව නානායක්කාර ඇමතිතුමා. "ලංකාවේ දේශපාලන පක්ෂ හා ඒවායේ පන්ති ස්වරූපය" පිළිබඳ කථාව එතුමා කළා. අතාවුද සෙනෙවිරත්න ජ්‍යෙෂ්ඨ අමාත්‍යතුමා එවකට තරුණයකු හැටියට තව කථාවක් කළා. "සමාජ පරිණාමය පිළිබඳව මාක්ස්වාදී ඇසින්" කියන මාතෘකාවෙන් තමයි ඒ කථාව කළේ. ඊ ළඟ කථාව මා ඇහුවේ දිවංගත පී.ඕ. විමලනාග මැතිතුමාගෙන්. එතුමාගේ මාතෘකාව වූයේ, "ලංකාවේ යුරෝපීය බලපෑම්" යන්නයි. මම අදටත් ප්‍රවේසමෙන් මේ දේශන තුනේ සටහන් තියා ගෙන ඉන්නවා. මා හා මගේ මිතුරන්ට, මගේ වයසේ හිටපු අයට දේශපාලනය පිළිබඳව තව තවත් ඉගෙන ගනිමින් ඉස්සරහට යන්න මේ දේශන තුන ඉතාම ප්‍රයෝජනවත් වුණා. විශේෂයෙන් විමලනාග සහෝදරයා -මන්ත්‍රීතුමා- නියම ගුරුවරයකු වශයෙන්ම හිතට කාවදින පරිදි එතුමාට ආවේණික ශෛලීන් අනුගමනය කරමින් එදා කරපු කථාව ශිෂ්‍යයන් හැටියට අපට පන්ති කාමරයටත් හරි ප්‍රයෝජනවත් වුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

පසු කලෙක මට වාසනාව ලැබුණා එතුමා සමඟ ඉතා ළඟින් එම පක්ෂයේම මධ්‍යම කාරක සභාවේත්, දේශපාලන මණ්ඩලයේත් කටයුතු කරන්න. ඒ නිසා ප්‍රශ්නයක් දිහා බලන ආකාරය පිළිබඳව අපට ඉගෙන ගන්න ලැබුණා. එක පැත්තකින් නොවෙයි පැති කීපයකින් බලමින් අන්තවාදී නොවී ප්‍රශ්නයක් දිහා බලලා තීරණ ගන්න පුළුවන් වන විධියට එවැනි ගුරුවරුන්ගෙන් අපට ඉගෙන ගන්න අවස්ථාව ලැබුණා. ඒ නිසා අපි වාසනාවන්ත වෙලා තිබෙනවා. එක අතකින් එම දැනුම ඉදිරියට ගෙන යන්න අපට ඉදිරි කාලයේදීත්, දැනුත් අවස්ථා උදා වන්නේ එතුමන්ලා වැනි අය ඇසුරු කිරීම නිසායි.

විශේෂයෙන් මන්ත්‍රීවරයකු හැටියට එතුමා ඉතා දුෂ්කර ආසනයක් නියෝජනය කළා. එතුමා කොලොන්න ආසනයට බොහොම ආදරෙයි. කොහේදි හෝ මොනවා ගැන කථා කළත්, ගම ගැන කථා කරන කොට, ගැමිකම ගැන කථා කරන කොට, කෘෂිකර්මය ගැන කථා කරන කොට කොලොන්නෙන්, ඇඹිලිපිටියෙන් උදාහරණ අරගෙන කථා කිරීම එතුමාගේ සිරිතක්. එතුමා හැම දාම කොලොන්න ජනතාවට ආදරය කළා. ගංවතුර විපත් වාගේ අවස්ථාවලදී මන්ත්‍රීවරයකු වශයෙන්, මහජන නියෝජිතයකු වශයෙන් කොහොමද කටයුතු කරන්න ඕනෑ, සමුපකාර ක්ෂේත්‍රයේ කොහොමද කටයුතු කරන්න ඕනෑ, වෘත්තීය සමිති ක්ෂේත්‍රයේදී කොහොමද කටයුතු කරන්න ඕනෑ කියන එක සම්බන්ධව එතුමාට මනා දැනුමක් තිබුණා. සැබෑ මානව හිතවාදියකු හැටියට එතුමා ඒ සියලු ක්ෂේත්‍රවල කැපී පෙනෙන විධියට ඒ යුගයේදී කටයුතු කළා.

එතුමා පාර්ලිමේන්තුවේ සිටි අවුරුදු 7ක කාලය තුළ අවුරුදු 5ක් පමණ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයකු හැටියටත්, අවුරුදු එකහමාරක් පමණ විපක්ෂයේ මන්ත්‍රීවරයකු හැටියටත් කියන ඒ දෙවිධියටම අත් දැකීම් ලබා ගෙන දේශපාලනයෙන් ඉතාම පරිපූර්ණ කෙනෙක් වුණා. එපමණක් නොවෙයි එතුමාගේ සේවය මේ සභාවට සීමා වුණේ නැහැ; මන්ත්‍රී ධුරයට පමණක් සීමා වුණේ නැහැ. ඊට පරිබාහිරව ක්ෂේත්‍ර ගණනාවකටම පැතිරී ගිහිල්ලා ජාත්‍යන්තර වශයෙනුත් එතුමාගේ සේවය මේ ලෝකයට ලබා දුන්නු මහා පුරුෂයෙක් වුණා එතුමා.

මේ අවස්ථාවේදී එතුමාගේ ඒ සේවය අගය කරන අතර, එතුමාගේ අභාවය අපටත්, පක්ෂයටත්, රටටත් පාඩුවක් බව සඳහන් කරන්න ඕනෑ. මේ අවස්ථාවේදී අනෙක් සියලු ගරු මන්ත්‍රීතුමන්ලාගේ, ඇමතිතුමන්ලාගේ කථා මඟින් එතුමා පිළිබඳ කරපු ගුණ ගායනා අනුමත කරමින්, එතුමාගේ අභාවය පිළිබඳව විමලනාග මැතිනියටත්, දියණිවරුන්ටත්, ඥාතීන්ටත් අපගේ ශෝකය පළ කරන මෙන් ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ. භා. 5.17]

**ගරු ඩිව් ගුණසේකර මහතා (මානව සම්පත් පිළිබඳ අමාත්‍යතුමා)**
(மாண்புமிகு டியூ குணசேகர - மனித வளங்கள் அமைச்சர்)
(The Hon. DEW Gunasekara - Minister of Human Resources)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විමලනාග මන්ත්‍රීතුමා ගැන ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය වෙනුවෙන් කෙටියෙන් වචන කිහිපයක් කථා කරන්න මා බලාපොරොත්තු වනවා.

විමලනාග මන්ත්‍රීතුමා ශිෂ්‍ය අවධියේදී වමේ ව්‍යාපාරයට එක් වෙලා ලංකා සමසමාජ පක්ෂයේ ඉහළ මණ්ඩලයට පත් වෙලා, අවසන් හුස්ම හෙළන තුරු එම පක්ෂයේ ධජය ඉහළින් ඔසවා ගෙන ගිය සහෝදරයෙක්. එතුමා වඩා හොඳ තණබිම් සොයා ගෙන ගිය කෙනෙකු නොවෙයි. ඉතාම දුෂ්කර තත්ත්වයන් යටතේ තමයි එතුමා දේශපාලනය කළේ. එතුමාගේ පෞද්ගලික ජීවිතයත්, දේශපාලන ජීවිතයත් එකට බද්ධ වෙලායි තිබුණේ. විශේෂයෙන්ම එතුමා 1970 දී කොලොන්න ආසනයට තරග කරන විටත්, ඊට පස්සේ 1977 දී යළිත් වරක් කොලොන්න ආසනයට තරග කරන කොටත් යාබද තංගල්ල ආසනයේ තරග කරපු මට එතුමාත් එක්ක ඒ මැතිවරණ ව්‍යාපාරවල යෙදෙන්න සිදු වුණා.

1977 මැතිවරණයේ අවසාන රැස්වීම් දිනයේ ආචාර්ය එන්.එම්.පෙරේරා මැතිතුමාත් එක්ක මා කොලොන්න ආසනයේ අවසාන රැස්වීමට ගියා මට මතකයි. විමලනාග මැතිතුමා නිවැරැදි යැයි තෝරා ගත්ත දර්ශනය, නිවැරැදි යැයි තෝරා ගත්ත පක්ෂය, නිවැරැදි යැයි තෝරා ගත්ත වමේ ව්‍යාපාරය අවසන් හුස්ම හෙළන තුරු ඉහළින්ම ඔසවා ගෙන හිටියා.

ප්‍රත්පත්තිගරුක, නිහතමානී, අව්‍යාජ, අවංක පුද්ගලයෙක් තමයි විමලනාග සහෝදරයා. එතුමාත් සමඟ අපි පසු ගිය කාලයේ දේශපාලන කටයුතු කළා. ඒ අවධියේ ලංකා සමසමාජ පක්ෂයේ දේශපාලන මණ්ඩලයත්, ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයේ දේශපාලන මණ්ඩලයත් රටේ පවතින තත්ත්වයන් පිළිබඳව එකට හිඳ ගෙන සාකච්ඡා කරන කොට එතුමා ඉතා ව්‍යක්ත ලෙස අදහස් ඉදිරිපත් කළ හැටි මට මතකයි.

ඇත්ත වශයෙන්ම එතුමා බුද්ධිමතෙක්; දේශපාලන ගුරුවරයෙක්. මා හිතන හැටියට අපේ ජනාධිපතිතුමාගේත් ගුරුවරයෙක්. එතුමාගේ පාසල් වියේදී ඉගැන් වූ ගුරුවරයෙක්. ඉතාම දුෂ්කර ආසනයක් වූ කොලොන්න ආසනයේ ජනතාව වෙනුවෙන් ඉමහත් සේවයක් කළ නිසා තමයි අදත් කොලොන්න ආසනයේ ප්‍රාදේශීය සභාවේ ඉහළම තනතුර එක්සත් ජනතා නිදහස් සන්ධානය වෙනුවෙන් නියෝජනය කරන්න ලංකා සමසමාජ පක්ෂයට අවස්ථාව ලැබී තිබෙන්නේ. ඒ ලැබීමෙන් විමලනාග සහෝදරයා ඒ ආසනයට කළ කැප කිරීම්, එතුමාගේ දායකත්වය ඉහළින්ම ඒ ජනතාව අගය කරන බව පෙනුණා.

ගරු වාසුදේව නානායක්කාර අමාත්‍යතුමා කිව්වා වාගේ 1953 වර්ෂයේ ඒ මහා දැවැන්ත හර්තාලය වෙලාවේ එතුමා විශ්වවිද්‍යාල ශිෂ්‍යයකු විධියට පෙරමුණේ ඉඳ ගෙන සටන් කළ බව අපට සිහිපත් වෙනවා.

මට පෙර කථා කළ සියලුම මන්ත්‍රීවරුන් ඉදිරිපත් කළ අදහස් අනුමත කරමින් ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය වෙනුවෙන් අපේ සාතිශය සංවේගය එතුමාගේ පවුලේ අයට මම පිරි නමනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපගේ ශෝකය ඒ පවුලේ අය වෙත දන්වා යවන ලෙස ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
**(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)**
(The Presiding Member)
හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු පී.ඕ. විමලනාග මහතාගේ අභාවය පිළිබඳව පාර්ලිමේන්තුවේ දෙපාර්ශ්වයෙන්ම කරන ලද ශෝක ප්‍රකාශ අනුමත කරමින් මම ද ඒ සමඟ සම්බන්ධ වීමට කැමැත්තෙමි. අද දින රැස්වීමට අදාළ නිල වාර්තාවේ පිටපත් ශෝකයට පත් පවුලේ අය වෙත යවන මෙන් පාර්ලිමේන්තුවේ මහලේකම්තුමාට මම නියෝග කරමි.

Order, please! Now, we will take up the Vote of Condolence on the late Hon. Alhaj N.M. Buhardeen.

## ශෝක ප්‍රකාශය: ගරු අල්හාජ් එන්.එම් බුහාර්දීන් මහතා
### அனுதாபத் தீர்மானம்: மாண்புமிகு அல்ஹாஜ் என்.எம்.புஹார்டீன்
### VOTE OF CONDOLENCE: HON. ALHAJ N.M. BUHARDEEN

[අ. භා. 5..21 ]

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා )**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Irrigation and Water Resources Management and Leader of the House of Parliament)

පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් මෙම උත්තරීතර සභාව නියෝජනය කරන ලද අල්හාජ් නූර් මොහොමඩ් බුහාර්දීන් මැතිතුමාගේ අභාවය 2009 ජූලි මස 19 වැනි දින සිදු වූයෙන් එතුමා පිළිබඳ ශෝකය පළ කිරීමේ යෝජනාවක් මම මේ අවස්ථාවේදී ගරු සභාවට ඉදිරිපත් කරන්නෙමි.

මහනුවර දිස්ත්‍රික්කයේ අකුරණදී නබීෂා උම්මා මහත්මියත්, නූර් මොහොමඩ් මහතාත් මව් පිය දෙපළ කර ගනිමින් 1936 සැප්තැම්බර් මස 25 වැනි දින නූර් මොහොමඩ් බුහාර්දීන් මහතා මෙළොව එළිය දුටුවේය. කුරුණෑගල ශාන්ත අන්තෝනි විද්‍යාලයෙන් අධ්‍යාපනය ලද එතුමා පාසල් අධ්‍යාපනයෙන් පසු 1965 වසරේ සිටම ව්‍යාපාර ක්ෂේත්‍රයට පිවිසුණු අතර ඇඟලුම්, රෙදිපිළි, ප්‍රවාහන, වෙළඳ ද්‍රව්‍ය සහ බඩු ගබඩා, නැවු බඩු ආදී විවිධ ක්ෂේත්‍රයන් සම්බන්ධ ෆෙයාර් ලයින් සමූහ ව්‍යාපාරය ආරම්භ කර එහි සභාපති වශයෙන් කටයුතු කළේය.

සිත්ති ෆරීඩා මෙනෙවිය සමඟින් යුග දිවි ගමන් ඇරඹීමෙන් පසු බුහාර්දීන් යුවළ මොහොමඩ් ඉම්තියාස් බුහාර්දීන් නැමැති පුතෙකුත්, දියණියන් සිව් දෙනෙකුත් මෙළොවට දායාද කළේය. 1970 වර්ෂයේදී දේශපාලනය හා සම්බන්ධ වූ එතුමා 1989 දී ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රස් ජාතික ලැයිස්තුවෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස පත් කිරීමෙන් පසු මෙම උත්තරීතර සභාවේ අසුන් ගත්තේය.

ඉන්පසු එක්සත් ජාතික පක්ෂය හා සම්බන්ධ වූ බුහාර්දීන් මහතාට 1994 වර්ෂයේ පැවැති මහා මැතිවරණයේදී එම පක්ෂයේ අපේක්ෂකයකු ලෙස මාතලේ දිස්ත්‍රික්කයට තරග වැදී මනාප විශාල සංඛ්‍යාවක් ලබා සිව් වැනි ස්ථානයට පැමිණීමට හැකි වුවද පාර්ලිමේන්තුවට පිවිසීමට එය ප්‍රමාණවත් නොවිණි.

ශ්‍රී ලංකාව තුළ ඇඟලුම් කම්හල් පිහිටුවීමේ පුරෝගාමියකු වෙමින් 1977 දී ග්‍රාමීය ප්‍රදේශ තුළ ඇඟලුම් කම්හල් පිහිටුවීමේ අවස්ථාවට අහම්බෙන් මෙන් සම්බන්ධ වීමට එතුමාට හැකියාව ලැබිණි. එම අවස්ථාවෙන් ප්‍රයෝජන ගනිමින් හාරිස්පත්තුව, අකුරණ, මහයියාව, අලවත්ගොඩ, වරකාමුර, රත්මලාන හා ගල්කිස්ස වැනි දිවයින පුරා ස්ථාන ගණනාවක කම්හල් ඇරඹූ මෙම ව්‍යාපාරිකයාට එතුළින් රැකියා අවස්ථා 10,000කට වඩා සපයා දීමට හැකියාව ලැබිණි. ජාත්‍යන්තර වශයෙන් වෙළෙඳ සම්බන්ධතාවයක් ගොඩ නඟා ගෙන සිටි එතුමා යටතේ සේවක සේවිකාවන් 50,000කට වඩා විවිධ සේවාවන්වල නියැළී සිටි අතර, එම ව්‍යාපාර තුළින් ඉතා විශාල විදේශ විනිමය ප්‍රමාණයක් ශ්‍රී ලංකාවට හිමි කර දීමට ද හැකියාව ලැබිණි.

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

දශක තුනක් තිස්සේ මහනුවර, නුවරඑළිය, කොළඹ සහ අකුරණ වැනි නගර කේන්ද්‍ර කර ගනිමින් වෙළෙඳ සල් සහ ගබඩා රැසක් පිහිටු වූ අතර එන්එම්බී පදනම ආරම්භ කර එමඟින් විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් රැසකට ශිෂ්‍යත්ව පිරිනැමීමටද පියවර ගත් එතුමා මහා මාර්ග, පාලම්, නිවාස ආදිය ඉදිකරවා දෙමින් විශාල මහජන සේවාවකද නියැළුණි. ප්‍රදේශයේ පැවැති අඩු පාඩු සොයා බලමින් ඒවා පිරිමසා දීමට ද එතුමා නිරන්තරයෙන්ම සැදී පැහැදී සිටියේය.

සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂා තුනෙන්ම කථා කිරීමේ මනා හැකියාවකින් පිරිපුන්ව සිටි එතුමා අධ්‍යාපනය හදාරන දූ දරුවන්ගේ යහපත නිතැතින්ම ප්‍රාර්ථනා කළේය. එම දරුවන් වෙනුවෙන් පාසල් ගොඩනැඟිලි ඉදි කර දෙමින් අධ්‍යාපන කාර්යයෙහිලා විශාල සහයෝගයක් ලබා දුන් බුහාර්දීන් නම් වූ මානව හිතවාදියා ආගම් භේදයකින් තොරව පන්සල් හා පල්ලි ඉදි කිරීම සඳහාත්, ආගමික පුනරුදය ඇති කිරීම සඳහාත් අනුපමේය දායකත්වයක් ලබා දුන්නේය.

දේශපාලන ක්ෂේත්‍රයේත්, ව්‍යාපාරික ක්ෂේත්‍රයේත් එකසේ රැඳී සිටිමින්, රැකී රක්ෂා ලබා දෙමින්, මහජන දියුණුව සලසාලමින්, රට වෙනුවෙන් සුවිශේෂී මෙහෙවරක යෙදී සිටි එතුමා වසර 73ක් ආයු වළඳා 2009 ජූලි 19 වැනි දින මෙලොවින් සදහටම සමු ගත්තේය. එය සමස්ත මුස්ලිම් ජනතාවටත්, පොදුවේ එතුමා යටතේ සේවයේ යෙදී සිටි විශාල පිරිසටත් සිදු වූ බලවත් පාඩුවකි. නූර් මොහොමඩ් බුහාර්දීන් මැතිතුමා ඇදහූ ශුද්ධ වූ ඉස්ලාම් ආගමට අනුකූලව එතුමාට "ජන්නතුල් පිර්දවුස්" නම් ඉහළම ස්වර්ගය ලැබේවාය ප්‍රාර්ථනා කරමි.

කාගේත් හිත දිනා ගැන්මෙහි සමත්කම් දක්වමින් මෙම උත්තරීතර සභාව ශෝභාවත් කළ, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී අල්හාජ් නූර් මොහොමඩ් බුහාර්දීන් මැතිතුමාගේ අභාවය සම්බන්ධයෙන් මෙම පාර්ලිමේන්තුවේ ශෝකය මෙයින් ප්‍රකාශ කරන අතර, වියෝවට පත් එතුමාගේ භාර්යාව වූ සිත්ති ෆරීඩා මහත්මියටත්, පුතනුවන් වූ මොහොමඩ් ඉම්ටියාස් බුහාර්දීන් මහතාට සහ දියණියන්ටත්, පවුලේ ඥාතීන් වෙතටත්, අප සැමගේ ශෝකය දන්වා යවන ලෙස යෝජනා කර සිටිමි.

[අ. භා. 5.26]

**ගරු කරු ජයසූරිය මහතා**
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දිවංගත ගරු අල්හාජ් එන්.එම්. බුහාර්දීන් මැතිතුමාගේ කීර්තිමත් දේශපාලන ජීවිතය සම්බන්ධයෙන් දීර්ඝ විස්තරයක් සභානායකතුමා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබුවා. කාල සීමාව ඉතාමත් සීමිතව ඇති බැවින් දීර්ඝ කථාවක් කරන්න බලාපොරොත්තු නොවුණත් එතුමාගේ විශිෂ්ට දේශපාලන චරිතාපදානය සම්බන්ධයෙන් ඉදිරිපත් කළ සියලු අදහස්වලට අපේ එකඟතාවය මේ අවස්ථාවේදී පුද කරනවා. ඒ වාගේම මා පෞද්ගලිකව බුහාර්දීන් මැතිතුමා දැන ගෙන සිටියා. අපි බොහෝ කාලයක් හිතවත්ව කටයුතු කළා.

ව්‍යාපාරිකයෙක් වශයෙනුත් ඒ වාගේම මන්ත්‍රීවරයෙක් වශයෙනුත් එතුමා කරපු සේවාව මා මේ අවස්ථාවේදී සිහිපත් කරනවා. ඒ වාගේම අල්හාජ් බුහාර්දීන් මැතිතුමා මෙම පාර්ලිමේන්තුව නියෝජනය කළ පරිණත දේශපාලනඥයෙක් වශයෙන් හඳුන්වන්න කැමැතියි. 1936 සැප්තැම්බර් 25 වන දා අකුරණදී උපත ලද එතුමා කුරුණෑගල ශාන්ත අන්තෝනි විද්‍යාලයෙන් අධ්‍යාපන ලැබුවා.

ඉන් පසු වෘත්තීයමය වශයෙන් ව්‍යාපාරිකයකු ලෙස ප්‍රකට වූයේ ඇඟලුම්, සංචාරක ක්ෂේත්‍රය සහ නැව්ගත කිරීම් වැනි කැපී පෙනෙන අංශ කීපයක් නියෝජනය කරමින් එතුමා ක්‍රියා කළ නිසායි. ඒ වාගේම එතුමා Fairline Group of Companies කියලා ඉතාමත් සාර්ථක ව්‍යාපාරයක් ගොඩ නැඟුවා. ජනාධිපති ප්‍රේමදාස මැතිතුමාගේ කාලයේ, විශේෂයෙන්ම ඇඟලුම් කර්මාන්තශාලා බොහෝ ගණනක් එතුමා සාර්ථකව ආරම්භ කළ ආකාරය මට මෙතැනදී මතක් වනවා.

සිත්ති ෆරීඩා මහත්මිය සමඟ විවාහ වී සිටි බුහාර්දීන් මැතිතුමා හට දූ දරුවන් පස් දෙනකු සිටියා. පුතා මොහොමඩ් ඉම්ටියාස් බුහාර්දීන්, ඒ වාගේම දූවරුන් ෆාතිමා රිස්ලා ෆාරිස්, ෆාතිමා ජෙසිලා අසාර්, ෆාතිමා රුස්නා රුස්නි, ෆාතිමා ෆර්හානා බුහාර්දීන් යන බොහොම ආදරණීය දූ පුතුන් පස් දෙනෙක් සිටියා. එතුමා දේශපාලන ගමන පටන් ගත්තේ 1970 දශකයේදී. ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසයේ ජාතික ලැයිස්තු මන්ත්‍රීවරයකු වශයෙන් 1988 දී පාර්ලිමේන්තුවට පැමිණි බුහාර්දීන් මැතිතුමා කෙතරම් වරප්‍රසාදයක් දිනා ගත්තාද කියනවා නම්, 1994 වසරේදී පාර්ලිමේන්තුවට තේරී පත් නොවුණත්, මාතලේ දිස්ත්‍රික්කයේ අපේක්ෂකයන් අතර හතර වැනි ස්ථානයට මනාප ලබා ගත් අපේක්ෂකයා බවට පත්වන්නට හැකියාව ලැබුණා.

මට මතකයි, එතුමා එක්සත් ජාතික පක්ෂයට සම්බන්ධ වෙලා වැඩ කරපු කාලයේ අපේ පක්ෂයේ සෑම කරුණක් උදෙසාම ඉදිරිපත් වුණු ආකාරය. යම් උත්සවයක් තිබෙනවා නම්, එහෙමත් නැත්නම් යම් අවස්ථාවක් තිබෙනවා නම්, පක්ෂයට යම් කිසි සේවයක් කරන්න ඕනෑ නම් ඒ සෑම අවස්ථාවකම බුහාර්දීන් මැතිතුමාට කිව්වාම එතුමා ඉදිරිපත් වෙලා ඒ සෑම කටයුත්තක්ම කළ බව මට මතකයි. ඒ වාගේම දිවංගත රණසිංහ ප්‍රේමදාස මැතිතුමා සමඟ ඉතාමත්ම කිට්ටු සම්බන්ධතාවක් එතුමාට තිබුණා. ජනතාවට සේවය කිරීමට, ඒ වාගේම දුප්පත් අයට උදවු කිරීමට, ඒ අයට යම් කිසි කරදරයක් වුණාම ඒ කටයුතුවලට සහාය දීමට එතුමා ඉදිරිපත් වුණු අවස්ථා ගැන මම පෞද්ගලිකව දන්නවා.

මේ අවස්ථාවේදී අපි බුහාර්දීන් මැතිතුමාව ඉතාමත්ම ගෞරවයෙන් සිහි කරනවා. ඒ වාගේම එතුමාගේ වියෝව සම්බන්ධයෙන් එක්සත් ජාතික පක්ෂයේ නායකතුමා ප්‍රමුඛ එක්සත් ජාතික පක්ෂයේත්, කෘත්‍යාධිකාරී මණ්ඩලයේ අප සියලු දෙනාගේත් ශෝකය එම මැතිනියටත් පවුලේ සියලුම දෙනාටත් මෙම අවස්ථාවේදී පුද කරමින් එතුමාට මොක් සුව ප්‍රාර්ථනා කරනවා.

[අ. භා. 5.31 ]

**ගරු දි.මු. ජයරත්න මහතා (අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு டீ.எம்.ஜயரத்ன - பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சரும்)
(The Hon. D.M. Jayaratne - Prime Minister, Minister of Buddha Sasana and Religious Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු අල්හාජ් එන්.එම්. බුහාර්දීන් මැතිතුමා උත්පත්තිය ලැබුවේ අකුරණ. අකුරණ, විශාල මුස්ලිම් ජනතාවක් ජීවත් වන, මුස්ලිම් ජනතාව විසින්ම ඉතාම දියුණු තත්ත්වයකට පත් කරපු මහනුවර දිස්ත්‍රික්කයේ තිබෙන කුඩා නගරයක්. ඒ නගරයේ වෙළෙඳාම් කටයුතු කරමින් තමයි මුස්ලිම් ජනතාව ජීවත් වන්නේ. එහි ඉතාම දියුණු වෙළෙඳ ව්‍යාපාරිකයකු හැටියට තමයි බුහාර්දීන් මැතිතුමා සිටියේ. එතුමා ආනයනය සහ අපනයන කටයුතුවල පවා යෙදුණා; විශාල වශයෙන් වෙළෙඳ ව්‍යාපාරයේ යෙදුණා. අපේ ප්‍රදේශවල තිබෙන භාණ්ඩ එකතු කරලා කොළඹ ගෙන ඒම, ඒවා පිට රටවලට

යැවීම ආදී දේවල් කළා වාගේම පිට රටිනුත් භාණ්ඩ ගෙනැල්ලා අපේ රටට ලබා දෙන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරමින් ඉතාම දියුණු, දක්ෂ වෙළෙඳ ව්‍යාපාරිකයකු හැටියට තමයි එතුමා මුලින් ක්‍රියාත්මක වුණේ.

අප මේ වේලාවේදී මතක් කරන්නට ඕනෑ, මේ රටේ මුස්ලිම් ජනතාව තමයි අපේ වෙළෙඳ ව්‍යාපාර දියුණු තත්ත්වයකට පත් කර ගෙන තිබෙන්නේ කියන එක. මුස්ලිම් ජනතාව නිසා අපේ භාණ්ඩ විශාල වශයෙන් අපනයනය කරන්න පුළුවන් වෙලා තිබෙනවා වාගේම විදේශ විනිමය උපයන්නටත් දක්ෂයන් බවට පත් වෙලා තිබෙන්නේත් මේ රටේ මුස්ලිම් ජනතාව කියන එක අපි බොහොම සන්තෝෂයෙන් මතක් කරන්න ඕනෑ. ඒ වාගේ බොහොම දියුණු විධියට ඒ වෙළෙඳ කටයුතු ක්‍රියාත්මක කළ කෙනකු තමයි එතුමා. එසේ ක්‍රියාත්මක කරන අවස්ථාවේදී අපේ ප්‍රදේශයේ ඉන්න මුස්ලිම් තරුණයන් පමණක් නොවෙයි සිංහල සහ ද්‍රවිඩ අයවළුන්ද ඒ ව්‍යාපාරවලට යොදා ගත්තා.

එතුමා විශාල පිරිසකට රැකියාවන් ලබා දුන්නා. රැකියා ලබා දීලා අකුරණ පමණක් නොවෙයි, අපේ දිස්ත්‍රික්කය පුරාම වාගේ ඉතාම ජනප්‍රිය පුද්ගලයෙක් බවට, වෙළඳ ව්‍යාපාරිකයකු බවට එතුමා පත් වෙලා සිටියා. ඒ එක්කම නොයෙක් විධියේ අත් යන්ත්‍ර රෙදි කර්මාන්ත -වීවින් කර්මාන්ත- ආරම්භ කරලා ඔය ඉස්සෙල්ලා කියපු ගම්මානවල පමණක් නොවෙයි, අපේ ප්‍රදේශයේ අපේ ගම්මානවල තිබුණු කර්මාන්තත් දියුණු තත්ත්වයට පත් කරලා ඒවාට මුදල් ලබා දීලා, සේවකයන් පත් කරලා ඒ භාණ්ඩ ලබා ගන්නත් වැඩ පිළිවෙළ සකස් කළා. ඒ තුළින් මහනුවර දිස්ත්‍රික්කයේම රැකියා වැඩි ප්‍රමාණයක්, ආදායම් ප්‍රමාණයක් අපේ සාමාන්‍ය ජනතාවට ලබා ගැනීමට විශාල වශයෙන් උදව් කරපු ශ්‍රේෂ්ඨ නායකයෙක් කියලා කියන්න පුළුවන් ගරු එන්.එම්. බුහාර්දීන් මැතිතුමා.

1989 අවුරුද්දේ තමයි මුස්ලිම් කොංග්‍රසයෙන් එතුමා පාර්ලිමේන්තුවට පත් කළේ. ඒ අවස්ථාවේදී ජනතාව ඉතාමත්ම සන්තෝෂ වුණා. මොකද මෙච්චර විශාල රැකියා ප්‍රමාණයක් ජනතාවට ලබා දීලා ආර්ථික දියුණුවක් ඇති කරපු පුද්ගලයෙක් පාර්ලිමේන්තුවට එවීම ගැන විශාල සන්තෝෂයක් සියලු දෙනාටම ඇති වුණා. මට මතකයි, ඒ මන්ත්‍රී පදවිය ලැබුණාට පස්සේ එතුමාට අපේ ගම්පොල ප්‍රදේශයටත් ආරාධනා කරලා, එතුමා පැමිණි පසු උත්සව පවත්වලා ඒ අවස්ථාවේදී මිනිස්සු බොහොම ගරුගාම්භීර ආකාරයෙන් එතුමාට සැලකුවා. ඒකට හේතුව අර විධියේ පෞද්ගලික වශයෙන් සහ පොදු වශයෙන් ආර්ථික දියුණුවට කරපු සේවාවයි. ඒ මන්ත්‍රී පදවිය ලබා ගෙන ඒ තුළිනුත් විශාල වැඩ ප්‍රමාණයක් රාජ්‍ය යන්ත්‍රයේ ප්‍රයෝජනය ලබා ගෙන එතුමා ක්‍රියාත්මක කළා. ඒ විධියට ක්‍රියාත්මක කරමින් ප්‍රදේශයේ දියුණුවටත්, ඒ වාගේම වෙළඳ ව්‍යාපාරවල දියුණුවටත්, සාමාන්‍ය ජනතාව විශේෂයෙන් අපේ ප්‍රදේශයේ හුඟක් අය කොළඹට ගෙනැල්ලා ඒ ගොල්ලන්ට කොළඹ නොයෙක් විධියේ ව්‍යාපාරවල යෙදෙන්නත් මාර්ග සැලැස්වූවා. ඒ අනුව අද අපේ ගැමි ජනතාව කොළඹට ඇවිල්ලා වෙළඳ ව්‍යාපාරිකයන් හැටියට බොහොම දියුණු පුද්ගලයන් බවට පත් වෙලා ඉන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේ ශ්‍රේෂ්ඨ පුද්ගලයකුගේ අභාවය සම්බන්ධයෙන් අපි බොහොම කනගාටු වෙනවා. ඒ වෙනුවෙන් අපේ බලවත් කනගාටුව ප්‍රකාශ කරනවා වාගේම ඒ පවුලේ දරුවන් සෑම සියලු දෙනාටමත්, ඥාතීන්ටත්, හිතවතුන්ටත් අපේ ශෝකය මේ අවස්ථාවේදී ප්‍රකාශ කර යවන හැටියට ඔබතුමාට විශේෂයෙන් මා මතක් කරනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි. මී ළඟට ගරු අබ්දුල් හලීම් මහතා.

[பි.ப. 5.36]

**ගරු අබ්දුල් හලීම් මහතා**
(மாண்புமிகு அப்துல் ஹலீம்)
(The Hon. Abdul Haleem)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எம்மைவிட்டு மறைந்த பல கௌரவ உறுப்பினர்களுக்காக இன்றைய தினத்திலே இச்சபையில் அனுதாபப் பிரேரணைகள் நிறைவேற்றப்பட்டுக்கொண்டிருக்கின்றன. எனக்குக் கிடைக்கப் பெற்றிருக்கும் கால எல்லையின்படி ஏனைய உறுப்பினர்களைப் பற்றிப் பேச முடியாதபோதும் மதிப்பும் கௌரவமுமிக்க இந்தச் சபையிலே ஓர் அங்கத்தவராக இருந்து எம்மைவிட்டுப் பிரிந்த மர்ஹூம் என்.எம். புஹார்தீன் அவர்களைப்பற்றி ஒருசில வார்த்தைகள் பேச வாய்ப்புக் கிடைத்தமையையிட்டு உண்மையில் நான் மகிழ்ச்சியடைகின்றேன். மர்ஹூம் புஹார்தீன் ஹாஜி யாரைப் பற்றிப் பேசுவதற்கு மற்றைய எல்லோரையும்விட கடமையும் பொறுப்பும் எனக்கிருக்கின்றதென்று நான் நினைக்கின்றேன். ஏனெனில், மர்ஹூம் புஹார்தீன் ஹாஜியார் அவர்கள் எனது குடும்பத்தைச் சேர்ந்தவர்; எங்கள் ஊரைச் சேர்ந்தவர்; ஹரிஸ்பத்துவ தொகுதியைச் சேர்ந்தவர்; கண்டி மாவட்டத்தைப் பிரதிநிதித்துவப்படுத்தி பாராளுமன்றத்தை அலங்கரித்தவர். அதுமட்டுமன்றி, அவர் எனது மாமனாரான முன்னாள் அமைச்சர் மர்ஹூம் ஏ.சீ.எஸ். ஹமீட் அவர்களின் நெருங்கிய நண்பருமாவார்.

மர்ஹூம் புஹார்தீன் ஹாஜியார் அவர்கள் வாழ்ந்த முறை எல்லோரும் நன்கு அறிந்ததேயாகும். 1935ஆம் ஆண்டில் பிறந்த அன்னார், 1956களில் சிறுசிறு வியாபாரங்களை ஆரம்பித்துப் படிப்படியாக முன்னேற்றம் கண்டார். இலங்கையில் மட்டுமன்றி, வெளிநாடுகளிலும் பெருமதிப்புடைய ஒரு தொழிலதிபராகவும் சமூகத் தொண்டனாகவும் விளங்கிய அவர் அல்லாஹ் தனக்குத் தந்த செல்வத்தினைத் தன்னை நாடி வருபவர்களுக்கெல்லாம் இல்லையென்று சொல்லாது அள்ளி வழங்கிய கொடைவள்ளல். பல்லாயிரக்கணக்கான தொழிலாளர்களுக்கு வேலைவாய்ப்புக் களை வழங்கி அதன்மூலம் எத்தனையோ குடும்பங்களின் ஏழ்மை யைப் போக்குவதற்கு வழிகோலினார். மனிதாபிமானமும் மாண்பு டைய பண்புகளையும் உடையவராக விளங்கிய அன்னாரால் ஏற்றம் பெற்றோர் ஏராளம். பல ஏழைக் குமர்கள் அவரால் வாழவைக்கப்பட்டனர். பாடசாலைகள், பள்ளிவாசல்கள் மற்றும் பொது ஸ்தாபனங்கள் பல அவரால் எழுச்சிபெற்றன. அதுமட்டுமன்றி, முஸ்லிம்களின் கல்வி வளர்ச்சிக்காகவும் அரும் பெரும் சேவைகளைச் செய்தார். முஸ்லிம் அனாதை இல்லங்கள் பலவற்றை அவர் அமைத்தார். சுருங்கச் சொல்வதாயின், நான் முன்னர் குறிப்பிட்டதுபோல, பெரும் கொடைவள்ளலாகவே விளங்கினார்.

எனது பள்ளிப்பருவத்திலிருந்தே அவரது சிறப்பையும் சிறப்பான வாழ்வையும் நான் கண்டும் கேட்டும் வந்துள்ளேன். அரசியல் அரங்கிலே அவர் காலடியெடுத்து வைத்த சம்பவம் எல்லோரும் அறிந்ததே! ஸ்ரீலங்கா முஸ்லிம் காங்கிரஸின் ஸ்தாபகர் மர்ஹூம் எம்.எச்.எம். அஷ்ரஃப் அவர்கள் இப்பெருமகனை இனங்கண்டு தன்னுடன் இணைத்துக் கொண்டார். புஹார்தீன் ஹாஜியார்மூலம் முஸ்லிம் காங்கிரஸ் வளர்ச்சிபெற்றது. முஸ்லிம் காங்கிரஸ் என்னும் மரம் வேரூன்றுவதற்கும் தழைப்பதற்கும் அரும்பாடுபட்டவர்களுள் சிரேஷ்டமானவர் புஹார்தீன் ஹாஜியார் அவர்களென்பது என்னுடைய எண்ணமாகும். கண்டிப் பிரதேச மக்கள் அவரை 'கண்டிச் சீதக்காதி' என்றே அழைத்தனர். அந்தளவுக்கு ஏழைகளின் நண்பனாகவும் பாமரர்களின் பாதுகாவலனாகவும் விளங்கிய அவர், உலகின் எல்லா நாடுகளிலும் பெருமையாகப் பேசப்படும் ஒரு தொழிலதிபராகத் திகழ்ந்தமைக்குக் காரணம் அவரது கொடையும் உழைப்பும் மார்க்க பக்தியும் மனிதாபினமானமு மென்றால் அது மிகையாகாது. இந்த நாட்டின் பௌத்த, இந்து, இஸ்லாமிய மக்களின் ஏகோபித்த அன்பையும் ஆதரவையும் பெற்றவராக விளங்கிய புஹார்தீன் ஹாஜியார் அவர்கள்

[ගරු අබ්දුල් හලීම් මහතා]

பன்மொழி பேசும் வல்லமை வாய்ந்தவர். அன்னாரின் இழப்பு இந்நாட்டுக்கும் பொருளாதாரத்திற்கும் பேரிழப்பாகும். அன்னார் இறந்துவிட்டபோதிலும் அவருடைய சேவைகள் என்றும் நிலைத்து நிற்கும் என்பதில் சந்தேகமில்லை.

தமிழ் இலக்கியத்திலே, பாரி என்னும் அரசன் முல்லைக்குத் தேர் கொடுத்து தனது பெயரை நிலைநிறுத்தினான். சிபி என்னும் சக்கரவர்த்தி ஒரு புறாவுக்காக தனது உயிரையே ஈந்தார். சீதக்காதி என்று எல்லோராலும் புகழப்பட்ட ஷெய்கு அப்துல் காதிர் எனும் வள்ளல் இறந்த பின்னும் கொடை கொடுத்து, 'செத்தும் கொடை கொடுத்த சீதக்காதி' என்று பெயர் பெற்றார். இந்த வரிசையிலே தன் செல்வத்தையெல்லாம் அள்ளி வழங்கிய புஹார்தீன் ஹாஜியார் அவர்களின் பெயரை சமூகத்தால் மறக்கவோ, மறைக்கவோ முடியாது. அந்தளவுக்கு, வரலாறு படைத்த ஒரு மனிதாபிமானி எனக் கூறினால் அது பிழையாகாது. அன்னாருக்கு மறு உலகில் 'ஜன்னத்துல் பிர்தௌஸ்' கிடைப்பதற்கு அல்லாஹ்வைப் பிரார்த்தித்து விடைபெறுகிறேன்.

[අ. භා. 5.41 ]

**ගරු වාසුදේව නානායක්කාර මහතා (ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යතුමා)**

(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார - தேசிய மொழிகள், சமூக ஒருமைப்பாட்டு அமைச்சர்)

(The Hon. Vasudeva Nanayakkara - Minister of National Languages and Social Integration)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රස් ජාතික ලැයිස්තුවෙන් පත් කරනු ලැබූ ගරු මන්ත්‍රීවරයකු ලෙස පාර්ලිමේන්තුවට පැමිණි අප මිත්‍ර ගරු බුහාර්දීන් මහතා අසුන් ගත්තේ මා අසලින්මයි. ඒ නිසාම අප දෙදෙනා අතර එක්තරා මිත්‍රත්වයක් හා අදහස් හුවමාරුවක් ඇති වුණා. අපි අවබෝධ කර ගත්තේ ඔහු සාර්ථක ව්‍යාපාරිකයෙක්, මහා ව්‍යාපාරිකයෙක්, ඒ වාගේම දානපතියෙක් වශයෙන්. තමන්ගේ සේවකයන්ට ආදරයෙන් ඔහු සැලකූ බව දැන ගැනීමට පුළුවන් වීම අපගේ මිත්‍රත්වය තහවුරු කිරීමට හේතුවක් වුණා. දෙවනුව ඒ සියලුම ජන වර්ගයන් අතර සම්බන්ධතාව තහවුරු කිරීම සඳහාත්, අන්‍යෝන්‍ය ගෞරවය ඇති කිරීමටත්, සහෝදරත්වය වර්ධනය කිරීමටත් ඔහු තුළ තිබූ විශාල වුවමනාව තවත් අතකින් අපගේ මිත්‍රත්වය තහවුරු කිරීමට හේතු වුණා. සමහර විටක මිත්‍රයන් ලෙස අපි ඔවුනොවුන්ට උපකාර කිරීම්ද කරගෙන තිබෙනවා. ඔහු හාස්‍යයට, විනෝදයට ප්‍රිය කළ කෙනෙක්. ඒ නිසාම ඔහු සමඟ ඇසුර ප්‍රීතිමත් වුණා. මේ හැඟීම් අපි පළ කරන්නේ ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුණ වෙනුවෙන්. බුහාර්දීන් හිටපු ගරු මන්ත්‍රීතුමාගේ පවුලේ සැමට, දරුවන්ට අපගේ මේ වචන කීපය දන්වා සිටින මෙන් ඔබතුමාගෙන් ඉල්ලමින් මම නිහඬ වනවා.

[5.43 p.m.]

**ගරු රවුෆ් හකීම් මහතා) අධිකරණ අමාත්‍යතුමා(**

(மாண்புமிகு றவுப் ஹகீம் - நீதி அமைச்சர்)

(The Hon. Rauff Hakeem - Minister of Justice)

*Bismillahir Rahmanir Raheem*

Mr. Presiding Member, the late Hon. Noor Mohamed Buhardeen was very popular as an illustrious industrialist of this country and I had the rare privilege of having served him for a while in the group of companies that he had formed, which had been referred to by the previous Members before me. My acquaintance with him gave me many rare insights to this man's wonderful personality. His philanthropy is something that was very pure and genuine. There are many thousands of people from all races in this country who will bear testimony for the wonderful gifted nature of the Hon. N.M. Buhardeen.

Mr. Presiding Member, his memory as an industrialist is unique in that he was perhaps one of those people who realized very early that with no natural comparative advantage beyond the abundant cheap labour in this country, it fell on the business genius of a handful of pioneers like the Hon. Noor Mohamed Buhardeen to harness this potential and ultimately push the garment exports to become the number one foreign exchange earner within a very short period in this country. We all know that in a poor country like ours with a small manufacturing base and a vast rural majority, the garment industry offers a labour intensive way of lifting people out of poverty. It was the Hon. Buhardeen who was one among the first to take the garment industry to the rural areas and in 1979, he established the Ceylon Garments Limited and Lankamerica Garments Limited in places like Akurana and expanded it to other areas in the neighbouring hamlets of the rural outskirts of Kandy. The Hon. Buhardeen under his tutelage has brought up many industrialists in the garment sector. To my mind, at least 20 such big garment industrialists were actually brought into business by the Hon. Buhardeen and his patronage. In fact, in around 1985, he had the largest amount of workforce in the garment industry as a single group of companies and he had received many export awards for his excellent performance in promoting garments to the international market.

The Hon. Buhardeen's memory is simply not confined to the garment industry. When he entered politics, I had the rare opportunity of being by his side when my late leader, the Hon. M.H.M. Ashraff visited him in his office to invite him to be the first nominee for the National List of the Sri Lanka Muslim Congress, before we contested the 1989 Parliamentary Elections.

That was a watershed period in this country's history. President Ranasinghe Premadasa had won with a narrow margin in a hotly-contested Presidential Election. It was the decision of the Sri Lanka Muslim Congress towards the end of the campaign to shift from our engagement with the then Democratic People's Alliance. That made the difference in bringing His Excellency Ranasinghe Premadasa to power. Even at that juncture, despite the fact that he had his close friendship with the late Hon. A.C.S. Hameed who was a towering figure in the then UNP regime, the Hon. Buhardeen took an enormous political risk in joining the Sri Lanka Muslim Congress. Not only did he join the Sri Lanka Muslim Congress but his strength as a foremost businessman assisted us financially in a great way to successfully enter Parliament with four Members in our initial attempt in the Parliamentary Election of February 1989. From then

onwards, his service to our Party made us stronger and towards the end, he, on a misunderstanding though, did leave us, continued to maintain very close cordial relationship with us.

I must say that his performance at the next Parliamentary Elections where he contested the Matale District on the UNP ticket has left a record up to date where he scored almost 25,000 preferential votes being a minority Member in the Matale District. Up to date it has not been surpassed by any other minority candidate in the Matale District for a General Election. That shows the immense popularity he commanded in politics having being a nominated Member for the first term.
Sir, may I say a few words in Tamil?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
You may have to speed up because there is another Vote of Condolence to be taken up.

**ගරු රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem)
Yes, I will. With your indulgence, I may take another five more minutes to say a few words in Tamil.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
I am very sorry because there are other Members to speak. I will be able to give you only two more minutes the most because there is another Vote of Condolence on the late Hon. Sarath Chandra Rajakaruna. His family members are here. We must be fair by them.

**ගරු රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem)
Okay. Therefore, Sir, I do not want to switch on to Tamil but simply to say that the Hon. Buhardeen's memory will go down in the annals of the Sri Lanka Muslim Congress as a personality who lent us his generous support to face the challenges that we had to face at the very initial period in this Party's history. Today being one of the foremost minority political parties in this country, we would like to pay our tribute to this wonderful personality, whose philanthropy has known no bounds and as people say in the words of James Barron Hope, "Tis after death that we measure men", And, in the Hon. Buhardeen and his life, we have certainly measured a man whose life was such a fountain for many others to flourish.

With those words, may I ask you to convey my sympathies to his family, his beloved wife, his youngest brother, Mr. Hameed who is in the Gallery today, his eldest son Imthiaz, his eldest son-in-law, Faris, his other daughters and sons-in-law.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
அடுத்ததாக, மாண்புமிகு எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ் அவர்கள். உங்களுக்கு ஐந்து நிமிடங்கள்!.

[பி.ப. 5.53]

**ගරු එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලා මහතා ( ළමා සංවර්ධන හා කාන්තා කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ் - சிறுவர் அபிவிருத்தி, மகளிர் அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. M.L.A.M. Hisbullah - Deputy Minister of Child Development and Women's Affairs)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, முன்னாள் பாராளுமன்ற உறுப்பினர் மர்ஹூம் புஹார்தீன் ஹாஜியார் அவர்களுக்கு அஞ்சலி செலுத்துமுகமாக இடம்பெறும் இந்த அனுதாபப் பிரேரணையின்மீது உரையாற்றுவதற்கு எனக்கும் சந்தர்ப்பம் கொடுத்ததற்காக உங்களுக்கு நன்றி கூறுகிறேன். எங்களுடைய மறைந்த மாபெரும் தலைவர் அல்ஹாஜ் எம்.எச்.எம். அஷ்ரஃப் அவர்கள் ஸ்ரீலங்கா முஸ்லிம் காங்கிரஸ் கட்சியை ஸ்தாபித்த வேளையில் அவரோடு சேர்ந்தியங்கியும் அக்கட்சியை 1988-89ஆம் ஆண்டுகளில் அரசியலில் மிகச்சிறந்த ஓர் அமைப்பாக மாற்றுவதிலும் மர்ஹூம் புஹார்தீன் ஹாஜியார் அவர்கள் ஆற்றிய பங்களிப்பு அளப்பரியது. 1989ஆம் ஆண்டுப் பொதுத் தேர்தலிலே அக்கட்சிமூலம் தெரிவுசெய்யப்பட்ட நான்கு பாராளுமன்ற உறுப்பினர்களில் ஒருவராக எங்களோடு இந்தப் பாராளுமன்றத்துக்கு முதற்தடவையாகப் பிரவேசித்த அவர், முதல் நாளிலேயே இங்கு தொழுவதற்கான வசதிகள் பற்றி அப்போதைய சபாநாயகர் அல்ஹாஜ் எம்.எச். மொஹமட் அவர்களோடு கலந்துரையாடினார்.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
கௌரவ பிரதி அமைச்சர் அவர்களே! கௌரவ பாக்கீர் மாக்கார் அவர்களுடைய பதவிக் காலத்தில்தான் தொழுகையறை ஒதுக்கித் தரப்பட்டது.

**ගරු එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලා මහතා**
(மாண்புமிகு எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. M.L.A.M. Hisbullah )
ஆம். அந்த அறைக்குத் தேவையான 'காப்பெட்'டுக்கள் மற்றும் 'முஸல்லா'க்கள் என்பவற்றை வழங்கி அதனை அழகுபடுத்தினார். அவர் தன்னுடைய பாராளுமன்றப் பதவிக் காலத்திலே நாட்டு மக்களுக்காக மிகச் சிறப்பான பணிகளைச் செய்தார். விசேடமாக, கிழக்கு மாகாணத்திலே பல்வேறுபட்ட பிரச்சினைகள் மற்றும் இனக்கலவரங்கள் ஏற்பட்டபொழுது தன்னுடைய பொருளா தாரத்தைக் கொண்டு மிகக்கூடிய பணிகளை அவர் செய்தார். நன்கொடை வழங்குவதிலும் அநாதைகளைப் பராமரிப்பதிலும் பள்ளிவாசல்கள் கட்டுவதிலும் விசேடமாக, வயதுவந்த பெண் பிள்ளைகளுடைய வாழ்க்கைக்காகவும் அவர் தன்னுடைய பொருளாதாரத்தில் அதிகபட்சமானவற்றைச் செலவு செய்தார். இந்த நாட்டிலே ஆயிரக்கணக்கான இளைஞர் - யுவதிகளுக்குத் தொழில்வாய்ப்புக்களை வழங்கினார். மிகப்பெரிய தொழிலதி பராக, தொழில் வல்லுநராக விளங்கிய புஹார்தீன் ஹாஜியார் அவர்கள் சிறந்த மார்க்கப் பற்றாளருமாவார்.

விசேடமாக நான் முன்னர் குறிப்பிட்டதுபோல, அன்றைய காலகட்டத்திலே ஸ்ரீலங்கா முஸ்லிம் காங்கிரஸை வளர்த்தெடுப் பதில் எங்களுடைய மறைந்த தலைவர் அல்ஹாஜ் எம்.எச்.எம்.

[ගරු එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලා මහතා]

அஷ்ரஃப் அவர்களோடு சேர்ந்து அளப்பரிய பங்காற்றியவர். அதுமட்டுமல்ல, அவர் ஈட்டிய பொருளாதாரத்தைச் சமூகத்தின் வளர்ச்சிக்காகப் பயன்படுத்தியவர். விசேடமாக தான் மறைந்த பின்னர் தன்னுடைய பொருளாதாரம்மூலம் தனக்கு நன்மை வந்து சேர வேண்டும் என்ற அடிப்படையில் அதிகம் கொடை கொடுத்து வாழ்ந்து வந்தவர். அவர் ஆற்றிய பணிகள் இன்றும் நிலைத்து நிற்கின்றன. அவர் மறைந்தாலும் அவருடைய பணிகளைப்பற்றி நாங்கள் இன்றும் பேசிக்கொண்டிருக்கின்றோம். ஆகவே, அல்லாஹுத்தஆலா இந்தப் புனிதமான ரமழான் நோன்பு மாதத்திலே அவர் செய்த நற்கொடைகளை, அவர் ஆற்றிய நற்பணிகளை மற்றும் நல்ல சேவைகளை அங்கீகரித்து, அவருடைய 'கப்ர்'ஐ சுவர்க்கத்துப் பூஞ்சோலையாக்க வேண்டும் என்று பிரார்த்தித்து, அவருடைய மனைவி, பிள்ளைகள் விசேடமாக அவருடைய மகன் இம்தியாஸ் மற்றும் அவர்களுடைய குடும்பத்தவர்கள் எல்லோருக்கும் எங்களது ஆழ்ந்த அனுதாபங் களைத் தெரிவித்து விடைபெறுகின்றேன். நன்றி.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

நன்றி! இப்பொழுது கௌரவ எச்.எம்.எம். ஹரீஸ் அவர்கள்! உங்களுக்கு மூன்று நிமிடங்கள்!

[பி.ப. 5.58]

**ගරු එච්.එම්.එම්. හරීස් මහතා**
(மாண்புமிகு எச்.எம்.எம். ஹரீஸ்)
(The Hon. H.M.M. Harees)

*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எமது ஸ்ரீ லங்கா முஸ்லிம் காங்கிரஸின் ஸ்தாபக உறுப்பினர்களில் ஒருவரான புஹார்தீன் ஹாஜியார் அவர்களின் மறைவையொட்டிய அனுதாபத் தீர்மானத்தில் உரையாற்றச் சந்தர்ப்பம் தந்தமைக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். முக்கியமாக 1988ஆம் ஆண்டுக் காலப்பகுதியில் எங்களுடைய ஸ்ரீ லங்கா முஸ்லிம் காங்கிரஸ் கட்சியை வளர்த்தெடுப்பதில் மறைந்த பாராளுமன்ற உறுப்பினர் புஹார்தீன் ஹாஜியார் அவர்கள் ஆற்றிய பங்களிப்பு வரலாற்றில் மறக்க முடியாததாகும். நாங்கள் மாணவர்களாக இருந்த அன்றைய காலகட்டத்தில், குறிப்பாக வடக்கு, கிழக்கில் இனப் பிரச்சினையினால் பாதிக்கப்பட்ட முஸ்லிம் சமூகத்தையும் இளைஞர்களையும் வழிநடத்த எமது பெருந் தலைவர் அஷ்ரஃப் அவர்கள் ஆரம்பித்த ஸ்ரீ லங்கா முஸ்லிம் காங்கிரஸ் கட்சி பொருளாதார நெருக்கடியில் சிக்குண்டவேளையில், மர்ஹூம் புஹார்தீன் ஹாஜியார் அவர்கள், அதற்குக் கைகொடுத்து, இந்த நாட்டில் அதனை ஒரு பெரும் கட்சியாக உருவாக்குவதில் தலைவர் அவர்களுக்கு ஒரு தளபதியாக இருந்து மிகப் பெரும் பங்காற்றினார். அத்தகைய மிகப் பெரும் தலைவர்களில் ஒருவர் எங்களை விட்டுப் பிரிந்திருப்பது மிகவும் கவலைக்குரிய விடயமாக இருக்கின்றது.

இலங்கையின் கைத்தொழில் துறையை வளர்த்தெடுப்பதிலும் அவர் பெரும் பங்களிப்புச் செய்துள்ளார். குறிப்பாக நாடு பூராவும் பல தொழிற்சாலைகளை உருவாக்கிப் பல்லாயிரக்கணக்கான இளைஞர் யுவதிகளுக்குத் தொழில்வாய்ப்புக்களை வழங்கி இந்த நாட்டின் கைத்தொழில் துறைக்கு மிகப் பெரும் பங்காற்றிய ஒரு பெரும் வர்த்தகராகவும் திகழ்ந்தார். அவர், தான் வாழ்ந்த காலப்பகுதியில் தனது மார்க்கக் கடமைகளில் மிகப் பற்றுள்ள வராகவும் அதேபோன்று ஏழை எளிய மக்களுக்குத் தான தர்மங்களை வழங்குகின்ற மிகப்பெரும் கொடையாளியாகவும் திகழ்ந்ததை நாங்கள் மறக்க முடியாது. அவரை இழந்திருக்கின்ற அவருடைய மனைவி, பிள்ளைகள் மற்றும் குடும்பத்தினர் அனைவருக்கும் எனது இந்தச் சந்தர்ப்பத்தில் எனது அனுதாபத்தைத் தெரிவித்து விடைபெறுகின்றேன்.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Hon. Mohamed Aslam, you have two minutes.

[பி.ப. 6.01]

**ගරු මොහමඩ් අස්ලම් මහතා**
(மாண்புமிகு மொஹமட் அஸ்லம்)
(The Hon. Mohamed Aslam)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் புஹார்தீன் ஹாஜியார் அவர்களுடைய மறைவையொட்டிய அனுதாபத் தீர்மானத்தின்மீது உரையாற்ற வாய்ப்பளித்த எல்லாம் வல்ல இறைவனுக்கு நன்றி கூறியவனாக என்னுரையை ஆரம்பிக்கின்றேன். மறைந்த புஹார்தீன் ஹாஜியார் அவர்கள் இந்தச் சபையிலே 1989ஆம் ஆண்டு முதல் 1994ஆம் ஆண்டுவரை எங்களுடைய ஸ்ரீ லங்கா முஸ்லிம் காங்கிரஸ் கட்சியின் உறுப்பினராக இருந்ததை எல்லோரும் அறிவோம்.

அவர் இந்த நாட்டிலே பிரபல்யமடைந்த Fairline Group of Companies என்னும் நிறுவனத்தின் தலைவராக இருந்து ஒரு சிறந்த தொழிலதிபராக ஆயிரக்கணக்கான இளைஞர், யுவதிகளுக்கு வேலைவாய்ப்பளித்தது மாத்திரமன்றி, அவருக்கு இறைவன் கொடுத்த செல்வத்தைக் கொண்டு ஏழை மக்களுக்கு நிறையச் சேவை செய்துவந்தார். அவர் ஏழ்மை நிலையிலிருந்த பல குமரிப் பெண்களுக்கு விவாகம் செய்து வைத்தார். அவர் செய்த அந்த உதவியினால் இன்றும் பல குடும்பங்கள் வாழ்ந்து கொண்டிருப்பதை எவராலும் மறக்க முடியாது. 1989ஆம் ஆண்டில் ஸ்ரீ லங்கா முஸ்லிம் காங்கிரஸ் ஓர் இக்கட்டான சூழ்நிலையில் இருந்த காலகட்டத்தில், ஐக்கிய தேசியக் கட்சியில் இருந்த என்.எம். புஹார்தீன் ஹாஜியார் அவர்கள் மிகுந்த துணிவுடன் முஸ்லிம் சமூகத்தினரின் கட்சி என்ற அடிப்படையிலே ஸ்ரீ லங்கா முஸ்லிம் காங்கிரஸ் கட்சிக்கு உரமூட்டியவர் என்பதை நாங்கள் மறந்துவிட முடியாது. அவர் அளித்த பண உதவி இந்தக் கட்சியின் வளர்ச்சிப் பாதையில் இன்று ஒரு முக்கிய மைல் கல்லாக அமைந்திருக்கின்றது. அவர் செய்த அர்ப்பணிப்பினாலும் இக்கட்சியின் வளர்ச்சிக்காக அவர் கொடுத்த ஆதரவினாலும் எமது கட்சி ஒவ்வொரு தேர்தலிலும் முறையே 9, 8, 7, 4 என்றவகையில் உறுப்பினர்களைப் பெற்றிருக்கின்றது. அதற்கு என்.எம். புஹார்தீன் ஹாஜியார் அவர்களின் பங்களிப்புத்தான் காரணம் என்பதை இங்கு சுட்டிக்காட்ட விரும்புகின்றேன். அவர் எமது சமூகத்துக்குச் செய்துள்ள பணியினால் இன்று எமது சமூகம் பலவகையான நன்மைகளைப் பெற்று வாழ்கின்றது. அவர் இன்று 'கப்ர்'இல் இருந்தாலும் அவர் அம்மக்களுக்குச் செய்துள்ள சேவைகளின் நன்மைகள் அவருக்குச் சென்றுகொண்டிருப்பதை நாங்கள் மறக்க முடியாது.

நான் நேற்றைய தினம் இப்பாராளுமன்றத்திலே அஸர் தொழுகையை முடித்த பின்னர் சகோதரர் எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ் அவர்களுடன் தொழுகை அறையிலுள்ள carpetஐப் பற்றிப் பேசியபொழுது என்.எம்.புஹார்தீன் ஹாஜியார் அவர்கள் மறைந்தாலும் அவர் செய்த சேவைக்குரிய நன்மைகள் 'ஸதக்கத்துல் ஜாரியா' என்ற அடிப்படையில் அவருக்குக் கிடைத்துக் கொண்டிருக்கும் என்று கூறினேன். அவரின் பிரிவால் துயருற்றிருக்கும் அவருடைய குடும்பத்தினர், மனைவி, புதல்வர் அல்ஹாஜ் இப்தியாஸ் அவர்கள், அவருடைய மருமகன் பாரிஸ் ஹாஜியார், சகோதரர் ஹமீட் மற்றும் உறவினர் அனைவரினதும் துக்கத்திலே நானும் பங்குகொண்டு, எல்லாம் வல்ல இறைவன் அவருக்கு "ஜென்னதுல் பிர்தௌஸ்" என்ற சொர்க்கத்தை வழங்கி அருள் பாலிக்க வேண்டுமென இந்தப் புனித ரமழானில் பிரார்த்தித்து, விடைபெற்றுக்கொள்கின்றேன்.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Order, please! I wish to associate myself with the sentiments expressed by both sides of the House on the death of the Hon. Noor Mohamed Buhardeen, ex-Member of Parliament.

I too wanted to speak about him today but that right is denied since I am chairing the House now. But, I pray for his soul. As it was said, when this Parliament was built, a room was reserved for the Muslim Members and the staff to observe their five-times daily prayers which is *Farl*. He carpeted that room. When we pray in that room in this holy month of Ramadan, we pray for the soul of the late Hon. Buhardeen. I pray that Allah grants him "Jennathul Firdous". He served in this House for five years, four months and one day.

I shall direct the Secretary-General of Parliament to make a Minute of the Proceedings of the Meeting today and send a copy thereof to the members of the bereaved family.

We will now take up the Vote of Condolence on the late Hon. Sarath Chandra Rajakaruna.

Order, please! Mr. Deputy Speaker will now take the Chair.

***අනතුරුව ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. ALHAJ A.H.M. AZWER *left the Chair and* MR. DEPUTY SPEAKER *took the Chair.*

## ශෝක ප්‍රකාශය: ගරු සරත් චන්ද්‍ර රාජකරුණා මහතා

### அனுதாபத் தீர்மானம்: மாண்புமிகு சரத் சந்திர ராஜகருணா

### VOTE OF CONDOLENCE: HON. SARATH CHANDRA RAJAKARUNA

[අ. භා. 6.07 ]

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා )**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Irrigation and Water Resources Management and Leader of the House of Parliament)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දොම්පේ මැතිවරණ කොට්ඨාසයේත්, ගම්පහ දිස්ත්‍රික්කයේත් පොදු මහජනතාව වසර ගණනාවක් තිස්සේ නියෝජනය කරමින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හා අමාත්‍යවරයෙකු වශයෙන් මෙම උත්තරීර සභාව ශෝභාවත් කරන ලද පරිණත දේශපාලනඥයකු වූ සරත්චන්ද්‍ර රාජකරුණා මැතිතුමාගේ අභාවය පිළිබඳ ශෝකය පළ කිරීමේ යෝජනාව මම මේ අවස්ථාවේදී ගරු සභාවට ඉදිරිපත් කරන්නෙමි.

1940 ජුලි මස 22 දින උපත ලද රාජකරුණා මොහොට්ටි අප්පුහාමිලාගේ සරත් චන්ද්‍ර රාජකරුණා මහතාගේ දයාබර පියාණන් වූයේ, හෙළ වෙදකමින් සිංහලයට අභිමානය කියා පෑ සිංහල, පාලි, සංස්කෘත භාෂා මැනවින් ප්‍රගුණ කළ, පොඩි මිනිසුන්ගේ හිතසුව පිණිස කටයුතු කරමින් මිල්ලතේ ලොකු රාළහාමි නමින් ප්‍රකටව සිටි, ඉඩම් හිමි වැවිලිකරුවෙකු වූ වෙද මුහන්දිරම් දොන් පීරිස් රාජකරුණා මහතාය. මෑණියන් වූයේ ලොකු මැණිකේ මංචනායක මහත්මියයි. දකුණු පළාත් ආණ්ඩුකාර ධූරය හොබවන කුමාරි බාලසූරිය මැතිනිය ඇතුළු සහෝදර සහෝදරියන් සත් දෙනෙකු සිටි රාජකරුණා පවුලට හිටපු හමුදාපති හැමිල්ටන් වනසිංහ හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍ය ආචාර්ය ජගත් බාලසූරිය යන මස්සිනාවරුන්ද පසු කලෙක එක් විය.

කිරිඳිවැල කනිෂ්ඨ විද්‍යාලයෙන් හා මොරටුව වේල්ස් කුමාර විද්‍යාලයෙන් අධ්‍යාපනය ලැබූ සරත්චන්ද්‍ර මහතා පාසලේදී ක්‍රීඩා හා විවාද කණ්ඩායම්වල දක්කම් පෑ අතර, 1959 දී වේල්ස් කුමාර විද්‍යාලයේ ප්‍රධාන ශිෂ්‍ය නායකයා වශයෙන්ද පත් විය. පාසල් අධ්‍යාපනයෙන් පසු ගන්නොරුව කෘෂි විද්‍යා පීඨයට ඇතුළත්ව ශිල්ප හැදෑරූ එතුමා ඉන් පිට වී පිය උරුමය අනුව යමින් ඉඩම් හිමි වැවිලිකරුවකු ලෙස කටයුතු කළේය. තරුණ පිරිස් පිරිවරා ගනිමින් මිල්ලතේ "සිරිරද භවනේ" සිට සමාජ සේවකයකු ලෙස ක්‍රියා කළ එතුමාට ඩඩ්ලි සේනානායක මහතාගේ මහ පෙන්වීම යටතේ එක්සත් ජාතික පක්ෂයට සම්බන්ධ වීමට හැකි විය.

බන්දුල මල්ලිකා රාජකරුණා මහත්මිය සමඟ විවාහ ජීවිතය ගත කළ රාජකරුණා මහතාට වාසනාවන්ත දූ පුතුන් සිව් දෙනෙකු මෙලොවට දායාද කිරීමේ භාග්‍ය ලැබිණි. හර්ෂණ සුපුන් රාජකරුණා මහතා බස්නාහිර පළාත් සභා මන්ත්‍රීවරයෙකු වශයෙන් කටයුතු කරමින් අතිශය ජනාදරයට පත්ව සිටින්නෙකි.

1977 මැතිවරණයේදී දොම්පේ ආසනය සඳහා එක්සත් ජාතික පක්ෂය යටතේ නාම යෝජනා භාර දුන් එතුමාට ඉන් ජයග්‍රහණය ලබා පළමු වරට මෙම උත්තරීතර සභාවේ අසුන් ගැනීමට හැකියාව ලැබිණි. එම රජයේ ආහාර හා සමුපකාර නියෝජ්‍ය ඇමතිවරයා වශයෙන් කටයුතු කළ එතුමාට එස්.බී. හේරත් මැතිතුමාගේ හදිසි අභාවයෙන් පසු 1988 සිට ආහාර අමාත්‍යවරයා වශයෙන් කටයුතු කිරීමට සිදු විණ.

1989 මහ මැතිවරණයේදී ගම්පහ දිස්ත්‍රික් මන්ත්‍රීවරයකු වශයෙන් තේරී පත් වූ එතුමා පොල් කර්මාන්ත රාජ්‍ය ඇමතිවරයා ලෙසත්, 1990 දී බල ශක්ති සංරක්ෂණ ව්‍යාපෘති ඇමතිවරයා ලෙසත්, 2003 දී දේශීය වෛද්‍ය හා ආපදා සහන ඇමතිවරයා ලෙසත් ජනතාවට සේවය සලසා දුන්නේය. 1977 දී දොම්පේ මහජන මන්ත්‍රීවරයා වශයෙන් පාර්ලිමේන්තුවට පිවිසි එතුමා 2000 වසරේ පැවති මැතිවරණයෙන් හැර අනිකුත් සියලුම මැතිවරණවලින් ජයග්‍රහණය ලබමින් 2010 දක්වාම දශක තුනකටත් වඩා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වශයෙන් කටයුතු කිරීමට වාසනාවන්ත විය.

ජනතා නියෝජිතයකු වශයෙන් කටයුතු කරමින් කිරිඳිවැල නගරය අංග සම්පූර්ණ නගරයක් හා වෙළෙඳ මධ්‍යස්ථානයක් බවට පත්කරමින්, ගම් දනව් පුරා විදුලි පහසුකම් ලබා දෙමින්, සුවහසක් ජනතාවට නිරෝගී සම්පත ළඟා කර දෙන දේශීය වෛද්‍යවරුන් වෙනුවෙන් "වෙදගම" හා අනාගත පරපුරේ දැස් පාදන ගුරුවරුන් උදෙසා "ගුරුගම" ඇතුළු උදාගම් කිහිපයක් ඉදි කරවමින්, කිරිඳිවැල නගරයේ මධ්‍යම පාන්තික නිවාස යෝජනා

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

ක්‍රමයක් ඇති කරමින්, කිරිඳිවැල සංඝමිත්තා බාලිකා විදුහල වැනි පාසල් කිහිපයක් තනා දෙමින් විවිධ ක්ෂේත්‍රයන් ඔස්සේ ජනතා සුභ සෙත උදා කරවූ එතුමා "මුහන්දිරම් ඩී.පී. රාජකරුණා" සහ "සරත්සඳ" නමින් ශිෂ්‍යත්ව දෙකක් ආරම්භ කර දුප්පත් දරුවන්ට ඒවා පිරිනැමීමද කළේය.

මිල්ලතේ ග්‍රාමයේ තමන් සතුව පැවැති අක්කර 20ක ඉඩමක් ශාසනයට පූජා කර, එහි ආරාණ්‍ය සේනාසනයක් හා ඕවිටිගම බෝධිමළු විහාරස්ථානයේ චෛත්‍යයක් තම පෞද්ගලික ධනයෙන් ඉදිකරවූ එතුමා කැරගල සමනබැද්ද මණ්ඩාවල පිරිවෙන ආරම්භ කිරීම, කිරිඳිවැල බෞද්ධ මණ්ඩල ගොඩනැගිල්ල ඉදිකිරීම ආදී වශයෙන් බෞද්ධාගමේ පුනරුදය වෙනුවෙන් විශාල වැඩ කොටසක් සිදු කළේය. ගම්පහ දිස්ත්‍රික් එක්සත් ජාතික පක්ෂ බල මණ්ඩලයේ සභාපතිවරයා ලෙස ජීවිතයේ අවසානය දක්වාම කටයුතු කළ රාජකරුණා මහතා දේශපාලනමය වශයෙන් තමන්ගෙන් පොදු ජනතාවට ඉටු විය යුතු සේවාවත්, සමාජමය වශයෙන් හා ආගමික වශයෙන් විය යුතු කාර්ය භාරයත් නොපිරිහෙළා ඉටු කළේය.

පංචශීල ප්‍රතිපත්තිය අනුගමනය කරමින් ධාර්මික ජීවිතයක් ගෙවූ එතුමා නිරහංකාර මෙන්ම ඍජු පැවැත්මෙන් යුතු පුද්ගලයකු වූ අතර, ගැමියන් සමඟ ජීවත් වෙමින් ඔවුන්ටත්, ප්‍රදේශයටත් දැඩි සේ ආදරය කළ අයෙක්ද විය. ඇමති තනතුරු දැරූ කාලයේ පවා ගෙවූ චාම් ජීවිතය හේතුවෙන් ජනතාවගේ ආදරය හා ගෞරවයද නොමඳව ලැබූ දේශපාලනඥයකු වූ එතුමාව ප්‍රදේශවාසීන් හැඳින්වූයේ "චූටිටන් රාළහාමි" යන ආදරණීය නාමයෙනි. අලි ඇතුන් පවා ආදරයෙන් රැක බලා ගත් රාජකරුණා මහතා තුළ මිනිස් සංහතිය පිළිබඳව පමණක් නොව සතා සීපාවා කෙරෙහිද නොමඳව කරුණාව පිරී ඉතිරී පැවතියේය.

සමාජ අත් දැකීම් බහුල කීර්තිමත් දේශපාලනඥයකු මෙන්ම මානව හිතවාදී ගුණයෙන් යුතු යුග පුරුෂයකු වූ සරත් චන්ද්‍ර රාජකරුණා මහතා ගම්පහ දිස්ත්‍රික්කයට පමණක් නොව ප්‍රජාතන්ත්‍රවාදය අගයන සමස්ත සමාජයටම වේදනාවක් ගෙන දෙමින් කිසිවකු බලාපොරොත්තු නොවූ මොහොතකදී වසර 70ක් ආයු වළඳා 2011 ජනවාරි මස 10 වැනි දින සදහටම මෙලොවින් සමුගත්තේය.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පොදු මහජනතාවගේ හිත සුව පිණිසත්, ප්‍රජාතන්ත්‍රවාදය සුරැකීම පිණිසත් සුවිශේෂී මෙහෙවරක් ඉටු කළ ගම්පහ දිස්ත්‍රික් හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී සහ හිටපු අමාත්‍ය සරත්චන්ද්‍ර රාජකරුණා මැතිතුමන්ට නිවන් සුව ප්‍රාර්ථනා කරන අතර, මෙම පාර්ලිමේන්තුවේ ශෝකය එතුමාගේ දයාබර භාර්යාව වූ මල්ලිකා රාජකරුණා මැතිනියටත්, බස්නාහිර පළාත් සභා මන්ත්‍රී හර්ෂණ සුපුන් රාජකරුණා මැතිතුමා ඇතුළු දූ දරුවන්ටත්, පවුලේ ඥාතීන්ටත් දන්වා යවන ලෙස යෝජනා කර සිටිමි.

[අ. භා. 6.14]

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Ranil Wickremasinghe - Leader of the Opposition)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පළමුවෙන් දැන ගන්න කැමැතියි, අද පස්වරු 6.30න් පසුවත් සරත්චන්ද්‍ර රාජකරුණා මැතිතුමාගේ ශෝක ප්‍රකාශය වෙනුවෙන් තවත් කාලය ගන්නවාද, එහෙම නැත්නම් හෙට අනෙක් ශෝක ප්‍රකාශ යෝජනා දෙක සමඟ එතුමා පිළිබඳ ශෝක ප්‍රකාශත් ගන්න පුළුවන්ද කියලා. එතුමාගේ පවුලේ අයත් අද මේ ගරු සභාවේ ගැලරියට පැමිණ සිටිනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

We will continue with this Vote of Condolence tomorrow.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

Okay. We will continue tomorrow.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා තමයි රාජකරුණා මන්ත්‍රීතුමාට දේශපාලනයට එන්නට මාර්ගය පාදමින් විශේෂයෙන්ම දොම්පේ ආසනයේ සංවිධායක හැටියට පත් කළේ. එතකොට මට මතක් වුණේ ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා එතුමා ගැන කිව්ව කථාවක්. රාජකරුණා මැතිතුමාගේ තාත්තා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආරම්භක භාණ්ඩාගාරික. රාජකරුණා මැතිතුමා පාර්ලිමේන්තුවට පත්වුණේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ බලවත්ම අපේක්ෂකයා වන, බලවත්ම ආසනයක් තිබුණු ෆීලික්ස් ඩයස් බණ්ඩාරනායක මැතිතුමා පරාජය කරමිනුයි. මම රාජකාරුණා මැතිතුමාව දැනගත් අවස්ථාවේ දී එතුමා දොම්පේ සංවිධායක හැටියට පත් වෙලා සිටියා. මම ඒ අවස්ථාවේ කැලණියේ සංවිධායක හැටියටයි හිටියේ.

අපි එකට වැඩ කටයුතු කළේ. ඒ එක්කම මා මීට පෙර සඳහන් කළ පරිදි මෙම ස්ථානයේ ඉන්න ගරු ජෝශප් මයිකල් පෙරේරා මන්ත්‍රීතුමාත්, ගරු ජෝන් අමරතුංග මන්ත්‍රීතුමාත් අපි එක්ක එකට වැඩ කටයුතු කළේ. ගම්පහත් සියනෑ කෝරළයේ තමයි වැඩියෙන්ම දේශපාලනය තිබුණේ. ඒක තමයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ බල කොටුව. එදා ගරු රාජකරුණා මැතිතුමා දොම්පේ ආසනය භාර ගන්න කොට මම ඇහුවේ "එතුමා කොහොමද දොම්පේ දිනන්නේ" කියලායි. අපි ඔක්කෝම හිටියේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ඉතාම විශාල සහයෝගයක් තිබුණු ප්‍රදේශයක. කැලණිය හැර අනෙක් හැම ප්‍රදේශයක්ම එහෙමයි තිබුණේ. ගරු අගමැතිතුමා දන්නවා. මහර, දොම්පේ, ගම්පහ, අත්තනගල්ල, දිවුලපිටිය, මීරිගම ඒ ප්‍රදේශ සියල්ලම එහෙමයි. ඒත් ගරු රාජකරුණා මැතිතුමා ඒක භාර ගත්තා. ඒ භාර අරගෙන තමයි ඒ ඡන්ද ව්‍යාපාරය කළේ. මම මේ පැත්තෙන් ගෙයින් ගෙට යන කොට එතුමා ඒ පැත්තෙන් ගෙයින් ගෙට ගියා. එතුමාගේ දේශපාලනය ශාඛා සමිතිවලට විතරක් සීමා වුණේ නැහැ. හැම මරණ ගෙයටම ගොඩ වුණා; හැම මඟුල් ගෙයටම ගොඩ වුණා. ජනතාව එක්ක විශාල සම්බන්ධකමක් තිබුණා. 1977 ජූලි මාසයේ මැතිවරණය තිබුණු කාලයේ අන්තිම සති දෙකේදී මට සිදු වුණා, දොම්පෙට ගිහින් ගරු රාජකරුණා මන්ත්‍රීතුමාගේ රැස්වීම අමතන්න. මමත් දේශපාලනයට ඇවිල්ලා තිබුණාට එදා කථිකයෙක් නොවෙයි. ඒත් දොම්පෙට එන්න කථිකයෝ සොයා ගන්න අමාරු වුණා. මොකද, හැම කෙනාම කැමැති වුණේ දිනනවාය කියන ආසනවලට ගිහිල්ලා කථා කරන්නයි. ඒත් අන්තිම දවස් කිහිපයේදී මට පෙනුණා, ගරු රාජකරුණා මැතිතුමාත් මොකක් හරි මෙතැන වෙනසක් කරන්න යනවා කියලා. එතුමා ඒක කළා. එතුමා නොසිටියා නම් සමහර විට දොම්පේ ආසනය අපිට එදා දිනන්න නොහැකි වෙන්න තිබුණා. ඒත් එතුමා නිසා අපි එම ආසනය දිනුවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊට පස්සේ බියගම වාගේම දොම්පේ ආසනය දියුණු කිරීමේදීත්, සංවර්ධනය කිරීමේදීත් අපි ඔක්කෝම එකට එකතු වෙලායි වැඩ කටයුතු කළේ. අපට දිස්ත්‍රික් ඇමතිවරයෙක් හිටියා. දිස්ත්‍රික්ක සංවර්ධන සභාව යටතේ ගම් මට්ටමෙන් විශාල දියුණුවක් ඇති කළා. මම බියගම වෙළෙඳ

කලාපය ආරම්භ කරන්න ක්‍රියා කරන ගමන් ගරු රාජකරුණා මැතිතුමා කළේ තවත් කාරණයක්. එතුමා කෘෂිකර්ම සංවර්ධන අධිකාරියේ රන්ජන් විජේරත්න මැතිතුමා කැඳවා, ඒ නිලධාරින් කැඳවා ඒ ප්‍රදේශයේ කෘෂිකාර්මික වශයෙන් විශාල දියුණුවක් ඇති කරන්න සැලැස්මක් ඇති කළා. ග්‍රාමීය මට්ටමේ වැඩ කටයුතුවලට උදව් කළා. පාසල් දියුණු කරන්න, ඒ වාගේම තරුණ කටයුතුවලදී එතුමා උනන්දුවෙන් වැඩ කටයුතු කළා. ඒ කටයුතු කරන ගමන් මට හැම වෙලාවේම මතක් කරනවා, බියගම වෙළෙඳ කලාපයටත් දොම්පෙන් කණ්ඩායමක් දමන්නය කියලා. කොහොමත් ඒක සිදු වුණා. මොකද, දොම්පේ ආසනයේ මායිමේ තමයි ඒ වෙළෙඳ කලාපයේ කර්මාන්තශාලා තිබුණේ. අන්න එහෙම එතුමාගේ උනන්දුව නිසා තමයි දොම්පේ ඔය දියුණුව ඇති වුණේ. දොම්පෙට විශාල දියුණුවක් 1977ත්, 1993ත් අතර කාලයේ ගරු රාජකරුණා මැතිතුමා ලබා දුන්නා.

ඒ විතරක් නොවෙයි. ගරු රාජකරුණා මැතිතුමා Prince of Wales' විද්‍යාලය කිසි විටෙක අමතක කළේ නැහැ. මට මතකයි මා අධ්‍යාපන ඇමතිව සිටි කාලයේ ටිරොන් ප්‍රනාන්දු මැතිතුමාටත් වඩා Prince of Wales' විද්‍යාලය ගැන කථා කළේ ගරු රාජකරුණා මැතිතුමාය බව. එතුමා නියෝජ්‍ය ආහාර හා සමුපකාර ඇමතිවරයා හැටියට හිටියා. ඒ අවස්ථාවේ එස්.බී.හේරත් මැතිතුමා එක්ක හොඳට වැඩ කටයුතු කළා. ඊට පස්සේ කැබිනට් මණ්ඩලයට ආවා. ගරු ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ විශාල ලැදියාවක් තිබුණා, එතුමා ඉදිරිපත් කරලා දිනපු ගරු රාජකරුණා මන්ත්‍රීතුමා සම්බන්ධයෙන්. ඊට පසුව රාජකරුණා මැතිතුමාට අවස්ථාව හම්බ වුණා පොල් කර්මාන්ත රාජ්‍ය ඇමතිවරයා හැටියටත්, බලශක්ති සංරක්ෂණ ව්‍යාපෘති ඇමතිවරයා හැටියටත් ක්‍රියා කරන්න. මම කියන්න කැමැතියි, විදුලිබල ඇමති හැටියට දොම්පේ ඉතිරි ප්‍රදේශවලට විදුලි බලය ලබා දෙන්න එතුමා ක්‍රියා කළ බව. දොම්පේ ආසනයේ පූගොඩ, කිරිඳිවැල, දොම්පේ, දෙකටන, සමනබැද්ද මේවාගේ නගර හැම එකක්ම දියුණු කරන්න තිබුණා. මට තිබුණේ ඉතා කුඩා ආසනයක්. එතුමාට තිබුණේ ඊටත් වඩා කුඩා ආසනයක්. මෙතුමාගේ -ගරු ජෝශප් මයිකල් පෙරේරා මන්ත්‍රීතුමාගේ- ජාඇල ආසනයේ එදා යම් කිසි දියුණුවක් තිබුණා. නමුත් මේ කියන ප්‍රදේශවල එදා දියුණුවක් තිබුණේ නැහැ. ගරු රාජකරුණා මැතිතුමා ඒ ප්‍රදේශවලට යටිතල පහසුකම් ලබා දීලා එම ප්‍රදේශ දියුණු කරන්න කටයුතු කළා. ඒ වාගේම කිරිඳිවැල මධ්‍ය මහා විද්‍යාලය දියුණු කරන්න විශාල උනන්දුවක් ගත්තා. එම පාසලේ 1977 තිබුණේ ගොඩනැඟිලි දෙක තුනක් විතරයි. ඊට පස්සේ එතුමාගේ උනන්දුවෙන් තමයි කිරිඳිවැල මධ්‍ය මහා විද්‍යාලය මේ තත්ත්වයට ආවේ.

විරුද්ධ පක්ෂයේ සිටියදී වුණත් එතුමා දැන ගත්තා, තමන් කථා කරන්න ඕනෑ කරුණ කුමක්ද කියලා. ඒවාට සීමා කරලා හොඳට කරුණු ටික ඉදිරිපත් කළා. දේශපාලනයේ ඉන්න කොට සමහර විට පරාජය වෙනවා. ඒකටත් එතුමා මුහුණ දුන්නා. අන්තිමට එතුමා දේශීය වෛද්‍ය හා ආපදා සහන ඇමතිවරයා හැටියට අපත් එක්ක වැඩ කටයුතු කළා. මම හිතන්නේ දේශීය වෛද්‍ය ඇමතිකමට, නක්ෂත්‍රයට දෙකටම එතුමාගේ කැමැත්තක් තිබුණා. එතුමා දේශීය වෛද්‍ය වැඩ කටයුතු ගැන ක්‍රියා කළා. මම හිතන්නේ එතුමා ඒ කෙටි කාලය තුළදී ඒ අමාත්‍යාංශය ඉදිරියට ගෙනි යන්න හැකි හැම පියවරක්ම අර ගත්තා කියලා. ගරු රාජකරුණා මන්ත්‍රීතුමා ඒ ප්‍රදේශයේ පන්සල්වලට විශාල උදවුවක් කළා. ගරු රාජකරුණා මැතිතුමාත්, මැතිනියත් දෙන්නාම බෞද්ධ වැඩ කටයුතුවල යෙදුණා. ඒ වාගේම ඒ පන්සල්වලට දායකත්වයක් දුන්නා. ඒවා අමතක කළේ නැහැ. ඒ ප්‍රදේශයේ යම් කිසි මරණ ගෙයක් තිබුණත්, යම් කිසි උත්සවයක් තිබුණත් එතුමා මට කථා කරලා කියනවා කොහොම හරි මෙහාට එන්න කියලා. ඒ ගැන මම එතුමාට කෘතඥ වෙනවා. මට එන්න බැරි වුණා නම් එතුමා එතැනට ඉදිරිපත් වනවා.

1989 දී මේ මනාප ක්‍රමය ඇති කරද්දී එතුමාත් මමත් එකට එකතු වෙලා ඡන්ද ව්‍යාපාරවල වැඩ කොටසක් කරගෙන ගියා. ඒ එක්කම ගරු රාජකරුණා මන්ත්‍රීතුමා අපි දැක්කේ හැම වෙලාවේම ජනතාව එක්ක බිම් මට්ටමින් විශාල සම්බන්ධකමක් තිබුණු පුද්ගලයෙක් හැටියටයි. එතුමා ඕනෑම පුද්ගලයෙක් දැනගෙන හිටියා. දෙවැනි පරම්පරාවත් දැනගෙන හිටියා. තුන්වැනි පරම්පරාවත් දැනගෙන හිටියා. එතුමා ඉදිරියට ආවේ නැති වුණාට කිව්වා, "මට දෙන්න, ඕනෑම ප්‍රශ්නයක් ගැන මම කථා කරන්නම්" කියලා. වාම්ව මන්ත්‍රීවරයෙක් හැටියට ක්‍රියා කළා. එහෙම මන්ත්‍රීවරු සොයා ගන්න එක ලෙහෙසි පහසු වැඩ කටයුත්තක් නොවෙයි. එතුමා ආසනයට කාලය ගත කළා.

ඒ වාගේම තමන්ට භාර දුන් අමාත්‍යාංශ සම්බන්ධව ක්‍රියා කළා. විරුද්ධ පක්ෂයේ සිටියදී තමන්ට විෂයයන් භාර දුන්නා නම් ඒ විෂයයන් සම්බන්ධවත් ක්‍රියා කළා. එතුමා ආදර්ශවත් මන්ත්‍රීවරයෙක්; කරුණු හැම එකක්ම දැන ගෙන සිටියා. අනෙක මම දන්නවා, ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා විශ්‍රාම ගියාට පස්සේ එතුමා ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා බම්බ වෙන්න බොහෝ විට යනවාය කියලා. සමහර අවස්ථාවල මට එතුමා හම්බ වුණාම කියනවා, ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා හම්බ වෙන්න යන්න ඕනෑ, එතුමාත් එක්ක සම්බන්ධය තියා ගන්න ඕනෑ කියලා. එතුමා ඒ ප්‍රදේශයත් එක්ක ඇති වුණු සම්බන්ධයත්, හිටපු නායකයකු එක්ක වැඩ කටයුතු කරපු එකත් හැම මන්ත්‍රීවරයකුගෙන්ම බලාපොරොත්තු වන්න පුළුවන් දෙයක් කියලා මම හිතන්නේ නැහැ.

රාජකරුණා මන්ත්‍රීමා ඒ වැඩ කටයුතු කරන ගමන් කෘෂි කාර්මික ව්‍යාපාරය ගැනත් විශාල දැනුමක් ලබා ගත්තා. එතුමා එම කර්මාන්තයේ යෙදුණා. රඹුටන් වගා කිරීම, දූරියන් වගා කිරීම, රබර් වගා කිරීම වාගේ හැම වගාවකටම එතුමා අවධානය යොමු කළා. රබර් මිල ගැනත් එතුමා දන්නවා. දූරියන් වගාවට තමයි එතුමා අන්තිමට අවධානය යොමු කළේ. කොහොමද මේ රටේ දූරියන් වගාව දියුණු කරන්නේ කියන එක ගැනත් කථා කළා. එතුමා හොඳ මිත්‍රයෙක්. එතුමා එක්ක අපි එකට වැඩ කටයුතු කළා. ගෙදරට එන්න කියනවා. කෑම කන්න එන්න කියනවා. රාජකරුණා මැතිනියත් ඒ වාගෙමයි. හැම වෙලාවේම උදව් උපකාර කරනවා. මොකක්ද වන්නේ කියලා විටින් විට දුරකථනයෙන් කථා කරලා අහන්න රාජකරුණා මන්ත්‍රීතුමා අමතක කළේ නැහැ. කාර්යාලයට එන්න කියනවා. ඒ කාලයේ දේශපාලනය කරපු අපි බොහෝ දෙනකුට ඒ සම්බන්ධකම තිබුණා. ඒ අනුව වැඩ කටයුතු කළා. එතුමාගේ අමාත්‍යාංශවල වැඩ කරපු නිලධාරින්ගෙන් ඇහුවොත්, එතුමා එක්ක වැඩ කළ හැම නිලධාරියෙක්ම කියන්නේ රාජකාරුණා මැතිතුමා එක්ක වැඩ කටයුතු කරන්න ලෙහෙසියි, කිසිම ප්‍රශ්නයක් නැහැ කියලායි. අපිත් එක්ක සාකච්ඡා කරනවා, ඒවාට එකඟ වෙනවා, පරස්පර මතයක් තිබෙනවා නම් ඒ ගැන ප්‍රකාශ කරනවා.

ඇමතිවරයෙක් හැටියට එතුමා ඒ වැඩ කටයුතු කළා. මාධ්‍ය ඉදිරියට ගිහින් විශාල ප්‍රසිද්ධියක් ලබා ගන්න රාජකරුණා මැතිතුමා කිසි විටෙක බලාපොරොත්තු වුණේ නැහැ. එහෙත් පක්ෂයේ වැඩ කටයුතු තිබුණා නම්, ආණ්ඩුවේ වැඩ කටයුතු තිබුණා නම් ඒවා කර හැරියේත් නැහැ. එක අතකින් ගත වුණු ජීවිත ගැන ඉංග්‍රීසියෙන් කියන්න පුළුවන් low-key කියලා. අනෙක් අතට සිංහලෙන් කියනවා නම් ජනතාව එක්ක විශිෂ්ට සම්බන්කම් තබාගෙන සිටියා. මම හිතන විධියට දොම්පේ ජනතාවට රාජකරුණා මැතිතුමාගේ සම්බන්ධය මතක් වුණේ 2010න් පස්සේ. අවාසනාවකට ඊට පස්සේ එතුමාට මේ පාර්ලිමේන්තුවට එන්න අවස්ථාව ලැබුණේ නැහැ. ඊට පස්සේ, විශේෂයෙන්ම එතුමා අභාවප්‍රාප්ත වූ දවස් කිහිපයේදීත් දොම්පේ ජනතාව කිව්වේ, එතුමා කොයි පක්ෂයේ හිටියත් එතුමා මුණ ගැහිලා, කථා කරලා වැඩ කටයුතු කරන්න පුළුවන් කියලායි. අද ඒ තත්ත්වය නැහැ. ඒ විධියේ ජනතා නියෝජිතයෙක් නැති වීම ඒ ප්‍රදේශයේ ජනතාවට විශාල අපරාධයක් කියලා ඔවුන් හිතුවා. එහෙත් ඒක දේශපාලනයේ එක ලක්ෂණයක්. ජනතාව සමඟ

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

එකට එකතු වෙලා වැඩ කරන මන්ත්‍රීවරුන්ගේ වටිනාකම අපට දැනෙන්නේ විශේෂයෙන්ම ඒ මන්ත්‍රීවරු පාර්ලිමේන්තුවෙන් පිට වුණායින් පස්සේ. රාජකරුණා මන්ත්‍රීතුමා අද මේ සභාවේ සිටියා නම් ඒ කරුණු සියල්ල ගැනම එතුමාගේ අවධානය යොමු වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මීට වඩා දීර්ඝ වශයෙන් කථා කරන්න තමයි මම බලාපොරොත්තු වුණේ. නමුත් අද අපට කාලය මදි වුණු නිසා මේ අවස්ථාවේදී මම මීට වඩා දීර්ඝ වශයෙන් කථා කරන්න යන්නේ නැහැ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

Hon. Member, we have to adjourn this Debate by 6.30 pm.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

Yes, give me one minute more.

ඒ නිසා එතුමාගේ පවුලේ අයට අපේ කනගාටුව ප්‍රකාශ කරන අතර, එතුමාට නිවන් සැප ලැබේවා කියා ප්‍රකාශ කරමින් කල් තැබීමේ යෝජනාව ගෙන ඒම සඳහා සභානායකතුමාට අවස්ථාව ලබා දෙනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

Thank you. This Vote of Condolence stands adjourned till tomorrow evening.

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
### பாராளுமன்ற அமர்வு
### SITTINGS OF THE PARLIAMENT

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා )**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Irrigation and Water Resources Management and Leader of the House of Parliament)

"ස්ථාවර නියෝග 7හි විධිවිධානවල සහ 2011.04.07 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, 2011.08.12 වැනි දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව අ.භා. 1.30 සිට අ.භා. 6.30 දක්වා විය යුතු ය. අ.භා. 6.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ශ්‍රී ලංකා ව්‍යවහාරික සංඛ්‍යාන විද්‍යා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
### இலங்கை பிரயோக புள்ளிவிபரவியல் நிறுவகம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
### INSTITUTE OF APPLIED STATISTICS, SRI LANKA (INCORPORATION) BILL

***පනත් කෙටුම්පත (ස්ථාවර කාරක සභාවෙහි දී) සංශෝධනය කළ ආකාරයෙන් සලකා බැලීමේ නියෝගය කියවන ලදී.***
*[நிலைக் குழுவில்] திருத்தப்பட்டவாறு, சட்டமூலத்தைப் பரிசீலித்தற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for consideration of Bill, as amended (in the Standing Committee), read.*

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ශ්‍රී ලංකා ව්‍යවහාරික සංඛ්‍යානවිද්‍යා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත පිළිබඳ ස්ථාවර කාරක සභාවේ වාර්තාව පිළිගත යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

"පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් දැන් තුන් වන වර කියැවිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන්වන වර කියවා සම්මත කරන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக் கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம் முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill, as amended, accordingly read the Third time, and passed.*

## දෙහිවල, නැදිමාලේ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත
### தெஹிவளை நெதிமாலை பௌத்த கலாசார நிலையம் (கூட்டிணைத்தல்) (திருத்தச்) சட்டமூலம்
### BUDDHIST CULTURAL CENTRE OF NEDIMALA, DEHIWALA (INCORPORATION) BILL

***දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.***
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "දෙහිවල, නැදිමාලේ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය (සංස්ථාගත කිරීමේ)

(සංශෝධන) පනත් කෙටුම්පත දෙවන වර කියවිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදින්, 48(3) වන ස්ථාවර නියෝගය යටතේ, නියෝජ්‍ය කථානායකතුමා විසින් එය "බී" ස්ථාවර කාරක සභාවට පවරන ලදී.***
*சட்டமூலம் இதன்படி, இரண்டாம் முறை மதிப்பிடப்பட்டு நிலைக் கட்டளை 48(3)இன்படி நிலைக்குழு " பி"க்கு பிரதிச் சபாநாயகர் அவர்களால் சாட்டப்பட்டது.*
*Bill accordingly read a Second time, and allocated by* MR. DEPUTY SPEAKER *to Standing Committee "B" under Standing Order 48(3).*

# සමස්ත ලංකා භික්ෂු සහයෝගිතා සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත

ஐக்கிய இலங்கை பிக்குமார்களுக்கான அபிவிருத்தி அமைப்பு (கூட்டிணைத்தல்) சட்டமூலம்
ALL ISLAND BHIKSHU BENEVOLENT DEVELOPMENT FOUNDATION (INCORPORATION) BILL

***දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.***
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "සමස්ත ලංකා භික්ෂු සහයෝගිතා සංවර්ධන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදින්, 48(3) වන ස්ථාවර නියෝගය යටතේ, නියෝජ්‍ය කථානායකතුමා විසින් එය "බී" ස්ථාවර කාරක සභාවට පවරන ලදී.***
*சட்டமூலம் இதன்படி, இரண்டாம் முறை மதிப்பிடப்பட்டு நிலைக் கட்டளை 48(3)இன்படி நிலைக்குழு " பி"க்கு பிரதிச் சபாநாயகர் அவர்களால் சாட்டப்பட்டது.*
*Bill accordingly read a Second time, and allocated by* MR. DEPUTY SPEAKER *to Standing Committee "B" under Standing Order 48(3).*

# දේශමාන්‍ය රවීන්ද්‍ර වනිගසේකර පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත

தேசமான்ய ரவீந்திர வணிகசேகர ஒழுங்கமைப்பு (கூட்டிணைத்தல்) சட்டமூலம்
DESHAMANYA RAVINDRA WANIGASEKARA FOUNDATION (INCORPORATION) BILL

***දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.***
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "දේශමාන්‍ය රවීන්ද්‍ර වනිගසේකර පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදින්, 48(3) වන ස්ථාවර නියෝගය යටතේ, නියෝජ්‍ය කථානායකතුමා විසින් එය "ඒ" ස්ථාවර කාරක සභාවට පවරන ලදී.***
*சட்டமூலம் இதன்படி, இரண்டாம் முறை மதிப்பிடப்பட்டு நிலைக் கட்டளை 48(3)இன்படி நிலைக்குழு " ஏ"க்கு பிரதிச் சபாநாயகர் அவர்களால் சாட்டப்பட்டது.*
*Bill accordingly read a Second time, and allocated by* MR. DEPUTY SPEAKER *to Standing Committee "A" under Standing Order 48(3).*

# ශ්‍රී ලංකා ඖෂධ විද්‍යා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත

இலங்கை ஔடதங்கள் சங்கம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
PHARMACEUTICAL SOCIETY OF SRI LANKA (INCORPORATION) BILL

***දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.***
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ශ්‍රී ලංකා ඖෂධ විද්‍යා සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදින්, 48(3) වන ස්ථාවර නියෝගය යටතේ, නියෝජ්‍ය කථානායකතුමා විසින් එය "බී" ස්ථාවර කාරක සභාවට පවරන ලදී.***
*சட்டமூலம் இதன்படி, இரண்டாம் முறை மதிப்பிடப்பட்டு நிலைக் கட்டளை 48(3)இன்படி நிலைக்குழு " பி"க்கு பிரதிச் சபாநாயகர் அவர்களால் சாட்டப்பட்டது.*
*Bill accordingly read a Second time, and allocated by* MR. DEPUTY SPEAKER *to Standing Committee "B" under Standing Order 48(3).*

# ජෝන් සෙනෙවිරත්න පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත

ஜோன் செனவிரத்ன மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
JOHN SENEVIRATNE FOUNDATION (INCORPORATION) BILL

***දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.***
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

**ගරු නිමල් සිරිපාලද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ජෝන් සෙනෙවිරත්න පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදින්, 48(3) වන ස්ථාවර නියෝගය යටතේ, නියෝජ්‍ය කථානායකතුමා විසින් එය "ඒ" ස්ථාවර කාරක සභාවට පවරන ලදී.*

*சட்டமூலம் இதன்படி, இரண்டாம் முறை மதிப்பிடப்பட்டு நிலைக் கட்டளை 48(3)இன்படி நிலைக்குழு " ஏ"க்கு பிரதிச் சபாநாயகர் அவர்களால் சாட்டப்பட்டது.*

*Bill accordingly read a Second time, and allocated by* MR. DEPUTY SPEAKER *to Standing Committee "A" under Standing Order 48(3).*

## තිදොර - තියටර් ඉන්ස්ටිටියුට් ෆෝ ඩිසැබිලිටි ඔරියන්ටඩ් රිසර්ච් ඇන්ඩ් ඇඩ්වොකසි (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත

### அங்கவீனர்களுக்கான ஆலோசனையும் உதவிகளையும் வழங்குவதற்கான திதொரா தியேட்டர் நிறுவகம் (கூட்டிணைத்தல்) சட்டமூலம்

### THIDORA-THEATRE INSTITUTE FOR DISABILITY ORIENTED RESEARCH AND ADVOCACY (INCORPORATION) BILL

*දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.*
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "තිදොර - තියටර් ඉන්ස්ටිටියුට් ෆෝ ඩිසැබිලිටි ඔරියන්ටඩ් රිසර්ච් ඇන්ඩ් ඇඩ්වොකසි සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත දෙ වන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදින්, 48(3) වන ස්ථාවර නියෝගය යටතේ, නියෝජ්‍ය කථානායකතුමා විසින් එය "ඒ" ස්ථාවර කාරක සභාවට පවරන ලදී.*

*சட்டமூலம் இதன்படி, இரண்டாம் முறை மதிப்பிடப்பட்டு நிலைக் கட்டளை 48(3)இன்படி நிலைக்குழு " ஏ"க்கு பிரதிச் சபாநாயகர் அவர்களால் சாட்டப்பட்டது.*

*Bill accordingly read a Second time, and allocated by* MR. DEPUTY SPEAKER *to Standing Committee "A" under Standing Order 48(3).*

## ශ්‍රී ධම්මාලංකාර සමාජ සේවා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත

### ஸ்ரீ தம்மாலங்கார சமூக சேவைகள் மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்

### SRI DHAMMALANKARA SOCIAL SERVICES FOUNDATION (INCORPORATION) BILL

*දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.*
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ශ්‍රී ධම්මාලංකාර සමාජ සේවා පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදින්, 48(3) වන ස්ථාවර නියෝගය යටතේ, නියෝජ්‍ය කථානායකතුමා විසින් එය "ඒ" ස්ථාවර කාරක සභාවට පවරන ලදී.*

*சட்டமூலம் இதன்படி, இரண்டாம் முறை மதிப்பிடப்பட்டு நிலைக் கட்டளை 48(3)இன்படி நிலைக்குழு " ஏ"க்கு பிரதிச் சபாநாயகர் அவர்களால் சாட்டப்பட்டது.*

*Bill accordingly read a Second time, and allocated by* MR. DEPUTY SPEAKER *to Standing Committee "A" under Standing Order 48(3).*

## කල්තැබීම

### ஒத்திவைப்பு

### ADJOURNMENT

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

### අධ්‍යාපන පරිපාලන කටයුතු බිඳ වැටීම

### கல்வி நிருவாக நடவடிக்கைகளின் வீழ்ச்சி

### DISRUPTION IN EDUCATION ADMINISTRATION ACTIVITIES

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සභාව කල් තබන අවස්ථාවේදී පහත සඳහන් යෝජනාව මම ඉදිරිපත් කරනවා:

> "දිවයින පුරා පිහිටි කලාප අධ්‍යාපන කාර්යාල, කොට්ඨාස අධ්‍යාපන කාර්යාල ඇතුළු අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පාලනය වන ඇතැම් අධ්‍යාපන ආයතනවල පරිපාලන කටයුතුවල මූලික වගකීම දේශපාලන පළි ගැනීම් ලෙස පත්වීම් ලද නිලධාරින්ට ලබා දී ඇති බැවින්, මුළුමහත් ශ්‍රී ලංකාවේම අධ්‍යාපන පරිපාලන කටයුතු මේ වන විට බරපතළ බිඳ වැටීමකට ලක්ව තිබේ.

> මෙම නිලධාරින් අධ්‍යාපන පරිපාලනයේ වගකීම්වලින් ඉවත් කර සුදුසුකම් සපුරා ඇති නිලධාරින්ට අදාළ පත්වීම් ලබා දීම තුළින් අධ්‍යාපන ක්ෂේත්‍රයේ පවතින මෙම බිඳ වැටීම වළක්වා ගැනීමට පියවර ගතයුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම යෝජනාව ඉදිරිපත් කරන්නට හේතුපාදක වුණේ එක පැත්තකින් සෘජුවම රේඛීය අමාත්‍යාංශය වාගේම පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ තුළත් ඇති වෙලා තිබෙන පරිපාලනයේ යම් අර්බුදකාරී තත්ත්වයනුයි. මා නියෝජනය කරන මාතර දිස්ත්‍රික්කය අයත් වන දකුණු පළාතේ වාගේම උතුරුමැද පළාතේත් මෙම ගැටලුව පැන නැඟුණා. 1948 අප නිදහස ලැබුවායින් පසුව ගත වුණු වසර 63ක කාලය තුළ පත් වුණු ඇතැම් රජයන් යටතේ සමහර අවස්ථාවලදී අහිංසක රජයේ සේවකයන් දේශපාලන පළිගැනීම්වලට ලක් වුණා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට වාගේම එක්සත් ජාතික පක්ෂයටත් ඒ පාපයෙන් මිදෙන්න බැහැයි කියන එක යථාර්ථවාදී ඒත් කටුක සත්‍යයක්.

දේශපාලන පළිගැනීම්වලට ලක් වුණු අයට අනිවාර්යයෙන්ම ඊ ළඟට පත් වන රජයක් විසින් සහන ලබා දීම ඉතා අත්‍යවශ්‍ය, වැදගත් කාරණයක්. ඒක අපි බැහැර කරන්නේ නැහැ. වර්තමාන රජය යටතේ දේශපාලන පළිගැනීම්වලට ලක් වුණු අයට අනාගත එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවකින් සහන දෙනවා. එදාට කවුරුහරි දේශපාලන පළිගැනීම්වලට ලක් වුණොත් ඊ ළඟට පත් වන එක්සත් ජනතා නිදහස් සන්ධානයේ හෝ පොදුජන එක්සත් පෙරමුණේ ආණ්ඩුවකින් සහන දෙනවා. මේ චක්‍රය ක්‍රියාත්මක වනවාට වඩා වටිනා, ඉතා වැදගත් දේ දේශපාලන පළිගැනීම් නතර කිරීමයි; ඒ සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීමයි. මෙකෙන් අපට බැහැර කරන්නට බැහැ. මා මේ යෝජනාව ඉදිරිපත් කිරීම මඟින් බලාපොරොත්තු වන්නේ දේශපාලන පළිගැනීම්වලට ලක්වූවන්ට සහන දෙන්නට එපාය කියන කාරණය නොවෙයි. දේශපාලන පළිගැනීම්වලට ලක්වූවන්ට අනිවාර්යයෙන්ම සහන ලබා දිය යුතුව තිබෙනවා. ඒ ගැන තර්කයක් නැහැ. නමුත් ඒ දේශපාලන පළිගැනීම්වලට ලක්වූවන්ට ලැබෙන ඒ සහනය දඩමීමා කර ගනිමින් ඒ සහනය ප්‍රයෝජනයට ගනිමින් ඇතැම් දේශපාලන අධිකාරීන් සමඟ එකතු වෙලා ගත්ත ක්‍රියා මාර්ග වහා නිවැරදි කර ගැනීමේ අවශ්‍යතාව තිබෙනවා. මා පෞද්ගලිකවම විශ්වාස කරනවා, අධ්‍යාපන ඇමතිතුමා අධ්‍යාපනය ගැන ලොකු කැක්කුමක් තිබෙන අධ්‍යාපනයේ විප්ලවීය වෙනසක් පරිවර්තනයක් කිරීමේ වුවමනාවක් තිබෙන ප්‍රගතිශීලි ඇමතිවරයෙක් බව. මේ කාරණය පිළිබඳව මා ගරු අමාත්‍යතුමාගේ අවධානය බරපතළ විධියට යොමු කරනවා. එතුමාගේ පිළිතුරු කථාවෙන් මම මේ තත්ත්වයට සහනයක් සම්පූර්ණයෙන් බලාපොරොත්තු වන්නේ නැහැ. ගරු ඇමතිතුමනි, මා සභාගත කරන්නට බලාපොරොත්තු වන ලේඛන ඔබතුමාගේ අතට පත් කරන්නට මම කැමැතියි. ඒ ලේඛනත් පරිශීලනය කරලා මේ ඇති වෙලා තිබෙන තත්ත්වය පිළිබඳව සාධාරණයක් ඉටු කරයි කියලා මා විශ්වාස කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අංක I වශයෙන් ලකුණු කර තිබෙන ලේඛනය මා මුලින්ම **සභාගත*** කරනවා.

මේ ලේඛනය අද මා මේ යෝජනාවට ඉදිරිපත් කරන්නට පාදක වුණු සිද්ධි දාමයෙන් එකකට අදාළයි. යම් යම් චෝදනා කිහිපයක් මත මාතර කලාපයේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා ගාල්ලට -පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට- මාරු කළා. ඒ මාරු කිරීමෙන් පස්සේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් ඔහුට ලියුමක් එවා තිබෙනවා, ඔහුට එරෙහිව දැනට පැවතෙන විමර්ශන කටයුතු අවසාන වන තෙක් වහාම ක්‍රියාත්මක වන පරිදි මුලටියන කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරේ වැඩ බැලීම සඳහා පත් කිරීමට දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කරන ලද බවට. මාතර වැරදි කරලා මොහුව ගාල්ලේ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට ස්ථාන මාරු කළාම, මොහුව ආපහු සැරයක් මුලටියනට එවනවා. ඇයි, මේ එවන්නේ? සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ට තායිලන්තයේ සංචාරයක් ලැබෙනවා. මොහුට මේ ලිපිය මඟින්ම කියනවා, "ඔබට එරෙහිව දැනට පැවතෙන විමර්ශන කටයුතු අවසාන වන තෙක්" කියා.

දැන් විමර්ශන පැවැත්වෙන නිලධාරියාව ගාල්ලට මාරු කළාම, ගාල්ලෙන් නැවත වරක් මුලටියන කලාපයට යවලා, එයාට ඒ චාරිකාව බුක්ති විඳීමේ අවස්ථාවත් ලැබෙනවා. මෙවැනි තත්ත්වයක් තුළ පනින රිළවුන්ට ඉණිමං බැඳීමක් වැනි තත්ත්වයකුයි ඇති වෙලා තිබෙන්නේ.

ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ අවධානය යොමු වීමට මම මේ ලිපි ලේඛන ලබා දෙන්න සතුටුයි. ගරු අධ්‍යාපන ඇමතිතුමා දන්නවා, උසස් පෙළ කරන්න සාමාන්‍ය පෙළ විභාගයෙන් ගණිතය විෂය සමත් වීම අනිවාර්ය කාරණයක් බව. මේ කලාප අධ්‍යක්ෂවරයාගේ සාමාන්‍ය පෙළ සහතිකය ඇමුණුම් II වශයෙන් ලකුණු කරලා **සභාගත*** කරනවා.

ඒ අනුව ඔහු ගණිතය සමත් නැහැ. ගණිතය සමත් නැති පුද්ගලයෙක් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර දක්වා ගියේ කොහොමද? ඊළඟට තිබෙන ප්‍රශ්නය ඒකයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ අවධානය සඳහා මම මේක කියන්න ඕනෑ. මාතර අධ්‍යාපන කලාපයේ සාමාන්‍ය ශිෂ්‍යයන්ගේ ගණිතය සමත් වීමේ ප්‍රතිශතය සියයට 60 සිට 70 දක්වා වසරින් වසර වෙනස් වනවා. එක වර්ෂයක සියයට 69.97ක් වුණා. මාතර කලාපයේ ශිෂ්‍යයෝ සියයට 69.97ක් ගණිතය සමත් වනවා. හැබැයි, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේ සාමාන්‍ය පෙළ සහතිකයේ ගණිතය විෂය අසමත්. මේ මොන විහිළුවක්ද? මාතර කලාපයේ ඉස්කෝල 109ක් තිබෙනවා. ශිෂ්‍ය සංඛ්‍යාව දළ වශයෙන් 66,000කට ආසන්නයි. ගුරුවරු අතර අධ්‍යාපන ශික්ෂණවේදී ඩිප්ලෝමාධාරීන්, උපාධිධාරීන්, පශ්චාත් උපාධි ඩිප්ලෝමාධාරීන්, ශාස්ත්‍රපති උපාධිධාරීන්, අධ්‍යාපනපති හා දර්ශනපති උපාධිධාරීන් ඉන්නවා. දළ වශයෙන් ගත්තොත් 3,900කට වැඩි උපාධි සහ පශ්චාත් උපාධිලාභීන් පිරිසක් මාතර කලාපය තුළ ඉන්නවා. හැබැයි, කලාපයේ හිටපු කලාප අධ්‍යක්ෂවරයාගේ ගණිතය සහ ඉංග්‍රීසි භාෂාව පිළිබඳව තිබෙන්නේ ප්‍රශ්නාර්ථයක්.

ඒ විතරක් නොවෙයි. මෙහෙම කෙනෙක් මේ තැනට ආවාම තමන්ගේ ගුරුවරුන්ට, විදුහල්පතිවරුන්ට ඒ නියෝග දෙන්නේ කොහොමද? මේ තත්ත්වය ඇති කර ගන්නේ කොහොමද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අදාළ නිලධාරියා දේශපාලන පළි ගැනීමක් විධියට යළි සේවයේ පිහිටුවන කොට 2003 දෙසැම්බර් 31 වැනිදා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයෙන් මේ හා සමාන පත්වීම් දුන්නු ලිපියක පිටපතක් මා සතුව තිබෙනවා. ඒ ලිපියේ පැහැදිලිව මෙසේ කියනවා:

> "මෙම පත්වීම අනුව සේවයට අදාළ වැටුප් ලබා ගැනීමේ හිමිකම හැර වෙනත් හිමිකමක් ඔබට නොලැබේ."

දේශපාලන පළි ගැනීම් වෙනුවෙන් සහනයක් විධියට ලැබෙන්නේ ඒ තනතුරට අදාළ වැටුප් ලබා ගැනීම විතරයි. වැටුප් ලබා ගැනීම හැර වෙනත් හිමිකමක් ඔහුට කිසිසේත්ම නැහැ. මොකක්ද මේ කියන්නේ? තනතුරට අදාළ වැටුප ලබා ගන්න පුළුවන්, හැබැයි ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු බුද්ධික පතිරණ මහතා]

නිලධාරියකු විධියට ඔහුට පරිපාලන ක්‍රියාදාමය තුළ කටයුතු කරන්න බැහැයි කියන එකයි මේ හා සමාන පත්වීම් ලැබුණ අයට දුන්නු මේ ලියුමේ පැහැදිලිව තිබෙන්නේ. මම ඒ ලියුම ඇමුණුම් III වශයෙන් **සභාගත*** කරන්නට කැමැතියි.

මේ විධියට පත් කරපු අය සම්බන්ධයෙන් බරපතළ ගැටලු සහගත තත්ත්වයක් ඇති වුණාම ඒ ගැටලු සහගත තත්ත්වය හමුවේත්, මීට කලින් ඇති වුණු තත්ත්වයන් හමුවේත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව 2002 ජනවාරි 11 වැනිදා සියලුම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරුන්ටත්, සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්ටත් යවන ලද ලිපියක් මා සතුව තිබෙනවා. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුවේ එවකට ලේකම් හැටියට කටයුතු කළ ටී.එම්.එම්. තෙන්නකෝන් මහත්මයාගේ අත්සනින් නිකුත් කර තිබෙන එම ලිපිය ඇමුණුම් IV වශයෙන් මා **සභාගත*** කරනවා.

එහි මෙසේ සඳහන් වනවා:

" මෙසේ පත් කරනු ලැබ ඇති වැඩි පිරිසක් දේශපාලන පළිගැනීම් විමර්ශන කමිටු නිර්දේශ මත උසස්වීම් ලත් පිරිසකි. එම නිලධාරින් හට උසස්වීම් ලබා දීමේදී 'අධිසේවක පදනම මත' සිදු කර ඇති අතර, අදාළ අමාත්‍ය මණ්ඩල තීරණයන් අනුව ඔවුනට හිමි කර දිය යුත්තේ ශ්‍රේණි පත් වීමට අදාළව මූල්‍ය වාසිය පමණක් වේ. එසේ නොමැතිව ඔවුන් තනතුරුවලට පත් කිරීමෙන් විධිමත් ලෙස පරිපාලන සේවයට පත් වූ නිලධාරින් හට අසාධාරණයක් සිදු වී ඇත. ...............එසේ අවිධිමත් ලෙස සිදු කර ඇති පත්වීම් වහාම අහෝසි කිරීමට කටයුතු කරන ලෙස තීරණය කර ඇත."

හැබැයි, මේවා කොළයට පමණක් සීමා වනවා. මේ නිලධාරියා දැනටත් මුලටියන කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විධියට යහතින් වැඩ බලනවා.

එහෙම නම් මේ නිකුත් කරපු චක්‍රලේඛ සියල්ල අවසාන විග්‍රහයේදී කඩදාසි බවට පත්වීම නේද සිද්ධ වෙලා තිබෙන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි?

ඒ වාගේම 2003 දෙසැම්බර් 02 වන දා රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් නිකුත් කරපු රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 04/03 ඇමුණුම් V වශයෙන් **සභාගත*** කරන්න මා කැමැතියි.

මේ චක්‍රලේඛය තුළ පැහැදිලිව කියනවා අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරුවලට පත් කිරීම කොහොමද කරන්න ඕනෑ කියලා. එහි පැහැදිලිව මෙසේ සඳහන් වනවා:

"මෙම තනතුරු සඳහා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 1 පන්තියේ නිලධාරින් පළාත් බලධාරින් විසින් පත් කරනු ඇත"

දැන් මේ නිලධාරියා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 1 පන්තියේ නිලධාරියෙක් නොවෙයි. මේ වාගේ පත් වුණු තවත් අය ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 1 පන්තියේ නිලධාරින් නොවෙයි. එම නිසාම වැඩ බලන්න පත් කරලා තිබෙනවා. දැන් ලංකාවේ බොහෝ පළාත්වල මේ විධියට වැඩ බලන මුවාවෙන් ලබා දී තිබෙන පත්වීම් නිසා සමස්ත අධ්‍යාපන පරිපාලනයම බිඳ වැටීමේ අවදානමක් තිබෙනවා. බිඳ වැටීමේ අවදානමක් විතරක් නොවෙයි, එහෙම බිඳ වැටීමකුත් සිදු වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා දකුණු පළාත් සභාවේ විපක්ෂ නායකවරයා විධියට පත් වන මොහොත වන විට පළාත් සභාව යටතේ තිබුණු සියලු කලාපවලට සිටියේ වැඩ බලන කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ය කියලා මා කියන්න ඕනෑ. මේ තුළයි මෙවැනි තත්ත්වයන් නිර්මාණය වෙලා තිබෙන්නේ.

2002 මාර්තු 01 වන සිකුරාදා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් නිවේදනය 1 වැනි කොටස (I) වැනි ඡේදය - සාමාන්‍ය, ආණ්ඩුවේ නිවේදන යටතේ ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ ව්‍යවස්ථා සංග්‍රහය ඇමුණුම් VI ලෙස **සභාගත*** කරන්න මා කැමැතියි.

මේ ව්‍යවස්ථා සංග්‍රහයේ 22 කාරණය යටතේ ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව පිළිබඳව පැහැදිලිව කියනවා. එහි මෙසේ සඳහන් වනවා:

"පිළිගත් විශ්ව විද්‍යාලයකින් ඉංග්‍රීසි මාධ්‍යයෙන් ලබා ගත් උපාධියක් නොමැතිව සේවයේ II වන පන්තියට පත් කර ඇති නිලධාරියකු 1 වන පන්තියට උසස් කිරීමට ප්‍රථම අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් හෝ ඒ හා සමාන මට්ටමකින් ඉංග්‍රීසි භාෂාව සමත් විය යුතුය."

අඩුම ගණනේ සාමාන්‍ය පෙළ විභාගයෙන් හෝ ඉංග්‍රීසි භාෂාව සමත් වෙලා තිබෙන්න ඕනෑය කියලා මෙහි සඳහන් වෙලා තිබෙනවා.

මා නැවතත් අවධානය යොමු කරන්න කැමැතියි, මා මුලින් ඇමුණුම් II ලෙස සභාගත කරපු, මේ කියන නිලධාරියාගේ අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ ප්‍රතිඵල ලේඛනයට. 1971 දෙසැම්බර් මාසයේ පැවැති විභාගයේ පීබී 44420 විභාග අංකය යටතේ ලබා ඇති ප්‍රතිඵල ලේඛනයේ විෂයයන් 7ක් සඳහන් වනවා, සිංහල භාෂාව, සිංහල සාහිත්‍යය, බුද්ධ ධර්මය, සෞඛ්‍ය විද්‍යාව, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව හා ජීව විද්‍යාව වශයෙන්. ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය පිළිබඳව කොතැනවත් සඳහන් වන්නේ නැහැ. එම නිසා මා මේ කාරණා ස්වල්පයෙන් මතු කරන්න උත්සාහ කළේ දේශපාලන පළිගැනීම්වලට ලක් වුණු යම් නිලධාරියකු, නිලධාරිනියකු ඉන්නවා නම් ඔහුට හෝ ඇයට නිසැක වශයෙන්ම සහන ලැබිය යුතුයි කියන එකයි. ඒ ගැන තර්කයක් නැහැ. ඒ ගැන කිසිම තර්කයක් නැහැ. හැබැයි මේ නිලධාරියා ඔහුට ලැබෙන ඒ සහනය දඩ මීමා කර ගෙන ඔහුට ඇතුළු වන්නට අකැප ප්‍රදේශවලට ඇතුළු වෙලා ඔහු පරිපාලනයට මැදිහත් වනවා නම් ඒ තුළ බරපතළ ගැටලුවක් ඇති වනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වඩු මහත්මයෙක් පුටුවක් හදන කොට පුටුවේ එක කකුලක පලුද්දක් වුණොත් ඒ කැල්ල කපා දමා ලී කැල්ලක් ගහලා ඒ පුටුව හදන්න පුළුවන්. ඒත් දරුවකුගේ අධ්‍යාපනය තුළ දරුවකුට යම් කිසි හානියක් වුණොත් ඒක අර පුටුවේ පලුද්ද නිවැරැදි කළා වාගේ නිවැරැදි කරන්න බැහැ. ගුරුවරයාගේ අතින් තමයි අහිංසකලා බිහි වන්නේත්, අංගුලිමාලලා බිහි වන්නේත්. ඒක අපි කැමැති වුණත්, අකැමැති වුණත් පිළිගත යුතු යථාර්ථයක්.

අපි පසු ගිය කාලයේ ප්‍රශ්න පත්‍ර වැරැදි ගැන කථා කළා. අපි පසු ගිය කාලයේ වාර විභාග ප්‍රශ්න පත්‍රවල කුණුහරුප අච්චු ගැහිලා තිබෙන ආකාරය පිළිබඳව කථා කළා. පසු ගිය කාලයේ පාසල් පොත්පත්, නිල ඇඳුම් කලට වෙලාවට බෙදන්න බැරි ප්‍රශ්න ගැන කථා කළා. මේවාට ගරු අමාත්‍යතුමාට, නියෝජ්‍ය අමාත්‍යතුමාට චෝදනා කරලා වැඩක් තිබෙනවාද? සමහර විට

***  පුස්තකාලයේ තබා ඇත.**
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*  *Placed in the Library.*

***  පුස්තකාලයේ තබා ඇත.**
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*  *Placed in the Library.*

ඔබතුමන්ලාට කියන්න පුළුවන්, මේවා පළාත් සභා වපසරියටයි ඇතුළත් වෙලා තිබෙන්නේ, පළාත් සභාවටයි මේ කටයුතු ඇතුළත් වෙලා තිබෙන්නේ කියලා.

නමුත් මා හිතනවා ගරු අමාත්‍යතුමාත්, නියෝජ්‍ය අමාත්‍යතුමාත්, රේඛීය අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්තුමාත් ප්‍රමුඛ සියලුම නිලධාරින් මැදිහත් වෙලා ලංකාවේම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ, කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ පත්වීම් පිළිබඳව සමාලෝචනය කරලා බලන්න ඕනෑය කියලා. එහෙම නැත්නම් අපේ අධ්‍යාපන ඇමතිතුමා විශේෂ කාරක සභාවක් පත් කරලා මේ රටේ අධ්‍යාපනය යාවත්කාලීන කරන්න, නවීකරණය කරන්න ගන්නා වූ දැඩි කැපවීම, දැඩි මහන්සිය ගඟට ඉනි කැපුවා සේ අපතේ යන්නට පුළුවන්.

ගරු අධ්‍යාපන ඇමතිතුමනි, මා ඔබතුමාගේ අධ්‍යාපන ප්‍රතිපත්තියට බොහොම ආදරය කරන පුද්ගලයෙක්; ඔබතුමාගේ අධ්‍යාපන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට සහභාගි වෙලා අදහස් ප්‍රකාශ කරන මන්ත්‍රීවරයෙක්. ඒ වාගේම නියෝජ්‍ය ඇමතිතුමා දන්නවා මා මේ ගරු සභාවේ වාචික පිළිතුරු අපේක්ෂාවෙන් ප්‍රශ්න 100ක් ඇහුවොත් ඒ 100න් අනූවක්ම අහන්නේ අධ්‍යාපනය සම්බන්ධයෙන් අවධානය යොමු කරලා බව. ඒ ප්‍රශ්න අහන මොනම වෙලාවකවත් පටු දේශපාලන වුවමනාව වෙනුවෙන්, කුහක පටු කණ්ණාඩියකින් බලා විවේචනය නොකරන ජනතා නියෝජිතයෙක් විධියට මම ඔබතුමන්ලාගේ අවධානය යොමු කරන්නේ, දේශපාලන පළි ගැනීම්වලට ලක් වූවන්ට නිසැක වශයෙන්ම සහන දෙන්න කියලා. මම පැහැදිලිව කියන්න ඕනෑ මම උදාහරණයට ගත්ත ඒ අධ්‍යාපන නිලධාරියා දකුණු පළාතේ පළාත් අධ්‍යාපන අමාත්‍යවරයාත් එක්ක එකගෙයි කන වැඩ පිළිවෙළක් තුළයි මේ ප්‍රශ්නය මෙච්චර දුර දිග ගිහිල්ලා තිබෙන්නේ කියලා. අපි ඇමතිතුමාගෙන් ඉල්ලන්නේ මේ පළාත් අධ්‍යාපන අමාත්‍යවරු යාමනය කරන්න; ඒ අයගේ ක්‍රියාවලින් පිළිබඳව මැදිහත් වෙන්න ඔබතුමාට නීතිමය ගැටලු තිබෙනවා නම් ජනාධිපතිතුමා මැදිහත් කර ගෙන හෝ දරුවන්ගේ අධ්‍යාපනය නාමයෙන්, රටේ අනාගත පරපුරේ නාමයෙන් අවශ්‍ය පියවර ගන්න කියලායි.

ගරු ඇමතිතුමනි, පළාත් අධ්‍යාපන ඇමතිවරු, පළාත් අධ්‍යාපන ලේකම්වරු, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරු එක්ක ඔබතුමන්ලා රේඛීය අමාත්‍යාංශ මට්ටමෙන් මොන තරම් ජාතික වැඩ පිළිවෙළවල් හැදුවත් වැඩක් නැහැ. අධ්‍යාපනයේ සමහර කොටස් පළාත් සභාවට ලැබිලා තිබෙන තත්ත්වයක් උඩ ඒවායේ යම් ගැටලු එනවා නම් ඒ ගැටලු නිවැරදි කර ගැනීමට අවශ්‍ය යාන්ත්‍රණයක් වහාම නිර්මාණය කළ යුතුයි. එවැනි යාන්ත්‍රණයක් නිර්මාණය කළේ නැත්නම් මේවා නිවැරදි කරන්න බැරි වෙනවා.

සමහර උද්ධච්ච පළාත් අධ්‍යාපන ඇමතිවරු ඉන්න පුළුවන්. එවැනි උද්ධච්ච පළාත් අධ්‍යාපන ඇමතිවරු පිළිබඳව බන්දුල ගුණවර්ධන ඇමතිතුමාට අත් දැකීම් ඇති. දකුණු පළාතත් ඒ ගොඩේ තිබෙනවාද, නැද්ද කියලා ඇමතිතුමාගේ හෘදය සාක්ෂිය දන්නවා ඇති. දකුණු පළාත ගැන කියන කොට අපේ ගරු නියෝජ්‍ය කථානායකතුමා හිනා වෙනවා. එතුමාටත් දකුණේ අධ්‍යාපන බලධාරින් පිළිබඳව එහෙම අත් දැකීම් තිබෙනවාද දන්නේ නැහැ. ඒ නිසා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඉතා පැහැදිලිව කියන්නේ මෙන්න මේ යථාර්ථය අපි තේරුම් අරගෙන ඒ කාරණා පිළිබඳව දැඩි අවධානයක් යොමු කළ යුතුව තිබෙනවා කියලායි.

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණිය වේවා, II ශ්‍රේණිය වේවා ඒ ශ්‍රේණිවලට පත් කිරීමේදී දේශපාලන පළි ගැනීම්වලට ලක් වූවන් ඒවාට පත් කරනවා නම් ඒ අයට දේශපාලන පළි ගැනීමෙන් පස්සේ සහන ලැබීමේදී ඒ සහන දීමට අදාළ ලිපියේ තිබෙන කොන්දේසිවලට පටහැනිව ඒ අය මේ පත්වීම් ලබාගෙන තිබෙනවාද කියලා හොයලා බලන්න. දැන් මම මේ සඳහන් කරපු මාතර හිටපු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා බලන්න. ඔහුට චෝදනා 10ක් තිබිලා මාතර කලාපයෙන් මාරු කළාම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට එනවා. එතැන ටික දවසක් ඉඳලා ආපහු හක්මණ කලාපයට යනවා. ඔහුට විනය චෝදනා තිබෙනවා. ඔහුට විරුද්ධව ගුරු මහත්මීන්ගෙන් චෝදනා තිබෙනවා, ඒ අයට අයුතු බලපෑම් කළාම ඒ අයුතු බලපෑම්වලට නතු නොවුණාම ස්ථාන මාරු දුන්නාය කියලා. සේවා කාලය තුළ මුවගින් මත්පැන් දුගඳ වහනය වනවාය කියන චෝදනා ඔහුට තිබෙනවා. මේ අපේ රටේ අධ්‍යාපනය. ඒ නිසා මේ අධ්‍යාපන පරිපාලන සේවයේ තනතුරුවලට පුද්ගලයන් පත් කිරීමේදී ඒ අයගේ අධ්‍යාපන සුදුසුකම්, ඒ අයගේ වෘත්තිය සුදුසුකම් සහ පළපුරුද්ද, අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ඒ අයගේ තිබෙන අත් දැකීම්, ඒ අයගේ විනයගරුකභාවය, අවංකභාවය, මධ්‍යස්ථව කටයුතු කිරීමේ හැකියාව, අධ්‍යාපන සංවර්ධනයට මුල් තැන දී කටයුතු කිරීමේ හැකියාව හා ඒ අයගේ නිර්මාණශීලීත්වය යන මේ සියලු කාරණා පිළිබඳව ගැඹුරින් ගවේෂණය කරලා විශ්ලේෂණය කරලා පත් කිරීම සඳහා යම් ඒකක නිර්මාණය කරන්න අවශ්‍ය නම් ඒවා නිර්මාණය කළ යුතු වෙනවා.

පාර්ලිමේන්තුවේ උසස් නිලතල පිළිබඳ කාරක සභාවක් තිබෙනවා. ඒ, සමහර තනතුරුවලට පත් කරන අය ගැන සොයා බලන්නයි. අධ්‍යාපන අමාත්‍යාංශය තුළත්, පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය තුළත් එවැනි ආකාරයේ ව්‍යුහයන් නිර්මාණය කරලා හරි මේ තැන්වලට අදාළ සුදුසු පුද්ගලයන් පත් කළ යුතුව තිබෙනවා,මේ රටේ හතළිස් ලක්ෂයක් දරුවන්ගේ අනාගතය ගැන කල්පනා කරලා. ඒ නිසා ඉහළම අධ්‍යාපන සුදුසුකම විධියට අපොස (සාමාන්‍ය පෙළ) සමත් වෙලා තිබෙන කෙනෙක්, මුල් පත්වීම විධියට විද්‍යා, ගණිත උපගුරු සහතික නොලත් පත්වීම් ලබපු කෙනෙක් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ධුරය දක්වා ගියත් කමක් නැහැ, නිසි අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කරලා.

අද මේ රටේ විධිමත් ආචාර්ය උපාධියක් ගන්න උසස් පෙළ සමත් වෙන්න ඕනෑ නැහැ. සාමාන්‍ය පෙළ විභාගය සමත් වෙලා ඊට අමතර මාර්ග හරහා ගිහින් විධිමත් ආචාර්ය උපාධියක් ගන්න පුළුවන්කම තිබෙනවා. මා මේ කියන්නේ එහෙන් මෙහෙන් දෙන උපාධි නොවෙයි. අද සාමාන්‍ය පෙළ විභාගය සමත් කෙනෙකුට ආචාර්ය උපාධියක් දක්වා යන්න පුළුවන්කම තිබෙනවා. ඒ ගැන නොවෙයි මේ තර්ක කරන්නේ. එහෙම යන්න පුළුවන් ක්‍රමවේද නිර්මාණය වෙලා තිබෙනවා. ඒ ගැන ප්‍රශ්නයක් නැහැ. හැබැයි, දේශපාලන පළිගැනීමක් නිසා තමන්ට ලැබුණු සහන පාවිච්චි කරමින්, ඒවා වැරදි විධියට අර්ථකථනය කරමින් යම් කලාප අධ්‍යක්ෂවරයෙක්, යම් පළාත් අධ්‍යක්ෂවරයෙක්, යම් කොට්ඨාස අධ්‍යක්ෂවරයෙක් කටයුතු කරනවා නම් ඒක ජාතියේම අවාසනාවක්. ඒ නිසා ඒ තත්ත්වය මග හැරවීම සඳහා ගත යුතු සියලුම ක්‍රියාමාර්ග ගන්න අපේ අධ්‍යාපන ඇමතිතුමාට හැකියාව, ශක්තිය ලබා දීම සඳහායි මා මේ යෝජනාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ.

ඒ වෙනුවෙන් අවස්ථාව සලසා දීම පිළිබඳව මගේ ගෞරවනීය ස්තුතිය පුද කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා දන්නවා අපේ අධ්‍යාපන ඇමතිතුමා මේවාට ක්ෂණිකව මැදිහත් වෙනවාය කියලා. එහෙම නේද ගරු අධ්‍යාපන ඇමතිතුමනි? ඒ නිසා මා සභාගත කරපු පත්‍රිකා ටික පුස්තකාලයට යවන්නට ප්‍රථම මේවායේ පිටපත් අධ්‍යාපන ඇමතිතුමාට දීලා ක්ෂණිකව මැදිහත් වෙන්න පුළුවන් නම් හොඳයි. මොකද, පිළිතුරු දෙන්නවත් දැන් එතුමාගේ අතේ තොරතුරු නැහැ. ඒ නිසා පුස්තකාලයට යවන්න කලින් මේ තොරතුරු ටික ගරු ඇමතිතුමාට පරිශීලනය කරන්න දුන්නොත් හොඳයි. මෙතැන 1, 2, 3, 4, 5, 6 වශයෙන් ලකුණු කළ ඇමුණුම්

[ගරු බුද්ධික පතිරණ මහතා]

6ක් තිබෙනවා. ඒ ඇමුණුම් 6 පුස්තකාලයට යවන්න කලින් ගරු ඇමතිතුමාට පරිශීලනය කරන්න දීලා ඊළඟට පුස්තකාලයට යවන්න කියා මා ඉල්ලා සිටිනවා. මතුවටත් මෙවැනි ක්‍රියාමාර්ග මේ රටේ සිදු නොවෙන්න වග බලා ගන්නය කියා මා ඉල්ලනවා. විභාගය සමත් වෙලා දකුණෙන් එන දරුවෙක් ඉදිරියට ගිහිල්ලා අවසානයේදී ඔහු රටේ බොහෝ ප්‍රදේශවල වග කිව යුත්තෙක් බවට පත් වෙන්න පුළුවන්. එක තැනක කෙරෙන වැරැද්දක් මුළු රටටම බලපාන්න පුළුවන්. ඒ නිසා මේ සම්බන්ධයෙන් ගන්න තිබෙන ඉහළම ක්‍රියා මාර්ග ගන්නය කියා ඉල්ලමින් මා මේ යෝජනාව ඉදිරිපත් කරනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
බොහොම ස්තුතියි ගරු මන්ත්‍රීතුමනි. එතුමා මගේ පැත්තටත් ඒ ලේඛන ටික පෙන්නුව නිසා මා මේ කාරණය කියන්න ඕනෑ. දකුණේ හොඳ අධ්‍යාපන ඇමතිවරයෙක් ඉන්න නිසා ඒ ප්‍රශ්න ටික විසඳාවිය කියා මා හිතනවා. මී ළඟට ගරු රංජිත් මද්දුමබණ්ඩාර මන්ත්‍රීතුමා.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M.Ranjith Madduma Bandara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Order, please! Will an Hon. Member propose the Hon. Alhaj A.H.M. Azwer to take the Chair?

**ගරු බන්දුල ගුණවර්ධන මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)**
(மாண்புமிகு பந்துல குணவர்தன - கல்வி அமைச்சர்)
(The Hon. Bandula Gunawardane - Minister of Education)
"ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* MR. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. ALHAJ A.H.M AZWER *took the Chair.*

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M.Ranjith Madduma Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා විසින් අධ්‍යාපන ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ඉදිරිපත් කළ යෝජනාව ස්ථිර කරමින් අධ්‍යාපන ක්ෂේත්‍රය ගැන වචනයක් දෙකක් කතා කරන්න කැමැතියි. දේශපාලන ඇඟිලි ගැසීම් නිසා, දේශපාලන පත්වීම් නිසා, දේශපාලන උසස්වීම් නිසා අද අධ්‍යාපන ක්ෂේත්‍රයේ සිදු වෙලා තිබෙන කඩා වැටීම් ගැන බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා කිව්වා. රටක තිබෙන වැදගත්ම අයෝජනය තමයි අධ්‍යාපනය. අද අධ්‍යාපන ක්ෂේත්‍රය නියම මාර්ගයට ගෙනෙන්න අපේ අධ්‍යාපන ඇමතිතුමා බොහොම ලොකු උත්සාහයක යෙදී සිටිනවා. විපක්ෂය හැටියට අපේ යුතුකමක් තමයි මේ ක්ෂේත්‍රයේ තිබෙන වැරදි ටික පෙන්වා දෙන එක. එක එක්කෙනාට ඇඟිලි දිග් කරන්නේ නැතුව, එක්කෙනෙක් වැරැද්දක් කරපු නිසා මාත් කරනවාය කියන්නේ නැතුව අපි මේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ පිරිසිදුභාවය රකින්න ඕනෑ.

හරියට දේවාලයක තිබෙන පිරිසිදුකම වාගේ පිරිසිදු තත්ත්වයට මේක ගෙනෙන්න ඕනෑ. ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමනි, ඔබතුමා අධ්‍යාපන ක්ෂේත්‍රය තුළින් දේශපාලනයට ඇවිල්ලා අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ යමක් කරන්න හදනවා. ඒ වාගේම ගරු අධ්‍යාපන නියෝජ්‍ය ඇමතිතුමා මගේ දිස්ත්‍රික්කය නියෝජනය කරන කෙනෙක්. එතුමා ඌව පළාතේ හිටපු අධ්‍යාපන ඇමතිතුමා. එතුමා හරි වැරැදි දෙකම දන්නවා.

අද දේශපාලන පළිගැනීම් කියලා පත්වීම් දෙනවා. දේශපාලන පළිගැනීම් කියලා පත්වීම් දුන්නාට කමක් නැහැ ආණ්ඩුවක් පෙරළිලා අලුත් ආණ්ඩුවක් ආවාම. 1977 ආණ්ඩුවෙන් අපිත් දුන්නා. 1994 ආණ්ඩුවෙන් තමුන්නාන්සේලාත් දුන්නා. මම දන්නවා දෙතුන් සැරයක් දේශපාලන පළිගැනීම් යටතේ පත්වීම් දුන්නු බව. ගරු ඇමතිතුමනි, හදවතට තට්ටු කරලා අහන්න, තමුන්නාන්සේලාගේ ආණ්ඩුව මෙච්චර දීර්ඝ කාලයක් තිබියදී එතැන දේශපාලන පළිගැනීමක් වෙන්න පුළුවන්ද කියලා. මා තමුන්නාන්සේලාගෙන් අහන්නේ ඒකයි. දේශපාලන පළිගැනීමක් වෙලා තිබෙනවාද? මෙතැනදී කරන්නේ දේශපාලනය කරන අයට උසස් වීම් දෙන්න ඕනෑ නිසා, දේශපාලන පළිගැනීම් කමිටුවක් දාලා ඒ අයට පත්වීම් දෙන්න හදන එක.

ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා කිව්වා වාගේ දේශපාලන පළිගැනීම් යටතේ පත්වීම් දෙන කොට ඒ චක්‍රලේඛයේ පැහැදිලිව තිබුණා, දේශපාලන පළිගැනීම් නිසා ලබන උසස්වීම්වලට අදාළ පඩිය විතරයි ගන්න පුළුවන්, අදාළ තනතුර හොබවන්න බැහැ කියලා. නමුත් විදුහල්පති සේවයේ, අධ්‍යාපන පරිපාලන සේවයේ මේ සඳහා දා ගෙන තිබෙන විකල්පය මොකක්ද? තිබෙන පුරප්පාඩුවලට වැඩ බැලීමේ පත්වීම් හැටියට අර ගොල්ලන්ට පත්වීම් දීලා තිබෙනවා. මෙහෙම කරලා අධ්‍යාපන ක්ෂේත්‍රයක් දියුණු කරන්න පුළුවන්ද?

සමහරු එක්සත් ජාතික පක්ෂයෙනුත් උසස්වීම් ලබලා, සමහර විට අනෙක් පැත්තටත් ගිහිල්ලා උසස්වීම් ගන්නවා දේශපාලන පළිගැනීම් කියලා. ඒ ගැන අපේ ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා නියෝජ්‍ය ඇමතිතුමා මාත් එක්ක එකඟ වෙනවා ඇති. ඌවේ හිටියා ලොකු අධ්‍යාපන නිලධාරියෙක්. මට මතකයි ඔහු එක්සත් ජාතික පක්ෂයේ මා ළඟටයි, ගරු ධර්මදාස බණ්ඩා හිටපු ඇමතිතුමා ළඟටයි ඇවිල්ලා මොනරාගල දිස්ත්‍රික්කයේ තිබෙන ලොකුම විදුහලේ විදුහල්පතිකම ගත්තා. ඊළඟ ඡන්දයේදී අනෙක් පැත්තට වැඩ කළා; තමුන්නාන්සේලා ළඟට ආවා. ඊට පස්සේ දේශපාලන පළිගැනීම් යටතේ බොහොම ලොකු හිඟ වැටුපකුත් අරගෙන ලොකුම තැනට ගියා. එහෙම නේද ගරු නියෝජ්‍ය ඇමතිතුමනි? දැන් තමුන්නාන්සේත් එක්කත් නැහැ එයා. එහෙම තමයි දේශපාලන පළිගැනීම් යටතේ තනතුරු ගන්නා අය කරන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමහර විදුහල්වල විදුහල්පති සේවයේ පළමුවැනි ශ්‍රේණියේ කෙනකු සිටිද්දී, ඒ විදුහල්පති තනතුරේ වැඩ බලන්න දෙනවා කිසිම ශ්‍රේණියක් නැති කෙනකුට. සමහර තැන්වල එහෙම තිබෙනවා. සමහර විදුහල්වල එවැනි අය ඉන්නවා මම දැකලා තිබෙනවා. අපට පුළුවන්ද මේ විධියට අධ්‍යාපන ක්ෂේත්‍රය දියුණු කරන්න? අපට පුළුවන්ද මෙකෙන් අධ්‍යාපන ක්ෂේත්‍රයේ සාධාරණයක් ඇති කරන්න? අපට පුළුවන්ද මෙකෙන් ළමයින්ට ආදර්ශයක් දෙන්න? විදුහල්පති සේවයේ පළමුවැනි ශ්‍රේණියේ කෙනෙක් සිටිද්දී අනෙක් මනුස්සයාට පුළුවන්ද විදුහලක් පාලනය කරන්න? ඒ විදුහලේ ඉන්න ප්‍රධානියා අනෙක් සියල්ලන්ටම වැඩිය සුදුසුකම් තිබෙන

පුද්ගලයකු වෙන්න ඕනෑ. අනෙක් අය පිළිගන්නා පුද්ගලයකු වෙන්න ඕනෑ. ඒ තත්ත්වය නැති කරන තරමට අද මේ අධ්‍යාපනයේ කඩා වැටීම කොච්චරද? අද ඉන්න අධ්‍යාපන අධ්‍යක්ෂවරු සියලු දෙනාම වාගේ දේශපාලන පළිගැනීම් මත ගිය අය. අධ්‍යාපන පරිපාලන සේවයේ පළමුවැනි ශ්‍රේණියේ නිලධාරින් ඉන්නවා. දෙවැනි පන්තියේ අය ඉන්නවා. ඒ අය සිටිද්දී ඒ තනතුරුවලට වෙන අය දමනවා. විභාගවලින් පාස් වෙලා ඉන්න අය සිටිද්දී වෙනත් අය ඒ තනතුරුවලට දමනවා.

මම ගරු ඇමතිතුමාගෙන් ප්‍රශ්නයක් අහනවා. අධ්‍යාපන පරිපාලන සේවයේ, විදුහල්පති සේවයේ විභාග හැම අවුරුද්දේම තියන්න ඕනෑ නේද ඇමතිතුමනි? නමුත් පසු ගිය අවුරුදු 17ටම හතර සැරයයි නැති නම් පස් සැරයයි ඒ විභාග තියලා තිබෙන්නේ. එක වකවානුවක අධ්‍යාපන පරිපාලන සේවයේ පළමුවැනි පන්තියේ නිලධාරින් 200ක් හිටියා. ඒ 200 තුළ හරි විධියට පත්වීම් ගත්ත එක්කෙනකු පමණයි හිටියේ. 199ක් හිටියේ වැරැදි විධියට ආපු අය! ඉතින් කොහොමද අධ්‍යාපන ක්ෂේත්‍රය පවත්වා ගෙන යන්නේ? ගරු ඇමතිතුමනි, ඔබතුමා මේ ගැන බලන්න. මේ තත්ත්වය බොහොම දරුණු විධියට තිබෙනවා පළාත් සභාවල. තමුන්නාන්සේට ඇහ බේරා ගන්න බැහැ, "පළාත් සභා පාසල් මගේ පාලනය යටතේ නොවෙයි තිබෙන්නේ." කියලා. තමුන්නාන්සේ ලංකාවේම අධ්‍යාපන ඇමතිවරයා. අප පිළිගන්නේ එහෙමයි. පාර්ලිමේන්තුවට වග කියන්නේ තමුන්නාන්සේ. තමුන්නාන්සේ මේකට ක්‍රමවේදයක් හදන්න. මේ ව්‍යවස්ථාව වෙනස් කරන්න. ඕනෑ නම් අපි ඒකට, අධ්‍යාපන ක්ෂේත්‍රයට ඕනෑ වෙනසකට පක්ෂව තමුන්නාන්සේට ඡන්දය දෙන්නම්. මා තමුන්නාන්සේගෙන් ඉල්ලන්නේ මේ වෙනස කරන්න කියන එකයි. කරුණාකර සුදුස්සන් සුදුසු තැන්වලට දමන්න.

ඇයි අද ළමයි ටියුෂන් යන්නේ? අපේ හිටපු අධ්‍යාපන ඇමතිතුමාත් එක්ක මම අනන්තවත් තර්ක කරලා තිබෙනවා. එතුමාට මම කිව්වා, අද සමහර ඉස්කෝලවල හරියට උගන්වන්නේ නැති නිසා ළමයි ටියුෂන් පන්තිවලට යනවා කියලා. නිදහස් අධ්‍යාපනයක් අපේ රටේ තිබෙන්නේ. නමුත් දුප්පත් අම්මලා තාත්තලා මාසයකට තුන්හාර දහසක්, පන්දහසක් ටියුෂන්වලට ගෙවන්න ඕනෑ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, තව විනාඩියකින් අවසන් කරන්න.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M.Ranjith Madduma Bandara)
ගරු ඇමතිතුමනි, අධ්‍යාපන ක්ෂේත්‍රයේ පිරිසිදුභාවය ඇති කරන්න නම් මේ තත්ත්වය නැති කරන්න. ඔබතුමාට ඒකට ශක්තිය තිබෙනවා. අපේ ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා කිව්වා කලාප අධ්‍යක්ෂවරයා ගණිතය සමත් නැහැ, සිංහල සමත් නැහැ කියලා. දෙයියනේ! අධ්‍යාපනයට දෙයියන්ගේම පිහිටයි. මේවා දිහා බලලා අඩුම තරමින් අපි අද කථා කළා වෙනුවට මේ ටිකවත් හදන්න. ගරු අධ්‍යාපන ඇමතිතුමනි, ඔබතුමා කණ්ඩායමක් යොදවලා සමීක්ෂණයක් කරන්න කොහොමද මේ වාගේ අය ඉන්නේ කියලා. ඉස්කෝල දහදාහේ ශ්‍රේණිධාරි විදුහල්පතිවරු කී දෙනක් ඉන්නවාද, නිකම් අය කොච්චර ඉන්නවාද බලන්න. කුසලතාවෙන්, දක්ෂතාවෙන්, විභාගයෙන් ආපු එක්කෙනා සිටිද්දී, වැඩ බැලුවා කියන පදනමට දේශපාලන හෙන්චයියලාට උසස්වීම් දෙනවා. කරුණාකරලා මේවා නවත්වන්න.

මොකක්ද අධ්‍යාපන ක්ෂේත්‍රයේ වෙලා තිබෙන්නේ? යූඑන්පීකාරයෙක් නම්, උසස්වීමක් ඕනෑ නම් යන්න ඕනෑ සන්ධානෙට. එහෙම යනවා. ඉතින් ගුරුවරයාත් බලනවා මම හෙට අනිද්දා pension යනවා. ඒ නිසා එතැනට ගිහිල්ලාවත් මේක කර ගන්න ඕනෑ කියලා. අපි ඒ ක්‍රමය නැති කරමු. ගරු අධ්‍යාපන ඇමතිතුමනි, ඔබතුමාට මේක කරන්න පුළුවන්. බලසම්පන්න ආණ්ඩුවක් ඔබතුමන්ලාට තිබෙන්නේ. තුනෙන් දෙකක බලයක් තිබෙනවා. ඒ නිසා මේවා තමයි කරන්න ඕනෑ.

රටක හොඳම ආයෝජනය, වැදගත්ම ආයෝජනය අධ්‍යාපනය වෙනුවෙන් කරන ආයෝජනයයි. මේ රටේ අනාගතය වෙනුවෙන් උගත් පිරිසක් බිහි කරන්න ඕනෑ. සාධාරණ සමාජයකට යන්න නම් පාසලේ ඉඳලාම ඒ සාධාරණත්වය උගන්වන්න ඕනෑ. මා දන්නා විධියට අද අධ්‍යාපන ක්ෂේත්‍රය අර්ථකථනය කළොත්, දේශපාලන පත්වීම් දෙන CTB එකට විතරයි ඒක දෙ වැනි වන්නේ. CTB එකේ නම් තිබෙන්නේ බස් නේ. ඒ නිසා කමක් නැහැ. CTB එක ඇරුණාම, අසාධාරණ විධියට උසස්වීම් දෙන, දේශපාලන උසස්වීම් දෙන එකම ක්ෂේත්‍රය තමයි අධ්‍යාපන ක්ෂේත්‍රය. මේක නවත්වන්න ඇමතිතුමනි. රාජ්‍ය සේවයේ අනික් තැන්වල මෙච්චර දරුණුවට මේ දේවල් කෙරෙන්නේ නැහැ. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ කෙනෙක් වෙන්න, උපදේශකයෙක් වෙන්න, කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ කෙනෙක් වෙන්න ඕනෑ නම් අද එයා දේශපාලනය කරන්න ඕනෑ. මේ ක්‍රමය නවත්වමු. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් ආවත් මේක නවත්වන්න ඕනෑ කියලා මම කියනවා. මේවා කළා දැන් හොඳටම ඇති. අධ්‍යාපන ක්ෂේත්‍රය විනාශ කළා, ජරා කළා දැන් හොඳටම ඇති. කරුණාකරලා මේ ගැන තීන්දුවක් ගන්න කියලා ඉල්ලමින්, බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු මේ කාලෝචිත, වැදගත් යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා (අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா - கல்வி பிரதி அமைச்சர்)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa - Deputy Minister of Education)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ එක සිද්ධියක් මුල් කර ගෙන සමස්ත අධ්‍යාපනය පිළිබඳව ලොකු කනස්සල්ලකින්, කනගාටුවකින්, විවේචනයෙන් -සැකයෙන්- බියෙන් කථා කළා. ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ බාල්දියේ කිඹුල්ලු දැක්කා. තේ කෝප්පයේ කුණාටු දැක්කා. මම හිතන හැටියට එසේ විය යුතු නැහැ. අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ මහින්ද චින්තන වැඩ පිළිවෙළේ මහින්ද චින්තන ඉදිරි දැක්ම යටතේ අපේ අධ්‍යාපන අමාත්‍ය ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා විසින් ඉතා පැහැදිලි, පිරිසිදු වැඩ පිළිවෙළක් නිර්මාණය කරනවා. සාකච්ඡාවෙන්, සම්මන්ත්‍රණයෙන්, සම්මුතියෙන් නිර්මාණය කර ගන්නා වූ ඉතා නිවැරැදි දැවැන්ත අධ්‍යාපන වැඩ පිළිවෙළක් මේ රට වෙනුවෙන් නිර්මාණය කරනවා. ඒ වැඩ පිළිවෙළට අබමල් රේණුවකවත් කැතක්, කුණක්, කිලුටක් ගාවන්නේ නැතිව, කිලි අහු වෙන්නේ නැතිව, නියම ආකාරයේ සළුපිළි පළන්දලා හරි විධියට මේ රටේ අධ්‍යාපන ක්ෂේත්‍රය වෙනුවෙන් වන දීර්ඝ කාලීන ආයෝජනය අප කරනවා. ඒ මනමාලිය කැන්දා ගෙන එන දවස වැඩි ඈතක නොවෙයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපේ බුද්ධික පතිරණ මන්ත්‍රීතුමාත්, රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමාත් විවිධ සිද්ධීන් කිව්වා. එවැනි සිද්ධි ඉතිහාසය පුරා තිබෙනවා. කැබිනට් පත්‍රිකා මඟින් සහ විවිධ දේශපාලන ක්‍රම මඟින් විශාල පිරිසකට මේ රටේ පැවති සෑම ආණ්ඩුවක්ම මේ තානාන්තර -පදවි, පට්ටම්- පූජා කරලා තිබෙනවා; ලබා දීලා තිබෙනවා.

[ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා]

හැබැයි, පසු ගිය කාලවකවානුවේ යම් ප්‍රමාණයකට අධ්‍යාපනයේ පරිපාලන සේවයට නිලධාරින් බඳවා නොගැනීම නිසා, විදුහල්පති විභාග නිසි ලෙස පවත්වලා ඒ විභාගවලින් විදුහල්පතිවරුන් තෝරා නොගැනීම නිසා මහා ලොකු හිඩැසක් - ලොකු පරාසයක ඉඩකඩක්- ඇති වුණා. මේ ක්ෂේත්‍රය පවත්වා ගෙන යන්නේ කොහොමද, කාටද මේ වගකීම -පාසල- භාර දෙන්නේ කියන එක පිළිබඳව බරපතළ අර්බුදයක් පළාත් අධ්‍යාපන ඇමතිවරුන්ට මතු වුණා. විදුහල්පතිකම භාර ගන්නේ නැහැ. සමහර පාසල්වලට වෙලා විදුහල්පතිවරු තුන් දෙනා, හතර දෙනා හැංගිලා ඉන්නවා. වැටුප අර ගෙන පාසලක් භාර ගන්නේ නැහැ. මොකද, "වැඩ කළොත් ලෙඩ. වැඩ නොකර හිටියොත් ලෙඩ නැත." කියන න්‍යාය මත පාසලක් භාර ගන්නේ නැහැ. අධ්‍යක්ෂවරු එව්වේ අපේ පළාත්වලට, පුහුණු කරන්න. ඇත එපිට නැඟෙනහිරට -සියඹලාණ්ඩුවට- පොළොන්නරුවට ඒ වාගේම ගාල්ල, මාතර, හම්බන්තොට වාගේ දුෂ්කර ප්‍රදේශවලට අධ්‍යක්ෂවරු ආවේ නැහැ, වැඩ කරන්න. ඒ නිසා මේ පවතින අධ්‍යාපන ක්‍රමය තුළ නුසුදුස්සනුත් පත් වෙලා ඇති. මම නැහැ කියන්නේ නැහැ. මම පිළිගන්නවා.

අපේ ගරු මන්ත්‍රීතුමා ගෙනාපු කාරණා මම පිළිගන්නවා. හැබැයි සමහර අය විභාග සමත් වෙලා, උපාධිය සමත් වෙලා සුදුසුකම් ඇතුව උපගුරුවරයා හැටියට ඉද ගෙන පාසල භාර ගෙන, පන්ති කාමරය භාර ගෙන, ගුරුවරු පාලනය කරලා, පාසල පාලනය කරලා, කලාපය පාලනය කරලා, කොට්ඨාසය පාලනය කරලා අධ්‍යක්ෂවරුන් හැටියට දීර්ඝ කාලයක් වැඩ කරපු පිරිසකුත් ඉන්නවා. ඒ පිරිස තමයි අධ්‍යාපනයේ කඩා වැඩිච්ච මේ භයානක තත්ත්වය තුළ යාන්තමින් හරි අධ්‍යාපනය ආරක්ෂා කර ගෙන ඉදිරියට ගෙන ආවේ. ඒ අය නිකම්ම නිකම් අවලංගු කාසි වාගේ විසි කරන්න පුළුවන් කමක් නැහැ. එහෙම කරනවා නම් ඒක ලොකු අසාධාරණයක්; වරදක්; අගතියක්; අයුක්තියක්. විවිධ ආණ්ඩු කාලවල විශේෂයෙන් එක්සත් ජාතික පක්ෂ කාලයේ අධ්‍යාපනයට විනා කරපු හැටි -ඒ තනතුරු දීපු හැටි- නම් සහිතව කියන්න මා ළඟ කරුණු ගොඩාක් තිබෙනවා. මම ඒවා ඉදිරිපත් කරන්නේ නැහැ. මම ඒවා ඉදිරිපත් කරන්නේ නැහැ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මම හිතනවා අද වැදගත් වන්නේ ඒක නොවෙයි කියා. තමුන්නාන්සේලා අපට ඇඟිල්ල දික් කරනවා. අපි තමුන්නාන්සේලාට ඇඟිල්ල දික් කරනවා. හැබැයි අපි හිතා ගන්න ඕනෑ එක ඇඟිල්ලක් දික් කරන කොට ඇඟිලි හතරක් අපේ පැත්තට දික් වෙනවාය කියන කාරණාව. ඒක නිසා මේ ඇඟිලි දික් කරන කාලයක් නොවෙයි. මේ රට එක්සත් කරලා, මේ රට ඒකීය රටක් හැටියට අද පාලනය වනවා.

මේ රට ජාතික අර්බුදයෙන් මිදිලා, ජාත්‍යන්තර අර්බුදවලට සහ ජාත්‍යන්තර අභියෝගවලට මුහුණ දෙන්න අලුත් පරම්පරාව සූදානම් කරන්න කාලය ඇවිල්ලායි තිබෙන්නේ. ඉතින් එහෙම නම් එවැනි කාලවකවානුවක අපි මේ රටේ ගන්නා වූ වැදගත්ම තීන්දුව තමයි අධ්‍යාපනය වෙනුවෙන් ගන්නා තීන්දුව. ඒ තීන්දුව ඉතා නිවැරදි විය යුතුයි; පිරිසිදු විය යුතුයි. ඒ සඳහා සුදුසුම අවස්ථාවේ මෙවැනි සිද්ධි මතු කරමින් හෝ කථා කිරීමත් වැදගත්ය කියලා මම විශ්වාස කරනවා. ඒකත් ඉතා වැදගත් දෙයක් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මොකද මෙහෙම වාදයක්, විවාදයක්, -සංවාදයක්- සාකච්ඡාවක් ඇති කරලා ඒ සංවාද මණ්ඩප තුළින් නිවැරදි දේ තෝරා ගෙන ඉස්සරහට යන්න තමයි මගේ ගරු ඇමතිතුමා මේ උත්සාහ ගන්නේ. මම හිතන්නේ, ඉතා විශාල ප්‍රමාණයක් අධ්‍යාපන විශේෂ උපදේශක කාරක සභා පවත්වමින්, මේ රටේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ විවිධ විද්වතුන් සහ විවිධ ක්ෂේත්‍රවල නිපුණත්වය ඇති පිරිස් ගෙන්වා ගෙන, -කැඳවා ගෙන- වෘත්තීය සමිති ගෙන්වා ගෙන එතුමා නිරන්තරයෙන්ම කරන්නා වූ සාකච්ඡාව තුළ අලුත් දෙයක්, අලුත් ලෝකයට ගැළපෙන නව අධ්‍යාපන ප්‍රතිපත්තියක් සකස් කරන්න කටයුතු කරන වෙලාවක් මේ. ඒ නිසා අපි ඒ ඇඟිල්ල දික් කර ගත්ත කාලය අවසන් කරලා අපි අලුත් යුගයකට, අලුත් වැඩපිළිවෙළකට අධ්‍යාපනය සහ රටේ දීර්ඝ කාලීන ආයෝජනය වෙනුවෙන් තිරසාර වැඩපිළිවෙළක් ආරම්භ කරලා ඒ වැඩපිළිවෙළ ඉදිරියට ගෙන යන්න ඔබ සැමගේ සහාය අපේක්ෂා කරමින් මගේ ගරු ඇමතිතුමාට සුබ පතමින් ඒ කටයුත්ත සාර්ථකව කරන්න ශක්තිය, ධෛර්ය, වාසනාව ලැබෙන්න කියලා ප්‍රාර්ථනා කරමින් මගේ කථාව අවසන් කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි. ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමා.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)**
(மாண்புமிகு பந்துல குணவர்தன - கல்வி அமைச்சர்)
(The Hon. Bandula Gunawardane - Minister of Education)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ නිදහස් අධ්‍යාපනයේ දරුවන් වන බුද්ධික පතිරණ මන්ත්‍රීතුමාගේත්, ඒ වාගේම අපේ රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමාගේත් යෝජනා, ස්ථිරත්වයෙන් රටේ ජාතික අධ්‍යාපන ක්‍රමයේ මතු වෙලා තිබෙන ගැටලු පිළිබඳව මේ ගරු සභාවට කරුණු දැක්වූවා.

එතුමා සඳහන් කළ කලාප අධ්‍යක්ෂවරයාගේ සිද්ධිය මුල් කර ගෙන තමයි මේ කරුණු දැක්වීම කළේ. එම නිසා ඒ පිළිබඳ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයාට පවරා, අදාළ ලියකියවිලි භාර දී පූර්ණ පරීක්ෂණයක් කරන්නට කටයුතු කරනවා කියන ටික මා ප්‍රථමයෙන් සඳහන් කරන්නට ඕනෑ.

අප කවුරුත් දන්නවා, අපේ රටේ නිදහස් අධ්‍යාපනයේ පියා වූ සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා ඉලක්ක කළේ, ඉන් පසු පැවැති සෑම රජයක්ම උත්සාහ කළේ, උපතින් ඉඩකඩම්, යාන-වාහන, හරකා- බාන අභිමි පරම්පරාවල දරුවන්ට තම දෙමවුපියන්ට, පවුලට, ඥාතීන් හිත මිත්‍රාදීනට බරක් නොවන ආකාරයට අධ්‍යාපනය හරහා- පාසල් අධ්‍යාපනය තුළින්-ජීවිතය ගොඩ නහා ගන්නට ශක්තිය ලබා දෙන්නට යි. ඒ පෞරුෂය ගොඩ නගන්නට අවශ්‍ය දැනුම, කුසලතා, ආකල්ප වෙනස්කම් කර, රටට සම්පතක් වන, ගෙදරට බරක් නොවන, විශ්වයට බරක් නොවන මානව සම්පතක් හදා ගැනීම තමයි අරමුණු කළේ. නමුත් පසු ගිය කාලපරිච්ඡේදය තුළදී මේ නිදහස් අධ්‍යාපනය සැබවින්ම නිදහස් අධ්‍යාපනයක් ද කියන ප්‍රශ්නය බරපතළ ලෙස මතු වුණා.

විභාග කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමයේ ප්‍රාථමික අංශයේ අධ්‍යාපනයේ ප්‍රධාන ගැටලුවක් නැහැ. ඉන්දියාව පාකිස්තානය, බංග්ලාදේශය, භූටාන් වැනි සාක් කලාපයේ ඕනෑම රටක් සමඟ සැසඳුවත්, ලෝකයේ දියුණු රටවල් සමඟ සැසඳුවත් සියලුම දරුවෝ ප්‍රාථමික අධ්‍යාපනයට පිවිසෙනවා. ප්‍රාථමික අධ්‍යාපනයට පිවිසෙන දරුවන් සියයක් ගත්තොත් එයින් 96 දෙනෙක් පස්වන ශ්‍රේණියේ විභාගයෙන් සමත් වෙනවා. එම නිසා පුද්ගලික විෂමතා අනුව ඇද හැලෙන කිහිප දෙනා හැරුණාම ප්‍රාථමික අධ්‍යාපනය රටේ උතුරේත් දකුණේත්, නැඟෙනහිරත්, බටහිරත් කියා ප්‍රශ්නයක් නැහැ. නමුත් ද්විතීයික අධ්‍යාපනයේ ගැටලු රාශියක් මතු වෙලා අපේ රටේ අපොස (සාමාන්‍ය පෙළ), අපොස (උසස් පෙළ) දරුවෝ වයස අවුරුදු පහළොවේදී, දහහතේදී, දහඅටේදී අවශ්‍ය දක්ෂතා, කුසලතා, නිපුණතා අත්පත් කර නොගෙන සමාජ ගතවීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඔවුන් මේ අධ්‍යාපන ක්‍රමය තුළ අතරමං වෙන, ජීවිතය ගොඩ නහා ගන්නට බැරි වන පිරිසක් බවට පත් වෙලා තිබෙනවා. විශේෂයෙන් මේ ප්‍රශ්නය ඈත එපිට ගම්මානවල දරුවන්ට බල පා තිබෙනවා. විවිධ ප්‍රතිසංස්කරණ හා පරිපාලන ක්‍රියාවලීන් තුළ අද දවස වන විට ඈත එපිට ගම්මානවල පළමුවන ශ්‍රේණියෙන් පාසල් අධ්‍යාපනය ආරම්භ කර දහතුන්වන

ශ්‍රේණියෙන් අධ්‍යාපනය හමාර කරනවිට, ඒ ඇතුළු වෙච්ච දරුවෝ සියයක් උසස් පෙළට පෙනී සිටියොත් එයින් විසි දෙදෙනායි විද්‍යා අංශයෙන් අධ්‍යාපනය ලබන්නේ.

ලෝකයේ ගෝලීයකරණය යටතේ බැංකු, රක්ෂණය, ප්‍රවාහනය, ගබඩාකරණය, සන්නිවේදනය යනාදිය විශාල වශයෙන් ව්‍යාප්ත වෙලා, ඒ ක්ෂේත්‍රයේ රක්ෂා අවස්ථා ජනිත වෙලා විශාල ආදායම් මාර්ග උත්පාදන අවස්ථා තිබුණත්, වාණිජ අංශයෙන් අධ්‍යාපනය ලබන්නේ සියයට විසිපහයි. සියයට 53ක් දරුවෝ කලා අංශයෙන් තමයි උසස් අධ්‍යාපනය ලබන්නේ. කලා අංශයේ දරුවෝ සියයට 53ක් එහෙම අධ්‍යාපනය ලබන්නේ දරුවන්ගේ වරදින්වත් දෙමව්පියන්ගේ වරදින්වත් නොවෙයි. ලංකාවේ අධ්‍යාපනයේ සම්පත් බෙදී යාමේ පවතින බරපතළ විෂමතාවය නිසා යි. අප කුඩා කාලයේ, පුරාණයේ විද්‍යා අංශයේ අධ්‍යාපනය ලබන දරුවාට practicals තියෙනවා. ප්‍රායෝගික දේවල් විද්‍යාගාරය තුළ කරන්නට ඕනෑ. අවාසනාවකට ඈත පළාත්වල දරුවන්ට එවැනි පහසුකම් දෙන්නට බැරි නිසා ප්‍රායෝගික පරීක්ෂණ ප්‍රශ්න පත්‍රවලින් ඉවත් කරනු ලැබුවා. ඒ වෙනුවට සරල ව්‍යුහගත රචනා, ප්‍රශ්න උත්තර දීලා, විද්‍යා අංශය පුළුල් කිරීම අත් හැරියා.

අතිගරු ජනාධිපතිතුමා මේ රට නිදහස් කර ගැනීමෙන් පසු මහින්ද චින්තන ඉදිරි දැක්ම යටතේ ඉතා පැහැදිලි ලෙස මේ රට ආසියාවේ ආශ්චර්යය බවට පත් කරන්නට නම් අධ්‍යාපනයේ ප්‍රමාණාත්මක, ගුණාත් මක ව්‍යුහාත්මක බරපතළ වෙනසක් ඇති කළ යුතුය කියා විශ්වාස කළ ජාතික නායකයායි. ඒ අනුව අප අද දවසේ මේ ග්‍රාමීය දරුවන්ට වෙලා තිබෙන අසාධාරණය කෙතරම් ද කියනවා නම් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1-AB විද්‍යා, කලා, වාණිජ සියලු අංශයන් සහිත උසස් පෙළ සහිත එකම පාසලක්වත් නැති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 72ක් ලංකාවේ තිබෙනවා.

1-AB එක පාසලක් පමණක් තිබෙන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 100ක් ලංකාවේ තිබෙනවා. මුළු ලංකාවේම තිබෙන්නේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 334යි. එයින් 172ක විද්‍යා හා වාණිජ අංශවලට ප්‍රමාණවත් පහසුකම් නැහැ. ඒ නිසා ඒ තත්ත්වය තුළ, සමහර දේශපාලන පළිගැනීම් නිසා පත් වීම් ලබා දීමේ ක්‍රියාවලිය ඒ කඩාවැටීම්වලට, අධ්‍යාපනයේ ගුණාත්මක බව පිරිහීම ඇති වන එකට -පිරිහීම්වලට- හේතුවක් වුණාය කියන එක මම පිළිගන්නවා. එය එක ආණ්ඩුවකින් සිදු වුණු දෙයක් නොවෙයි. දීර්ඝ කාලයක් තිස්සේ විවිධ ආණ්ඩුවලින්, විශේෂයෙන්ම 1977 එක්සත් ජාතික පක්ෂය අති විශාල ජයග්‍රහණයක් ලබා බලයට පත් වූ අවස්ථාවේදී ඉතිහාසයේ නොවූ විරූ පරිද්දෙන් අධ්‍යාපනය දේශපාලනීකරණය වීමත්, දේශපාලන පළිගැනීමත් සිදු වුණා. එකට එක කිරීමේ ප්‍රතිතෝලන ප්‍රතිවිපාකයක් තිබෙනවා නේ. අනෙක් ආණ්ඩු බලයට පත් වුණාමත් ඒ ක්‍රියාවලියම සිද්ධ වුණා. සමහර විට මෙවැනි තත්ත්වයන් ඇති වෙමින් පවතින අවස්ථාවේදී අප කැමැති වුණත් අකැමැති වුණත් එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව විසින් ජේ.ආර්. ජයවර්ධන යුගයේදී පළාත් සභා ක්‍රමය හඳුන්වා දුන්නා. මගේ පෞද්ගලික අදහස නම්, සමාජ සුබසාධනය ලෙස ගත්තාම, මේ රටේ මානව සම්පත ආරක්ෂා කිරීමේ ප්‍රධානම අංග ලෙස මේ රටේ අධ්‍යාපනය සහ සෞඛ්‍යය මධ්‍යම රජය යටතේ පැවතිය යුතුව තිබුණා. එසේ වුණත් වෙනත් රටවල තිබුණු ආකෘතිය අනුව අධ්‍යාපනය හා සෞඛ්‍යයත් විමධ්‍යගත කරනු ලැබූ විෂයන්ට බෙදුවා.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන්වන සංශෝධනයට අනුව ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය සකස් කිරීම, ඒ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම, විෂය නිර්දේශ සකස් කිරීම, පෙළ පොත් සකස් කිරීම, නිල ඇඳුම් ලබා දීම, විභාග පැවැත්වීම, ඇගයීම් ක්‍රියාවලිය වැනි කරුණු කාරණා රාශියක් මධ්‍යම ආණ්ඩුවට අයිති වුණත් මේ පාසල් පද්ධතියේ එදිනෙදා පරිපාලන කටයුත්ත පළාත් සභාවලට පැවරුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධ්‍යාපනය සම්බන්ධයෙන් චෝදනා සියල්ල එල්ල වන විට ඒවා රටේ අධ්‍යාපන ඇමතිට, ජාතික අධ්‍යාපන ඇමතිට පැවරුණත් වැඩි ප්‍රශ්න ප්‍රමාණයක් ගත්තොත් වැඩි පාසල් සංඛ්‍යාව අයිති පළාත් සභාවේ තමයි මේ ප්‍රශ්න වැඩි ප්‍රමාණය තිබෙන්නේ. විශේෂයෙන් බුද්ධික පතිරණ වැනි තේරුම් බේරුම් කර ගත හැකි මන්ත්‍රීතුමන්ලා වාගේම එසේ තේරුම් බේරුම් කර ගත නොහැකි වූ සමහර මන්ත්‍රීතුමන්ලා පළාත් සභාවේ කුඩා පාසල පිළිබඳවත් අපෙන් නියෝජ්‍ය ඇමතිතුමාගෙන් පාර්ලිමේන්තුවේදී ප්‍රශ්න අහනවා. පළාත් සභා විසින් ලියලා එවන උත්තරය හැර ඊට වඩා වැඩි යමක් කරන්න මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව අපට ඉඩක් නැහැ කියා ඔබතුමන්ලා අවංකව පිළිගත යුතු වෙනවා. එහිදී පළාත් සභාව තුළ තිබෙන ප්‍රශ්නය විසඳීම සඳහා පළාත් තුළ පළාත් අධ්‍යාපන අමාත්‍යතුමෙක්, පළාත් සභාවේ පළාත් අධ්‍යාපන ලේකම්වරයෙක් ඒ ලේකම්වරයා හා බැඳුණු පහළට ගිය ව්‍යුහයක් පවතිනවා. ඒ නිසා ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමනි, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ පත් කරන විටත්, අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරු දෙදෙනෙක් පත් කරන විටත් පමණයි රේඛීය අමාත්‍යාංශය පළාත් සභාවලට මැදිහත් වන්නේ. එතැනින් පහළට තිබෙන කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ ධුර, කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ, විෂය ප්‍රධානී, ගුරු උපදේශක, විදුහල්පති, ගුරුවරු මාරු කිරීම්, පත් කිරීම්, උසස් කිරීම් යනාදිය පිළිබඳවත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව මේ බලතල පැවරෙන්නේ පළාත් සභාවලට.

අද රටේ පවතින උද්ඝෝෂණය තමයි, රටේ පවතින සමහර ඉල්ලීම් තමයි, පළාත් සභාවට තිබෙන බලතල පුළුවන් තරම් තවත් වැඩි කරලා දෙන්න ඕනෑයි කියන එක. ඒ යටතේදී අපි මේ තත්ත්වය පිළිබඳව යථාවාදී අවබෝධයකින් එක දෙයක් අප පැහැදිලිව කියන්න කැමැතියි. අතීතයට බැණ වැදීමෙන් රටේ අනාගතය නිර්මාණය කරන්න බැහැ. අතීතයේ වෙච්ච වැරැද්ද පිළිගන්නා අතර, එය නිවැරදි කිරීමට අවශ්‍ය සමස්තය නිර්මාණය කිරීම සඳහා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂය, මේ දැනුම කේන්ද්‍රීය සංවර්ධනය කියන වැඩ පිළිවෙළ හරහා දියත් කරන්නට බලාපොරොත්තු වනවා. මම ඔබතුමාගේ අවසරය ඇතුව අද දින **සභාගත*** කරනවා, "ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය සඳහා නව අධ්‍යාපන පනතක්, සංදර්භය ගැටලු සහ යෝජනා අවසන් වාර්තාව, සාමාන්‍ය අධ්‍යාපනය සඳහා නව අධ්‍යාපන පනතක් සම්පාදනය කිරීමේ ජාතික කමිටුව 2009" කියන පොත.

මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, 2009 වර්ෂයේදී සකස් කරලා, මුද්‍රණය කරලා අවසන් කරපු මේ වාර්තාව, ජාතික වැදගත්කමින් යුත් කටයුත්තක් ලෙස සලකා හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කරන්න කියලා. මක් නිසාද යත්, ඒ පිළිබඳ වඩාත් පුළුල් අදහස් දැක්වීමක් කිරීම සඳහා ඒ හැන්සාඩ් වාර්තාව ප්‍රයෝජනයට ගන්න පුළුවන්කම ලැබෙන නිසා.

ඔබතුමන්ලා සඳහන් කරපු විධියට නිර්දේශපාලනීකරණය කරලා, ඇත්ත වශයෙන්ම මේ රටට අවශ්‍ය කරන මානව ප්‍රාග්ධනය ගොඩනඟන්නට පුළුවන් වන ආකාරයට, නිදහස් අධ්‍යාපනය ප්‍රායෝගිකව හා යථාර්ථවාදී ලෙසම නිදහස් අධ්‍යාපනයක් බවට පත් කරලා, දෙමව්පියන්ට පවුලට බරක් නොවන ආකාරයට දරුවා නිර්මාණය කරන්න අවශ්‍ය අධ්‍යාපනයේ හැරවුම මේ යෝජනා ක්‍රමය තුළ තිබෙනවා. එය තවත් පුළුල් පදනමක් යටතේ ගෙන ඒම සඳහා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ යෝජනාවලියට අතිරේකව තවත් අදහස් ඉදිරිපත් කිරීම සඳහා පාර්ලිමේන්තුවේ විශේෂ උපදේශක කාරක සභාවක් ඇති කරලා, අද දිනයත් සමඟ දින 22ක් මේ පාර්ලිමේන්තුවේදී ඒ විශේෂ උපදේශක කාරක සභාව රැස් වෙලා

---

***** *පුස්තකාලයේ තබා ඇත.***

* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

* *Placed in the Library.*

[ගරු බන්දුල ගුණවර්ධන මහතා]

තිබෙනවා. මම ඒ සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවටත්, පාර්ලිමේන්තුවේ විශේෂ උපදේශක කාරක සභා කමිටුවල සියලුම නිලධාරින්ටත් ජාතිය වෙනුවෙන් මගේ ගෞරවයත් ස්තුතියත් පුද කරනවා.

මේ රටේ වෙනත් කිසිම දවසක නැති ප්‍රමාණයට විපක්ෂයේ ඉන්න තරුණ මන්ත්‍රීවරු, පාසල් ගිය මන්ත්‍රීවරු, බුද්ධිමය හැකියාවක් අත් පත් කර ගත්ත මන්ත්‍රීවරු වැඩි දෙනෙක් දේශපාලන පක්ෂ පාට හා දේශපාලන පක්ෂවල න්‍යාය පත්‍රයෙන් තොරව ඇවිල්ලා මේ විශේෂ උපදේශක කාරක සභාවට ඉතා විශාල දායකත්වයක් සපයලා තිබෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු ඇමතිතුමා ඒ කාරක සභාවේ අවසාන වාර්තාව මුද්‍රණය කරලා සභාවට යොමු කළොත් හොඳයි නේද?

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

"සංදර්භය ගැටලු සහ යෝජනා" කියන මුද්‍රිත කෘතිය පදනම් කර ගෙන මේකට අතිරේක යෝජනා තමයි විශේෂ උපදේශක කාරක සභාවට ඉදිරිපත් වන්නේ.

ඊයේ දිනයේදී, මේ රටේ දීර්ඝ කාලීන පළපුරුද්ද තිබෙන විදුහල්පතිවරුන්, විදුහල්පතිනියන් 150 දෙනෙක් පමණ ඔවුන්ගේ දීර්ඝ කාලීන අත් දැකීම තුළ සමස්ත පද්ධතියේ ඇති විය යුතු වෙනස්කම් පිළිබඳව ඔවුන්ගේ යෝජනාත් මේ යෝජනාවලට අතිරේකව ඉදිරිපත් කළා. අද දිනයේදී විවිධ ගුරු වෘත්තීය සමිතිවල අය අදහස් ඉදිරිපත් කළා. අපි සැප්තැම්බර් මාසය තුළදී, සැසි වාර 25කින් පසු, මේ විශේෂ උපදේශක කාරක සභාව අවසන් කරනවා. අවසන් කළාට පස්සේ මේ යෝජනාවලියත්, ඒ අනුව ඉදිරිපත් වෙලා තිබෙන යෝජනාත් ඇතුළත් අවසාන වාර්තාව මේ ගරු සභාවට ඉදිරිපත් කරලා, පනතක් ලෙස සම්මත කරලා, අපේ ඉදිරි කාල පරිච්ඡේදය තුළදී, ආණ්ඩු වෙනස් වුණත් වෙනස් වන්නේ නැති, ඇමතිවරුන් වෙනස් වුණත් වෙනස් වන්නේ නැති, ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් මත රටේ දරුවන්ගේ අනාගතය ගොඩනැඟීම සඳහා වන අධ්‍යාපන ක්‍රියාවලිය 2012 සිට ආරම්භ කරනවායි කියන එක මම මේ අවස්ථාවේදී මේ ගරු සභාවට දැනුම් දෙනවා.

අධ්‍යාපනය ලබන දරුවාට දේශපාලන පක්ෂයක් නැහැ, පාටක් නැහැ. ඔහු මතු යම් දවසක කුමන දේශපාලන පක්ෂයක කවර තනතුරක් දැරුවත්, ඔහුට එතැනට ඒම සඳහා මඟ සැලසීමට නිර්දේශපාලනීකරණය වූ, සුදුසුකම් මත පත්වීම් ලැබෙන, මානව දයාවක් සහිතව දරුවා හදන්න පුළුවන් ඉගැන්වීමේ ක්‍රියාවලියට සම්බන්ධ පුද්ගලයන් යොදවන්නත්, ඔවුන්ගේ දක්ෂතා, කුසලතා හා කාර්යඵල ඇගැයීමෙන් උසස්වීම්, මාරුවීම් ලබා දෙන්නටත්, ඔවුන්ගේ දායකත්වය තුළින් දරුවා නිර්මාණය කරන්නටත් අපි හෙට පිළිබඳ විශ්වාසයක් ඇතිව මේ වැඩ පිළිවෙළ තුළ විවිධ වැඩසටහන් රාශියක් අන්තර්ගත කරලා තිබෙනවා.

දැනට පවතින තත්ත්වය තුළ දරුවන් දවසින් දවස වයසට යන නිසාත්, සාමාන්‍ය අධ්‍යාපන ක්‍රියාවලිය දිගටම සිදු වන නිසාත්, හතළිස් ලක්ෂයක් මනුෂ්‍ය ජීවිත මේ ක්‍රියාවලියට සම්බන්ධ වන නිසාත්, අපි ලබන වර්ෂයේ සිටම ප්‍රාථමික පාසල් ජාලයේ පෝෂණය සඳහා ද්විතීයික පාසල් දහසක් නිර්මාණය කිරීමේ කටයුත්ත කරනවා. එකම 1-AB පාසලක්වත් නැති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 72ට 1-AB පාසල් 156ක් ලැබෙන ලෙසත්, විද්‍යා අංශයේ උසස් පෙළ කළ හැකි එක පාසලක් පමණක් තිබෙන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට පාසල් 288ක් ලැබෙන ලෙසත් මේ පාසල් සිතියම්ගතකරණය කරලා කොළඹ නගරයේ හරි, මාතර නගරයේ හරි, මහනුවර නගරයේ හරි ජනප්‍රිය යැයි සම්මත පාසලක තිබෙන සියලු පහසුකම් සහිතව සෑම දිස්ත්‍රික්කයකම, සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම අඩුම තරමේ එවැනි පාසල් දෙකක්, හෝ තුනක් නිර්මාණය කිරීමේ කටයුත්ත ජනවාරි මාසයේ සිට අපි ආරම්භ කරනවා. එතකොට අර ඈත පිටිසර අපේ නියෝජ්‍ය අධ්‍යාපන ඇමතිතුමා නියෝජනය කරන මොණරාගල වැනි ප්‍රදේශවල හැම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකමත් කොළඹ නගරයේ සුපිරි පාසලක් වාගේ පාසල් දෙකක් හරි අඩු තරමින් ඇති වෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු ඇමතිතුමා තව විනාඩි දෙකකින් අවසන් කරන්න.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා නියෝජනය කරන මාතර දිස්ත්‍රික්කයේ තිබෙන පාසල් පද්ධතියට අතිරේකව සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම මාතර නගරයේ තිබෙන රාහුල, සුජාතා වැනි විද්‍යාලවල තිබෙන පහසුකම්වලට සමාන පහසුකම් තිබෙන පාසල් දෙකක් ඇති වෙනවා. එතැනදී මේ පරිපාලන ක්ෂේත්‍රයේ නිලධාරින්ගේ, කලාප අධ්‍යක්ෂකතුමන්ලාගේ, එහෙම නැත්නම් වෙනත් අධ්‍යාපනඥයන්ගේ පැවැත්ම පිළිබඳව ප්‍රශ්නයක් මතු වෙනවා. මොකද, මේ වැඩ පිළිවෙළ කරන්න පුළුවන් වෙන්නේ ගුරුවරුනුත්, විදුහල්පතිවරුනුත්, කලාප අධ්‍යක්ෂකවරුනුත් කැප වීමකින් හා සද්භාවයෙන් මේ හැරවුම කිරීම සඳහා දායක වුණොත් පමණයි. එහෙම වුණේ නැත්නම් ඔවුන්ගේ දේශපාලන පක්ෂ, පාට, තරාතිරම නොබලා ඉවත් කරලා අවංක භාවයෙන් දේශපාලන පක්ෂ, පාට බේදයෙන් තොරව දරුවෝ වෙනුවෙන් පෙනී සිටින නිලධාරින් ආරක්ෂා කරන්නටත්, ඔවුන්ට අවශ්‍ය උසස්වීම් හා මාරුවීම් ලබා දෙන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නටත් මේ නව පනත අනුව අපි ප්‍රතිඥා දෙනවා. අපි ඒ ක්‍රියාවලිය පූර්වාදර්ශයක් ලෙස අරගෙන ආණ්ඩු වෙනස් වුණත් දිගටම ඒ ක්‍රියාවලිය පවත්වා ගෙන යාමයි කරන්න තිබෙන්නේ. ඒ නිසා අතීතයේ සිද්ධ වුණු අසාධාරණකම් හෝ අයථා ක්‍රම තිබෙනවා නම් ඒවා විධිමත් කිරීම සඳහා අපි ඒ සීමාව තුළ, අපට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළින් පැවරෙන බලය ප්‍රකාරව ඒ බලයට අනුව මේ තත්ත්වය නිවැරදි කිරීමට කරන්න පුළුවන් හැම දෙයක්ම අපි කරනවා කියන ටිකත් සඳහන් කරමින්, මේ කාරණයට සභාවේ අවධානය යොමු කිරීම ගැන ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ වචන කීපය සමාප්ත කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

බොහොම ස්තුතියි.

***එකල්හි වේලාව අ. භා. 7.30 වුයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2011 අගෝස්තු 12 වන සිකුරාදා අ. භා. 1.30 වන තෙක් කල් ගියේ ය.***

*அப்பொழுது, பி. ப. 7.30 மணியாகிவிடவே தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*அதன்படி பாராளுமன்றம், 2011 ஓகஸ்ட் 12, வெள்ளிக்கிழமை பி. ப. 1.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது*

*It being 7.30 p.m.,* MR. PRESIDING MEMBER *adjourned Parliament without Question put.*

*Adjourned accordingly until 1.30 p.m. on Friday, 12th August, 2011.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to be Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts**
**Received from Parliament :**

**Printed copies dispatched :**

දායක මුදල් : පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 2178කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 18.15කි. තැපැල් ගාස්තුව රු. 2.50කි. කොළඹ 6, කිරුළපන, පාමංකඩ පාර, අංක 102, පියසිරි ගොඩනැගිල්ලේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දාට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබා ගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම් පත් භාර ගනු නොලැබේ.

**சந்தா ;** ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15. தபாற் செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக **அத்தியட்சகர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 102, பியசிறி கட்டிடம், பாமன்கடை வீதி, கிருளப்பனை, கொழும்பு 6** என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப்பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

**Subscriptions :** The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of Hansard is available for Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, No. 102,Piyasiri Building, Pamankada Road, Kirulapone, Colombo 6. The fee should reach him on or before November 30 each year . Late applications for subscriptions will not be accepted.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.